# ගෙවතු වගාව



ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

තාක්ෂණික දායකත්වය හා සැකසුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය

# ගෙවතු වගාව

ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

තාක්ෂණික දායකත්වය හා සැකසුම
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය

2020

| | |
|---|---|
| ප්‍රකාශක | ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය |
| පළමු මුද්‍රණය | 2020 |
| තාක්ෂණික දායකත්වය හා සැකසුම | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| නිර්මාණය | ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය<br>කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

## විධායක සම්බන්ධීකාරක

එච්.එම්. ජයන්තා ඉලංකෝන් මැණිකේ (අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල් - සංවර්ධන)

## තාක්ෂණික කමිටුව

එච්.එම්. ජයන්තා ඉලංකෝන් මැණිකේ (අතිරේක අධ්‍යක්‍ෂ ජනරාල් - සංවර්ධන)
එස්. පෙරියසාමි (අධ්‍යක්‍ෂ - තොරතුරු හා සන්නිවේදන)
දිස්නා රත්නසිංහ (නියෝජ්‍ය අධ්‍යක්‍ෂ - ව්‍යාප්ති හා පුහුණු)
එස්.එස්. වැලිගමගේ (ප්‍රධාන කෘෂි විද්‍යාඥ - උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය)
ජී.ජී.බී. ශ්‍යාමලී (විදුහල්පති/සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
ඩී.එච්.ජේ.කේ. කීර්තිරත්න (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
ප්‍රදීප් රණසිංහ (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
කේ.ඒ.ඩී.එස්.ටී. කහඳවආරච්චි (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - පර්යේෂණ)
ඩබ්.ජී.එම්. දයාවංශ (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
කපිල වික්‍රමසිංහ (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
කමල් නිශාන්ත කන්නන්ගර (ප්‍රධාන කෘෂි විශේෂඥ - ශාක අභිජනන)
අනූෂා කන්නන්ගර (කෘෂිකර්ම උපදේශක)
එම්.සී.අයි. සිල්වා (කෘෂිකර්ම උපදේශක)
එච්.එල්.සී. නාලක හේරත් (කෘෂිකර්ම උපදේශක)
ශිරාණි ගුණසේකර (කෘෂිකර්ම උපදේශක)
නිමාලි ජාගොඩආරච්චි (පොල් සංවර්ධන නිලධාරී)
එච්.ඒ.එල්. සමිත්‍රි (ව්‍යාප්ති නිලධාරී/සුළු අපනයන බෝග)

## සංස්කරණය

එම්.එෆ්.එම්. රිස්වාන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)
ඩබ්.ජී.එම්. දයාවංශ (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)

## ප්‍රකාශන කළමනාකරණය

එස්. පෙරියසාමි (අධ්‍යක්‍ෂ - තොරතුරු හා සන්නිවේදන)
ඩබ්.එල්. හිරාන් පීරිස් (අතිරේක අධ්‍යක්‍ෂ - තොරතුරු හා සන්නිවේදන)
එම්.එෆ්.එම්. රිස්වාන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්‍ෂ - සංවර්ධන)

## සහාය සංස්කරණය හා සහාය ප්‍රකාශන කළමනාකරණය

එම්.කේ.ඩී.එම්. ශ්‍රියන්තා මැණිකේ (කෘෂිකර්ම උපදේශක)
එන්.ඩබ්.එල්.බී. නාරංගම්මන (කෘෂිකර්ම උපදේශක)

## පරිගණක පිටු සැකසුම

ලියනගේ ගෝතමී
කුමුදු සෙනෙවිරත්න
ලසන්තා කුමාරි වීරසිංහ
හසන්තිකා සංගීති ගුණසිංහ
රුවනි යශෝධරා කුමාරි
දේවිකා විනෝදනී
ශෂිකලා උදේශිනි කුරුප්පුආරච්චි

## ඡායාරූපකරණය

චන්දන උදයසිරි
මධුසංඛ හේවාආරච්චි
ප්‍රනීත් දර්ශන
තරිඳු රාජපක්‍ෂ

## පිටකවරය සැකසුම

ශෂිකලා උදේශිනි කුරුප්පුආරච්චි
හේමන්ත බෝගහවත්ත

## නිර්මාණය

ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**2020**

**තාක්ෂණික දායකත්වය සඳහා විශේෂ ස්තුතිය.....**

අජිත් ජයසූරිය (ඉංජිනේරු/නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්)
ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය

සාගරිකා සුමනසේකර (අධ්‍යක්ෂ)
පශු සම්පත්, ගොවිපල ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය

අරුණ දිසානායක (සහකාර අධ්‍යක්ෂ - සන්නිවේදන)
අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ආචාර්ය ශෙහාන් වික්‍රමසිංහ (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - සංවර්ධන)
ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

ආචාර්ය සුදීපා සුගතදාස (වනස්පති)
ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද මධ්‍යස්ථානය

සී.කේ. ගිරිඋල්ල (ව්‍යාප්ති නිලධාරී)
ආයුර්වේද දෙපාර්තමේන්තුව

# පෙරවදන

අපේ නිවස හා බැඳුනු පරිසර පද්ධතිය ගෙවත්තයි. ගෙවත්ත නම් වූ ඒ කුඩා පරිසර පද්ධතිය අපේ පවුල නම් වූ කුඩා ඒකකය ජීවත් කරවන්නට තරම් විවිධාංගීකරණය වී, වර්තමානයේ පවුලේ ආර්ථිකයට මිල කළ නොහැකි ශක්තියක් හා වටිනාකමක් එක් කර ඇත.

ගෙවතු වගාව වූ කලී අපේ පාරම්පරික කෘෂිකාර්මික සංස්කෘතියේ මූලාරම්භයයි. එදා සිට අද දක්වා විවිධ අයුරින් හා විවිධ තේමාවල් ඔස්සේ මෙන්ම, විවිධ සංකල්පනාවන් හා තාක්ෂණික හඳුන්වාදීම් ඔස්සේ පන්නරය ලැබූ ගෙවතු වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම, මඟපෙන්වීම හා තාක්ෂණ දායකත්වය වර්තමානයේ දී මනා ලෙස ඉස්මතු වී ඇත.

එහෙයින් ගෙවතු වගා සංවර්ධනය සඳහා මෙන්ම, කුටුම්භයක ආර්ථික ශක්තිය ගෙවත්ත තුළින් තර කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග බොහෝය. ඒ අතරින් ප්‍රජාවට පිදෙන මෙම "ගෙවතු වගාව" පොත, ගෙවතු වගාවේ නිරත වන්නන්ට මෙන්ම ගෙවතු වගාවේ නිරත වීමට අපේක්ෂාවෙන් සිටින්නන් උදෙසා සකස් කර ඇති තාක්ෂණික අත්පොතකි.

"ගෙවතු වගාව" කෘතිය තුළින් ඉඩකඩ ඇති වගේම ඉතා සීමිත ඉඩකඩක් ඇති ගෙවතු සඳහා ලෙහෙසියෙන්, පහසුවෙන් යොදා ගත හැකි ගෙවතු වගා තාක්ෂණික ක්‍රමවේදයන් ඉතා සරලව හා පැහැදිලිව ඉදිරිපත් කර ඇති බැවින් මෙම පොත ඉතාමත් පහසුවෙන් කියවා තේරුම් ගෙන ඒ තුළ ඇති දෑ ප්‍රායෝගික භාවිතයට ඉඩකඩ විවර කර ඇත.

එසේම මෙමඟින් ගෙවත්ත සැලසුම් කිරීමේ සිට ගෙවත්ත සැකසීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය භාවිතය, ගෙවත්තට පොහොර යෙදීම, ගෙවතු බෝග ලෙස පලතුරු වගාව, අස්වනු නෙළීමේ දර්ශක, පසු අස්වනු තාක්ෂණික ක්‍රමවේද, රෝග හා පලිබෝධ පාලන ක්‍රම මෙන්ම ගෙවත්ත ආර්ථික ඒකකයක් බවට පත්කර ගැනීම සඳහා උපදෙස් හා මඟපෙන්වීම ලබා දීමට සමත් වේ. විශේෂයෙන් නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල ගෙවත්තක් සැලසුම් කර පවත්වාගෙන යාමට ලබා දෙන තාක්ෂණික උපදෙස්වලින් ද පරිපූර්ණ තත්ත්වයට පත්ව ඇත.

එසේම වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය වන රට හදන සෞභාග්‍යයේ දැක්මෙහි ශක්තිමත් පවුල් ඒකක ලක්ෂ 20ක් ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියාත්මක කරනු ලබන "සෞභාග්‍යා ගෙවතු වැඩසටහන" තුළින් කුටුම්භයක ආර්ථික ශක්තිය ඉහළ නැංවීම මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලබන ගෙවතු වගා වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මෙම "ගෙවතු වගාව" පොතෙහි අන්තර්ගතය සකස් කර ඇත. එසේම තම පවුලේ පාරිභෝජන අවශ්‍යතා හැකි සෑම විටම ගෙවත්ත තුළින් ලබා ගැනීමට ගෙවතු වගාකරුවන්ට මඟ පෙන්වීම සඳහාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම "ගෙවතු වගාව" පොත ගෙවතු වගා තාක්ෂණික සංග්‍රහයක් ලෙස පිරිනමයි. තව ද මෙම ජාතික වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඍජු දායකත්වය සපයනු ලබන සියලුම ක්ෂේත්‍ර නිලධාරීන් හට මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කිරීමට ද මෙම කෘතිය සකස් කර ඇත.

තව ද මෙම "ගෙවතු වගාව" පොත සැකසීමේ දී සම්පත් දායකත්වය දැක්වූ නිලධාරීන් සියලුම දෙනා සතු දැනුම හා අත්දැකීම් මෙන්ම ඔවුන් කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ දිගු කලක් කටයුතු කිරීමෙන් ලබා ගත් නිපුණත්වය ද ඉවහල් වී ඇත.

එමෙන්ම මේ සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙමින් කටයුතු කළ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. වීරකෝන් මහතාටත්, අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) එච්.එම්. ජයන්තා ඉලංකෝන් මහත්මියටත්, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) එස්. පෙරියසාමි මහතාටත් ලබා දුන් මග පෙන්වීමට ගෞරව පූර්වක ස්තූතිය හිමි වේ. තව ද තම දායකත්වය නොමසුරුව ලබා දෙමින් තාක්ෂණික සහය දැක් වූ සැමටත් මෙම පොත සාර්ථකව එළිදැක්වීම සඳහා ආරම්භයේ සිට අවසානය දක්වාම නන් අයුරින් තම සේවය ලබා දුන් සියළුම දෙනාටත් ගෞරව පූර්වක ස්තූතිය පිරි නැමීමට අවස්ථාවක් කර ගනිමු.

**කර්තෘ මණ්ඩලය**

## ගරු සභාපතිතුමාගේ පණිවිඩය - ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය



පෙරදිග ධාන්‍යාගාරය නමින් ලොව ප්‍රචලිත "වී" ගොවිතැන ප්‍රමුඛ, ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හිමිකම් කියූ මෙරට පාරම්පරික කෘෂි ආර්ථිකයට ජීවය සැපයීමට එකළ විසූ අප මුතුන් මිත්තෝ සිය සම්ප්‍රදායික කෘෂිකාර්මික අත්දැකීම් හා භාවිතයන් උපයෝගී කර ගැනීමට දැක්වූ අපූරු හැකියාව නිසාම එකළ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිහි වීමට හේතු පාදක විය.

"පවුල" නමැති කුඩාම සංස්ථා ඒකකය මත ගොඩනැගෙන පාරම්පරික ශ්‍රී ලාංකික ජන සමාජය තුළ අතිශය සුන්දර වූත්, සරල වූත්, ඇවතුම් පැවතුම්වලින් සමන්විත වූ සදාචාර සම්පන්න, ගුණගරුක, ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වූ ඒකකයක් විය.

මේ සියල්ලට ම තිරසාර පදනම වූයේ "පවුල" කේන්ද්‍ර කරගත් කෘෂිකාර්මික ජීවන රටාවයි. මව පියා මුල් කරගත් පවුල් ඒකකයේ සියලු සාමාජිකයින්ගේ ශ්‍රම ශක්තියෙන් කුඹුරු යාය අස්වද්දා ගනු ලැබූ අතර තුන් වේල සරි කර ගැනීමට අවශ්‍ය එළවළු, පලතුරු, ධාන්‍ය වර්ග, අල වර්ග තම ගෙවත්ත තුළදී ම සකස් කර ගත්හ. ක්‍රමවත්ව, පිරිසිදුව හා පිළිවෙළට ගොම මැටියෙන් සකස් කළ සියලු අංගෝපාංග සහිත නිවස සහ වාතය, හිරු එළිය, ජලය ආදී ස්වභාවික සම්පත් වලින් අනූන වූ ගෙවත්ත අලුත් එළවළු හා පලතුරු මෙන්ම නැවුම් කිරි, බිත්තර යනාදී සත්ත්ව ආහාර වලින් ස්වයංපෝෂිත අටුකොටු පිරුණු සුන්දර සමාජ ඒකකයක් විය.

තම පරිභෝජන අවශ්‍යතා සිය ගෙවත්ත තුළින් සපුරා ගෙන සුහදත්වය, සහෝදරත්වය, අන්‍යෝන්‍ය බැඳීම, ගරුත්වය යනාදී ගුණාංග පිරි මිත්‍රශීලී සමාජ ඒකකය නිර්මාණයට මෙම පවුල නමැති ඒකකය දායක විය. මෙලෙස ස්වයංපෝෂිත වූ ආර්ථිකයක් සහ සමාජීය, සංස්කෘතික වශයෙන් පෝෂණය වූ පවුල් ඒකක සමූහයක් තුළින් සැකසුණු අපේ ගම්මානය ශ්‍රී ලාංකේය අනන්‍යතාවය ආරක්ෂා කරමින් මෙරට වැජඹිණි.
එහෙයින්, මෙම යථාරූපී සංකල්පය යළි මෙරට තුළ ගොඩ නැංවීමට අවශ්‍ය පදනම සකසනු වස් අතිගරු ජනාධිපතිතුමාගේ රට හදන සෞභාග්‍යයේ දැක්මෙහි එන ඵලදායී පුරවැසියෙක්, සතුටින් ජීවත්වන පවුලක් යන සංකල්පයට අනුව යමින් ගෘහ ආර්ථිකය පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන හඳුන්වාදීමට සැළසුම් කෙරිණි.

ජනතාවගේ ස්වයං සහභාගීත්වය සහිත ශක්තිමත් ගෘහ ආර්ථික ඒකක මගින් පවුල් ඒකක සවිබල ගන්වමින්, වස විසෙන් තොර ආහාර නිෂ්පාදනය වැඩිකර ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමත්, පරිසර හිතකාමී ජීවන රටාවකට ජනතාව හුරු කරමින් ජනතාවගේ පෝෂණ තත්ත්වය ඉහළ දැමීමත්, තම පරිභෝජන අවශ්‍යතා සිය ගෙවත්ත තුළ සම්පාදනය කර ගැනීමෙන් කුටුම්භ පරිභෝජන වියදම අවම කර අමතර ආදායම් ඉපැයීමත් මෙම වැඩසටහනෙහි මූලික අරමුණ විය. සීමිත භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගෙන

තිරසර ගෘහ ආර්ථික සංකල්පය වෙත ශ්‍රී ලාංකීය ප්‍රජාව සවි බල ගන්වමින් ස්වයං නිෂ්පාදන හා පරිභෝජන රටාවකට ජනතාව හුරු කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාවට නැංවීම රජයේ ප්‍රමුඛ කාර්යයකි.

එම අභියෝගය ජය ගැනීම සඳහා ගෘහ ආර්ථිකය පෝෂණය වැඩි දියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ කාබනික එළවළු හා පලතුරු පරිභෝජනය ගෘහ මට්ටමින් පුළුල් කිරීම සඳහා වන ගෙවතු ලක්ෂ 20 ක් වගා කිරීමේ වැඩපිළිවෙල දැනටමත් ආරම්භ කර ඇත. ඒ සඳහා කැප වී සිටින ග්‍රාමීය හා දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්ගේ හා ස්ව කැමැත්තෙන් මෙම ජාතික වැඩසටහන සඳහා ඒකාත්මික වන ප්‍රතිලාභීන්ගේ දැනුම වඩා විද්‍යානුකූලවත්, නිර්මාණශීලීවත් යොදා ගැනීම "අපේ ගෙවත්ත" පොත එළිදැක්වීම තුළින් අපේක්ෂා කරන බව මාගේ හැඟීමයි.

ඒ අනුව මේ පොත හුදෙක් කෘෂිකර්මාන්තය පිළිබඳ පාඨ ග්‍රන්ථයක් නොව. අතීත ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය වෙත ශ්‍රී ලාංකීය ප්‍රජාව දිරිමත් කරන අත්පොතක් වනු දැකීම මාගේ අභිලාෂයයි.

**බැසිල් රෝහණ රාජපක්ෂ**
**සභාපති**
**ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාව තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය**

## ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ පණිවිඩය



කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ගෙවතු වගා මාර්ගෝපදේශ සංග්‍රහයක් එළිදක්වමින් කෘෂිකාර්මික ක්ෂේත්‍ර නිලධාරීන්ගේ දැනුම වර්ධනයට කටයුතු කිරීම කාලීනව ඉතා වැදගත් කාර්යයක් ඉටුකිරීමක් සේ අගයමි. ඊට මූලිකවම කටයුතු කළ සියලු දෙනාටමත් පළමුව මාගේ කෘතඥතාවය පළකරමි.

රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා තිරසර පරිභෝජනය හා ආදායම් උත්පාදනය මූලික කරගත් ගෘහ ආර්ථිකය සහ පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික වැඩසටහන හඳුන්වා දී ඇත. මේ තුළ ගෙවතු වගා වැඩසටහන ප්‍රමුඛතා කොට සැලකෙන අතර, 2020/21 මහ කන්නය ඉලක්ක කර ගනිමින් ගෙවතු වගා දස ලක්ෂයක් දිවයින පුරා ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.

කුඩා ඉඩමක වුවද නව තාක්ෂණය හා උපක්‍රම භාවිතා කරමින් එදිනෙදා භාවිතයට අවශ්‍ය භවභෝග නිපදවා ගැනීමේ හැකියාව පිළිබඳ අවබෝධයක් නිවැසියන්ට ලබාදිය යුතුය. කාබනික වගාවක් තුළ වස විස නැති ආහාර වේලකට ගෙවත්තෙන් ලබාදිය හැකි දායකත්වය පිළිබඳ අවබෝධයක් ලබාදී රාජ්‍ය අනුග්‍රහයෙන් බීජ හා පැළ ලබාදෙමින් ඊට දිරිගැන්වීම් සිදුකළ යුතුය. රජය විසින් ලබාදී ඇති අනුග්‍රහයන් ප්‍රායෝගිකව ක්ෂේත්‍රය වෙත ගලා යා යුතුය. මේ සඳහා ක්ෂේත්‍රයේ කටයුතු කරන නිලධාරියාට විශාල වගකීමක් පැවරෙන අතර, අපේක්ෂිත ඉලක්ක ළඟා කරගැනීමට ඔවුන්ගේ දැනුම ද යාවත්කාලීන හා වර්ධනය කරගත යුතුය. ඒ සඳහා මෙම ග්‍රන්ථය මනා පිටුවහලක් සැපයෙනු ඇතැයි විශ්වාස කරමි.

**මහින්දානන්ද අලුත්ගමගේ**
**කෘෂිකර්ම අමාත්‍ය**

# ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවිඩය



රට හදන සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව කාබනික එලවළු හා පලතුරු පාරිභෝජනය පුළුල් කිරීමේ අරමුණ පෙරදැරිව ගෙවතු විසි ලක්ෂයක් සංවර්ධනය කිරීම උදෙසා ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය මඟින් සැළසුම්කර අමාත්‍යාංශ කිහිපයක් ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ගෘහ ආර්ථිකය හා පෝෂණය වැඩිදියුණු කිරීමේ ජාතික ගෙවතු වගා වැඩසටහන වඩාත් එලදායි වැඩසටහනක් බවට පරිවර්තනය කිරීමේ මුඛ්‍ය පරමාර්ථය ඇතිව එළිදැක්වෙන ගෙවතු වගා මාර්ගෝපදේශකත්ව සංග්‍රහය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යක් සේ සලකමි.

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලාංකික ප්‍රජාව තම දෛනික පාරිභෝජනය සඳහා අවශ්‍ය වන එළවළු, පලතුරු, කුළුබඩු, ඖෂධ පැළෑටි හා ගෘහ අලංකරණ ශාක තම ගෙවත්තේ තිරසාර හා පරිසර හිතකාමී ලෙස වගා කර තම පවුලේ ආහාර හා පෝෂණ සුරක්ෂිතාව සපුරාගත් අතර, අතිරික්තය අසල්වාසින් සමඟ හුවමාරු කිරීම හෝ අලෙවිකර ගෘහස්ථ ආදායම් මුලාශ්‍රයක් නිර්මාණය කරගත්හ.

හැත්තෑව දශකය අගභාගයේ විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමඟ එතෙක් ලාංකික ජනතාවගේ පැවති සරල ස්වයංපෝෂිත ජීවන රටාව බිඳ වැටී තරඟකාරි ජීවන රටාවක් බවට පත්වූ අතර, අනාදිමත් කාලයක සිට ලාංකික ප්‍රජාවට ආර්ථික සමාජීය හා පාරිසරික ප්‍රතිලාභ සම්භාරයක් ලබාදුන් තිරසාර ගෙවත්ත නොසලකාහරිනු ලැබූහ. අද වනවිට ග්‍රාමීය ජනතාව පවා එදිනෙදා පාරිභෝජනය කරන තම එළවළු පලතුරු අවශ්‍යතා සපුරාගැනීම උදෙසා වෙළඳපොල වෙත යොමුවී ඇත.

ඒ අනුව, ශ්‍රී ලාංකික ජනතාවගේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය තහවුරු කරගැනීම සඳහා වඩාත් සුදුසුම උපාය මාර්ගයක් ලෙස ගෙවතු සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇති අතර, රට හදන සෞභාග ‍යයේ දැක්ම ආර්ථික ප්‍රතිපත්තියට අනුව ගෙවතු විසි ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

මෙම ගෙවතු සංවර්ධන ජාතික වැඩසටහනට සමගාමීව කෘෂිකාර්මික ක්ෂේත්‍රය නියෝජනය කරනු ලබන සියළුම ආයතනයන්ගේ සක්‍රිය දායකත්වය ඇතිව සකස් කරන ලද මෙම ගෙවතු වගා මාර්ගෝපදේශ සංග්‍රහයේ මඟ පෙන්වීම් උපයෝගී කරගනිමින් සාර්ථක ගෙවතු සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට මහගු පිටුවහලක් වනු ඇතැයි මා හුදෙක්ම විශ්වාස කරමි.

වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියේ සුවිශේෂී නිර්දේශයන් පදනම් කර ගනිමින් හා අනුගත වෙමින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන ගෙවතු විසි ලක්ෂයක් සංස්ථාපනය කිරීමේ මහඟු මෙහෙවරට උපදේශනයක් සැපයීමට දායකවන මෙම මාර්ගෝපදේශ සංග්‍රහය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය දායකත්වය ලබාදෙන ලද වියතුන්ට මාගේ කෘතඥතාවය පළ කරමි. එසේම ඉතා කෙටි කාලයක් තුළ මෙම මාර්ගෝපදේශ සංග්‍රහය මුද්‍රණය කර එළිදැක්වීම සඳහා කටයුතු කරන ලද සංස්කරණ මණ්ඩලයට හා විවිධ අයුරින් මේ සඳහා සහයෝගය ලබා දුන් සැමදෙනාටමද මාගේ ප්‍රසංශාව හිමිවේ.

**ශෂීන්ද්‍ර රාජපක්ෂ**
**කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය**
**වී හා ධාන්‍ය, කාබනික ආහාර, එළවළු, පළතුරු, මිරිස්, ළූණු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය,**
**බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය.**

# කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලාංකික ප්‍රජාව ඈත අතීතයේ සිටම තම නිවස ආශ්‍රිත පරිසරය එනම් ගෙවත්ත එළවළු, පලතුරු, කුළුබඩු, ඖෂධීය පැළෑටි, මල් හා දැව ආදී විවිධ ප්‍රයෝජන ලබාගැනීම උදෙසා භාවිතා කළ අතර එම පරිසරය අලංකාරවත්, පිරිසිදුවත් තබාගනිමින් එහි ප්‍රතිලාභ භුක්ති විඳින ලදි. මෙම ගෘහාශ්‍රිත පරිසර පද්ධතිය මඟින් ප්‍රධාන වශයෙන් ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කරනු ලැබූ අතර, එමගින් ඔවුන්ට ආර්ථික සමාජීය හා පාරිසරික වශයෙන් ප්‍රතිලාභ සම්භාරයක් හිමිවිය. තවද එහි ඇති තිරසර වගා රටාවන් තුළින් පරමාදර්ශීය ඉඩම් පරිහරණ සැළසුම් ක්‍රමවේදයක් ස්ථාපිතව පැවති බව කෘෂි පාරිසරික විද්‍යාඥයින්ගේ මතය විය.

වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය වන "රට හදන සෞභාග්‍යයේ දැක්මෙහි" ප්‍රමුඛ සංකල්පයක් ලෙස ගැනෙන, "ඵලදායී පුරවැසියෙක් සතුටින් ජීවත් වන පවුලක්" යන සංකල්පය යථාර්ථයක් බවට පත්කර සමෘධිමත් වූ දේශයක් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් දිවයින පුරා ගෙවතු ලක්ෂ 20ක් සංවර්ධනය කර ගැනීම සඳහා ඉහළ ප්‍රමුඛත්වයක් ලබා දීමට සමත් වී ඇත.

මේ සඳහා ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය විසින් ගෘහාර්ථිකය හා පෝෂණය වැඩිදියුණු කර පවුල් ඒකක සවිබල ගැන්වීමේ ජාතික ගෙවතු සංවර්ධන වැඩසටහන සැළසුම් කර ක්‍රියාත්මක කිරීමට මූලික කටයුතු සිදුකර ඇත. මේ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ ගණනාවක් ඒකාබද්ධ වෙමින් එය සාර්ථක කිරීමට සෘජු දායකත්වය ලබාදෙමින් සිටින බව සඳහන් කරනුයේ මහත් සතුටිනි. මෙහිදී කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ගෙවතු හිමියන් දිරිගැන්වීම සඳහා අවශ්‍ය වන එළවළු බීජ, එළවළු තවාන් පැළ හා පලතුරු පැළ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා සපයනු ලබන අතර, ප්‍රතිලාභීන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා නිපුණත්වය ලබාදීමට ද මැදිහත් වී ඇත.

මෙම වැඩසටහනට සමගාමීව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ගෙවතු වගාව ප්‍රවර්ධනයට දායක වන විවිධ වෙනත් දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතනයන්ගේ සම්පත් දායකත්වයෙන් බිහිකරන ලද මෙම ගෙවතු වගා මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කර ගැනීමට දායක වූ සියළු නිලධාරීන්ට මාගේ ස්තූතිය මෙයින් පිරිනැමේ.

මෙම ගෙවතු වගා මාර්ගෝපදේශ සංග්‍රහය ගෙවතු විසි ලක්ෂයක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනට සෘජුව දායක වන විවිධ තරාතිරමේ ක්ෂේත්‍ර නිලධාරීන්ට තම රාජකාරී කරගෙන යාමට මග පෙන්වන්නක් වේ යයි විශ්වාස කරන අතරම ශ්‍රී ලංකාව පුරා විහිදී සිටින ගෙවතු වගාවේ සෘජු ප්‍රතිලාභීන් වන විසි ලක්ෂයක් වූ ගෙවතු හිමියන්ට තිරසර වූ ගෙවත්තක් පවත්වාගෙන යාමට අත්වැලක් වීමට හැකිවේ යැයි මාගේ විශ්වාසයයි.

**සුමේධ පෙරේරා ඩබ්ඩබ්වී ආර්ඩබ්පි ආර්එස්පි යූඑස්පි එන්ඩියූ**
**මේජර් ජෙනරාල් (විශ්‍රාමික)**
**ලේකම්**
**කෘෂිකර්ම අමාත්‍යාංශය**

# කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



අතීතයේ සිටම කෘෂිකර්මය අප රටේ ජීවනාලිය ලෙස සළකනු ලැබූ අතර, පෙරදිග ධාන්‍යාගාරය ලෙසින් ද විරුදාවලිය ලබා ඇත. මේ වනවිට රට සහලින් ස්වයංපෝෂිත වීමේ අභියෝගය අප ජයගෙන ඇති නමුදු අප රට තුළ වගා කළ හැකි බෝග රැසක් තවමත් විදේශීය රටවලින් ආනයනය කිරීමේ තත්ත්වය වළක්වා ගැනීමේ අභියෝගය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අවධානය යොමු කර ඇති අතර සෞභාග්‍යයේ දැක්ම තුළින් නුදුරු අනාගතයේ දී රට තුළ වගා කළහැකි බෝග විශාල ප්‍රමාණයක් ස්වයංපෝෂිත තත්ත්වයට ළඟා වනු ඇත.

පවුලේ ආහාර හා පෝෂණ අවශ්‍යතා ගෙවතු පරිසර පද්ධතියෙන් සපුරා ගැනීම අපගේ මුතුන් මිත්තන්ගේ ජීවන රටාවේ අංගයක් වූ නමුදු කාර්මීකරණය හා ආර්ථික රටාවේ නවීකරණයත් සමඟම අපගේ ජන ජීවිතය තුළින් ගෙවත්ත බැහැර වී ඇති බවක් පෙනේ. වගා කළ හැකි භූමි ප්‍රමාණයන් සීමා වෙමින් පවතින අවධියක ඒ සඳහා යෝග්‍ය වූ නව තාක්ෂණයන් හඳුන්වා දෙමින් නැවත ගෙවත්ත අපගේ ප්‍රජාව තුළ ඇති කරලීමට විවිධ වූ ක්‍රියාමාර්ග රැසක් මේ වන විටත් ක්‍රියාත්මක කරමින් තිබූ අවධියක වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය වන ''රට හදන සෞභාග්‍යයේ දැක්ම'' මඟින් පවුල් ඒකකය සංවර්ධනය කිරීම උදෙසා ගෙවතු වගා ලක්ෂ 20 ක ඉලක්කයක් සාක්ෂාත් කර ගැනීමට ප්‍රමුඛත්වයක් ලබා දී තිබීම සතුටට කරුණකි. එමෙන්ම ගෝලීය වසංගතයක් වන කොවිඩ් 19 උවදුරට මුහුණ දී ජාතියක් ලෙස නැගිටීම සඳහා පවුල් ඒකකය ආර්ථික වශයෙන් හා පෝෂණීය අතින් ශක්තිමත් වූ තත්ත්වයකට පත් කිරීමට ගෙවත්ත පිටුවහල් වන බව සඳහන් කරනු කැමැත්තෙමි.

මෙම නව අභියෝගයට මුහුණදීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලිකත්වය ඇතිව ගෙවතු වගා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට දායක වන දෙපාර්තමේන්තු හා වෙනත් රාජ්‍ය ආයතනයන් ඒකාබද්ධ වෙමින් නිර්මාණය කළ මෙම ග්‍රන්ථයෙන් ගෙවතු වගාවට මාර්ගෝපදේශයක් ලබා දෙන අතර රටේ සියලුම ජනතාව එය පරිහරණය කරමින් තම ගෙවත්තේ පෝෂණය, ආර්ථිකය මෙන්ම පවුලේ සතුට ද රටේ සෞභාග්‍ය ද උදා කර ගැනීමට හැකිවනු නොඅනුමානය. තවද මෙයට අමතරව ගෙවතු වගා ජාතික වැඩසටහනට උරදී සිටින සියළුම රාජ්‍ය ආයතනයන්ගේ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය තාක්ෂණිකව ශක්තිමත් කිරීමට මෙම ගෙවතු වගා ග්‍රන්ථය ඉවහල් වන බව මාගේ විශ්වාසයයි.

**ආචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්. වීරකෝන්**
**කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්**

# පටුන


**1.0 හැඳින්වීම................................................................ 01-14**

1.1 ගෙවත්ත යනු ................................................................ 01

1.2 ගෙවත්තක වැදගත්කම හා වාසි ................................................................ 01-03

1.3 ගෙවත්තක තිරසර බව ................................................................ 03-05

1.4 මූලික අවශ්‍යතා ................................................................ 05-10

1.5 ගෙවත්තේ පවතින විවිධ අංග ................................................................ 10-13

**2.0 ගෙවතු සැලසුම්කරණය සහ නිර්මාණය ................................................................ 15-32**

2.1 ආහාර බෝග මගින් භූමි අලංකරණය සඳහා සැළසුම් කිරීම ................................................................ 16-19

2.2 ගෙවතු සැළසුමක් සකස් කර ගැනීම ................................................................ 20-32

**3.0 ගෙවත්තට බීජ හා රෝපණ ද්‍රව්‍ය ................................................................ 33-50**

3.1 හැඳින්වීම ................................................................ 33-34

3.2 ගෙවත්ත සඳහා ස්වයං බීජ නිෂ්පාදනය ................................................................ 34-36

3.3 තවානක බීජ සිටුවා යම් කාලයක් රැක බලාගෙන පසුව ගෙවත්තේ සිටුවීම ................................................................ 36-44

3.4 බීජ සෘජුවම ගෙවත්තේ හෝ විශාල බඳුන්වල සිටුවීම ................................................................ 44

3.5 වර්ධක කොටස් මඟින් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම ................................................................ 44-46

3.6 ගෙවත්තට යොදාගත හැකි බෝග වර්ග කිහිපයක්................................................................ 47-49

**4.0 ගෙවත්ත සකසා ගැනීම ................................................................ 51-70**

4.1 ගෙවත්ත සඳහා මායිම් වැට සකස් කිරීම ................................................................ 51

4.2 වගා කිරීමට සුදුසු තත්ත්වයට ඉඩම සැකසීම ................................................................ 52

4.3 ගෙවත්තේ පාංශු හා ජල සංරක්ෂණය දියුණු කිරීම ................................................................ 56

4.4 බිම් සකස් කිරීම හා ක්ෂේත්‍ර සංස්ථාපනය ................................................................ 56-58

4.5 ගෙවත්තේ විවිධ බෝග වර්ග සිටුවීම ................................................................ 59-62

4.6 අල බෝග වගා කිරීම ................................................................ 62-63

4.7 කුළුබඩු, ඖෂධීය, දැව ශාක වගා කිරීම ................................................................ 63-64

4.8 සත්ත්ව පාලනය ................................................................ 64-65

4.9 වගා පාලන කටයුතු ................................................................ 65-68

4.10 පලතුරු බෝග වගා කිරීම ................................................................ 68-70

**5.0 ගෙවත්තේ පොහොර භාවිතය ................................................................ 71-78**

5.1 හැඳින්වීම ................................................................ 71

5.2 පොහොර භාවිතය ................................................................ 71-74

5.3 ගෙවත්ත සඳහා සැකසූ කාබනික පොහොර භාවිතය ................................................................ 74-78

**6.0 නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ගෙවතු වගාව සැලසුම්කරණය හා නිර්මාණය කිරීම........ 79-96**

6.1 හඳුනාගත් ස්ථාන සඳහා සුදුසු බෝග වගාවන් තෝරා ගැනීම................................................................ 80

6.2 ඉඩකඩ අඩු ගෙවතු සඳහා යොදාගත හැකි වගා ක්‍රම................................................................ 81-84

6.3 විවිධ සිරස් ව්‍යුහ භාවිතයෙන් බෝග වගාව ................................................................ 84-88

6.4 ඉහළ මාලයේ පියැසි මුදුන මත බෝග වගාව ................................................................ 88-89

6.5 එල්ලෙන වගා මළු තුළ බෝග වගාව ................................................................ 89

6.6 නිවසේ ඇතුළත පවා වගා කළ හැකි ජල රෝපිත වගා බඳුන් ................................................................ 89-91

6.7 සිරස් ජීව ව්‍යුහ ................................................................ 91-94

6.8 කුඩා ඉඩක් සඳහා වගා ව්‍යුහ................................................................ 95

**7.0 පලතුරු වගාවේ මුහුණ දෙන ගැටළු හා ඒවාට ලබාදිය හැකි විසඳුම් ........................................ 97-102**
7.1 පලතුරු ගස්වල ඵල හට නොගැනීම සඳහා විසඳුම් ........................................ 97-100
7.2 ඒකාන්තර ඵලදාව ........................................ 100-101

**8.0 අස්වනු නෙළීම ........................................ 103-108**
8.1 අස්වනු නෙලීමේ දර්ශක ........................................ 103-105
8.2 පසු අස්වනු හැසිරවීම ........................................ 105-106
8.3 අගය එක් කිරීම ........................................ 107

**9.0 ගෙවත්තෙහි බෝග පළිබෝධකයින්ගෙන් ආරක්‍ෂා කර ගැනීම ........................................ 109-124**
9.1 හැඳින්වීම ........................................ 109-110
9.2 ගෙවත්තේ ඒකාබද්ධ පළිබෝධ පාලනය ........................................ 110-111
9.3 පළිබෝධක සතුන් ........................................ 111-116
9.4 ශාක රෝග ........................................ 116-118
9.5 ගෙවත්තේ කෘමි පළිබෝධකයින් පාලනය ........................................ 118-121
9.6 ගෙවතු වගාවේ රෝග පාලනය ........................................ 121
9.7 වල් පැළෑටි ........................................ 122-123

**10.0 ගෙවත්තට ඔසු වගාව ........................................ 125-142**
10.1 පවුලේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ගෙවත්තට ඔසු පැළ........................................ 125-126
10.2 කළාප වලට අනුව ඔසු පැළ........................................ 126-129
10.3 රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම........................................ 129
10.4 බීජ හා රෝපණ ද්‍රව්‍ය සඳහා ප්‍රතිකාර කිරීම........................................ 130
10.5 ඖෂධ පැළ නිපදවා ගැනීම........................................ 130-131
10.6 වගා නඩත්තුව හා අස්වැන්න නෙළීම........................................ 131
10.7 ඖෂධ පැළ හා බීජ ලබා ගැනීම........................................ 132
10.8 ගෙවත්තෙන් අත් බෙහෙත්........................................ 132-138
10.9 නිතර භාවිතා වන ඖෂධ ශාක........................................ 139-141

**11.0 ගෙවත්ත ආර්ථික ඒකකයක් බවට පත් කර ගැනීම ........................................ 143-176**
11.1 කහ වගාව ........................................ 144-147
11.2 ඉඟුරු වගාව........................................ 148-151
11.3 වැනිලා වගාව ........................................ 151-154
11.4 ගම්මිරිස් වගාව ........................................ 155-157
11.5 නයි මිරිස් වගාව ........................................ 157-160
11.6 පොල් වගාව ........................................ 161-164
11.7 පොකුණු තුළ මසුන් වගාව ........................................ 165-167
11.8 වතු ආශ්‍රිත පොකුණු/වතු ජලාශ වල ජලජීවී වගාව ........................................ 167-168
11.9 කාලීන ජලාශවල මත්ස්‍ය වගාව ........................................ 168-169
11.10 විසිතුරු මත්ස්‍ය වගාව ........................................ 170-171
11.11 විසිතුරු මත්ස්‍ය වගා ගොවිපළ වැඩිදියුණු කිරීම ........................................ 171
11.12 ගෘහාශ්‍රිත කුකුළු පාලනය ........................................ 172-174
11.13 ගෘහස්ථ ජීව වායු ජනක........................................ 175-176

**ඇමුණුම් ........................................ 177-198**

**වැඩිදුර විස්තර........................................ 199**



# 01 හැඳින්වීම

## 1.1 ගෙවත්ත යනු

අප ජීවත්වන නිවස හා ඒ වටා ඇති පුංචි පරිසර ඒකකය ගෙවත්තයි. එහි අපට ගැළපෙන පරිදි වගා කිරීම ගෙවතු වගාවයි.

ගෘහය (පවුලක්) හා ඉඩම (වගාවක්) ඒකාබද්ධ වන අවස්ථාවක් ලෙසින් එනම්, ගෘහාශ්‍රිත වගා පද්ධතියක් ලෙස ගෙවත්ත සළකනු ලැබේ.

අපේ ගෙවත්තේ එළවළු, පලතුරු, කුළුබඩු, ඖෂධීය පැළෑටි, මල් සහ දැව ආදී ප්‍රයෝජනවත් හා අලංකාරවත් ශාක අපට වගා කරන්න පුළුවන්. ඊට අමතරව අපට සතුන් ද ඇති කරන්න පුළුවන්.

ගෙවතු වගාවේ පොදුවේ දක්නට ලැබෙන ලක්ෂණයක් වනුයේ ප්‍රමාණයෙන් කුඩා බවකින් යුක්ත වීමයි. එමගින් අප සතු සීමිත සම්පත් යොදවා ගෙන ගෙවත්ත පවත්වා ගෙන යාමට ඉඩකඩ අපට ලබාදෙයි. එමෙන්ම පවුලේ පෝෂණය හා ආහාර අවශ්‍යතාවයන් සපුරා ගැනීමට ගෙවතු වගාව ඉතාමත් වැදගත් වෙනවා.

## 1.2 ගෙවත්තක වැදගත්කම හා වාසි

නිවැසියන්ට අවශ්‍ය එළවළු, පලතුරු හා අනෙකුත් බෝග මෙන්ම සතුන් ද ගෙවත්තට ඇතුල් කර ගැනීමෙන් වාසි රාශියක් ලැබෙනවා.

- පවුලේ සාමාජිකයන්ට ප්‍රිය ජනක, වස විසෙන් තොර, පිරිසිදු, සමබර ආහාර වේලකට අවශ්‍ය බොහෝ දේ ලබාගන්න පුළුවන්.
- පෝෂණ අවශ්‍යතා වසර පුරාම ලබාගන්නත් පුළුවන්.
- බෝග වර්ග වලට අමතරව සත්ත්ව පාලනය ද ගෙවත්තට එකතු කරගත් විට පවුලේ දෛනික සත්ත්ව ප්‍රෝටීන් අවශ්‍යතාවයෙන් යම් ප්‍රමාණයක් සපයා ගන්න ගෙවත්ත උපකාරී වෙනවා.
- අවශ්‍ය වෙලාවට අවශ්‍ය ප්‍රමාණයෙන් නැවුම් බවකින් හා ගුණාත්මයෙන් උසස් නිමැවුම් නෙළාගන්නත් පුළුවන්. මේ හෙයින් අතේ දුරින් පවතින සජීවී ගබඩාවක් ලෙසින් ගෙවත්ත සැළකිය හැක.

- වාණිජ වගාවන්හි දී වැරදි පළිබෝධනාශක භාවිතයත්, පළිබෝධනාශක භාවිතයෙන් පසු අස්වනු කාලය ඉකුත්වීමට පෙර (සති 2 - 3 ක් කාලයක් ගතවීමට පෙර) අස්වැන්න නෙළීම කර වෙළඳපොලට එවීමත් ගැටළුවක් වී ඇත. එහෙත් ගෙවතු වගාව තුළින් සැම විටම වස විසෙන් තොර, නැවුම් හා පිරිසිදු ආහාර ද්‍රව්‍ය අපට ලබාදෙයි.
- එළවළු හා පලතුරු අස්වැන්න වසරක් තුළ සමහර කාලවලට සීමා වීම සහ අයහපත් දේශගුණික තත්ත්ව නිසා වෙළඳ පොලට සැපයුම අඩුවන අවස්ථාවන්වල දී වෙළඳපොලේ මිල ඉහළ යනවා. වසර පුරා ගෙවත්ත නඩත්තු කිරීමෙන් අපට අධික මිලකට වෙළෙඳපොලෙන් මිලට ගැනීමට සිදුවන්නේ නැහැ. එමනිසා මුදල් ඉතිරි කරගන්න පුළුවන්.
- අතිරික්ත නිෂ්පාදන (අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් නිෂ්පාදනය වන) වෙළඳ පොළට අළෙවි කිරීමෙන් ගෙවත්තෙන් ලබාගැනීමට නොහැකි දේවල් මිලදී ගැනීමට අපට හැකි වෙනවා.
- එවැනි අතිරික්ත අස්වැන්න පදනම් කරගෙන අගය එකතු කළ නිෂ්පාදන සකස් කර ගැනීම මගින් හා කල්තබා ගැනීම වගේම ඒවා අසල්වාසීන් සමග බෙදා ගැනීම හෝ අලෙවිකර අමතර ආදායමක් ද ලබා ගන්න පුළුවන්. (උදා: බිලිං අච්චාරු, තක්කාලි සෝස්, ජෑම්, ලුණු දෙහි)
- එසේම සාර්ථක ගෙවත්තක අත්දැකීම් පසු කලකදී මහා පරිමාණ වගාවකට අත්වැලක් මෙන්ම පෙළඹවීමක් ද ඇති කරනවා.
- එම නිසා පෝෂණය අතින් මෙන්ම ආර්ථිකය අතින් ද පවුලක් වැඩි දියුණු වෙනවා.
- සීමිත සාධක වන භූමිය හිරුඑළිය, ජලය වැනි ස්වභාවික සම්පත් වලින්ද උපරිම ප්‍රයෝජන ලබා ගත හැකි වෙනවා.
- පවතින සම්පත් හා පවුලේ ශ්‍රමය යොදා ගන්නා නිසා අඩු වියදමකින් කර ගත හැකි වෙනවා.
- නිවසේ හා ගෙවත්තේ අපද්‍රව්‍ය නැවත නැවත භාවිතා කිරීමට හැකිවීම තවත් වාසියකි.
- ගෙවත්තේ පස සාරවත් වෙනවා. ඒ අතරම පරිසරය ද පිරිසිදු වෙනවා.
- හොඳින් සැළසුම් කළ ගෙවත්තක් කලාත්මක නිර්මාණයක් වන හෙයින් එය භූමි අලංකරණයට නව පිවිසුමක් ද වෙනවා.
- ශාක නිසා නිවස අවට සෞම්‍ය පරිසරයක් ඇතිවෙනවා.
- ගෙවත්තේ කාර්යන්හි නියැලීමෙන් ඒකායන අරමුණක සිත රැඳෙන නිසා මානසික සුවයක් ද ඇති වෙනවා.
- මානසික ආතතිය අවම කරගන්න ගෙවතු වගාව බෙහෙවින් ඉවහල් වෙනවා.
- එම නිසා ගතට ව්‍යායාමයක්, සිතට සතුටක් මෙන්ම පවුලේ සමඟිය ද ඇති වෙනවා.
- අපේ විවේක කාලය ප්‍රයෝජනවත් ලෙස ගත කර ගත හැකියි.
- ගෙවතු වගාවට අපේ පවුලේ දුවාදරුවන් එක්කර ගැනීම මඟින් කෘෂිකර්මයට ලැදි පරිසර හිතකාමී කුසලතාවයෙන් පිරිපුන් නව පරපුරක් බිහි කර ගන්නට දායක වෙනවා.



- සාර්ථක ගෙවත්තක් කෘෂිකාර්මික දැනුම පරපුරෙන් පරපුරට ද, අසල්වැසියන්ට ද බෙදා හරින පාසලක් බඳු වෙනවා.

## 1.3 ගෙවත්තක තිරසර බව

අපි ආරම්භ කර පවත්වාගෙන යන ගෙවත්ත මඟින් විවිධ වූ බෝග හා සත්ත්ව නිෂ්පාදන ලබා දෙමින් රෝග, පළිබෝධ හානි හා බෝගවල පෝෂක ඌණතා අවම වන සේ වසර පුරාම අඛණ්ඩව පවත්වා ගෙන යන්න පුළුවන් නම් එය ''තිරසර ගෙවත්තක්'' ලෙස හැඳින්වේ. එහි ඇති හිරු එළිය, ඉඩකඩ, පස, ජලය වැනි සීමිත සම්පත් හැකිතාක් ප්‍රයෝජනයට ගනිමින් විවිධ බෝග හා සත්ත්ව සංකලනයන් (ජෛව විවිධත්වය) වැඩිකර ගනිමින් හා පවත්වා ගනිමින් ගෙවත්තක තිරසර බව රැක ගත හැකි විය යුතුය.

- හොඳින් සැළසුම් කරගෙන තිරසරව පවත්වාගෙන යන ගෙවත්තකින් අවුරුද්ද පුරාම අපට අවශ්‍ය එළවළු, පලතුරු, අල වර්ග, කොස්, පොල්, දෙල්, කුළුබඩු, ඔසු වර්ග ආදිය මෙන්ම සත්ත්ව නිෂ්පාදනත් ලබාගන්න පුළුවන්.
- අපට සැමවිටම තිරස්ව මෙන්ම සිරස්ව ද තිබෙන සම්පත් (පස/භූමිය, හිරුඑළිය, ඉඩකඩ ආදිය) උපරිමව ප්‍රයෝජනයට ගත යුතු වෙනවා.
- බෝග මෙන්ම සත්ත්ව පාලනය මඟින් ද පුළුල් ජෛව විවිධත්වයක් පවත්වා ගන්න පුළුවන්.
- එමඟින් සම්පත් කාර්යක්ෂමව හා උපරිමව ප්‍රයෝජනයට ගනිමින් අපට ගෙවත්ත දිගින් දිගටම පවත්වා ගන්න පුළුවන්.

- ගෙවත්තක වගා කරන බෝග වර්ග වල බීජ හා රෝපණ ද්‍රව්‍ය වටපිටාවෙන්ම සොයා ගැනීමට හෝ සමහරවිට ගෙවත්තෙන්ම නිපදවා ගැනීමට හැකි වන්නේ නම් එය ගෙවත්තේ තිරසර පැවැත්මට ඉතා වැදගත් වේ.
- අපේ පරිසරයට ගැළපෙන, ශ්‍රී ලාංකේය රසය සහිත, සාම්ප්‍රදායික බෝග රාශියක් අපට තිබෙනවා. එම සමහර සාම්ප්‍රදායික බෝග වගාකර හොඳ අස්වැන්නක් ලබා ගැනීමට රසායනික පොහොර අවශ්‍යම නැහැ. එබැවින් අපට ඒවා කාබනික පොහොර යොදා වගාකර ගත හැකිවනවා මෙන්ම අමතර වියදමක් ද දරන්න අවශ්‍ය නැහැ. උදා : ඇත්දළ බණ්ඩක්කා, රතු බණ්ඩක්කා, ආලංගා, දේශීය වට්ටක්කා, ගොරකා තක්කාලි, අවර, හාල්මැස්සන් දඹල, පුහුල්, තම්පලා, පලා වර්ග ආදිය



ඇත්දළ බණ්ඩක්කා



රතු බණ්ඩක්කා



ආලංගා



දේශීය වට්ටක්කා



ගොරකා තක්කාලි



අවර

- හොඳින් තහවුරු කරගත් ගෙවත්තක් විවිධ බෝග වර්ග මිශ්‍රව වගා කරනු ලබන අතර ඒ අනුව පවතින වගාවන් විවිධ උසට වැඩෙන නිසා ද, විවිධ පෝෂණ අවශ්‍යතා වලින් යුක්ත වන නිසා ද, විවිධ ගැඹුරට මූල පද්ධතීන් විහිදෙන නිසා ද, සීමිත සම්පත්වන භූමිය, හිරුඑළිය, ජලය හා පාංශු පෝෂක කාර්යක්ෂම ලෙස නැවත නැවත භාවිතයෙන් ඒකක බිමක වපසරියෙන් වැඩි ආහාර ප්‍රමාණයක් නිපදවා ගන්නත් පුළුවන්.
- මිශ්‍ර බෝග වගාවක් ලෙසින් ගෙවත්ත පවත්වාගෙන යෑමත්, නිතර පරීක්ෂාව, බෝග මාරුව, බෝග සනීපාරක්ෂක කටයුතු වැනි කාර්යයන් සිදු කිරීම මඟින් පළිබෝධ හානි ස්වභාවිකව අඩු වේ. එමනිසා ගෙවත්තට පළිබෝධනාශක භාවිතා කිරීමේ අවශ්‍යතාවය අවම වේ.
- විවිධ උස මට්ටම් වල වැඩෙන බෝග නිසා හිරුඑළිය වැටීම පාලනය වන බැවින් වල් පැළෑටි කරදරකාරීව ඉස්මතු වීම ද පාලනය වෙනවා.
- ගෙවත්තෙන්ම ඉවතලන දිරාපත් වන ද්‍රව්‍ය වලින් අමතර වියදමක් රහිතව කොම්පෝස්ට් සාදා ගැනීමෙන් පරිසරය සංරක්ෂණය මෙන්ම පසේ පෝෂණය හා පසේ තත්ත්වය ද වැඩි දියුණු කරගන්න පුළුවන්.
- තවද සත්ත්ව පාලනය සිදු කිරීම මඟින් ගෙවත්තට අවශ්‍ය වන කාබනික පොහොර යම්තාක් දුරට ගෙවත්තෙන්ම සපයා ගන්න පුළුවන් වෙනවා.



කුකුල් පාලනය

## 1.4 මූලික අවශ්‍යතා

පවතින බෝග හා අනෙකුත් කටයුතු සඳහා ගෙවත්තේ මූලික අවශ්‍යතාවන් ලෙස සළකනු ලැබේ. මෙම මූලික අවශ්‍යතාවයන් කෙතරම් සුලභව පවතීද යන්න මත ගෙවත්තේ තිරසාර බව රඳා පවතී.

**බෝග අවශ්‍යතා**

- බෝග තෝරා ගැනීමේ දී පළමුව පවුලේ රුචිකත්වය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ. එලෙසම සළකා බලන ගෙවත්ත පිහිටි ප්‍රදේශයේ දේශගුණය පිළිබඳව මැනවින් සළකා බලා බෝග තේරීම කළ යුතුයි.
- එම ගෙවත්තෙහි පවතින හා එක් එක් ස්ථානයට ලැබෙන හිරු එළිය, බෝග වගා කිරීම සඳහා ඇති ඉඩකඩ, එහි ඇති පස හා පසේ තත්ත්වය මෙන්ම බෝග වගාව සඳහා ලබා ගතහැකි ජලය පිළිබඳව ද සැළකිලිමත් විය යුතුවේ.


පුහුල්


අළු කෙසෙල්


තුඹ කරවිල

### දේශගුණික තත්ත්වය

- මෙහිදී වර්ෂාපතනය, උෂ්ණත්වය වැනි සාධක පිළිබඳව සැළකිලිමත් වීම වැදගත් වේ.
- වර්ෂාපතනය අධික තෙත් කළාපයෙහි පහතරට ප්‍රදේශයන්හි ගෙවතුවල එළවළු වගාව අධික වර්ෂා කාලය මගහැර ආරම්භ කරන්න. උදා : බණ්ඩක්කා, වම්බටු, මෑ, බෝංචි, දඹල, කරවිල, පතෝල, පිපිඤ්ඤා, තක්කාලි, මාළුමිරිස් ආදී බෝග වර්ග හා කොළ එළවළු වර්ග
- වර්ෂාපතනය අධික වූ උඩරට හා මැදරට ප්‍රදේශවල ගෙවතු වල ඒ ඒ ප්‍රදේශ වලට උචිතවන ලීක්ස්, කැරට්, ගෝවා, කරවිල, පතෝල, මෑ, මාළුමිරිස්, දඹල, නෝකෝල් වැනි බෝග වර්ග වගා කරගත හැකියි.
- එසේම වර්ෂාපතනය අඩු වියළි ප්‍රදේශවල බොහෝ විට අඩු ජල තත්ත්වයන් ප්‍රිය කරන කැකිරි, එළබටු, බණ්ඩක්කා, වට්ටක්කා, අළු කෙසෙල්, පුහුල්, තිබ්බටු, තුඹ කරවිල, පිපිඤ්ඤා වැනි එළවළු බෝග වර්ග ද කතුරුමුරුංගා, මුරුංගා වැනි බෝග වර්ග ද වගා කරන්න.
- ජලය බැසයාම දුර්වල තැන්වල කංකුන්, මුකුණුවැන්න, කොහිල වැනි බෝග වගා කරන්න.

### හිරු එළිය

- ගෙඩි හටගන්නා එළවළු හා පලතුරු බෝග වර්ග වගා කිරීම සඳහා ගෙවත්තේ හොඳින් හිරු එළිය ලැබෙන ස්ථාන තෝරා ගන්න.
- හිරු එළිය අඩු ස්ථාන ඇත්නම් එවැනි තැන් වල පවතින ගස්වල අතු කපා ඉවත් කර, හිරු එළිය ලබා ගැනීමට කටයුතු කළ හැකි වේ. එසේත් නැත්නම් සෙවන ප්‍රිය කරන ගම්මිරිස්, කෝපි, කහ, ඉඟුරු, කිරිඅල වැනි බෝග වර්ග තෝරා ගන්න.
- ගෙවත්තට සෙවණ අවශ්‍ය ස්ථාන වලට කොස්, දෙල්, අඹ, රඹුටන්, අලිපේර, මුරුංගා, ආදී ගස් වර්ග තිබෙන ඉඩකඩ අනුව වවාගන්න. විශාල ගස් වර්ග හැකිතාක් දුරට උතුරු දිශාවේ පවතින වැටේ මායිමට ආසන්නව සිටුවාගන්න.
- ස්වභාවික සෙවණ යටතේ ඕකිඩ්, ඇන්තූරියම් වැනි මල් වර්ග වවාගන්න.



මල් වගාව



සිරස් වගාවක්

**ඉඩකඩ**

- නමුත් අපිට ගෙවත්තක ඉඩකඩ බොහෝවිට සීමාවෙන අවස්ථා තිබෙනවා.
- එවැනි අවස්ථා වල පවතින ඉඩකඩ අනුව සුදුසු පරිදි බෝග තෝරා ගන්න පුළුවන්.
- එලෙසම පවතින ඉඩකඩ කළමනාකරණය කර ගනිමින් ගෙවත්ත තුළ සතුන් ඇති කිරීම ද කළහැකි වෙනවා.
- ඉඩකඩ අඩු අවස්ථා වලදී අපට අවකාශය භාවිතා කර එක් එක් ස්ථර වලට ගැළපෙන ආකාරයට බෝග වගා කළ හැකිය.



පළා කුළුණ

- විශාල උස ගස් අතර සෙවන ප්‍රිය කරන කෝපි, ගම්මිරිස්, කොකෝවා වැනි බෝග ද ඉන් පහළ මට්ටමේ කහ, ඉඟුරු, කිරි අල වැනි බෝග ද ස්ථර ලෙස වගා කරන්න පුළුවන්.



කහ වගාව



ඉඟුරු වගාව

- එසේම ඉඩකඩ අඩු අවස්ථා වල දී වගා මළු, හාල් කවර, පොලිතීන් කවර, මල් පෝච්චි, ප්ලාස්ටික් බඳුන් ආදියේ බෝග වගා කර අපිට අවශ්‍ය ස්ථානවල තබා ගත හැකියි.



බඳුන්ගත පලතුරු වගාවක්

- එසේම විවිධ බඳුන්වල බෝග සිටුවාගෙන තාප්පය උඩ, වහලයේ හෝ ගස්වල එම බඳුන් එල්ලා ගැනීම ද කළ හැකියි.

**පස**

- අපේ ගෙවතු වල ඇති පස, ගෙවත්තෙන් ගෙවත්තට, ස්ථානයෙන් ස්ථානයට, කලාපයෙන් කලාපයට වෙනස් වෙනවා.
- බොහෝ එළවළු හා පලතුරු බෝග වගා කිරීම සඳහා කාබනික ද්‍රව්‍ය අඩංගු සාරවත් පසක් මෙන්ම හොඳින් ජලය බැස යන පසක් අවශ්‍ය වෙනවා. නමුත් එවැනි පසක් අපිට සැම විටම බලාපොරොත්තු වෙන්න බැහැ.

*පස ආරක්ෂා කිරීමට*

- තවත් සමහර අවස්ථා වලදී අපේ පස් සේදීයාමට භාජනය වෙනවා. එවැනි අවස්ථා වලදී ගල් වැටි, පස් වැටි, කාණු සහ තනි වේදිකා වැනි පස් සංරක්ෂණ ක්‍රම භාවිතා කර පසේ සේදීයාම අඩු කරගන්න.
- එවැනි තැන්වල පස සේදීයාම අඩුකර ගැනීමට බිම වැතිරී වැඩෙන බෝග වර්ග වන ගොටුකොළ, මුකුණුවැන්න ආදිය වැවීම හෝ තණ පිඩලි, පොල්ලෙලි ඇල්ලීම වැනි දේ කළ හැකියි. සේර, සැවැන්දරා වැනි බෝග වැටි යෙදීම ද කළ හැකියි.
- අපේ ගෙවත්තේ පසෙහි එකම ස්ථානයක දිගින් දිගටම එකම බෝග වර්ගය වගා නොකර බෝග මාරුව ඇති කරගන්නේ නම් රෝග හා පළිබෝධ පාලනය සඳහාත් පසේ ඇති පෝෂක ද්‍රව්‍ය කළමනාකරණය සඳහාත් වැදගත් වෙනවා.

*පස සරු කර ගැනීමට*

- සමහර ගෙවතුවල යම් ස්ථානවල සේදී ගිය නිසරු පසක් දකින්න ලැබෙනවා නම්, එම පසට කාබනික ද්‍රව්‍ය, සාරවත් මතුපිට පස් ආදිය මිශ්‍ර කර සරු කර ගන්න පුළුවන්.
- එම පසෙහි වැලි, මැටි ආදිය අධිකනම් එම පසට කාබනික ද්‍රව්‍ය එකතු කර ගන්න ඕන.
- අපේ ගෙවත්තේ යම් ස්ථානවල පස ගල්, බොරළු සහිත හෝ නිසරු ගොඩකළ පසක් විය හැකියි. එවැනි අවස්ථාවල දී වෙනත් කළ හැකි දෙයක් නොමැති නම්, බඳුන් හෝ මළුවල වගාකර එම ස්ථානවල තබා භූමිය ප්‍රයෝජනවත් ලෙස යොදා ගන්න.

**ජලය**

- බෝග වගාව මෙන්ම සත්ත්ව පාලනය සඳහා ද ජලය අත්‍යවශ්‍ය සාධකයකි. ගෙවත්තෙහි ඇති සියළුම ජල ප්‍රභවයන් මේ සඳහා යොදාගත හැකි වෙනවා.

*ජලය හිඟ ප්‍රදේශ වල දී*

- වර්ෂාව ඇති කාලයට වැසි ජලය ටැංකි, විශාල බැරල්, විශාල භාජන, පොකුණු ආදියේ එක්රැස් කර ගෙවතු වගාවට යොදාගන්න.



වැසි ජල ටැංකියක්

- එසේම ජලය අඩු ප්‍රදේශවල ගිල් වූ පාත්ති වල බෝග සිටුවන්න.



ගිල්වූ පාත්තියක්

- මෙවැනි අවස්ථාවල දී ජලය වැඩියෙන් අවශ්‍ය නොවන බෝග තෝරා ගන්නත් පුළුවන්. උදා : කැකිරි, වට්ටක්කා, තිබ්බටු, එළබටු, මුරුංගා, අළු කෙසෙල් ආදී බෝග
- තවද නිවසේ භාවිතා කරන ජලය එක්රැස් කර ගෙවත්තෙහි බෝග සඳහා යොදා ගන්න. මේ සඳහා අධිකව සේදුම් කාරක අඩංගු රෙදි සෝදන ජලය භාවිතා නොකරන්න.
- පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම මඟින් පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව ඉහළ නැංවේ. එමගින් ජල හිඟ තත්ත්ව වල දී බෝග වගාවට හොඳින් ගෙවත්ත භාවිතා කළ හැක. පසෙන් ජලය ඉවත් වීම වළක්වා ගැනීම සඳහා බෝග අවට වසුන් යොදන්න.



බෝග වසුන්

- හිමිදිරියේ හෝ හවස බෝග වලට ජලය යොදන්න.

**ජලය වැඩි ප්‍රදේශ වල දී**

- සමහර අපේ ගෙවතු වල පසෙහි ජලය රඳා පැවතීම වැඩියි. එවිට කාණු දමා උස් පාත්ති සාදා බෝග වගා කරන්නත් පුළුවන්.
- එසේත් නොමැති නම් එම ස්ථානවල ජලය ප්‍රියකරන බෝග වර්ග වන කංකුන්, මුකුණුවැන්න, කොහිල ආදිය වගා කරන්න හැකියාව තිබෙනවා.



කොහිල වගාව

- එවැනි ජලය වැඩි ප්‍රදේශ වල දී වර්ෂාවෙන් ළපටි පැළ ආරක්ෂා කර ගන්න උපක්‍රම යෙදීම වගේම උස් මළු හෝ පෝච්චි වල බෝග සිටුවා ගැනීම, මැහි භාවිතය වැනි උපක්‍රම භාවිතා කළ හැකියි.

- වැඩියෙන් ජලය එක් රැස් වන ස්ථාන පවතින්නේ නම් මත්ස්‍යයින් හෝ විසිතුරු මත්ස්‍යයින් ඇතිකිරීම ද සිදු කළ හැකියි.

## 1.5 ගෙවත්තේ පවතින විවිධ අංග

- ගෙවත්ත යනු අප ජීවත්වන නිවස අවට වටපිටාවයි. මෙම නිවස අවට වටපිටාව පවුලේ ශ්‍රමය එක් කර ගෙන පරිභෝජනයට සුදුසු ඒකකයක් බවට පත් කිරීම ගෙවතු වගාවේ මූලික පරමාර්ථයයි.
- ගෙවත්තක් සැළසුම් කරලීමේ දී නිවසට අමතරව පවතින වෙනත් ස්ථිර ව්‍යුහයන්, ඒවායේ පිහිටීම හා ස්වාභාවය පිළිබඳව සැළකිලිමත්වීම අවශ්‍ය වේ. උදාහරණයක් ලෙස ළිඳ හෝ ජල සැපයුම, වැට හෝ තාප්පය, වැසිකිළිය, ගබඩා කාමරය, සත්ත්ව පාලන ඒකකය හැඳින්විය හැක.
- තම නිවස සතු භූමි භාගය ඉතා ඵලදායී ලෙස භාවිතයට ගෙන එමගින් ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණීය විවිධත්වයක් ලැබෙන පරිදි වසර පුරාම බෝග වගාවලින් සමන්විත වන ලෙස ගෙවත්ත සඳහා බෝග තේරීම සිදු කළ යුතුය.
- ගෙවත්ත සඳහා එක්කර ගත යුතු විවිධ අංග සැළසුම් කිරීමේ දී තිබෙන ඉඩකඩ, හිරු එළිය, පවුලේ රුචිය, දේශගුණික තත්ත්වය, වගා කන්නය හා ජල පහසුකම් ගැන සැළකිලිමත් විය යුතුය.
- අඩු නඩත්තුවක් යටතේ වගා කළ හැකි බෝග වර්ග හා ගෙවත්තේ තිරසාරභාවය පවතින ආකාරයට බෝග වර්ග තේරීමක් කළ හැක. අනෙකුත් අංගයන් එකතු කිරීමටත් සැළසුම් කළ යුතුය. එමෙන්ම භූමි අලංකරණ ක්‍රමවේදයන් යොදා ගෙන මෙම බෝග හා විවිධ අංගයන් ඒකාබද්ධව පිහිටුවීමෙන් ගෙවත්තේ අලංකාරය වැඩි වේ.
- විවිධ වර්ණ සහිත බෝගවල සංකලනයන් එක් වන පරිදි බෝග තෝරා ගැනීම මගින් වර්ණ 5 කින් යුත් ආහාර වේලක් සෑම දිනකම ලබාගත හැකිවන අතර ගෙවතු පරිසරය ප්‍රියජනක තත්වයන්ට පත්කළ හැකියි.
- පළිබෝධ පාලනය සඳහා වැදගත් වන හිතකර සතුන් ආරක්ෂා කර ගැනීම සඳහාත් ඔවුන් ගෙන්වා ගැනීම සඳහාත් සැළසුම් කළ යුතුයි. එමෙන්ම පළිබෝධකයින් පළවා හැරීමට සමත් වන උපාය මාර්ග ද ඇතුළත් කර තිබිය යුතුය.

**එළවළු**

- ගෙවත්තක වගා කරන ප්‍රධාන බෝග කාණ්ඩය එළවළු වේ. ගෙවත්තේ හිරු එළිය ලැබීම, ජලය රැඳා පැවතීම වැනි විවිධ තත්ත්ව වලට ගැලපෙන එළවළු වර්ග භූමිය තුළ ස්ථාන ගත කළ යුතුය.
- මෙහිදී එක් එළවළු වර්ගයක් වැඩි භූමි ප්‍රමාණයක වගා කිරීම වෙනුවට එළවළු වර්ග වැඩි සංඛ්‍යාවක් කුඩා ප්‍රමාණවලින් වගා කිරීම මගින් පෝෂණීය විවිධත්වය ද ලැබීමට අමතරව වැඩි රුචිකත්වයකින් යුක්තව පවුලේ පරිභෝජනයට ගෙවත්තේ නිෂ්පාදන යොදා ගත හැකි වේ. මෙහිදී එක් එළවළු වර්ගයකින් ගස් 5-6 ක් පමණවත් තිබීම ප්‍රමාණවත් වේ.
- එළවළු බෝග තේරීමේ දී පහත කරුණු කෙරේ අවධානය යොමු කිරීම වැදගත් වේ.

- දේශගුණික තත්ත්ව වලට ගැළපෙන එළවළු වර්ග
- ගෙවත්ත පිහිටි ප්‍රදේශයට සහ ගෙවතු බිමට ගැලපෙන එළවළු වර්ග
- ගෙවත්තේ පවතින හා එක් එක් ස්ථානයට ලැබෙන හිරු එළිය, ජලය රඳා පැවතීම, පසේ තත්ත්වය වැනි විවිධ සාධකවලට ගැළපෙන බෝග
- පවතින ඉඩකඩ අනුව ගැළපෙන එළවළු වර්ග
- පහසුවෙන් වගා කළ හැකි වීම
- ලෙඩ රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව
- පවුලේ රුචිකත්වයට ගැලපීම
- පෝෂණ විවිධත්වයක් තිබීම
- නඩත්තු කටයුතු පහසුවීම
- වැඩි කාලයක් අස්වනු ලබා ගත හැකි වීම

**කොළ එළවළු**

- සමබල ආහාර වේලක අත්‍යවශ්‍යයෙන්ම කොළ එළවළු වර්ගයක් තිබිය යුතු වේ.
- පහසුවෙන් වගා කළ හැකි කංකුං, නිවිති, මුකුණුවැන්න, සාරණ, ගොටුකොළ, තම්පලා, කොහිල, කතුරුමුරුංගා කොළ එළවළු වර්ග ඒ අතර වේ.
- මීට අමතරව අඩු නඩත්තුවක් යටතේ ස්වභාවිකව වැවෙන කොළ වර්ග එකතු කිරීම මඟින් ආහාර වේලට විවිධත්වයක් ලබා ගත හැකිය. උදා : කුරිඤ්ඤා, කිරි අඟුණ, කිරි හැන්ද, තෝර, වැල් පෙනෙල, තෙබු
- වගා කරන වෙනත් බෝගවල පත්‍ර ද කොළ එළවළුවක් ලෙස ආහාරයට එක් කර ගත හැක. උදා : මඤ්ඤොක්කා, වැල් දොඩම්

**පලතුරු**

- ගෙවත්තේ තිබෙන ඉඩකඩ අනුව පලතුරු වර්ග තෝරා ගත යුතුය. වැඩි ඉඩකඩක් සහිත ගෙවත්තක් සඳහා විශාල වියනක් සහිත පලතුරු ශාක තෝරා ගත හැකිය. උදා: අලිපේර, පැපොල්, රඹුටන්, අඹ, අනෝදා, දොඩම්
- වසර පුරා ඵල දරණ, අඩු ඉඩක් ගන්නා පලතුරු වර්ග අඩු ඉඩකඩක් සහිත ගෙවත්තට එක් කර ගැනීම සුදුසුය. උදා: මිටි ඇඹරැල්ලා, අන්නාසි, පේර, කෙසෙල්, වැල් දොඩම්, දෙහි, ලෙමනයින්
- දේශගුණික තත්ත්ව වලට ගැළපෙන ප්‍රභේද තෝරාගත යුතුය.

*කලාප අනුව හා ආහාරයට ගන්නා ආකාරය අනුව සුදුසු පලතුරු ප්‍රභේද*

| බෝගය | කලාපය | පලතුරු ලෙස | ව්‍යාංජන ලෙස |
|---|---|---|---|
| අඹ | වියළි කලාපය | වෙල්ලෙයි කොලොම්බන් | වෙල්ලෙයි කොලොම්බන් |
| කෙසෙල් | වියළි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, සීනි කෙසෙල්, කණ්ඩුල | දිය අළු මොන්දන්, පුලතිසි, ඇටමුරු, අමොන්දන්, අළු කෙසෙල්, ප්‍රසාද්, කණ්ඩුල |
| කෙසෙල් | අතරමැදි කලාපය | කෝලිකුට්ටු, ඇඹුල්, ආනමාලු, ඇම්බන්, සීනි කෙසෙල්, කණ්ඩුල, | දිය අළු මොන්දන්, ප්‍රසාද්, අමොන්දන්, කණ්ඩුල, කිතල, අළු කෙසෙල්, පුලතිසි |
| කෙසෙල් | තෙත් කලාපය | ඇඹුල්, ආනමාලු, ඇම්බන්, සීනි කෙසෙල්, රත්කෙසෙල්, පූවාලු, බිං කෙසෙල්, කණ්ඩුල | දිය අළු මොන්දන්, පුලතිසි, ඇටමුරු, අමොන්දන්, කිතල, අළු කෙසෙල්, ප්‍රසාද් |

ඉඩකඩ අඩු ගෙවත්තක් සඳහා බඳුන්ගත පලතුරු වගාව වැදගත් වේ. මෙහිදී අඩි 2x2 පමණ වන පෝච්චිවල පලතුරු වගාකළ හැකි අතර බිම වගා කළ නොහැකි හොඳින් හිරු එළිය ලැබෙන ස්ථාන වල බඳුන් ගත පලතුරු වගාව කළ හැකිය.

**වෙනත් ක්ෂේත්‍ර බෝග**

- බඩ ඉරිඟු, මුං, කව්පි, උඳු, තල, කුරක්කන්, සෝගම් වැනි බෝග වියළි කලාපීය ගෙවතු සඳහා සුදුසු වේ.
- තිබෙන ඉඩකඩ අනුව හා දේශගුණික කලාප පදනම් කරගෙන මෙම බෝග වර්ග ගෙවත්තට එක් කර ගත හැකිය.
- පෝෂණීය විවිධත්වය සඳහාත්, ආහාර සුරක්ෂිතතාවය සඳහාත් වැදගත් වේ.

**කුළුබඩු**

- මිරිස්, කොච්චි, නයිමිරිස්, ගම්මිරිස්, රතු ළූණු, කහ, ඉඟුරු, රම්පේ, කරපිංචා, මිංචි, සේර, කුරුඳු වැනි කුළුබඩු බෝග ගෙවත්තට එකතු කර ගත යුතු ප්‍රධාන බෝග වේ.

**ඖෂධ වර්ග**

- එදිනෙදා අත් බෙහෙත් ලෙස අවශ්‍ය වන පැළෑටි වර්ග එක් කර ගත හැකිය. උදාඃ පොල්පලා, කෝමාරිකා, ඉඟුරු, කහ, තිප්පිලි, හාතාවාරිය, නීරමුල්ලිය

**අල බෝග**

- මඤ්ඤොක්කා, බතල, කිරිඅල, ඉන්නල, වැල් අල වර්ග ගෙවත්තට එක් කළ හැක.
- එම බෝග අඩු නඩත්තුවක් යටතේ වගා කළ හැකි අතර ආහාර සුරක්ෂිතාවය ද ලබා දේ.

**මල් වගාව**

- ගෙවත්තට අලංකාරයක් ලබා දීම සඳහා මල් හා විසිතුරු පැළ එක් කළ හැකිය.
- ඇන්තූරියම්, ඕකිඩ්, විසිතුරු පැළ ස්වභාවික සෙවණ යටතේ වගා කළ හැකිය. මෙය අමතර ආදායම් මාර්ගයක් ද කර ගත හැකිය.

**වෙනත් බෝග**

- පොල්, පුවක්, බුලත්, කෝපි වැනි ප්‍රයෝජනවත් බෝග මෙන්ම ඉඩකඩ පවතී නම් වැට මායිම ආසන්නයේ දැව වර්ග වගා කළ හැකිය. උදාඃ කොස්, දෙල්, මිටි මුරුංගා, හල්මිල්ල, පිහිඹිය, කොහොඹ හා ග්ලිරිසීඩියා

**සත්ත්ව පාලනය**

- කිරි හා බිත්තර මඟින් පවුලේ සත්ත්ව ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාලීම සඳහාත්, සත්ත්ව මළද්‍රව්‍ය කාබනික පොහොර නිෂ්පාදනයටත් වැදගත් වේ.
- ඉඩකඩ, පරිසර තත්ත්ව, සුලභතාව සහ සත්ත්ව ආහාර අනුව සත්ත්ව පාලනය රඳා පවතී.
- ගව පාලනය, කුකුළු පාලනය, වටු කුරුල්ලන් ඇති කිරීම සහ එළු පාලනය ද සිදු කළ හැක.

**බිම්මල් වගාව**

අමතර ආදායම් මාර්ගයක් ලෙසින් ගෙවත්තේම සකස් කර ගන්නා කුඩා බිම්මල් ගෘහයක් තුළ බිම්මල් නිෂ්පාදනය කර අලෙවි කළ හැකිය. මේ සඳහා පිදුරු හෝ ලී කුඩු භාවිතා කළ හැකි අතර පවුලේ ශ්‍රමය යොදා ගත හැකිය. විශාල ඉල්ලුමක් පවතින නිෂ්පාදනයක් වන මෙය හොඳ ස්වයං රැකියාවකි.

### විසිතුරු මත්ස්‍ය වගාව

- අමතර ආදායම් මාර්ගයක් ලෙසින් ගෙවත්තේ සකස් කර ගන්නා ටැංකි තුළ මත්ස්‍ය වගාව කළ හැකි වේ.

### කාබනික පොහොර ඒකකය

ගෙවතු වගාව ප්‍රධාන වශයෙන්ම කාබනික පොහොර මුල් කරගෙන සිදුකරන බැවින් කාබනික පොහොර ඒකකයක් තිබීම වැදගත් වේ. මෙමගින් නිවසේ හා වගා භූමියේ එකතුවන දිරාපත් වන කැළි කසල කොම්පෝස්ට් බවට පත් කළ හැකිය. අවශ්‍ය ප්‍රමාණයට කාබනික පොහොර පසට එක් කිරීම නිසා පසෙහි ආරක්ෂාව හා පෝෂණය දිගුකාලීනව පැවතීමට හේතු වේ. තිබෙන ඉඩකඩ හා දේශගුණික තත්ව අනුව සුදුසු ක්‍රමවේදයක් භාවිතා කර කාබනික පොහොර නිපදවිය හැක. මෙහිදී ගොඩ ක්‍රමය, හා කෝටු රාමු ක්‍රමය යොදාගත හැක. මීට අමතරව ගැඩවිල් දියර පොහොර නිෂ්පාදනය කරගත හැකි නම් එයද වගාවට භාවිතා කළ හැකිය.

- පහසුවෙන් නොදිරන ටින්, යකඩ කැබලි, වීදුරු හා පොලිතීන් ගෙවත්තේ පසට එකතුවීම වැළැක්වීමට බඳුනකට හෝ වලකට එකතු කළ යුතුය.
- අවශ්‍ය ප්‍රමාණයට කාබනික ද්‍රව්‍ය සුලබව ඇත්නම් සහ මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත්ව ඔබ සතුව පවතිනම් ජීව වායු ඒකකයක් ගෙවත්තට ඇතුළත් කළ හැක. එමගින් කාබනික ද්‍රව්‍ය ගෙවත්ත සඳහා ලබා ගැනීමට අමතරව විකල්ප බලශක්ති ප්‍රභවයක් නිවසට ලබා ගැනීමට හැකි වේ.

### පැළ තවාන් ඒකකය

- තිරසර ගෙවත්තක් අඛණ්ඩ වගාවක් ලෙස පවත්වා ගැනීම සඳහා තවාන් ඒකකයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. අඛණ්ඩ ඵලදාවක් ලබා ගැනීමට ගෙවත්ත සැළසුම් කිරීමේදී යම්කිසි බෝගයක් ක්ෂේත්‍රයෙන් ඉවත්වන විටම වෙනත් බෝගයක් සංස්ථාපනය කිරීම සඳහා සැළසුම් කර සුදුසු පැළ නිපදවාගෙන තිබිය යුතු වේ. ජලවහනය හොඳින් සිදුවන, හොඳින් හිරු එළිය වැටෙන, සුදුසු ස්ථානයක් තවාන් සඳහා වෙන් කර ගත යුතුය.

### වෙනත් ඒකක

- ගෙවත්තේ පරිසරය තුළ මී මැසි පාලනයට සුදුසු පරිසර තත්ත්ව හා මල්, පරාග සුලභව පවතී නම් ඔබගේ ගෙවත්තට මී මැසි ජනපද සහිත පෙට්ටි තැබීම කළ හැක.
- මෙමගින් පෝෂ්‍යදායි හා ඖෂධීය වටිනාකමක් සහිත මී පැණි ලබා දීමට අමතරව ඒවා අලෙවියෙන් අමතර ආදායමක් ද ලබා ගැනීමට ද හැකිවේ.
- තව ද මී මැස්සන් මගින් පරාගණය සිදු වන බැවින් ගෙවත්තේ අනෙක් බෝගවල අස්වැන්නේ ද වැඩිවීමක් ඇති කරයි.



# 02 ගෙවතු සැළසුම්කරණය සහ නිර්මාණය

ගෙවත්ත නිවැරදිව සැළසුම් කිරීම හා එය නිසි ලෙස නිර්මාණය කර පවත්වාගෙන යාම ගෙවත්තේ දීර්ඝ කාලීන පැවැත්මට වගේම ගෙවත්තේ පෝෂණීය හා ආර්ථික වාසි ලබා ගැනීමටත් ගෙවත්තට අලංකාරයක් ලබා දීම සඳහාත් වැදගත් වේ.

දැනට පවත්වා ගෙන යනු ලබන ගෙවත්තක් සැළසුම්කරණයේ දී පවතින බෝග හා අනෙකුත් සම්පත්වලට හානියක් නොවන පරිදි ගෙවත්ත සැළසුම් කිරීමට කටයුතු කළ යුතුවේ. ඔබ අලුතින්ම ගෙවත්තක් සැළසුම් කර පවත්වාගෙන යාමට අදහස් කරනවා නම් අලුත් සැළසුමකට අනුව ගෙවත්ත නිර්මාණය කරන්න.

පවතින ගෙවත්තක් අලුතෙන් සැළසුම් කර නිර්මාණය කිරීමේ දී මෙන්ම අලුතෙන්ම ගෙවත්තක් සැළසුම් කර නිර්මාණය කිරීමේදීත් සැළකිය යුතු කරුණු ගණනාවක් පිළිබඳව ඔබගේ අවධානය යොමු කරමින් කටයුතු කිරීම අවශ්‍ය වෙනවා. මෙහිදී ඔබේ දැක්ම, රුචිකත්වය, නිර්මාණශීලි හැකියාව, සිතන ආකාරය, කෘෂිකාර්මික දැනුම වගේම විද්‍යාත්මකව ඔබ බලන ආකාරය අනුව ගෙවත්ත සාර්ථකව සැළසුම් කර නිර්මාණ කර ගත හැකියි.

ගෙවත්ත පිළිබඳවත් එහි අලංකරණය පිළිබඳවත් සිතන විට පළමුව අපට සිහිපත් වනුයේ මල් හා විසිතුරු පැළ යොදවා ගැනීම පමණි. එහෙත් ගෙවත්තේ මල් හා විසිතුරු පැළ වෙනුවට විකල්ප බෝග ලෙස විවිධ වර්ගයන්ගෙන් හා විවිධ වර්ණයන්ගෙන් යුතු ආහාර බෝග වගාකළ හැකිවේ. මෙලෙසින් අප එදිනෙදා පරිභෝජනයට ගන්නා ආහාර බෝග යොදා ගනිමින් ගෙවත්ත සැළසුම් කර නිර්මාණය කර ගැනීම, **"ආහාර බෝග මගින් ගෙවතු භූමි අලංකරණය"**, ලෙස හඳුන්වයි.

ආහාර බෝග මගින් ගෙවතු භූමි අලංකරණය කිරීමට විවිධ බෝග කාණ්ඩ යොදා ගත හැකියි. ඒ සඳහා අර්ධ වාර්ෂික, වාර්ෂික මෙන්ම බහු වාර්ෂික බෝග බාණ්ඩ යොදා ගත හැකියි. උදා: එළවලු, පලතුරු, පලා වර්ග, වර්ණ පත්‍රික ශාක ආදිය

ආහාර බෝග යොදා ගනිමින් ගෙවත්ත සැළසුම් කර නිර්මාණය කර ගැනීමේ දී නවීන තාක්ෂණික වගා ක්‍රම සමග පාරම්පරික වගා ක්‍රම ද ගෙවතු භූමි අලංකරණ ක්‍රමවේදයන් සමග සංකලනය කරන්න.

සෞන්දර්යාත්මකව සහ නිර්මාණාත්මක සංකල්පනාවන් ද එකතු කරමින් පවුලේ රුචිකත්වයට ගැළපෙන පරිදි පරිභෝජනය කරන ආහාර බෝග යොදා ගනිමින් ගෙවත්ත නිර්මාණය කරන්න.

## 2.1 ආහාර බෝග මඟින් ගෙවතු භූමි අලංකරණය සැළසුම් කිරීම

- භූමි අලංකරණ ක්‍රමවේදයන් යොදා ගනිමින් ඔබේ ගෙවත්ත අලංකාරව මෙන්ම ඵලදායීව පවත්වාගෙන යෑම සඳහා සැළසුම් කිරීමේ දී පහත සඳහන් අදියර ඔස්සේ සිදු කළ යුතුයි.

**පළවන අදියර**

- ගෙවත්තේ වටපිටාව හොඳින් නිරීක්ෂණය කිරීම සහ තොරතුරු රැස් කිරීම.

**දෙවන අදියර**

- ගෙවත්තේ බෝග වගාවට බලපාන භූමි සාධක හඳුනා ගැනීම.

**තුන්වන අදියර**

- ගෙවත්ත සැළසුම් කිරීමට යොදා ගන්නා භූමි අලංකරණ ක්‍රමවේද/සිද්ධාන්ත තීරණය කිරීම.

**හතරවන අදියර**

- සුදුසු භූමි අලංකරණ ක්‍රමවේද/සිද්ධාන්ත යොදා ගනිමින් ගෙවතු සැළැස්මක් සකස් කර ගැනීම.

**පළමුවන අදියර - ගෙවත්තේ වටපිටාව හොඳින් නිරීක්ෂණය කිරීම සහ තොරතුරු රැස් කිරීම**

- ආහාර බෝග මඟින් ගෙවතු භූමි අලංකරණයේ දී ගෙවත්තේ වටපිටාව ගැන හොඳින් නිරීක්ෂණය කිරීම අවශ්‍ය වේ. එමඟින් ගෙවත්තේ දැනට පවතින සම්පත් මෙන්ම එහි පවතින විභවයන් පිළිබඳව මූලික අදහසක් ලබා ගැනීමට හැකිවීම නිසා ගෙවතු සැළසුම්කරණ කටයුතු වඩාත් පහසු වේ.
- තව ද මෙමඟින් අඩු වියදමකින් හා අඩු ශ්‍රමයක් යටතේ ගෙවත්ත පිහිටුවීමට ඔබට හැකි වන අතර ගෙවත්ත පිහිටුවීමෙන් ඔබගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට ද මහත් පිටුවහලක් වනු ඇත.
- එබැවින් ගෙවත්ත සැළසුම් කිරීමට පෙර ගෙවතු භූමිය හොඳින් නිරීක්ෂණය කරන්න.
- ගෙවත්තේ වටපිටාව හොඳින් නිරීක්ෂණය කිරීමේ දී ගෙවත්තේ පිහිටි සෑම ස්ථානයක්ම හොඳින් විපරම් කරන්න. විවිධ කෝණ ඔස්සේ ඇස් මට්ටමින් මෙන්ම පොළොව මට්ටමින් ද නිරීක්ෂණය කිරීම ඉතා වැදගත් වේ. ඒ අනුව ගෙවත්ත සැළසුම් කිරීමේ දී පවතින සම්පත් සහ විභවයන් පිළිබඳව ඉතා හොඳ අවබෝධයක් ඔබට ලබා ගත හැක.



*වටපිටාව හොඳින් නිරීක්ෂණය කිරීම*

- මෙලෙස නිරීක්ෂණය කිරීමේ දී පහත සඳහන් කරුණු පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා ගැනීම ගෙවත්ත සැළසුම් කිරීමට ඉතා වැදගත් වේ.

- ගෙවත්තේ වැට මායිම හා වැටේ ස්වභාවය (කම්බි වැටක් ද, ජීව වැටක් ද, චේන් ලින්ක් යොදා ඇති වැටක්, තාප්පයක් ද යන්න)
- ගෙමිදුල හා ගෙවත්තේ පිටුපස කොටසේ පවතින තත්ත්වය
- සත්ත්ව පාලන ඒකකය, ගබඩා කාමරය හා වැසිකිළිය වැනි ස්ථිර ඒකක පිළිබඳව ද ඒවායේ පිවිසුම් මාර්ගයන් පිළිබඳව
- ළිඳ, ජල සැපයුම් ආකාරය, ජල නල පද්ධති එලා ඇති ආකාරය, ජලය ගලායන ස්වභාවය, වර්ෂාවකට පසුව ජලය රැඳෙන ආකාරය
- පාංශු ඛාදනය, පාංශු හා ජල සංරක්ෂණ ක්‍රමවල අවශ්‍යතාවය පිළිබඳව
- දැනට පවතින ස්ථිර බෝග හා ඒවා වගා කර ඇති ස්ථාන
- ගෙවත්තේ අපද්‍රව්‍ය එකතු කරන ක්‍රමය හා එකතු කර ඇති ස්ථාන
- විදුලි රැහැන් ගෙවත්ත තුළ ඇද ඇති ආකාරය

● මේ සෑම ස්ථානයක්ම ගෙවත්තේ අලංකරණය සඳහා වගේම පාරිභෝජනය සඳහා බෝග වැවීමට යොදා ගැනීමේ දී අදාළ වන තීරණ ගැනීමට වැදගත් වන්නා වූ ස්ථාන වේ.

**දෙවන අදියර - ගෙවත්තේ බෝග වගාවට බලපාන භූමි සාධක හඳුනා ගැනීම**

● ගෙවත්ත සැළසුම් කිරීමේ දී ගෙවත්තේ භූමි ලක්ෂණ, ජලය බැස යන ආකාරය, පසේ ස්වභාවය, ගෙවත්තට සුළං හමන දිශාව, හිරු නැගෙන හා බහින දිශාව, ගෙවත්තේ ජලය රැඳෙන ස්ථාන වගේම ගල් පර වැනි ස්ථාන පිළිබඳව හොඳ අවබෝධයක් තිබිය යුතුයි. එසේම පසේ ස්වභාවය හා එහි පැතිරීම ගැනත් අවධානය යොමු කළ යුතුයි.

● ගෙවත්තේ භූ ලක්ෂණ සැළකීමේ දී භූමියේ පිහිටීම, උස වගේම ස්වභාවය ගැන අවධානය යොමු කළ යුතුයි. උදා: මුඩු බිමක් ද වගා කරපු බිමක් ද, අතහැර දාපු බිමක් ද, බෑවුම් සහිත බිමක් ද වගාවන් පවතින බිමක් ද යන්න.

● පසේ ස්වභාවය සැළකීමේ දී ; ගෙවත්තේ ස්ථාන අනුව පසේ ගැඹුර, පසේ ව්‍යුහය සහ වයනය (පස වැලි ද මැටි ද ලෝම පසක් ද යන්න), පසේ ආම්ලික භාෂ්මික ස්වභාවය වැනි ලක්ෂණ සම්බන්ධයෙන් ද අවබෝධයක් ලබා ගැනීම ගෙවත්ත සඳහා සැළසුමක් සකස් කිරීමේ දී ඉතා ප්‍රයෝජනවත් වේ.

● ගෙවත්තේ ජලය බැසයන ආකාරය නිරීක්ෂණය ද ඉතා වැදගත් වේ. සාමාන්‍යයෙන් භූමියක ස්වාභාවිකව ජලය බැස යන ආකාරය ගැන දැනුවත් වීම ගෙවතු සැළසුමක් සැකසිමේ දී හා නිර්මාණය කිරීමේ දී ඉතා වැදගත් වේ.

● ගෙවත්තේ යම් යම් ස්ථානයන් පාංශු ඛාදනයට ලක්වී ඇති බව පෙනී යන්නේ නම්, ඒ අනුව පිහිටි භූමියේ බෑවුම දිගේ පස සෝදා නොයන ලෙස ගෙවත්තේ අතිරික්ත ජලය බැස යන පරිදි කටයුතු කිරීම වැදගත් වේ. මෙවැනි තත්ත්වයක් පවතින ගෙවතු බිම් සඳහා මනා පාංශු සංරක්ෂණ ක්‍රමවේදයන් සඳහා සැළසුම් සකස් කළ යුතුයි.

● ගෙවත්තේ බෝග වගාවට බලපාන භූමි සාධක හඳුනා ගැනීමේ දී පාංශු තත්ත්වය සම්බන්ධයෙන් ද අවධානය යොමු කළ යුතුයි.

- ඒ අනුව පහසුවෙන් ජලය බැස යාමේ හැකියාව ද පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව ද, ඉතා වැදගත් වේ. එනම්, ජලසම්පාදනය සිදු කිරීමේ දී යොදා ගත යුතු කාලාන්තරය තීරණය කිරීමට මෙම කරුණු වැදගත් වේ.
- වසරේ යම් කාලයක් සඳහා ගෙවත්තේ ජල හිඟවීමක් (නියං තත්ත්වයක්) ඇති වන්නේ නම් ඒ අනුව විවිධ ජල සංරක්ෂණ ක්‍රම ද යොදාගත යුතු බව අවබෝධ කරගෙන සැළසුම සකස් කර ගැනීම සිදු කළ යුතුයි.
- ආහාර බෝග මඟින් ගෙවතු භූමි අලංකරණය සඳහා ගෙවත්ත සැළසුම් කිරීම නිවස මූලික කර ගනිමින් සිදුවන බැවින් නිවසේ පිහිටීම හා එහි ස්වභාවයට ගැලපෙන ආකාරයට ගෙවතු සැළසුම සකස් කර ගත යුතුය. නිවසට අමතරව ගෙවත්තේ පවතින ස්ථිර ව්‍යුහයන් හා ඒවා පවතින ස්ථාන පිළිබඳව ද සැළකිලිමත් වීම සැළසුම්කරණයේ දී වැදගත් වේ.
- ගෙවත්තට සුළං හමන දිශාව, හිරු නැගෙන දිශාව, හිරුබසින දිශාව, ගෙවත්තේ ජලය රැඳුනු ස්ථාන තිබේ නම් එම ස්ථානයන් ද ගල්පර වැනි ස්ථාන තිබේනම් එම ස්ථානයන් ගැන ද ගෙවත්ත සැළසුම් කිරීමේ දී අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.
- ජලය රැඳුනු වගුරු බිම්, ගල්කුළු සහ ගල්තලා වැනි ස්ථාන ගෙවත්තේ පවතී නම් ගෙවතු සැළසුම්කරණයේ දී එම ස්ථාන හඳුනාගනිමින් එවැනි ස්ථාන සඳහා සුදුසු පරිදි නිර්මාණශීලීව සැළැස්මක් සකස් කළ යුතුය. මෙවැනි ස්ථාන වගාවට සුදුසු පරිදි වගේම අලංකරණයක් ලැබෙන පරිදි සකසා ගැනීම මඟින් එම ස්ථාන ඔබේ ගෙවත්තේ ඇති සුන්දරම ස්ථානයන් බවට පත් කර ගත හැකියි.

**තුන්වන අදියර - ගෙවත්ත සැළසුම් කිරීම සඳහා යොදා ගන්නා භූමි අලංකරණ සිද්ධාන්ත තීරණය කිරීම**

- භූමි අලංකරණයේ දී ප්‍රධාන භූමි අලංකරණ සිද්ධාන්ත දෙකක් යොදා ගනී.

  1. විධිමත් භූමි අලංකරණ සිද්ධාන්ත
  2. අවිධිමත් භූමි අලංකරණ සිද්ධාන්ත

මේ සිද්ධාන්ත දෙක අතරින් ගෙවතු භූමි අලංකරණ කටයුතු සඳහා බහුල ලෙස යොදා ගනු ලබන්නේ අවිධිමත් භූමි අලංකරණ සිද්ධාන්තයයි.

1. *විධිමත් ගෙවතු භූමි අලංකරණ සිද්ධාන්ත*

- විධිමත් භූමි අලංකරණ සිද්ධාන්ත යොදා ගනිමින් භූමි අලංකරණ කටයුතු සිදු කිරීමේ දී නියමිත රටාවකට භූමිය සැළසුම් කරයි. මෙම ක්‍රමවේදයට අනුව සිදු කරමින් භූමි අලංකරණය සිදු කිරීමේදී ඒ සඳහා යොදා ගන්නා භූමිය සමාන කොටස් දෙකකට බෙදා සමාන භූමි අලංකරණ ක්‍රමවේද අනුගමනය කරයි. මෙහි දී භූමියේ වම් සහ දකුණු ඉඩම් කොටස් සඳහා යොදා ගන්නා ජීවී සහ අජීවී ද්‍රව්‍ය හැඩයෙන්, ප්‍රමාණයෙන් හා සංඛ්‍යාවෙන් ද සමාන වන අතර යොදා ගන්නා භූ හැඩතල ද ප්‍රමාණයෙන් සහ ස්වභාවයෙන් එකිනෙක සමාන වේ.
- විධිමත් භූමි අලංකරණ සිද්ධාන්ත ප්‍රධාන වශයෙන්ම යොදා ගනු ලබන්නේ විශාල ඉඩම් සහිත භූමි සඳහා වන බැවින් ගෙවත්තක් වැනි කුඩා ක්ෂේත්‍ර අලංකරණයේ දී මෙම භූමි අලංකරණ සිද්ධාන්තය බහුල ලෙස යොදා

නොගනී. උදා : උද්‍යාන අලංකරණ, විශාල හෝටල් බිම් අලංකරණය



විධිමත්ව භූමි අලංකරණය කළ අවස්ථාවක්

2. අවිධිමත් ගෙවතු භූමි අලංකරණ සිද්ධාන්ත

ආහර බෝග මගින් ගෙවතු භූමි අලංකරණය සඳහා සැළසුම් කිරීමේ දී අවිධිමත් භූමි අලංකරණ සිද්ධාන්තයන් බහුලව භාවිතා කරයි. අවිධිමත් භූමි අලංකරණ සිද්ධාන්තයන්ට අනුව ගෙවත්තක් සැළසුම් කිරීමේ දී නියමිත රටාවකට භූමිය සැළසුම් නොකරයි. විවිධ රටාවන් ඔස්සේ අක්‍රමවත් ලෙස, විවිධ හැඩතල සහිත පාත්ති, විවිධ ජීවී සහ අජීවී ව්‍යුහයන්/ඒකක භාවිතා කරමින් ගෙවත්තට අලංකරණයක් ලැබෙන පරිදි බෝග පිහිටුවීමට හැකිවන ලෙසින් ගෙවත්ත සැළසුම් කර ගැනීම සිදු කරයි.

ඉහත භූමි අලංකරණ සිද්ධාන්තයන් භාවිතා කිරීමේ දී ඒ සඳහා යොදා ගන්නා ජීවී සහ අජීවී ඒකකයන්/ද්‍රව්‍ය අනුව භූමි අලංකරණ ක්‍රමවේද ආකාර 3 කින් දැක්විය හැක.

### I. මෘදු භූමි අලංකරණය

මෘදු භූමි අලංකරණයේ දී ප්‍රධාන වශයෙන්ම භූමි අලංකරණ කටයුතු සඳහා යොදා ගන්නේ සජීවී ද්‍රව්‍යයන් වේ. උදා: විවිධ වර්ණයන්ගෙන් යුතු පැළෑටි, ශාක වර්ග හා ආහාර බෝග වර්ග

විශේෂයෙන්ම මෘදු භූමි අලංකරණය ආහාර බෝග යොදා ගනිමින් සිදු කරනු ලබන භූමි අලංකරණ කටයුතු සඳහා බහුල වශයෙන් යොදා ගනියි. උදා : ගෙවතු භූමි අලංකරණය, කාර්යාල භූමි අලංකරණය

### II. දෘඪ භූමි අලංකරණය

දෘඪ භූමි අලංකරණයේ දී ප්‍රමුඛත්වයක් ලබා දෙන්නේ අජීවී ද්‍රව්‍යය මෙන්ම දෘඪ ද්‍රව්‍ය යොදා ගනිමින් භූමි අලංකරණ කටයුතු කිරීම සඳහායි. විශේෂයෙන්ම සිමෙන්ති ආශ්‍රිත නිමැවුම් මෙන්ම අනෙකුත් දෘඪ ද්‍රව්‍යය යොදා ගනිමින් නිර්මාණය කරන අජීවී ව්‍යුහයන් ද මේ සඳහා බහුලව යොදා ගනියි. උදා :- උද්‍යාන පොකුණු, විවිධ හැඩැති පැළෑටි, විවිධ සත්ත්ව රූප, ප්‍රතිමා, දිය ඇළි, බෝග ආරුක්කු ආදිය

### III. විවිධ තේමා අනුව ගෙවතු භූමි අලංකරණය

විවිධ තේමාවල් ඔස්සේ භූමිය අලංකරණය කිරීම මෙම භූමි අලංකරණ කටයුතුවලදී සිදු කරයි. මෙහි දී විශේෂයෙන් මෘදු භූමි අලංකරණය මෙන්ම දෘඪ භූමි අලංකරණ ක්‍රමවේදය යන්නෙහි සම්මිශ්‍රණයක් යොදා ගනී. උදා :- දේශීය පළතුරු උයන, රනිල බෝග කොටස, අල බෝග උද්‍යානය, ගිරි දුර්ග කලාපය

විශේෂයෙන්ම අවිධිමත් භූමි අලංකරණ සිද්ධාන්තයන් යොදා ගැනීමේ දී ඉහත භූමි අලංකරණ ක්‍රමවේද ත්‍රිත්වයම එකිනෙක සංකලනය කරමින් පරිපූර්ණ භූමි අලංකරණ සැළැස්මක් සකස් කර ගැනීමට ද ඔබට හැකියාව ඇත.

## 2.2 ගෙවතු සැළසුමක් සකස් කර ගැනීම

- ආහාර බෝග මගින් භූමි අලංකරණය කර ගැනීමේ දී විධිමත් ගෙවතු සැළැස්මක් පළමුව සකස් කරගත යුතු අතර ඒ සඳහා පියවර කිහිපයක් අනුගමනය කළ යුතුයි.
- එම ක්‍රියාවලියේ සමස්ථ ප්‍රතිඵලය ලෙසින් භූමි අලංකරණ සිද්ධාන්ත මැනවින් යොදාගත් ගෙවතු සැළැස්මක් නිර්මාණය කර ගැනීමට ඔබට හැකිවනු ඇත. එලෙස සැළසුම් කර ගන්නා ගෙවත්ත සඳහා භූමි අලංකරණ සිද්ධාන්තයන් මැනවින් යොදා ගත හැකි අතරම ඔබ සතු සම්පත් වඩාත් කාර්‍යක්ෂමව භාවිතා වීම තහවුරු කරයි. එසේම ගෙවත්තේ තිරසර බව ද ඉහළ නංවයි.
- මේ සඳහා ප්‍රධාන සැළසුම් කිරීමේ ක්‍රම 03ක් භාවිතා කළ හැකි අතර ආහාර බෝග යොදා ගනිමින් සංවර්ධනය කරනු ලබන ගෙවත්තක් සඳහා මෙම සැළසුම් භාවිතා කරමින් ගෙවත්ත නිර්මාණය කර ගත හැක.

**සැළසුමක් සකස් කර ගැනීමේ ක්‍රම**

**01 ක්‍රමය**

- පරිමාණයකට අනුව ගෙවත්තේ සැළැස්ම ඇඳ ගැනීම.

**02 ක්‍රමය**

- ගෙවත්ත ඡායාරූප ගත කර ෆොටෝ කොපි කඩදාසියකට පිටපත් කර ගෙවත්තේ සැළැස්ම ඇඳ ගැනීම.

**03 ක්‍රමය**

- ගෙවත්ත ඡායාරූප ගත කිරීම හා පරිගණක ආශ්‍රයෙන් ගෙවතු සැළැස්මක් සකස් කර ගැනීම.

***සැළසුමක් සකස් කර ගැනීමේ 01 ක්‍රමය :***

***පරිමාණයකට අනුව ගෙවතු සැළැස්මක් ඇඳ ගැනීම***

- මෙහි දී පරිමාණයකට අනුව ගෙවත්තේ ඇති දෑ (වැට මායිම්, නිවස හා ස්ථිර ව්‍යුහයන්) කොටු කඩදාසියක හෝ ප්‍රස්ථාර කොළයක සළකුණු කිරීම හා සුදුසු භූමි අලංකරණ සිද්ධාන්ත ඇතුළත් කරමින් සම්පූර්ණ සැළැස්ම ඇඳ ගැනීම සිදු කරයි.
- මේ සඳහා පහත සඳහන් ද්‍රව්‍ය භාවිතා කළ හැකියි.
  - A 4 ප්‍රමාණයේ කඩදාසියක්, කොටු කොළයක් හෝ ප්‍රස්ථාර කඩදාසියක්
  - පෑනක් හෝ පැන්සලක්
  - දිග සලකුණු කළ ලණුවක් හෝ ටේප් පටියක්
- පරිමාණයකට අනුව ගෙවතු සැළැස්මක් ඇඳ ගැනීමේ දී ගෙවත්තේ වැට මායිම් පළමුව සලකුණු කරගනිමින් ඉන්පසු නිවස සහ ගෙවත්ත තුළ ඇති ස්ථිර ව්‍යුහ පරිමාණයකට සලකුණු කිරීම කළ හැක.
- පරිමාණයට අනුව ගෙවතු සැළසුමක් ඇඳ ගැනීමේ දී පහත පියවරයන් අනුගමනය කළ යුතුයි.

*පියවර 01*

ගෙවත්තේ (ඉඩමේ) පිහිටීම අනුව උතුරු දිශාව නිශ්චය කර ගන්න. ඔබ ළඟ ඇති A4 ප්‍රමාණයේ කඩදාසියේ දකුණු පසට වන්නට ඊතලයක් මගින් උතුරු දිශාව සටහන් කරගන්න. (රූපය 1)




රූපය 1

## පියවර 02

ඉන්පසු ඉඩමේ පිහිටීම හෝ හැඩයට අනුකූලව වැට මායිම්වල පිහිටීම කොළයේ කෙළවරට වන්නට සලකුණු කරන්න. ඔබේ ගෙවත්තේ පිහිටීම හතරැස් හෝ ඊට වෙනස් ආකාරයක් ගත හැක. (රූපය 2)




රූපය 2

## පියවර 03

හඳුනාගත් වැට මායිම් ලක්ෂයන් එකිනෙක යා කරමින් ඉඩමේ හෝ ගෙවත්තේ හැඩය හඳුනාගන්න. ඉන්පසු දිග සළකුණු කළ ලණුව හෝ ටේප් පටිය ගෙන සළකුණු කළ වැට මායිම්වල දුර මැන ගෙන සටහන් කර ගන්න (මීටර් හෝ අඩි ලෙස). (රූපය 3)




රූපය 3

## පියවර 04

ඉඩමේ කොන්වල සිට නිවසේ හතර කොන්වලට ඇති දුර සළකුණු කරන්න. ඉන්පසු නිවසේ මධ්‍යයට (මැදට) වැට මායිම්වල සිට දුර සලකුණු කර ගන්න. (බිත්තියේ මැද සිට වැට මායිමට ඇති දුර මැනීමේ දී $90^0$ කෝණයක් සිටින සේ දුර මැන ගැනීමෙන් නිවැරදි පරිමාණයට අදාල සැළැස්ම ඇද ගත හැකියි) (රූපය 4)




රූපය 4

## පියවර 05

වැට මායිම්වල සිට දුර මැන සළකුණු කළ නිවසේ හතර කොන් සහ නිවසේ මධ්‍ය ලක්ෂ්‍යයන් යා කරමින් නිවසේ පිහිටීම සළකුණු කර ගන්න. ඉන්පසු දිග සළකුණු කළ ලණුව හෝ ටේප් පටිය ගෙන සළකුණු කළ නිවසේ ලක්ෂ්‍යන්ට ඇති දුර මැනගෙන සටහන් කර ගන්න. (මීටර් හෝ අඩි ලෙස) (රූපය 5 සහ 6)




රූපය 5




රූපය 6

*පියවර 06*

මෙලෙස ගෙවතු බිමේ පවතින වෙනත් ස්ථිර ව්‍යුහයන් බෝග කලාපයන් සහ අනෙකුත් ස්ථිර ව්‍යුහයන් ඇතුළත් කිරීම සිදුකළ යුතුයි. ඒ සඳහා ඉඩමේ මායිම හා නිවාසය A4 කඩදාසිය මත ඇඳ ගැනීම කළ පසු ඉඩමේ පවතින වෙනත් ස්ථිර ව්‍යුහයන් හා ස්ථානයන් හඳුනාගෙන නිවසේ සිට අදාල ස්ථානවලට ඇති දුරවල් සළකුණු කරගන්න. උදා - වැසිකිළිය, දර මඩුව, ගව මඩුව, ළිඳ, වැට හා ස්ථාවර බෝග පවතින ස්ථාන, ගල් කුළු වැනි දෑ පිහිටි ස්ථාන, ජල ප්‍රභවයන් හා විදුලි රැහැන් කණු වැනි ස්ථාන වගේම නිවසට සුවිශේෂී වන ස්ථාන, උදා: නිවසේ පිටුපස දොරටුව, ප්‍රධාන පිවිසුම. (රූපය 7)

මෙම දුරවල් මැනීමේ දී නිවසේ සිට එම ස්ථානයන්ට ඇති දුර $90^0$ කෝණයක් සිටින සේ මැන ගැනීමෙන් නිවැරදි දුර ප්‍රමාණයන් ලබා ගත හැකි අතර ඉතාමත් නිවැරදි පරිමාණයකට අනුව ගෙවතු සැළසුම සකස් කර ගැනීමේ හැකියාව ඔබට ලැබෙනු ඇත.

සැ.යු: එසේම ඉහත ක්‍රමය වෙනුවට පළමුව නිවසේ දළ පිහිටීම සළකුණු කිරීමෙන් පසුව නිවසේ සිට වැට මායිම සඳහා දුර සළකුණු කිරීම ද ඉන් පසුව ගෙවත්ත තුළ ඇති ස්ථිර ව්‍යුහයන් හඳුනා ගෙන සලකුණු කිරීමේ ක්‍රමවේදය ද ඔබට අනුගමනය කළ හැක.




රූපය 7

**ලබාගත් දුර ප්‍රමාණයන් කොටු කොළයේ/ප්‍රස්ථාර කොළයේ පරිමාණයට සටහන් කර ගැනීම**

1. කඩදාසියේ සටහන් කර ගත් දළ සැළැස්මට අනුව නිවස, වැට සීමා හා අනෙකුත් ස්ථිර ව්‍යුහයන්ට ඇති දුරවල් නියමිත පරිමාණයට සළකුණු කිරීම සඳහා කොටු කඩදාසිය හෝ ප්‍රස්ථාර කොළය භාවිතා කරන්න (පෙර ලෙසට උතුරු දිශාව සටහන් කරන්න).




රූපය 08

2. පරිමාණයකට සළකුණු කිරීමේ දී කොටු කඩදාසියේ හෝ ප්‍රස්ථාර කොළයේ ලොකු කොටු 01ක්, මැනගත් දුර ප්‍රමාණයන්හි අඩි හෝ මීටර ලෙස සළකුණු කර ගන්න.

3. මෙලෙස සළකුණු කර ගැනීමේ දී සැළැස්ම ඇඳ ගැනීම සඳහා ඔබට පහසු යැයි හැඟෙන දුර ප්‍රමාණයක් ලොකු කොටු 1ක් ලෙස සළකමින් භාවිතා කළ හැක.

   උදා: - පරිමාණය - ලොකු කොටු 01ක් සමානයි අඩි 15/20ක් හෝ ඊට වැඩි

4. ඉන්පසු ප්‍රස්ථාර කොළයේ/කොටු කඩදාසිය තුළ සළකුණු කිරීමට නියමිත සියලුම දුරවල් පරිමාණයකට අනුව ඉහත සඳහන් කළ පරිමාණය භාවිතා කරමින් සටහන් කරන්න.

   උදා : වැට මායිම් දුරවල්, නිවසේ දිග පළල, නිවසේ සිට වැසිකිළියට, ගව මඩුවට, දර මුඩුවට, ස්ථිර බෝග කොටස් සහිත ස්ථානයන්ට දුර ආදී වශයෙන් (රූපය 9).

- මෙලෙස පරිමාණයට සකස් කරගත් ගෙවතු සැළසුම සඳහා ඔබගේ රුචිකත්වය අනුව තෝරාගත් ආහාර බෝග වගා කිරීම සඳහා සුදුසු ප්‍රදේශයන් තෝරා ගනිමින් (පෙර ගෙවතු නිරීක්ෂණ මත පදනම්ව) ඒ සඳහා වූ විවිධ හැඩැති පාත්ති ගෙවතු වගා සැළැස්මට ඇතුළත් කරන්න. (රූපය 10).




රූපය 9




| | | |
|---|---|---|
| **01 කව්පි** | **06 සාරණ** | **11 මඤ්ඤොක්කා** |
| **02 කෝලියාස්** | **07 බඩඉරිඟු** | **12 වම්බටු වගාව** |
| **03 බඳුන් පලතුරු** | **08 මෑ** | **13 ලූනු වගාව** |
| **04 නිවිති** | **09 කොළ එළවලු** | **14 ගම්මිරිස්** |
| **05 මල් වගාව** | **10 වගා කුළුණ** | **15 මැහි බෝග** |

රූපය 10

- පරිමාණයට අනුව ගෙවතු සැළසුමක් ඇඳ ගැනීමේ ක්‍රමවේදය ඔබේ ගෙවත්ත නිර්මාණය කර ගැනීම සඳහා වූ පූර්ව සැළසුම් ක්‍රමවේදයක් වේ.
- මේ සඳහා විවිධ හැඩතල සහිත හතරැස්, රවුම්, අර්ධ කවාකාර, තරු හැඩති, හදවත් හැඩති වගේම විවිධ ජ්‍යාමිතික හැඩය ඇති

පාත්ති වර්ග සැළසුම් කර ගත හැකිය. එලෙස හැඩතල නිර්මාණය කර ගත් පාත්ති තුළ භූමි අලංකරණයක් ලැබෙන පරිදි ආහාර බෝග ස්ථාන ගත කළ හැක. (නව ගෙවතු සඳහා මෙන්ම පැරණි ගෙවතු සඳහා ද මෙම සැළසුම් ක්‍රමවේදයන් අනුගමනය කළ හැක)

- මේ අනුව ඔබේ ගෙවත්තට ආහාර බෝග මඟින් භූමි අලංකරණය සඳහා පරිමාණයට සකස් කළ දර්ශනීය ගෙවතු සැළැස්මක් ඔබට පහසුවෙන් නිර්මාණය කර ගත හැක.

*සැළසුමක් සකස් කර ගැනීමේ 02 ක්‍රමය*

***ගෙවත්ත ඡායාරූප ගත කර ෆොටෝ කොපි කඩදාසියකට පිටපත් කර ගෙවතු සැළැස්මක් ඇඳ ගැනීම***

- ඔබේ ගෙවත්තට ඉතාමත් පහසුවෙන් මෙන්ම ඉක්මනින් ගෙවතු වගා සැළැස්මක් සකස් කර ගැනීම සඳහා මෙම ක්‍රමවේදය භාවිතා කළ හැක.
- ඔබේ ගෙවත්තේ තියෙන සෑම බිම් අඟලක්ම වගා කටයුතු සඳහා වැදගත් වන බැවින්, ඔබේ ගෙවත්තේ ඇති සෑම ස්ථානයක්ම ආවරණය වන පරිදි ඡායාරූප ගැනීම කළ යුතුයි.
- ගෙවත්ත ඡායාරූපගත කර ගැනීම ඔබගේ ජංගම දුරකථනය මඟින් පවා පහසුවෙන් කර ගත හැකිය.
- ඉන්පසු ලබා ගත් ඡායාරූප ෆොටෝ කොපි කොළයකට පිටපත් කරගන්න. එවිට ඔබට පහත පරිදි ඡායාරූපයක් ලැබේවි. (රූපය 11)



*රූපය 11 - ඡායාරූප ගත කළ නිවසේ ඉදිරි කොටසේ ෆොටෝ කොපි ඡායාරූපය*

- ඉන්පසු එම ඡායාරූප පිටපත් මත නව නිර්මාණ ඒකරාශී කරමින් විවිධ හැඩතලවලින් යුතු වගා පාත්ති වගේම විවිධ භූමි අලංකරණ අංගයන් එකතු කරමින් ගෙවතු සැළැසුම ඇද ගන්න.




**01 දුරන්ත වැට** **05 වගා රාක්ක**
**02 මල් වගාව** **06 කොළ එළවළු**
**03 බඳුන්ගත එළවළු** **07 එළවළු පාත්ති**
**04 මැහි බෝග** **08 එල්ලෙන වගා බඳුන්**

*රූපය 12 - ෆොටෝ කොපි ඡායාරූපය මත ඇඳගත් විවිධ බෝග වගා හැඩතල*

- රූපය 12 දැක්වෙන සැළැස්මට අනුව භූමියට සමාන්තර (තිරස්) අවකාශය මෙන්ම භූමියේ ඉහළ (සිරස්) අවකාශය ද සුදුසු පරිදි යොදා ගනිමින් අදාළ ගෙවතු සැළසුම සකස් කර ඇති බව ඔබට පෙනේවි.

- ලබා ගත් සෑම ජායාරූපයක්ම ඉහත පරිදි විවිධ හැඩතල සහිත පාත්ති හා විවිධ භූමි අලංකරණ අංගයන් එකතු කරමින් ඔබගේ රුචිකත්වයට අනුව සම්පූර්ණ ගෙවතු සැළසුම නිර්මාණය කර ගන්න.
- ඔබේ සැළසුම තිරසර ගෙවත්තක් සඳහා මූලික අඩිතාලම වන නිසා පෙර සඳහන් කර ඇති ගෙවතු නිරීක්ෂණ භූමි සාධක හා සුදුසු භූමි අලංකරණ සිද්ධාන්ත මත පිහිටමින් සිදු කළ යුතුයි.

*සැළසුමක් සකස් කර ගැනීමේ 03 ක්‍රමය*

*ගෙවත්ත ජායාරූප ගත කිරීම හා පරිගණක ආශ්‍රයෙන් ගෙවතු සැළැස්මක් සකස් කර ගැනීම*

- ඔබේ ගෙවත්තේ සෑම ස්ථානයක්ම ජායාරූප ගත කර ආහාර බෝග යොදා ගනිමින් සිදු කරනු ලබන භූමි අලංකරණ ක්‍රමවේදයන් ද ඇතුළත් කරමින් පරිගණකය ආශ්‍රයෙන් දර්ශනීය ගෙවතු වගා සැළැස්මක් නිර්මාණය කර ගැනීමේ ක්‍රමයක් ලෙස මෙම ක්‍රමය හැඳින්විය හැක.
- ඔබේ ගෙවත්තේ තියෙන සෑම බිම් අඟලක්ම වගා කටයුතු සඳහා වගේම භූමි අලංකරණ කටයුතු සඳහා ප්‍රයෝජනවත් වේ. එබැවින්, මෙම ක්‍රමයට ගෙවත්ත සැළසුම් කිරීමේ දී, ඔබේ ගෙවත්තේ සෑම බිම් කොටසක්ම ආවරණය වන සේ ජායාරූප ගැනීම සිදු කළ යුතුයි. මෙය ඔබගේ ජංගම දුරකථනය මඟින් පවා ඔබට පහසුවෙන් කර ගත හැකිය.
- ගෙවත්තේ සියලුම දිශා ආවරණය වන පරිදි ගත් ජායාරූප පරිගණකයකට ඇතුල්කර ෆොටෝෂොප් (Photoshop) හෝ ඉලස්ට්‍රේටර් (Illustrator) වැනි පරිගණක මෘදුකාංගයන් භාවිතා කිරීමෙන් ඉතා පහසුවෙන් ඔබගේ ගෙවතු වගා සැළැස්ම නිර්මාණය කර ගත හැකිය.
- මෙම පරිගණක මෘදුකාංගයන් භාවිතා කරමින් විවිධ හැඩතල සහිත බෝග පාත්ති හා විවිධ වගා රටාවන් වගේම මෘදු හා දෘඪ භූමි අලංකරණ ක්‍රමවේදයන් අතුළත් කරමින් නව සැළසුමක් නිර්මාණය කර ගන්න.
- පරිගණකයක් භාවිතා කර අඳිනු ලබන සැළසුම ඉතාමත් සිත්ගන්නා සුළු ලෙස නිර්මාණය කරගත හැකි බැවින් ඔබ විසින් නිර්මාණය කරන සැළැස්ම ප්‍රායෝගිකව ගෙවත්ත තුළ ද නිර්මාණය කළ යුතු බැවින් ඒ ගැන ද සැළකිලිමත් වෙමින් භූමි අලංකරණ නිර්මාණයන් එකතු කිරීමට වග බලා ගත යුතුයි. උදා: සැළසුම සරල වීම, ආර්ථිකව ලාභදායි වීම, පහසුවෙන් ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කළ හැකි වීම
- මෙලෙස නිර්මාණය කර ගනු ලබන ගෙවතු සැළැස්ම ඔබේ ආදායම් තත්ත්වයට ගැළපෙන සැළැස්මක් වගේම ඔබගේ අරමුණු සහ අපේක්ෂාවන් ඉටුකර ගත හැකි සැළැස්මක් විය යුතුය.
- මෙම ක්‍රමය සඳහා පරිගණක දැනුම මෙන් ම කෘෂි තාක්ෂණික දැනුම ද පැවතීම සාර්ථක සැළසුමක් නිර්මාණය සඳහා වැදගත් වේ.



ගෙවත්තේ පෙර සැකසුම

↓



පරිගණක ආශ්‍රයෙන් සැකසූ නව ගෙවතු සැළැස්ම

රූපය 13



ගෙවත්තේ පෙර සැකසුම

↓



පරිගණක ආශ්‍රයෙන් සැකසූ නව ගෙවතු සැළැස්ම

රූපය 14

- මෙම සැළසුම් සැකසීමේ දී නිර්මාණශීලි හා ඵලදායි සැළැස්මක් ලබා ගැනීම සඳහා අප විසින් සිදු කරන ලද ගෙවත්තේ පූර්ව නිරීක්ෂණයන් බෝග සාධක සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම වගේම සුදුසු භූමි අලංකරණ සිද්ධාන්තයන් සම්බන්ධයෙන් දැනුවත් භාවය ද ඇතිව මෙම සැළැස්ම නිර්මාණය කිරීමට කටයුතු කිරීම ඉතාමත් වැදගත් වන බව මතක තබා ගන්න.

**ගෙවත්තට ගැලපෙන බෝග වගා හැඩතල සහිත පාත්ති හඳුනා ගැනීම**

- භූමි අලංකරණ ක්‍රමවේදයන් භාවිතා කරමින් ගෙවතු සැළැස්මක් නිර්මාණයේ දී විවිධ බෝග, විවිධ වගා හැඩතල සහිත පාත්ති භාවිතා කරයි. උදා - හතරැස්, රවුම්, අක්‍රමවත්, අර්ධකවාකාර, තරු ආකාර සහ හදවත් හැඩය වැනි විවිධ හැඩතල. එම නිසා මේ මඟින් ගෙවත්තේ බාහිර පෙනුමට මෙන්ම ගෙවත්තට හඳුන්වා දෙන බෝග සඳහා ද දැකුම්කළු පරිසරයක් නිර්මාණය කරයි.

- ඔබ විසින් පරිමාණයට සළකුණු කර ඇඳගත් ගෙවතු වගා සැළැස්මට ගැළපෙන පරිදි සුදුසු ස්ථානයන් සඳහා විවිධ **"බෝග වගා පාත්ති"** නිර්මාණය කරගන්න. විවිධ ජ්‍යාමිතික හැඩතල සහිත ගෙවතු සැළැස්මක් නිර්මාණය කර ගන්න.

- මෙම ගෙවතු වගා සැළැස්ම ඔබගේ රුචිකත්වයට අනුව සකස් කළ සැළැස්මකි. එහෙත් ඒ තුළට ඇතුළත් කරන බෝග වගා පාත්ති හෙවත් බෝග වගා හැඩතල ඔබගේ රුචිකත්වය අනුව වෙනස් කර ගැනීමේ හැකියාව ඇති අතර මූලික සැළැස්ම යළි යළිත් සංශෝධනය කර ගනිමින් ඔබගේ රුචිකත්වයට වඩාත්ම ගැළපෙන හා ප්‍රායෝගිකව යෙදිය හැකි සුදුසු බෝග වර්ග මෙන්ම ඒ සඳහා ගැළපෙන පාත්ති වර්ග ද (විවිධ හැඩතලයන්) ඇතුළත් කර ගත හැක.



*රූපය 15*



*රූපය 16*



*රූපය 17*



*රූපය 18*

*විවිධ හැඩතල පාත්ති නිර්මාණය කර ගැනීම (රූපය 15,16,17,18)*

- නිර්මාණය කරගත් හැඩතල සහිත පාත්ති තුළ භූමි අලංකරණයක් ලැබෙන පරිදි විවිධ ආහාර බෝග ස්ථාන ගත කළ හැකිය. නව ගෙවතු සඳහා මෙන්ම පැරණි ගෙවතු සඳහා ද මෙම සැළසුම් ක්‍රමවේදය අනුගමනය කළ හැක.

- විවිධ ආහාර බෝග වගා කිරීම සඳහා විවිධ හැඩැති පාත්ති නිර්මාණයේ දී උණ බම්බු, පොල්ලෙලි, උළුකැට, ගඩොල් කැට, ටින්, යෝගට් කෝප්ප සහ පොල් කටු වැනි නිවසින් ඉවතලන ද්‍රව්‍ය භාවිතා කළ හැක. පාත්ති සැකසීම සඳහා මෙවැනි ද්‍රව්‍ය භාවිතා කිරීම මගින් පාත්තියේ හැඩය මනා ලෙස බාහිරට පෙන්වන අතරම පාත්ති සේදී යාම වළක්වයි. එසේම පොල් ලෙලි, ගඩොල්, උළු වැනි ද්‍රව්‍ය පාත්තිය තුළ ජල සංරක්ෂණයට උදව් කරයි.





උණ බම්බු වලින් සැකසූ වගා පාත්ති

- එසේම පාත්තිවල පිටත දාරය සඳහා විවිධ වර්ණවත් මෙන්ම විවිධ හැඩැති පත්‍ර සහිත ශාක වර්ග ද භාවිතා කළ හැක. එය ගෙවත්තට අලංකාරයක් ද එකතු කරයි. උදා:විවිධ වර්ණයෙන් යුතු මුකුණුවැන්න ප්‍රභේද, සලාද වැනි දේත් විවිධ හැඩැති පත්‍ර සහිත ගොටු කොළ

**ගෙවතු භූමි සැළසුම්කරණය සහ නිර්මාණය සඳහා ආහාර බෝග වර්ග තේරීමේ දී සැළකිය යුතු කරුණු**

- ආහාර බෝග මගින් ගෙවතු භූමි අලංකරණයේ දී ගෙවතු වගාව සඳහා බෝග වර්ග තේරීම ඉතා වැදගත් වූ ක්‍රියාවලියකි. මන්ද යත් ගෙවත්තක තිරසරභාවය මෙන්ම ගෙවත්ත පිහිටුවීමේ දී සළකා බැලූ අරමුණු ඉටු කර ගැනීම සඳහා එය වැදගත් වේ. මේ හෙයින් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කර බෝග තේරීම නිවැරදිව සිදු කිරීම ඉතා වැදගත් වූ කාර්‍යයකි.
- ගෙවතු භූමි සැළසුම්කරණයේ දී හා නිර්මාණයේ දී ගෙවත්තට ගැළපෙන බෝග වර්ග තේරීමේ දී ඔබගේ හා පවුලේ සාමාජිකයන්ගේ කැමැත්තට අනුව බෝග වර්ග තෝරා ගන්න. එමගින් ඔබගේ පවුලේ රුචිකත්වය, ආහාර අවශ්‍යතාවය සපුරා ගැනීමට ගෙවත්ත ඉවහල් වනවාට අමතරව ගෙවත්ත තිරසරව පවත්වා ගැනීමට ද හේතුවක් වේ.
- එසේම ආහාර බෝග යොදා ගනිමින් ගෙවත්ත සැළසුම්කර නිර්මාණය කර ගැනීමේ දී ඔබට ඉතාමත් පහසුවෙන් නඩත්තු කළ හැකි බෝග වර්ග තෝරා ගැනීම ඉතා වැදගත් වේ. එමගින් ඔබට ගෙවත්ත සඳහා අමතර වැය බරක් දැරීමට සිදු නොවන අතරම ඔබගේ කාර්‍ය බහුල දෛනික කටයුතු අතරතුර ගෙවත්ත පහසුවෙන් නඩත්තු කර ගැනීමට ද හැකි වීම විශේෂ වාසියකි.
- භූමි අලංකරණ ක්‍රමවේදයන් භාවිතා කරමින් ගෙවත්ත සැලසුම් කර නිර්මාණය කිරීමේ දී ඔබ ප්‍රදේශයට හා දේශගුණික තත්ත්වවලට ගැලපෙන වඩාත් උචිත බෝග වර්ග තෝරා ගැනීම ඉතා අවශ්‍යයි. එය ඔබගේ ගෙවත්තේ තිරසර භාවයට ඉතා වැදගත් වන අතරම රෝග හා පළිබෝධ හානි අවම කර ගැනීමට ද වැදගත් වේ.

- එසේම ගෙවත්තක් සැළසුම් කර නිර්මාණයේ දී රෝග හා පළිබෝධවලට යම්තාක් දුරට ප්‍රතිරෝධී හා ඔරොත්තු දෙන බෝග කාණ්ඩ තෝරා ගැනීම මගින් වස විසෙන් තොර පෝෂණීය එළවළු හා පලතුරු ගෙවත්ත තුළින් ලබා ගැනීමට හැකි වනවා මෙන්ම එය ගෙවත්තේ තිරසර පැවැත්මට ද හේතුවක් වේ. විශේෂයෙන් අපගේ දේශීය බෝග ප්‍රභේද රෝග හා පළිබෝධ හානිවලට ඉතා ඉහළ ප්‍රතිරෝධීතාවයක් දක්වන අතර හැකි සෑම අවස්ථාවකම දේශීය බෝග ප්‍රභේද ද සැළකිය යුතු ප්‍රමාණයක් ගෙවත්තට ඇතුළත් කර ගැනීමට කටයුතු කරන්න. උදා: දඹල, ඇත්දළ බණ්ඩක්කා, ආලංගා, කොච්චි

- ගෙවත්ත නිර්මාණයේ දී එළවළු පේළි සමග මල් පැළ පේළි ද සිටුවා ගත හැක. ඒ මගින් බෝගවල ඒකාකාර පැහැය වෙනස් වී නෙතට ප්‍රිය වූ වර්ණවත් පරිසරයක් ඇති කරයි. එමෙන්ම සමහරක් මල් වර්ග වගා කිරීම මගින් කෘමි පළිබෝධකයින් විකර්ෂනය කරනු ලබන අතර මෙය ඒකාබද්ධ පළිබෝධ පාලනයට හිතකර වේ. උදා: දාස්පෙතියා, සිනියාස්

- ගෙවත්ත සඳහා ඔබ තෝරාගන්නේ එකම වර්ගයේ එළවළු නම් ඒවා එක පේළියට වගා කිරීම තුළින් ද ගෙවත්තට ඉතා ප්‍රියජනක දර්ශනීය බවක් ලැබේ. ඒ වගේම විවිධ ස්ථරයන් ලෙස මිශ්‍රවන ආකාරයට බෝග වගා කිරීම මගින් ද ගෙවත්තේ ආකර්ශනීය බව ඉහළ නංවයි.

- යොදා ගන්නා බෝගයන්හි වර්ණ වෙනස්වීම මෙන්ම උස වෙනස්වීම තුළින් ද ගෙවත්තේ අලංකාරය වැඩි කළ හැක. උදා: කොළ සහ රතු පැහැති නිවිති පාත්තිවල ඉදිරිපසට වැඩි උසට නොවැඩෙන එළවළු සිටුවන්න. පිටුපසට වන්නට වඩා උසට වැවෙන එළවළු වර්ග සිටුවන්න.

- ගෙවත්ත සැළසුම් කර නිර්මාණය කිරීමේ දී ඔබගේ ගෙවත්තේ නිතර වතුර රැඳෙන ස්ථානවලට කෙකටිය, කොහිල, කංකුන් වැනි බෝග වැවීමට සැළසුම් කරන්න. ඒ වගේම ඔබ විසින් නිර්මාණය කළ සැළසුම්වලට අනුව ගෙවත්තේ හඳුනාගත් ස්ථානවලට වඩාත් ගැලපෙන බෝග වර්ග තෝරා ගැනීමට කටයුතු කරන්න.



*ආහාර බෝග භාවිතා කර ගෙවතු අලංකරණය*

**ආහාර බෝග යොදා ගනිමින් ගෙවත්තේ සිදු කළ කළ හැකි විවිධ නිර්මාණ**

- ගෙවතු අලංකරණය සඳහා ආහාර බෝග යොදා ගනිමින් විවිධ නිර්මාණයන් සිදු කළ හැකි අතර එමගින් ගෙවත්තේ අලංකාර බව මෙන්ම ආකර්ශනීය බව ද වැඩි කර ගත හැකිය.

1. බාධක වැට් හෝ ආරක්ෂක වැට්

- ගෙවත්තේ වැට සීමාවට ආසන්නව හෝ වගා ක්ෂේත්‍රයක් ආරක්ෂා කර ගැනීමට අපට සමහර බෝග වර්ග වගා කළ හැකිය. මෙලෙස බෝග වැටියක් ලෙස වගා කිරීම

මඟින් ආරක්ෂක වැටියක් ලෙස හෝ විවිධ සතුන් සඳහා බාධක වැටියක් ලෙස යොදා ගත හැක. (උදා : වැට ආසන්නයෙන් අන්නාසි පැළ පේළි සිටුවීම)



බාධක වැටි යෙදීම

2. *ගෙවත්තේ වැට මායිම් සඳහා බෝග වැටි*

- ගෙවත්තේ වැට විවිධ බෝග ප්‍රභේද යොදා ගනිමින් අලංකාර කර ගත හැකිය. එසේම බෝග වැටියක් ලෙසින් දිගට වගා කිරීමෙන් ආර්ථික වාසියක් මෙන් ම සුන්දරත්වයක් ද ඇති වේ. එසේ ම වැටකින් බලාපොරොත්තු වන ආරක්ෂාව ද ඉටු වේ.

මෙම වැටි ලෙස වැල් බෝග වර්ගයන් ද වැල් සහිත මැල්ලුම් බෝග ද උසට වැවෙන ක්ෂේත්‍ර බෝග වර්ග ද යොදා ගත හැකිය. උදා: දඹල, අවර, අලංගා, අගුණ



වැටට වැල් බෝග ඇතුළත් කිරීම

3. *ඉඩම් කොටස් වෙන් කරන බෝග වැටි*

- ගෙවත්තේ සුන්දරත්වය වැඩි කිරීමට ගෙවත්ත සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි විවිධ හැඩැති පාරවල් ගෙවත්ත තුළ යෙදිය හැක.
- එවැනි පාරවල් දෙපස බෝග වැටි ලෙස සිටුවීමෙන් ගෙවත්ත විවිධ බෝග කලාපවලට බෙදා වෙන් කළ හැකියි. මේ සෑම බෙදා වෙන් කිරීමක දීම බෝග වැටවල් සහිත පාගමන් මාර්ගයන් ගෙවත්ත හරහා වැටෙන බැවින් මෙය ගෙවත්තට අපූර්ව සුන්දරත්වයක් ගෙන එයි.
- ඉඩම් කොටස් වෙන් කිරීම සඳහා වැල් බෝග වර්ග මෙන්ම විවිධ එළවලු බෝග වර්ගයන් ද ක්ෂේත්‍ර බෝග වර්ග ද යොදා ගත හැක. උදා: හාල් මැස්සන් දඹල, බතල වගාව, එළවළු බෝග වැටිය

4. *බහු වාර්ෂික බෝග වැටවල්*

- බහු වාර්ෂික බෝග යොදා ගනිමින් පරිභෝජනයට ගත හැකි ලෙස වැට නිර්මාණය කළ හැක.
- ගෙවත්තේ කෙළවරකට වන්නට බහු වාර්ෂික බෝග (පලතුරු) වැටවල් සිටු වීමෙන් ගෙවත්තට අලංකාරයක් මෙන් ම පරිභෝජනයට එළවලු පලතුරු ලබා ගත හැක. එසේ ම දැව අවශ්‍යතාවය ද සපුරා ගත හැක. උදා :- මුරුංගා, කතුරුමුරුංගා සහ ඌන භාවිත පළතුරු බෝග (නෙල්ලි, වෙරළු, මාදං) වැනි බෝග ද යොදා ගත හැක.
- මෙවැනි බහුවාර්ෂික බෝග ශාක ගෙවත්තේ වැටට යොදා ගැනීමෙන් වැටෙහි ස්ථායිතාවය මෙන්ම විධිමත්භාවය වැඩි කර ගත හැකි

වගේම අලංකාරවත්, ක්‍රමානුකූල බවක් ද ලැබේ. උදා :- මුරුංගා, කතුරුමුරුංගා, ඩ්‍රැගන් ෆෘට්, මසං, වෙරළු, මොර



ඩ්‍රැගන් ෆෘට් වැට මායිම

## 5. ස්ථාන ආවරණය සඳහා ජීවී වැටවල්

- විශේෂයෙන් ගෙවත්තේ ඇති වැසිකිළිය, ගව මඩුව, දර මඩුව, කුණු දමන ස්ථානයන් ආවරණය සඳහා උස බෝග කාණ්ඩයන් හෝ වැල් බෝග කාණ්ඩයන් ස්ථාපනය කළ හැක.
- මේ මගින් අදාළ ස්ථානයන් ආවරණය වන අතරට හරිත පැහැති බෝග වැටක් ලෙස දිස් වේ. උදා :- කරවිල, පතෝල, වැටකොලු, බඩඉරිඟු



ස්ථිර ව්‍යුහවලට ආවරණ වගාවක්

## 6 . බෝග කුටි

- ගෙවත්තේ ඉඩකඩ පවතින ස්ථානයන් සඳහා වැල් බෝග වර්ග යොදා ගනිමින් සෙවන සහිත කුටි නිර්මාණය කර ගත හැකියි.
- මේ සඳහා වැල් දොඩම්, දඹල, ලබු, පුහුල් වැනි වැල් බෝගවලින් හා ඉක්මනින් වැවෙන වඳුරු මෑ වැනි රනිල බෝග ද යොදා ගත හැක.

## 7. වැල් බෝග ආරුක්කු

- විවිධ වැල් බෝග වර්ග විවිධ හැඩති ආරුක්කු යොදා ගනිමින් වගා කිරීමෙන් ගෙවත්තේ අපතේ යන ඉහළ ස්ථරය ඉතාමත් ඵලදායි ලෙසත් කාර්යක්ෂම ලෙසත් වගාව සඳහා යොදා කළ හැකියි.



ආරුක්කු මැස්සක වවන ලද පතෝල වගාවක්

- මේ මගින් නිවසට ඉතා අලංකාරයක් ලැබෙනවා මෙන්ම ගෙඩිවල විවිධ හැඩයන් ඇස පිනවන චමත්කාර දසුනක් මවයි. උදා : ලබු, පුහුල්, කරවිල, පතෝල, වැටකොළු
- වැල් බෝග සඳහා ආරුක්කු විවිධ ආකාරයෙන් හා හැඩයෙන් නිර්මාණය කළ හැකි අතර මෙම ආරුක්කු යකඩ හෝ ලී වලින් මෙන්ම ප්ලාස්ටික් බට ආදිය යොදා ගනිමින් සකස් කළ හැක.





විවිධ ආරුක්කු වගාවන්

*8. වතුර රැඳෙන තැනට වගා පොකුණ*

බෝග මගින් සිදු කරන භූමි අලංකරණ නිර්මාණවලට අමතරව ගෙවත්තේ ජලය එක්රැස් වන ස්ථාන සඳහා ද නිර්මාණශිලිව භූමි අලංකරණ කටයුතු සිදු කරමින් ගෙවත්තට නව පෙනුමක් සහ ජීවයක් ලබා දිය හැකිය.

- ගෙවත්තේ ජලය ඇති ස්ථානවල කුඩා පොකුණු ඉදි කිරීමෙන් ගෙවත්ත තුළ එක් රැස්වන ජලය හොඳින් කළමනාකරණය සඳහා මෙම ස්ථානයන්හි කෘත්‍රිමව පොකුණු හා දිය ඇලි සෑදීමට හැකිය.
- බෝග පාත්ති සමඟ කෘත්‍රිමව සකස් කර ගත හැකි පොකුණු හා දිය ඇලි ඔබේ ගෙවත්තට මනරම් දසුනක් එක් කරයි. එසේම මෙම පොකුණුවල බැම්ම මත එළවළු බෝග වවා වඩාත් ආකර්ෂණීය කර ගත හැකිය.

උදා : රතු නිවිති, කංකුන්, කෙකටිය, කොහිල මගින් අලංකාර වූ පොකුණු

- එම පොකුණු ආශ්‍රිතව දිය සීරාව පවතින ස්ථාන සඳහා ජලයට ප්‍රිය බෝග වර්ග යොදා ගත හැකියි. උදා: කොහිල, කංකුන්

*9. ශෛලමය උද්‍යාන*

- ඔබේ ගෙවත්තේ ඇති බෝග වගා කළ නොහැකි ගිරිහෙල් සහිත කොටසක් තිබේනම් එම කොටස තුළ ද වගා කටයුතු ඇරඹීම සඳහා අවධානය යොමු කරන්න. ඒ සඳහා පහත සඳහන් උපාය මාර්ග යොදා ගත හැක.

  - ගල් අතර ඇති හිඩැස්වල පවතින පස් ස්ථරය තුළ පළා වැනි බෝග වර්ග වගා කළ හැක. එසේම සමහර එළවළු බෝග ද වගා කළ හැක.
  - තව ද ගල් කුළු මත පස් තට්ටුවක් යොදා තරමක් උසකට සැකසීමෙන් ගැඹුරට මුල් නොයන පලා වැනි බෝගයන් ද ඉතා පහසුවෙන් වගා කළ හැක. මෙය ගල් කුළු මත වගාව ලෙස හඳුන්වයි. උදා : ගොටුකොළ, කංකුන්, කෝමාරිකා, මුකුණුවැන්න වගේ ම ගැඹුරු පස් හිඩැස් අතර කතුරුමුරුංගා, පැෂන්, දඹල වැනි බෝග ද ස්ථාපනය කළ හැක.

- මෙවැනි තැන් ඉතා ආකර්ශනීය ස්ථානයක් ලෙස ඔබට සංවර්ධනය කර ගත හැක.එය ඉතාමත් චමත්කාර දසුනක් ඔබේ ගෙවත්තේ අසිරියට එක් කරයි.



# 03 ගෙවත්තට බීජ හා රෝපණ ද්‍රව්‍ය

## 3.1 හැඳින්වීම

- ගෙවත්ත වසර පුරා අඛණ්ඩව පවත්වාගෙන යන හෙයින් විවිධ බෝග වර්ග වරින් වර මාරුවෙන් මාරුවට සිටුවීම කළ යුතු වෙනවා. මේ සඳහා වසර පුරාම බීජ හා රෝපණ ද්‍රව්‍ය අප සතුව තිබීම හෝ මිළදී ගැනීම අවශ්‍ය වෙනවා.
- ගෙවත්තේ සිටුවන විවිධ බෝග සඳහා රෝපණ ද්‍රව්‍ය ආකාර කිහිපයකින් යොදා ගත හැකියි.
    i. බීජ
    ii. වර්ධක කොටස් (අතු හෝ කඳ කැබලි, ධාවක, මුල්, රෛසෝම, කෝම/අල කැබලි, මොරෙයියන්, අතු බැඳීමෙන් හා බද්ධ කිරීමෙන්)
- අපගේ ගෙවත්තේ බෝගවල පැවැත්ම මෙන්ම හොඳ නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා ද මූලික අඩිතාලම වන්නේ භාවිතා කරනු ලබන බීජ හා රෝපණ ද්‍රව්‍ය වල ගුණාත්මක භාවයයි.
- ගෙවත්තේ යම් බෝගයක් ආරම්භ කිරීමේ දී භාවිතා කරනු ලබන බීජ හෝ රෝපණ ද්‍රව්‍ය සෑම විටම නීරෝගී හා කෘමි හානි රහිත බව පිළිබඳව තහවුරුවක් සහිතව ලබා ගැනීම ඉතා අවශ්‍ය වේ.
- අපේ ගෙවත්ත සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය වෙළඳපොලෙන් මිළදී ගැනීමට අමතරව අසල්වැසියන්ගෙන් හෝ හිතවතුන්ගෙන් ඉල්ලා ගැනීම, හුවමාරු කර ගැනීම හෝ ගෙවත්තේ ඇති බෝග වලින් අපටම නිෂ්පාදනය කර ගැනීමට ද හැකියාව තිබෙනවා.
- තමන් විසින්ම නිපදවා ගත් බීජ හා රෝපණ ද්‍රව්‍ය නැවත තම ගෙවත්තට භාවිතා කරනු ලබන්නේ නම් (ස්වයං බීජ නිෂ්පාදනයක් කර ගෙවත්තට භාවිතා කරන්නේ නම්) ඒවා ලබා ගන්නා මව් ශාක නීරෝගී හා කෘමි හානි වලින් තොරව පවතින්නේ ද යන්න පිළිබඳව අවධානය යොමු කරන්න.
- ගෙවත්තට බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට බොහෝ දෙනෙකු භාවිතා කරනු

ලබන තවත් ජනප්‍රිය ක්‍රමයක් වන්නේ අසල්වාසීන්ගෙන් බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමයි. මෙම ක්‍රමයේදීත් අසල්වාසීන්ගෙන් ලැබෙන බීජ හා රෝපණ ද්‍රව්‍ය නීරෝගී හා කෘමි හානි වලින් තොර බව තහවුරු කර ගන්න.

- එහෙත් බීජ හා රෝපණ ද්‍රව්‍ය වෙළඳසැලකින් මිළදී ගෙන ගෙවතු බෝග වගාව සඳහා භාවිතා කරනු ලබන්නේ නම්, ඒවා මිළදී ගනු ලබන ස්ථානය විශ්වාසනීය ස්ථානයක්වීම අවශ්‍ය වේ. නිශ්චිත බීජ සහතික කිරීමේ වැඩපිළිවෙලක් යටතේ නිපදවා ගත් බීජ හා රෝපණ ද්‍රව්‍ය මිළදී ගැනීම සිදු කරනු ලබන්නේ නම් එමඟින් නීරෝගී බව හා කෘමි හානි රහිත බව පිළිබඳ නිශ්චිත තහවුරුවක් ලැබේ. එමඟින් ලබා ගන්නා බීජ හා රෝපණ ද්‍රව්‍ය නියමිත ප්‍රභේදයට අයත් වන්නේ ද යන්නත්, සිටුවීමට සුදුසු අවස්ථාවේ පවතී ද යන්නත් තහවුරු කර ගැනීමට ඉඩක් ලැබේ.

## 3.2 ගෙවත්ත සඳහා ස්වයං බීජ නිෂ්පාදනය

- බොහොමයක් එළවළු, සමහරක් පලතුරු හා ක්ෂේත්‍ර බෝග වල මීළඟ වගාව ඇති කරලීම සඳහා ස්වයං බීජ නිෂ්පාදන ක්‍රමවේදය යොදා ගත හැක. එනම් තමන් විසින්ම නිපදවා ගනු ලබන බීජ ඊළඟ වගාවේ දී යොදා ගැනීම හෝ අවශ්‍ය අවස්ථාව වනතෙක් ගෘහස්ථව ගබඩා කර තබා ගැනීම කළ හැකියි.
- බොහොමයක් බෝග වර්ගවල බීජ නිෂ්පාදනය කර ගැනීම ගෙවතු හිමියන්ටම කරගන්න පුළුවන්. ඒ සඳහා මූලික දැනුමක් අවශ්‍ය වනවා මෙන්ම එය ප්‍රවේශමෙන් හා කල්පනාකාරීව කළ යුතු වෙනවා. එසේ නොවුවහොත් ඒවායේ පැළවීම (ප්‍රරෝහණ ප්‍රතිශතය) අඩුවීම, වෙනත් ප්‍රභේද සමග මිශ්‍රවීම, රෝග හා පළිබෝධ හානි නිසා විනාශවීම වැනි අහිතකර සිදුවීම් ඇතිවිය හැකිය.

### 01. කරල් බෝග වලින් බීජ ලබා ගැනීම

***මෑ, බෝංචි, වැටකොළු, දඹල, බණ්ඩක්කා, මුං, කව්පි වැනි බෝග***

- වඩාත් සුදුසු වනුයේ අස්වනු නෙළීම් වාර 2 සිට 6 දක්වා වූ කරල් අස්වැන්නෙන් බීජ ලබා ගැනීමයි. තවද පළිබෝධ හා රෝග හානි මෙන්ම වර්ධනය බාල වූ ගස් වලින් ද කරල් ගැනීමෙන් වැළකීම අවශ්‍ය වේ.
- බීජ ලබා ගැනීමට සුදුසු කරල් සාමාන්‍ය අස්වැන්න නෙළීමේ දී ඉවත් නොකර ගසේම හොඳින් මේරීමට හා වියළීමට ඉඩ ලබා දෙන්න. මෙහිදී කරල් පිපිරී බීජ විසිරීමට පෙර කරල් නෙළාගැනීම අවශ්‍ය වේ. නෙළාගත් කරල් වලින් බීජ වෙන් කරගෙන දින කිහිපයක් මද පවනේ වියළීමට ඉඩ හරින්න. ඉන්පසුව එම බීජ පිරිසිදු කර, පැදුරක, ගෝනියක හෝ ප්ලාස්ටික් තැටිවල අතුරා හිරු එළියේ දින 3 - 4 ක් වියළීමෙන් තෙතමනය හැකි තරම් අඩු කර ගන්න. (8% - 9%) බීජ අස්වැන්න නෙළා ගැනීමේදී අධික වැසි සහිත කාලගුණයන් මඟහැරීම ඉතා අවශ්‍ය වේ.
- එම බීජ පොලිතින්වල අසුරා ශීතකරණයේ සෙන්ටිග්‍රේඩ් අංශක 13 -15 අතර උෂ්ණත්වයක තබා ගන්න. මෙම ක්‍රමයෙන් වසර 1 - 1 $^{1}/_{2}$ ක් පමණ කාලයක් බීජ ගබඩා කර තබාගෙන සිටුවීම සඳහා යොදා ගත හැකියි. සිටුවීමට

දිනකට පමණ පෙර ශීතකරණයෙන් එළියේ තබා ගන්න.

- එසේ නැතිනම් මෙම කරල් වලින් බීජ වෙන් නොකර කරල් පිටින්ම වියලා අටුවේ තබා ගෙන අවශ්‍ය විටක දී බීජ ලබා ගැනීමට ද හැකියාව තිබේ.

**02. ගෙඩි බෝගවල බීජ ලබා ගැනීම**

*තක්කාලි, පිපිඤ්ඤා, කැකිරි වැනි බෝග*

- වඩාත් සුදුසු වනුයේ අස්වනු නෙළීම් වාර 2 සිට 6 දක්වා වූ ගෙඩි අස්වැන්නෙන් බීජ ලබා ගැනීමයි. මේ සඳහා රෝග හා පළිබෝධ වලින් තොර ශාක වලින් ගෙඩි ලබා ගන්න.
- මෙම තෝරාගත් ගෙඩි ගසේම හොඳින් පැසී ඉදීමට ඉඩ හරින්න. ඉන්පසු නෙළාගත් ගෙඩි තවත් දින කිහිපයක් ඉදීමට ඉඩ හරින්න.
- ඒවා දෙකට කපා බීජ හා ඒ සමග ඇති පල්පය ප්ලාස්ටික් හෝ මැටි බඳුනකට දමා දිනක් පමණ පැසීමට ඉඩ ලබා දෙන්න. පසුව පල්පය ඉවත්වන තෙක් පිරිසිදු ජලයෙන් බීජ සෝදා පිරිසිදු කර ගන්න. මෙම බීජ මද පවනේ වියලා ප්ලාස්ටික් තැටි, කඩදාසි හෝ ගෝනිවල අතුරා හිරුඑළියේ දින 3 - 4 ක් පමණ තෙතමනය 8% - 9% වන තෙක් වියලා ගන්න.
- එම බීජ පොලිතීන් වල අසුරා ශීතකරණයේ සෙන්ටිග්‍රේඩ් අංශක 13 -15 අතර උෂ්ණත්වයක ගබඩා කර තබා ගැනීම කරන්න. සිටුවීමට දිනකට පමණ පෙර ශීතකරණයෙන් එළියේ බීජ තබා සිටුවීමට භාවිතා කරන්න.

*වම්බටු, එළබටු හා තිබ්බටු වැනි බෝග*

- වඩාත් සුදුසු වනුයේ අස්වනු නෙළීම් වාර 2 සිට 6 දක්වා වූ ගෙඩි අස්වැන්නෙන් බීජ ලබා ගැනීමයි. මෙහිදී තෝරාගත් ගෙඩි අස්වැන්න ලෙස නෙළා ගැනීමක් නොකර ශාකයේම හොඳින් මේරීමට ඉඩහරින්න. ඉන්පසු ඉදුණු ගෙඩි නෙළාගෙන තවත් දින කිහිපයක් ගොඩ ගසා තබන්න. පසුව මෙම ගෙඩි ලීයකින් හොඳින් තලා ගෙඩිය පලා ජල බඳුනකට බීජ වෙන්කර ගනී. මෙම බීජ හොඳින් ජලයේ සෝදා පෙරා, මද පවනේ ජලය වියළීමට ඉඩ හරියි.
- ඉන්පසු ප්ලාස්ටික් තැටි හෝ කඩදාසිවල අතුරා දින 2 - 4 වියළීමෙන් පසු පොලිතීන් බෑග්වල අසුරා ශීතකරණයේ තබාගන්න. (උෂ්ණත්වය සෙල්සියස් අංශක 13 - 15 අතර)
- තවාන් දැමීමට දිනකට හෝ දෙකකට පෙර ශීතකරණයෙන් එළියේ තබාගන්න.

*පතෝල, වට්ටක්කා, පැපොල් වැනි බෝග*

- මෙම බෝගවල ගෙඩි හෝ කරල් ශාකයේම හොඳින් මෝරා ඉදීමට ඉඩ හරින්න.
- පසුව ඒවා නෙළාගෙන තවත් දින කිහිපයක් ඉදීමට ඉඩහැර තියුණු මළ නොබැඳුණු පිහියකින් පලා බීජ වෙන්කර ගන්න.
- එම බීජ ඒවායේ මාංශලය ඉවත්වන තෙක් පිරිසිදු ජලයෙන් සෝදාගෙන පවනේ වියළා ගන්න.
- ඒවා ප්ලාස්ටික් තැටි/පාත්ති/පැදුරක අතුරා හිරු එළියේ දින 4-5 පමණ හොඳින් වියළා ගන්න. (තෙතමනය 8% - 9% පමණ වනතෙක්)

- ඉන්පසු ඒවා හොඳින් පිරිසිදු කර පොලිතීනයක අසුරා සෙල්සියස් අංශක 13-15 අතර උෂ්ණත්වයක තබාගන්න.

## 3.3 තවානක බීජ සිටුවා යම් කාලයක් රැක බලා ගෙන පසුව ගෙවත්තේ සිටුවීම

බොහොමයක් එළවළු බෝග සඳහා තවානක් මඟින් පැළ නිපදවාගෙන ගෙවත්තට භාවිතා කළහැක. සමහරක් පලතුරු වර්ග, ඖෂධ පැළෑටි වර්ග හා වන වගා පැළ වැනි බෝග සඳහා ද මෙම ක්‍රමය යටතේ පැළ නිපදවා ගැනීම කරයි.

### එළවළු තවාන් පාලනය

#### වැදගත්කම

- ගෙවත්තක් වසර පුරා අඛණ්ඩව නඩත්තු කරන නිසා අපගේ අවශ්‍යතාවයට අනුව අවශ්‍ය පැළ වර්ග අවශ්‍ය වෙලාවට ලබා ගන්න තමන්ගේම තවානක් නඩත්තු කරගෙන යාම ගෙවතු වගාවේ දී අවශ්‍ය වෙනවා. මේ නිසා ගෙවත්ත අඛණ්ඩව පවත්වාගෙන යාමට අපට හැකි වෙනවා.
- අපි ගෙවත්තේ වගාකරන එළවළු බෝග බොහොමයක බීජ කුඩා නිසාත්, ඒවා වගා කිරීමේ දී නඩත්තුව පහසු වීම හා නීරෝගී, දිරිමත් පැළ ලබාගැනීම සඳහාත් බීජ තවාන් කර වර්ධනය වූ පැළ ගෙවත්තේ සිටුවීම සඳහා යොදා ගන්නවා.
- තවානක් භාවිතා කර එළවළු පැළ නිපදවාගෙන ගෙවත්තේ සිටුවීම තුළින් වාසි රැසක් ලබාගන්න පුළුවන්. ඒවානම්,
    - තවානක පැළ කුඩා කාලයේ දී අපට පහසුවෙන් රැක බලාගන්න පුළුවන්.
    - තවානක් මගින් ශක්තිමත් හා නීරෝගී පැළ වැඩි සංඛ්‍යාවක් නිපදවාගන්න හැකිවෙනවා.
    - එකවර බීජ වගා බිමේ කෙළින්ම සිටුවීම සඳහා අවශ්‍යවන බීජ ප්‍රමාණයට වඩා අඩු බීජ ප්‍රමාණයකින් අවශ්‍ය පැළ සංඛ්‍යාව නිපදවා ගන්න පුළුවන්.
    - වැඩිපුර පැළ ඉතිරි වූ විට අලෙවි කිරීම මඟින් අමතර ආදායමක් ලබා ගන්න හැකි වෙනවා. එම පැළ අසල්වාසීන් සමඟ බෙදා ගත්තොත් හොඳ හිතත් වර්ධනය වෙනවා.

#### *තවාන් කර පැළ නිපදවා ගනු ලබන බෝග*

- තවාන් භාවිතා කර සුදුසු ආකාරයේ පැළ නිපදවා ගනු ලබන එළවළු බෝග වන්නේ බටු, මිරිස්, මාළු මිරිස්, තක්කාලි, ගෝවා, මල් ගෝවා, ලීක්ස්, බීට්, නෝකෝල්, සලාද ආදියයි.
- කැරට් හා රාබු වැනි බීජ ඉතා කුඩා වුවත් මේ අන්දමට තවාන් සකස්කර පැළ හදාගන්නේ නැහැ. එයට හේතුව තමයි පැළ ගලවන විට මුදුන් මුලට හානි ඇති වුණොත් අල විකෘති වීමක් හෝ හොඳින් වර්ධනය වීමක් සිදු නොවීමයි.
- ඒ වගේම විශේෂ හේතූන් මත (බීජ සතුන්ගෙන් විනාශ වීම වැළැක්වීමට, වැසි කාලය මගහැරීමට, වියළි කාලය මගහැර වැසි පටන්ගන්නා විට සිටුවීමට) වට්ටක්කා, කරවිල, පිපිඤ්ඤා, දඹල වැනි බෝගවල බීජ විශාල වුණත් විශේෂ තවාන් ක්‍රම උපයෝගී කරගෙන පැළ නිපදවාගන්න පුළුවන්.

*තවාන් ආකාර*

- ගෙවත්තේ සිටුවීම සඳහා වරකට අවශ්‍ය වන්නේ පැළ කීපයක් බැවින් විශේෂයෙන් තවාන් පාත්ති සකස් කිරීමක් අවශ්‍ය වන්නේම නැහැ.
- එහෙයින් බීජ තවාන් කිරීම සඳහා ලී හෝ කාඩ්බෝඩ් පෙට්ටි, පොලිතීන් මළු, වලං, ප්ලාස්ටික් බඳුන්, පොල්කටු, කඩදාසි හෝ කෙසෙල් කොළවලින් සකසාගත් බඳුන් හා කෙසෙල් පට්ටා යොදාගෙන සකසා ගත් කුඩා භාජන ආදිය භාවිතා කරන්න පුළුවන්.



ඉවතලන ප්ලාස්ටික් කෝප්පවල තවාන් පැළ නිපදවීම



තවාන් සඳහා භාවිතා කරන විවිධ තවාන් බඳුන්

- පුවත්පත් පිටු, කඩදාසි, කෙසෙල් කොළ හෝ කෙසෙල් පට්ටා එක මත එක තබා රවුම් හැඩයේ බඳුන් හෝ ලී කොට වටේ ඔතා ඇමුණුම් කටු, අල්පෙනිති, ඉරටු ආදිය උපයෝගී කරගෙන කුඩා භාජන ලෙස සකසා ගත හැකියි.



කෙසෙල් කොළ බඳුන්

- ඒ වගේම පහසුවෙන් තවානක් ඇතිකර ගැනීම සඳහා අපට වෙළඳපොළෙන් මිළදී ගත හැකි තවාන් තැටි යොදාගන්නත් පුළුවන්.



තවාන් තැටි

- එලෙසම පොලිතීන් බෑග් වලත් තවාන් පැළ හදා ගන්න පුළුවන්.



පොලිතීන් බෑග් භාවිතය

- කොහු කර්මාන්තයේ දී අතුරු ඵලයක් ලෙස ඉතිරිවන කොහුබත් වලින් සාදා ගනු ලබන කොහුබත් කැට දැන් වෙළඳපොළෙන් මිලදී ගන්න පුළුවන්. එම කොහුබත් කැට තවාන් තැටියක අසුරා තබා ටික වේලාවක් ජලය එකතුකර ගැනීමෙන් පසු ඒවා ප්‍රසාරණය වනු ලබන අතර ඉන්පසු එම කොහුබත් කැට මැදට බීජ යෙදීම කරන්න පුළුවන්. මෙම ක්‍රමය මඟින් ලැබෙන පැළ නිර්පාංශු වගාවට ද භාවිතා කරන්න පුළුවන්වීම විශේෂ වාසියකි.



කොහුබත් කැට

*බඳුන් සඳහා මාධ්‍යය සැකසීම හා ජීවානුහරණය*

- ගල් හා මුල් ඉවත්කර හොඳින් කුඩුකරන ලද මතුපිට පස් හා කාබනික පොහොර (වියළි ගොම හෝ වියළි කොම්පෝස්ට් පොහොර) සමාන ප්‍රමාණ වලින් මිශ්‍ර කර සාදාගත් බඳුන් මිශ්‍රණය බීජ තවාන් කිරීම සඳහා යොදා ගන්න.
- මෙම බඳුන් මිශ්‍රණයේ සමහරවිට රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් හෝ පළිබෝධකයන්ගේ ජීවන චක්‍රයේ බිත්තර, කීට වැනි සමහර අවස්ථා තිබිය හැකියි. ඒ මඟින් කුඩා පැළවලට හානි සිදු විය හැකියි.
- එමනිසා මෙම හානි පාලනය කරගැනීමට නම් මෙම පස් මිශ්‍රණය බඳුන් වලට පිරවීමට පෙර තද අව්වේ දින කිහිපයක් හොඳින් වියළා ගැනීම හෝ තහඩු කැබැල්ලක් මතට තෙත් පස් මිශ්‍රණය දමා එම තහඩුව ලිපක් මත තබා හොඳින් ගින්නෙන් රත්කර ගැනීම මඟින් එම අහිතකර පළිබෝධකයන් හෝ ඔවුන්ගේ ජීවන චක්‍රයේ අවස්ථා විනාශ වී යාම සිදුවේ.
- බඳුන් මිශ්‍රණය අවශ්‍ය වන්නේ කුඩා ප්‍රමාණයක් නම්, වාෂ්පයෙන් තම්බා ගැනීම හෝ උණු වතුරෙන් තැම්බා ගැනීම ද කළ හැකියි.
- මෙලෙසින් ජීවාණුහරණය කරගත් බඳුන් මිශ්‍රණයෙන් භාජන, තවාන් තැටි සහ බඳුන් පුරවා ගන්න. එලෙසම තවාන් තැටි පුරවා ගැනීමට හොඳින් තම්බාගත් කොහුබත් හා බාගෙට කර කරගත් දහයියා 1:1 මිශ්‍රණය ද යොදාගන්න පුළුවන්. මිශ්‍රණය පුරවා ගන්නට පෙර භාජන හෝ බෑග් වල ජලය බැසයාම පහසු වීම සඳහා පතුලේ සිදුරු කිහිපයක් සාදා ගැනීම වැදගත් වෙනවා.
- පැළ කරගත යුතු බීජ තුනියට තැන්පත් කර ඊට උඩින් ජීවාණුහරනය කරගත් පස් මිශ්‍රණය තුනී තට්ටුවක් ලෙසින් යොදා බීජ වසා දැමීම කරන්න.
- අපට දිරිමත් පැළ වැඩි සංඛ්‍යාවක් අවශ්‍යවන විට මෙවැනි තවාන් තැටි හෝ භාජන වැඩි සංඛ්‍යාවක් භාවිතා කර තවාන් පැළ ඇති කරගන්න පුළුවන්.
- බීජාවරණය වඩා ඝනකම් සහිත බෝග වන බණ්ඩක්කා, කරවිල, පතෝල, දඹල ක්ෂේත්‍රයේ සිටුවීමට හෝ තවාන් දැමීමට පෙර රැයක් පමණ ජලයේ ගිල්වා තබා ජලය උරාගත් පසු බීජ ජලයෙන් ඉවතට ගන්න. ඉන්පසු බීජවල ප්‍රරෝහණයට අවශ්‍යවන තෙතමනය, වාතය

හා උණුසුම ලැබෙන සේ භාජනයකට බීජ ටික දමා වසා තැබීමෙන් පැළවීම ඉක්මන් කරගන්න.

- බඳුන් සහ තවාන් තැටි වලට බීජ යෙදූ පසු මතුපිටින් තෙත් වසුනක් යොදා ගත්විට බීජ ඉක්මනින් පැළ වේ. වසුන සඳහා තෙත ගෝනි හෝ අළුත් පිදුරු අතුරා ගැනීම කළ හැකියි. අළුත් පිදුරු භාවිතා කළේ නම් වසුන යෙදූ පසු මල් බාල්දියකින් පිදුරු තෙත් කරන්න. බීජ පැළවීම අරඹන විට දී වසුන ඉවත් කරන්න මතක තබා ගන්න.



පිදුරු වසුනක් යෙදීම

- වසුන ඉවත් කළ පසු මෙම බඳුන් හා තවාන් තැටි වල ඇති කළ පැළ ද සාමාන්‍ය තවානක් ලෙස රැක බලා ගන්න.

### තවානක් සඳහා සුදුසු බිමක් තෝරාගැනීම

- පැළ වැඩි සංඛ්‍යාවක් නිපදවා ගැනීමට අවශ්‍යනම් පමණක් පිහිටි බිමෙහි ද තවානක් ඇතිකර පවත්වාගෙන යන්න පුළුවන්. මෙහිදී අමතරව නිපදවන පැළ අලෙවියට හෝ අසල්වාසීන් සමග බෙදා ගන්නත් පුළුවන්.
- පිහිටි බිමෙහි තවානක් සාදා ගන්නේනම් (උස් තවානක්, ගිල්වූ තවානක්) ඒ සඳහා සුදුසු තවාන් බිමක් තෝරාගැනීම අත්‍යාවශ්‍ය වෙනවා. එලෙසම බඳුන් තවාන් හා තවාන් තැටි භාවිතා කරන අවස්ථාවලදීත් ඒවා තබාගැනීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගතයුතු වෙනවා.
- තවානක් සඳහා බිමක් තෝරා ගන්නේ නම් එම බිමෙහි පැවතිය යුතු ලක්‍ෂණ ගණනාවක් තිබෙනවා.
  - ඒ සඳහා නොකඩවා එළවළු වගා නොකළ බිමක් නම් වඩා සුදුසුයි.
  - එසේම එම ස්ථානයට දවසේ වැඩි කාලයක් හිරුඑළිය ලැබෙනවා නම් හොඳයි.
  - එම ස්ථානයේ අනවශ්‍ය ලෙස ජලය රැඳා නොපවතින බිමක්වීම වැදගත් වෙනවා.
  - එලෙසම තද වැස්සකට පසුව ගලා යන ජලය තවාන් බිමට එකතු වන ස්ථානයක් නොවීමත් වැදගත්.
  - තවාන සකස් කරන ස්ථානයට අපහසුවකින් තොරව පිරිසිදු ජලය අවශ්‍ය ප්‍රමාණයට ලබා ගැනීමට හැකිවීමත් වැදගත් වෙනවා.
  - ඉලුක්, ඇටවරා, කළාඳුරු වැනි පාලනය කරන්න අපහසු වල් පැළෑටි එම ස්ථානයෙහි නොපැවතීමත් වැදගත් වෙනවා.
  - මීට ඉහත කන්න වලදී පසෙන් බෝවන රෝග නොපැවති ස්ථානයක් තෝරා ගන්න.
  - පරීක්‍ෂාවට පහසු ස්ථානයක් වීම.
  - බල්ලන් වැනි සතුන්ගෙන් තවාන් වලට හානිවන හෙයින් එම සතුන්ට පැමිණීමට අපහසු ස්ථානයක් තෝරා ගැනීම.

### උස් තවාන් පාත්ති සකස් කිරීම

- මේ සඳහා තවාන දැමීමට සති 3-4 කට පෙර එම බිමෙහි වල් පැළෑටි හා ගල් බොරළු ඉවත්කර සෙ.මී. 20 පමණ ගැඹුරට පස පෙරළන්න. (මෙවිට මතුවන ගල්, බොරළු, නොදිරූ ශාක කොටස්, පොලිතීන් ආදියත් සුදු පණුවන්, කියත් පණුවන් වැනි අහිතකර කෘමීන් ද තෝරා තවාන් බිමෙන් ඉවත් කළ යුතු වෙනවා)
- මේ අන්දමට කිහිප විටක් පස පෙරළීමෙන් වල් පැළෑටි විනාශ වෙනවා. එමෙන්ම හිරුඑළියට නිරාවරණය වීමෙන් පසේ සිටින රෝග කාරක ජීවීන් ද පාලනය වෙනවා.
- තවාන පිහිටි පසෙන් සෙ.මී. 10 උසට සකසා ගන්න. තවානේ පළල සෙ.මී. 90 (අඩි 3) නොඉක්මවන ලෙස සකස් කර ගන්න.
- ඉන්පසු හලන ලද ගොම හා හලන ලද මතුපිට පස් 1:1 අනුපාතයට මිශ්‍රකර ඒ මඟින් තවත් සෙ.මී. 05 පමණ උසට එම මිශ්‍රණය තවාන මත අතුරා ලී පටියකින් සමතලා කර ගන්න.



මිශ්‍රණය ලී පටියකින් සමතලා කර මට්ටම් කර ගැනීම

### උස් තවානක් ජීවාණුහරණය කර ගැනීම

- මෙම තවාන් පාත්ති මතට බීජ යෙදීමට පෙර තවානේ සිටින පාංශු රෝග කාරකයින් අවම කර ගැනීමට තවාන ජීවාණුහරණය කරගත යුතු වෙනවා.
- මේ සඳහා තවාන පිළිස්සීම හෝ සූර්යාලෝකය ආධාරයෙන් ජීවානුහරණය කර ගැනීම කළ හැකියි.

### (i) පිළිස්සීම මගින් ජීවානුහරණය

- පෙරදී සකස් කරගත් තවාන තෙත්කර වැඩිපුර ඇති ජලය බැස යාමට පැයක පමණ වේලාවක් තබන්න.
- ඉන්පසු පිදුරු හා දහයියා සෙ.මී. 5 ක ගණකමක් සහිත තට්ටු ලෙසින් මාරුවෙන් මාරුවට අතුරා ගන්න. මෙලෙස තට්ටු 4 ක් අතුරා ගැනීම ප්‍රමාණවත්ය.




පිළිස්සීම සඳහා සකස් කළ උස් තවානක්

- ඉන්පසු සුළඟ හමන දිශාවට විරුද්ධ දිශාවෙන් යටින් ඇති පිදුරු තට්ටුවට ගිනි අවුලන්න.




තවාන පිළිස්සීම ආරම්භ කිරීම

- තවාන තෙත් කිරීමෙන් පසු පිළිස්සීම සිදුකරන හෙයින් තවාන දිගු කාලයක් තැම්බීමක් සිදුවේ. මේ නිසා දියමළන් කෑමට හේතුවන රෝගකාරකයන් හා වෙනත් රෝගකාරකයන් මෙන්ම වල් පැළෑටි බීජ ද විනාශ වෙනවා.
- තවානේ පිළිස්සීම අවසන් වී සාමාන්‍ය උෂ්ණත්වයට තවාන් පස පත්වූ පසු මතුපිට ඇති අළු ප්‍රවේශමෙන් ඉවත් කර තවාන මට්ටම් කර ගන්න.



පිළිස්සීම අවසන් කළ තවානක්

(ii) *සූර්යාලෝකය ආධාරයෙන් ජීවානුහරණය*

- පිළියෙළ කරගත් තවානේ පස් මිශ්‍රණය ලෑලි පටියක් ආධාරයෙන් මට්ටම් කරගන්න.
- සකස් කරගත් තවාන ජලයෙන් තෙත්කර මද වේලාවක් අමතර ජලය බැස යන තෙක් තබන්න. ඉන්පසු තවානේ මුළුවල ගඩොල් කැබලි තබන්න.
- පසුව විනිවිද පෙනෙන පොලිතීන් ස්ථරයකින් තවාන සම්පූර්ණයෙන්ම ආවරණය කර තවාන වටේම තෙත පස් යොදා හොඳින් සීල්කර ගන්න.



සූර්යාලෝකයෙන් ජීවානුහරණය කරන උස් තවානක්

- මෙම තවාන සති 2 ක පමණ කාලයක් නොකඩවා සූර්යාලෝකයට නිරාවරණය කර ගැනීමෙන් ජීවානුහරණය වෙනවා.
- ඒ මත ඇති පොලිතීන් ආවරණය ඉවත්කර ටික වේලාවකට පසු බීජ යෙදීම කරන්න පුළුවන්.

***බීජ යෙදීම හා උස් තවානක් රැක බලා ගැනීම***

- බීජ යෙදීමට පෙර ජීවානුහරණය කර ගත් තවානේ මතුපිට මට්ටම්ව තිබීමත් පසේ ප්‍රශස්ත තෙතමනය පැවතීමත් ඉතා වැදගත් වේ.
- කුඩා රීප්ප පටියක් ආධාරයෙන් සෙ.මී. 10-12 පමණ පරතරයට සිටින සේ නොගැඹුරු කුඩා ඇලි සකසාගන්න.




බීජ යෙදීමට ඇලි සළකුණු කිරීම

- තවානට යොදන බීජ මගින් රෝගකාරකයින් තවානට ඇතුළු වියහැකි බැවින් බීජ ප්‍රතිකාර කළ බීජ තවානට යෙදීම වඩාත් සුදුසු වේ.
- මෙම ඇලි දිගේ තුනීවට බීජ යෙදීම සිදුකර, එම බීජ ජීවානුහරණය කළ පාත්තියෙන්ම ලබාගත් පස්වලින්ම යන්තමින් වසන්න.
- ඉන්පසු පිරිසිදු තෙත ගෝනිවලින් හෝ අළුත් පිදුරුවලින් වසුනක් යොදන්න. අළුත් පිදුරු වලින් වසුන යෙදුවේ නම් මල් බාල්දියකින් වසුන තෙත් කිරීමට කටයුතු කරන්න.



පිදුරු වසුන් යෙදූ තවානක්

- බීජ පැළ පසෙන් මතුවනවිටම වසුන ඉවත් කරන්න අමතක කරන්න එපා.
- එම වසුන ඉවත් කළ තවානට ඇති විය හැකි ප්‍රධාන ගැටළුවක් වන්නේ දියමලන් කෑමේ රෝගයයි. මෙය වළක්වා ගැනීමට ''කර කළ දහයියා'' තවාන් පේළි අතර තුනියට අතුරා ගන්න. මෙහිදී කර කළ දහයියා බීජ පැළවල නොගෑවෙන ලෙස යෙදීම ද වැදගත් වෙනවා.



පේළි අතර කර කළ දහයියා යෙදූ තවානක්

- ඉන්පසු නැමෙන සුළු කෝටුවලින් හෝ උණ ගස්වලින් පලාගත් පටිවලින් අඩි 2 - 2 $^{1}/_{2}$ පමණ උසට ආරුක්කුවක් සාදා විනිවිද පෙනෙන පොලිතීන්වලින් වසා තද වැස්සෙන් හා හිරු එළියෙන් ළපටි පැළ ආරක්ෂා කරගන්න. පොලිතීන් ආවරණයෙන් තවාන වැසීමේ දී පොළව ආසන්නයෙන් ඉඩ තබා ගන්න. එමගින් තවානට හොඳ වාතාශ්‍රයක් ඇතිවෙනවා.



තවානට ආවරණ සැපයීම

- පවතින කාලගුණ තත්ත්වය මත දිනකට එක් වරක් හෝ දෙවරක් අවශ්‍ය නම් පමණක් ජලය යොදන්න.
- මෙසේ ජලය සපයමින්, වල් පැළ ගලවා ඉවත් කරමින් අවශ්‍ය කාල සීමාව වනතෙක් තවාන නඩත්තු කරන්න.
- බෝගය අනුව පැළ තවානේ තිබිය යුතු කාල සීමාව වෙනස්වේ.

| **බෝගය** | **තවානේ තිබිය යුතු සති ගණන** |
|---|---|
| තක්කාලි, සලාද | 2 - 3 |
| බටු, මිරිස්, මාළුමිරිස්, ගෝවා, නෝකෝල්, බීට් | 3 - 4 |
| ලීක්ස් | 8 - 10 |

- මෙසේ සකසාගත් තවානෙන් පැළ ගැලවීමට දින කිහිපයකට පෙර සිට තවානට ජලය

යොදන වාර ගණන ක්‍රම ක්‍රමයෙන් අඩු කිරීම මෙන්ම උදේ කාලයේ දී ටිකෙන් ටික හිරු එළියට නිරාවරණය කිරීමෙන් පැළ දැඩි කර ගන්න.



පැළ දැඩි කිරීම

- නිසි වයසට පැමිණි පසු නිරෝගී පැළ තෝරා ක්ෂේත්‍රයේ සිටුවන්න පුළුවන්. පැළ ගැලවීමට පෙර තවානේ පස හොඳින් තෙත් කරන්න. අත් මුල්ලුවක් භාවිතා කර පස බුරුල්කර පස් සමග මුල් නොකැඩෙන ලෙස පැළ ගලවා ගන්න.

### ගෙවත්තේ පැළ සිටුවීම

- තවාන් කරන ලද එළවළු පැළ ගෙවතු බිමේ සිටුවීම සඳහා ගලවා ගැනීමේ අවස්ථාව ඉතා වැදගත් වේ. නියමිත වයසට තවානෙන් පැළ ගලවා ගැනීම මෙන්ම, පැළ ගැළවීමේදී මුල් වලට හානි නොවීමට හා පැළ ප්‍රවාහනයේ දී හානි නොවීමට වගබලා ගත යුතුවේ.
- උස් තවානකින් හෝ තවාන් පෙට්ටිවලින් පැළ ගලවා ගැනීමේ දී, පසත් සමඟ පැළ ගලවා ගෙන පරිස්සමින් ප්‍රවාහනය ඉතා අවශ්‍ය වේ.
- එලෙස ගලවන ලද පැළ හෝ බඳුන් පැළ තවාන් බිමේ සිට ගෙවත්තට රැගෙන යාමේ දී පැළ වලට හා බඳුන් වලට හානි සිදුවීම වළකා ගැනීම සඳහා පැතලි පතුලක් සහිත භාජනයක අසුරා රැගෙන යන්න.
- තවාන් තැටි භාවිතා කරන්නේ නම් පාංශු මාධ්‍යයෙන් සිදුරු පිරවීමට පෙර ඒවායේ සිදුරුවල පතුලට සෙ.මී. 1 පමණ පළල පොලිතීන් පටියක් එළා ගැනීමෙන් මුල් නොකැඩී පහසුවෙන් පැළ ගලවා ගැනීමට හැකිවේ. (පොලිතීන් පටියේ කොණකින් එසවීමෙන් එකින් එක පැළ මාධ්‍යය සමඟ ඔසවා ගත හැකිවන නිසා)



ඍජුෆෝම් තවාන් තැටි



ඍජුෆෝම් තවාන් තැටි වලට පොලිතීන් පටි යෙදීම

- තවානේ ලබා ගන්නා පැළ ක්ෂේත්‍රයේ කෙළින්ම සිටුවීම වෙනුවට උස අඟල් 14 ක් හා විෂ්කම්භය අඟල් 12 ක ප්‍රමාණයේ කළු පොලිතීන් බෑග්වල සිටුවා ගැනීම කළ හැකියි. මෙම විශාල බඳුන්වල සිටවූ මිරිස් පැළ ගෙවත්තෙහි වගාවට යොදා ගැනීමට අපහසු ස්ථානවල පවා තැබීම කළ හැක.



බඳුන්ගත වගාව

## 3.4 බීජ සෘජුවම ගෙවත්තේ හෝ විශාල බඳුන්වල සිටුවීම

- සමහරක් බෝග විවිධ හේතූන් මත තවාන් කිරීමක් සිදු නොකර සෘජුවම ගෙවතු බිමේ හෝ විශාල බඳුන්වල සිටුවීම කරන්න වෙනවා.
- එළවළු බෝග අතුරින් කැරට් තවාන් කර සිටුවන්න සුදුසු නැහැ. කැරට් තවාන් කර පැළ ගලවා සිටවුවහොත් කැරට් අල හොඳින් සෑදීමට එය බාධාවක් වෙනවා.
- එලෙසම රාබු වැනි බෝග කෙටි වගා කාළයක් තියෙන නිසා තවාන් කරන්නේ නැතිව සෘජුවම වගා බිමේ සිටුවනවා.
- බීජය තුළ පවතින සංචිත ආහාර වැඩියෙන් පවතින හෙයින් සාපේක්ෂව ප්‍රමාණයෙන් විශාල එළවළු බීජ වර්ග තවාන් කරන්න අවශ්‍ය වන්නේ නැහැ. උදා. වැල් බෝංචි, පඳුරු බෝංචි, මෑ, මැහි බෝග
- වෙනත් ක්ෂේත්‍ර බෝග කාණ්ඩයට අයත් වන බඩඉරිඟු, මුං, කව්පි, උඳු, තල වැනි බෝග සෘජුවම ගෙවතු බිමේ සිටුවා ගන්න පුළුවන්.

## 3.5 වර්ධක කොටස් මඟින් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම

මෙහිදී ශාකවල වර්ධක කොටස් එනම් අතු හෝ කඳ කැබලි, මුල්, රෛසෝම, කෝම, මොරෙයියන් ආදිය රෝපණ ද්‍රව්‍ය ලෙස යොදාගත හැකි වේ. එවිට අපට අවශ්‍ය ප්‍රභේදය තෝරාගත් වැඩි අස්වැන්නක් දෙන වගාවකින් තෝරා බෝකර ගත හැකි වේ.

**අතු හෝ කඳ කැබලි**

- පහසුවෙන් ලබාගත හැකිවීමත්, නිවැරදිව ප්‍රභේදය ලබාගත හැකි වීමත් මෙහිදී අපට ගෙනදෙන වාසි වෙනවා. නමුත් අපි ලබා ගන්නා අතු හෝ කඳ කැබලි පළිබෝධ හා රෝග හානි වලට ලක් නොවූ වගාවකින් ලබා ගැනීමට අප තරයේම වග බලා ගතයුතු වෙනවා. උදා : බතල, මඤ්ඤොක්කා, කන්කුන්, මුකුණුවැන්න

**බතල**

- පත්‍ර 5 ක් පමණ ඇති සෙ.මී. 20 පමණ දිග කඳ කැබලි සිටුවීමට යොදාගනී. මව් වැල්වල කරටි හෝ ඊට ආසන්න කොටස රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා කළ හැකියි.
- එක දිගට රෝපණ ද්‍රව්‍ය ලෙස එකම වැල් භාවිතා කිරීම අස්වනු අඩු වීමට හේතුවන නිසා වරින් වර අල තවාන් කර නව දිරියක් ඇති අළුත් වැල් රෝපණ ද්‍රව්‍ය ලෙස භාවිතා කිරීම සුදුසු වේ.

**මඤ්ඤොක්කා**

- මේරූ, කෘමි හෝ රෝගවලට පාත්‍ර නොවූ හා අංකුර මෝදු නොවූ, පැළුදු නොවූ දඬු රෝපණ

ද්‍රව්‍ය ලෙස භාවිතා කිරීම සුදුසුයි. අංකුර 5-7 ක් සහිත සෙ.මී. 20-25 ක් දිග දඬු කැබලි භාවිතා කිරීම සුදුසු වන අතර, සිටුවීමේදී අංකුර 2-3 ක් පස මතුපිට සිටින සේ තනි කැබැල්ලක් සෘජුව හෝ ආනතව සිටුවිය හැක.

### කන්කුන්

- නීරෝගී වගාවකින් රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීම සුදුසුය. ගැට 3-4 ක් සහිත සෙ.මී. 20-30 ක් පමණ දිග කඳ කැබලි සිටුවීමට සුදුසුයි. සිටුවීමට පෙර පත්‍ර ඉවත් කරන්න.
- කන්කුන් බීජ මගින් ද පැළ සකස් කර ගැනීමට හැකි අතර සාපේක්ෂව බීජ මගින් ලබාග න්නා වගාවක් කඳ කැබලි වලින් ලබාගන්නා වගාවකට වඩා වැඩි කාලයක් ගෙවත්තේ පවත්වාගෙන යෑමට පුළුවන.

### මුකුණුවැන්න

- සෙ.මී. 10-12 ක් හෝ ඊටත් වඩා දිග දඬු කැබලි රෝග හා පළිබෝධ වලින් තොර නීරෝගී වගාවකින් ලබා ගැනීම සුදුසුයි.

### මුරුංගා

- විෂ්කම්භය සෙ.මී. 2 පමණ වූ අර්ධව මේරූ, අඩි 1 1/2 - 2 ක් පමණ දිග අතු කැබලි මේ සඳහා යොදාගත හැකියි. පොලිතීන් මළුවල සිටුවා හොඳින් මුල් ඇද ස්ථාපනය වූ පසු සිටුවීමට යොදාගන්න.

### කතුරු මුරුංගා

- හරිත ප්‍රභේදයේ කතුරුමුරුංගා සෙ.මී 1 - 1 1/2 ක් විශ්කම්භය ඇති හා අර්ධව මේරූ අතු, මුල් ඇද්දවීම සඳහා යොදාගත හැකියි. පොලිතින් මළුවල ඉන්දවා හොඳින් ස්ථාපනය වූ පසු ක්ෂේත්‍රයේ සිටුවීමට යොදාගන්න.



අතු කැබලි වලින් බිහිකළ කතුරුමුරුංගා පැළයක්

### රෙරෙසෝම/කෝම

- මෙම බෝගවල රෝපණ ද්‍රව්‍ය ලෙස මව් අල භාවිතා කරයි. උදා: වැල් අල, කිරි අල, ඉඟුරු, කහ වැනි බෝග



සිටුවීමට සුදුසු ඉන්නල

- වැල් අල සහ කිරි අල තවාන් කිරීමෙන් වැඩි පැළ සංඛ්‍යාවක් නිපදවාගත හැකියි. කිරි අල මව් අල අඟල් 2 - 2.5 ක් පමණ ඝනකමට කපාගත් පෙති ද, වැල් අල ග්‍රෑම් 250 පමණ වූ අල කැබලි ද කපාගෙන, කැපුම් පෘෂ්ඨයේ දැව අළු හෝ දිලීර නාශක ගැල්වීම කළ යුතුය.
- සෙවණ ඇති තැන්වල වැලි තවාන් ද, විවෘත ස්ථානවල වැලි, මතුපිට පස් හා කාබනික පොහොර 1:1:1 අනුපාතයෙන් මිශ්‍රිත තවාන් පාත්ති ද සකසා, අල කැබලි තැන්පත් කර, තවාන් මාධ්‍යයෙන්ම වසා වසුන් යොදන්න.

- පළමුව නැගෙන අංකුර ඉවත් කර, සුප්ත අංකුර උත්තේජනය කිරීම මගින් පැළ සංඛ්‍යාව වැඩිකර ගත හැකිය. තවානේ මාස 1 - 1 $^{1}/_{2}$ ක් පමණ වයස්ගත වූ පැළ සිටුවීමට යොදාගත හැකිය.

**ධාවක මගින්**

- රෝග හා පළිබෝධ වලින් තොර වගාවකින් (විශේෂයෙන් වටපණු හානිය රහිත වගාවකින්) මධ්‍යස්ථව මේරූ ධාවක ලබාගන්න. සිටුවීමට දින 2-3 කට පෙර පත්‍ර ඉවත් කර සිටුවීමට යොදාගන්න. උදා : ගොටුකොළ

**මුල් මගින්**

- හොඳ අස්වැන්නක් ලබාදෙන ශාකයක මුල් මගින් වර්ධනය වූ පැළ ලබාගෙන ඒවා මාධ්‍යය පිරවූ පොලිතීන් බඳුන්වල සිටුවා හොඳින් ස්ථාපනය වූ පසු ගෙවත්තේ කොණකට වන්නට සිටුවා ගන්න. උදා: දෙල්, කරපිංචා

**මොරෙයියන් මගින්**

- කෙසෙල් හා අන්නාසි වැනි බෝගවල ගසේ මුලින් හටගන්නා හොඳින් වර්ධනය වූ නීරෝගී මොරෙයියන් රෝපණ ද්‍රව්‍ය ලෙස යොදා ගන්න පුළුවන්. රෝග හා පළිබෝධ හානි වලින් තොර වගාවකින් මොරෙයියන් ලබා ගැනීම වැදගත් වෙනවා.

**අතු බැඳීම/ලේයර් කිරීම හා බද්ධ කිරීම මගින්**

- බොහෝවිට පලතුරු බෝග සඳහා මෙම ක්‍රම දෙකම භාවිතා කරයි. පලතුරු බෝගවල බීජ මගින් පැළ ලබාගතහොත් ඒවායෙන් නිවැරදිම ප්‍රභේදයට අයත් වගාවක් ලැබේයැයි සැමවිටම බලාපොරොත්තුවන්න අපහසුයි. එමෙන්ම බීජ පැළ උස වැඩිවීම මෙන්ම අස්වැන්න ලබා ගැනීමට බොහෝ කල්ගත වීමත් තවත් අවාසීන් වෙනවා. උදා: අඹ, රඹුටන්. අලිපේර, වරකා
- අස්වැන්න හොඳින් ලැබෙන තෝරාගත් ප්‍රභේදයන්හි මව් ශාකවල සුදුසු අතු තෝරා (පේර, දෙළුම්, ජම්බු වැනි බෝග) සෙ.මී. 1 ක පමණ අර්ධ පොතු වලයක් ඉවත්කර හොඳින් තෙත් කරන ලද කොහුබත් ඒ මත තබා පොලිතීනයකින් එය හොඳින් ඔතා දෙකෙළවරින් තදින් බැඳ තබන්න.
- අවශ්‍ය පමණට මුල් ඇද වර්ධනය වන විට ප්‍රවේශමෙන් එම මුල් ඇදුනු කොටසට පහළින් තියුණු පිහියකින් කපා මව් ශාකයෙන් වෙන් කරගන්න. ඉන්පසු එම කොටස බඳුනක හෝ ගෙවත්තේ සුදුසු ස්ථානයක සිටුවීම කළ හැක.
- අඹ, රඹුටන්, අලිපේර, දූරියන්, වරකා වැනි පලතුරු බෝග වල බද්ධ පැළ ලබා ගත හොත් අපිට අවශ්‍ය නිවැරදිම ප්‍රභේදය ලබා ගැනීමට හැකි වනවා මෙන්ම ශාක වඩා උස් නොවී පුහුණු කරගෙන, අඩු කාලයකින් අස්වැන්න ලබා ගැනීමට හැකියාව ලැබෙනවා. එසේම ඒවා රෝග හා පළිබෝධ මෙන්ම විවිධ ආතති තත්ත්වයන්ට ද ඔරොත්තු දීමේ හැකියාවෙන් යුක්ත වෙනවා.
- එමනිසා මෙම බෝගවල බද්ධ පැළ ලබා ගන්නා විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුමත කළ හෝ ලියාපදිංචි පැළ තවානකින් පැළ මිලදී ගන්නේ නම් වැදගත් වෙනවා.

## 3.6 ගෙවත්තට යොදාගත හැකි බෝග වර්ග කිහිපයක්


අළු පුහුල්


මල් කැකිරි


තලනබටු/එළබටු


තිබ්බටු


අමු මිරිස්


මාළුමිරිස්


දඹල


රුහුණු වම්බටු


තුඹ කරවිල


දේශීය කරවිල


කිරි අගුණ


තම්පලා


වැටකොළු


පතෝල


මහවැලි මෑ


හාල්මැස්සන් දඹල



# 04 ගෙවත්ත සකසා ගැනීම

## 4.1 ගෙවත්ත සඳහා මායිම් වැට සකස් කිරීම

- ගෙවත්තක් ආරම්භ කිරීමේ දී හෝ පවතින ගෙවත්තක් වැඩි දියුණු කිරීමේ දී පළමු පියවර ලෙස ගෙවත්ත මායිම් වන වැට සකසා ගන්න.
- ගෙවත්තක වැටෙන් මායිම සළකුණු කිරීමට අමතරව තව වාසි රාශියක් ලැබෙනවා. එයින් ආහාර ලෙස ගත හැකි ද්‍රව්‍ය හෝ පොහොර ලෙස ගත හැකි ද්‍රව්‍ය ලැබෙනවා. එය වැල් බෝග සඳහා ආධාරකයක් ද වෙනවා.
- මේ සඳහා ආහාර බෝග ලෙස හෝ වෙනත් ප්‍රයෝජනයක් ලබා දෙන කතුරුමුරුංගා, මුරුංගා, එරබදු, ග්ලිරිසීඩියා, පාවට්ටා, අනෝදා, වල්සූරියකාන්ත, වාතහංග වැනි ශාක තෝරා ගැනීම සිදු කළ යුතු වෙනවා.
- අඟල් 8-10 පමණ පරතරයට සිටින සේ ශාක වර්ග සිටුවා ගැනීමෙන් බාහිර සතුන් ගෙවත්තට පැමිණීම වළක්වා ගන්න පුළුවන්.
- ගෙවත්තේ සතුන් ඇති කරයි නම් සතුන්ට ආහාර ලෙස භාවිතා කළ හැකි දේ මායිම් වැටෙන් ලැබෙනවා.
- බාහිරින් පැමිණෙන හානිකර කෘමීන් ගෙන් ගෙවත්ත ආරක්ෂා වෙනවා. වැට අපට හිතකර පක්ෂීන්, මකුළුවන් වැනි සතුන්ට හොඳ නවාතැනක් වන හෙයින් ස්වාභාවිකව පළිබෝධ පාලනයක් සඳහා උපකාරී වෙනවා.
- වැටෙහි පවතින ශාකවලින් ඉවත් කරන අනවශ්‍ය අතු මඟින් ගෙදරට අවශ්‍ය දර ලබා ගන්නත් පුළුවන්.





බහුවාර්ෂික බෝග යෙදූ ගෙවත්තේ වැටක්

## 4.2 වගා කිරීමට සුදුසු තත්ත්වයට ඉඩම සැකසීම

- වැට සෑදීමෙන් පසුව අදාළ ගෙවත්ත සුද්ද පවිත්‍ර කර ගැනීම වැදගත් වෙයි.
- ගෙවත්තේ ඇති ස්ථිර ගොඩනැඟිලි හා විශාල ශාක එලෙසම තිබිය දී අනවශ්‍ය ගස් හා වැල් ආදිය ඉවත් කරන්න.
- ගෙවත්තට හිරු එළිය ලැබීම ඉතා වැදගත් නිසා ප්‍රයෝජනවත් ශාක වල ද අනවශ්‍ය අතු කපා ඉවත් කර එම ගස් හැඩගස්සවා ගන්න.
- මෙසේ ඉවත් කරන ශාකමය අපද්‍රව්‍ය පුළුස්සා විනාශ නොකර බෝග වගා කළ නොහැකි ස්ථානයක කොම්පෝස්ට් පොහොර ගොඩක් සෑදීම සඳහා යොදා ගන්න.
- එමෙන්ම ගෙවත්තේ ඇති දිරාපත් නොවන ගල්, බොරළු, ප්ලාස්ටික්, කොන්ක්‍රීට් කැට හා වීදුරු වැනි දේ ඉඩමෙන් ඉවත් කරන්න.

## 4.3 ගෙවත්තේ පාංශු හා ජල සංරක්ෂණය දියුණු කිරීම

- ගෙවතු වගාව සාර්ථක කර ගැනීමට නම් එහි බෝග වර්ධනයට අවශ්‍ය හොඳ පසක්, පසේ ප්‍රශස්ත තෙතමනයක් සහ උසස් ජලවහන තත්ත්වයක් තිබිය යුතුය.
- මේ හෙයින් ගෙවත්තේ වැට මායිම් සකසා භූමියේ අනවශ්‍ය ශාක සහ අපද්‍රව්‍ය ඉවත් කර ගැනීමෙන් පසුව ගෙවත්තේ පස හා ජලය (තෙතමනය) සංරක්ෂණයට පියවර ගන්න. එමෙන්ම ජල වහනය දියුණු කිරීම පිළිබඳව ද ඔබගේ අවධානය යොමු කිරීම ඉතා වැදගත් වෙයි.
- බෝග වර්ධනයට හිතකර සරු, මතුපිට පසක් ගෙවත්තේ ඇත්නම් එය වඩාත් හොඳ ලක්ෂණයකි. එහෙත් ගෙවත්තේ පස සෝදා පාලුවට ලක් වුවහොත් පෝෂක රඳවා ගන්නා මතුපිට සරු පස ඉවත් වී නිසරු පසක් ඉතිරි වෙයි. එහෙයින් ගෙවත්තේ පවතින පස ආරක්ෂා කර ගැනීමටත්, පසේ ප්‍රශස්ත තෙතමනය පවත්වා ගැනීමටත්, ගෙවත්ත සඳහා සුදුසු පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම යෙදීම අවශ්‍ය වේ.
- ගෙවත්තට සුදුසු පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම භාවිතය තුළින් වාසි රැසක් ලබා ගැනීමට හැකිවේ.
  - ගෙවත්තේ පස ආරක්ෂා කරගැනීම මඟින් බෝගය වර්ධනයට අවශ්‍ය පාංශු පෝෂක හොඳින් ලැබෙයි.
  - බෝගයන්ගේ මූල මණ්ඩලය හොඳින් වර්ධනය වෙයි. ඔබ යොදන පොහොර අපතේ නොයා ගෙවත්ත තුළම රැඳෙයි.
  - පසේ තෙතමනය හොඳින් ආරක්ෂා වෙයි. එලෙස පස තුළ තෙතමනය ආරක්ෂා වීමෙන් බීජ ප්‍රරෝහණය හොඳින් සිදුවෙයි.
  - ශාක මුල් වර්ධනය වී ශාකවලට පෝෂක අවශෝෂණය හොඳින් සිදුවෙයි.
  - පත්‍ර හා මල් හැලී යාම වැළකෙයි. එමෙන්ම ශාකය නීරෝගී වීමෙන් රෝග හා පළිබෝධ හානි අවම වෙයි.
  - අවසානයේ ඔබට හොඳ අස්වැන්නක් ලැබෙයි.
- ගෙවත්තට සුදුසු පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම යෙදීමේ දී ඒවා භූමි අලංකරණ නිර්මාණවලට

ද ගැළපෙන ලෙස සිදු කිරීම මගින් ගෙවත්ත වඩාත් සිත් ඇද ගන්නා තැනක් බවට පත් කළ හැක.

- භූමියේ බෑවුම, පසේ ස්වභාවය, ආවරණ ශාක හා අප වගා කිරීමට බලාපොරොත්තු වන බෝග වර්ග අනුව අදාළ පාංශු සංරක්ෂණ ක්‍රමය තීරණය කරන්න.
- භූමියේ බෑවුම අධික වූ විට පාංශු ඛාදනය වේගවත් වන බැවින් පාංශු සංරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු කළ යුතුය.
- වැලි අධික පසක් නම් පාංශු හා ජල සංරක්ෂණය සඳහා වැඩි කැපවීමක් අවශ්‍ය වෙයි.
- භූමිය ශාකවලින් ආවරණය වී පවතී නම් පාංශු හා ජල සංරක්ෂණය හොඳින් සිදුවෙයි.
- පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම යෙදීමේ දී ප්‍රධාන වශයෙන් අවධාරණය කරනුයේ
    - වැසි බිංදු නිරාවරණය වූ පස මතුපිට කෙලින්ම පතිතවීම වැළැක්වීම
    - ජලය පොළොව/පස මතුපිටින් ගලාගෙන යන වේගය හා දුර අඩු කිරීම
    - පස මතුපිටින් ගලාගෙන යන ජලය ප්‍රමාණය අඩුකිරීම
    - ජලය පස තුළට කාන්දුවීම වැඩිකිරීම
    - ඉඩමේ බෑවුම වෙනස්කරලීම/අඩුකරලීම

**ගෙවත්තට සුදුසු පාංශු සංරක්ෂණ ක්‍රම**

*පස් වැටි*

- වර්ෂාපතනය අඩු ප්‍රදේශ වල අඩු බෑවුමක් සහිත ගෙවතු වලට වඩාත් සුදුසු වේ. මෙමගින් පස මතුපිටින් ගලන වැසි ජලයේ වේගය දුර සහ ප්‍රමාණය අඩුකර පස තුළට ජලය කාන්දුවීම වැඩි කරයි. පොළොව මතුපිට ඇදී යන පස හා රොන් මඩ රඳවා ගැනීමට සමත් වේ.




*වැටි යෙදූ බිමක සිරස්කඩක්*



*වගා බිමකට වැටි යෙදූ අවස්ථාවක්*

- පස් වැටියට ඉහළින් සපත්තු කාණුවක් යෙදීම හා පස් වැටිය මත තෘණ ආවරණයක් යෙදීම මගින් පස් වැටිය නඩත්තු කිරීම හොඳින් සිදුවේ. තවද පස් වැටිය මත උසට නොවැඩෙන ශාක වර්ග වගා කිරීමෙන් ද පස් වැටිය සුරක්ෂිතව පවත්වාගෙන යා හැකිය. උදා : දෙහි, ලෙමනයින් වැනි ශාක

*කුට්ටි කාණු*

- සුළු බෑවුම් සහ මධ්‍යස්ථ බෑවුම් සහිත ගෙවතු සඳහා සුදුසුය.
- මෙමගින් පස මතුපිටින් ගලන වැසි ජලයේ දුර සහ වේගය අඩු කිරීමත් වැඩි ජල ප්‍රමාණයක් පස තුළට කාන්දු වීමටත් සලස්වයි. මතුපිටින් ගලා යන ජලය ක්‍රමානුකූලව ඉඩමෙන් ඉවත් කිරීමට සලස්වයි.
- කාණුව සැකසීමේ දී ඉවත් කරන පස් පහළට දැමීමත්, කාණුව උඩ පැත්තට සෙ.මී. 15 දුරින්

සැවැන්දරා හෝ පඳුරු තෘණ වර්ග වැටියක් ලෙස යෙදීමත් අවශ්‍ය වේ.




කුට්ටි කාණු යෙදූ බිමක සිරස්කඩ



කුට්ටි කාණු යෙදූ බිමක්

- සෑම වැසි කාළයකටම පසුව කාණුවේ එකතු වන පස් උඩ පැත්තට දමා කාණුව යථාවත් කරන්න.

### ගල් වැටි

- වැඩි බෑවුමක් තුළ පිහිටි ගෙවතු සඳහා සුදුසුය.
- මෙමගින් පස මතුපිටින් ජලය ගලා යන දුර සහ වේගය අඩුකර පස තුළට ජලය කාන්දුවීම වැඩි කරයි. මෙම පාංශු සංරක්ෂණ ක්‍රමය ස්ථිරව සකස් වන ව්‍යුහයක් වන අතර මේ සඳහා වැඩි මුදල් ප්‍රමාණයක් හා සකස් කිරීමට වැඩි ශ්‍රමයක් අවශ්‍ය වේ.




ගල් වැටි යෙදූ බිමක සිරස්කඩ



වගා බිමකට වැටි යෙදූ අවස්ථාවක්

### සෝල්ට්/SALT වැටි (Sloping Agricultural Land Technology)

- මධ්‍යස්ථ හා තද බෑවුමක් සහිත ගෙවතු සඳහා සුදුසුය.
- පොළොව මතුපිටින් ගලා යන වැසි ජලයේ වේගය අඩු කිරීම සහ දුර අඩු කිරීම මඟින් පාංශු ඛාදනය අඩු කරයි. වැඩි ජල ප්‍රමාණයක් පොළොවට කාන්දු වීමට සලස්වයි. වැටිවල වගා කරන ශාක කප්පාදු කිරීම මඟින් එකතුවන කොටස් වැටි අතර තැන්පත් කිරීම නිසා පසේ තෙතමනය ආරක්ෂා වීමත් පසේ සාරවත් භාවය වැඩිවීමත් සිදුවේ.
- රූපයේ ආකාරයට බෑවුමේ හරස් අතට ඉක්මනින් පැළවෙන හා ගෙවත්තට ප්‍රයෝජනවත් (ග්ලිරිසීඩියා වැනි) බෝග පේළි 02 ක් අඩි $1\,^{1}/_{2}$ පරතරයකින් සිටුවා ඒවා මැදට බෝග අවශේෂ යොදා ජීව වැටියක් නිර්මාණය කරයි.




SALT වැටි සඳහා ග්ලිරිසීඩියා කෝටු සිටුවීම



SALT වැටියක ආරම්භක අවස්ථාවක්

පස් වැටි, ගල් වැටි, කුට්ටි කාණු, සෝල්ට් (SALT) වැටි යන ක්‍රම භාවිතා කිරීමේ දී එම වැටි අතර පරතරය භූමියේ බෑවුමේ ස්වභාවය අනුව අඩු වැඩි කිරීම අවශ්‍ය වේ.

### තනි වේදිකා

- බෑවුම් සහිත හා අක්‍රමවත් මතුපිටක් ඇති ගෙවතු වලට භාවිතා කළ හැක.
- පාංශු ඛාදනය අවම කරන අතරම තද නියං කාලවල දී නියඟයේ බලපෑමෙන් බහු වාර්ෂික බෝග ආරක්ෂා කර දීමට ද මෙම ක්‍රමය සමත් වේ.






ගෙවත්තකට තනි වේදිකා ක්‍රමය භාවිතා කිරීම

### හෙල්මළු

- අධික බෑවුම් ප්‍රදේශවල ගෙවත්ත සැකසීමේ දී පළමුව හෙල්මළු ආකාරයට භූමිය සකස් කර පසුව බෝග සංස්ථාපනය කර ගැනීම අවශ්‍ය වෙයි.
- පොළොව මතුපිටින් ගලා යන ජලයේ වේගය සහ දුර අඩු කර වැඩි ජල ප්‍රමාණයක් පස තුළට කාන්දු වීමට සලස්වයි. එමෙන්ම වර්ෂාවෙන් පසුව ඇති වන පිටාර ජලය ආරක්ෂාකාරී ලෙස ගෙවත්තෙන් බැහැර කරයි.
- හෙල්මළු සැකසීම මගින් ගෙවත්තේ බෝග පාලනයට වඩාත් පහසු වන මතුපිටක් සහිත බිමක් ඇති කරයි.




හෙල්මළු සැකසීම



හෙල්මළු යෙදවූ වගා බිමක්

### වසුන් යෙදීම

- ගෙවත්ත සඳහා වඩාත් පහසුවෙන් යෙදිය හැකි පාංශු හා ජල සංරක්ෂණ ක්‍රමයක් ලෙස හැඳින්විය හැක.

- පස ආරක්ෂා කර ගැනීම සඳහා ජීවී හෝ අජීවී වසුන් භාවිතා කළ හැකි වුවත් ගෙවත්ත සඳහා වඩාත්ම සුදුසු අජීවී වසුන්ය. බෝග අවශේෂ, අමු කොළ, වියළි කොළ, බීජ රහිත වල් පැළෑටි ආදිය අජීවී වසුන් සඳහා භාවිතා කරන්න පුළුවන්.
- වසුන් මඟින් වැසි ජලය කෙළින්ම පස සමඟ ගැටීම වළකින බැවින් හා පස මතුපිටින් ගලා යන ජල ප්‍රමාණය අඩු කර වසුන උඩින් ජලය ගලාගෙන යන නිසා පසට හානි සිදුවන්නේ නැහැ.
- වසුන යෙදීම නිසා පසට ජලය හොඳින් උරා ගන්නවා. වියළි දිනවල දී තද සූර්යාලෝකයෙන් පස ආරක්ෂා කර තෙතමනය රඳවා ගන්නවා. මීට අමතරව තවත් වාසි රැසක් ගෙවත්තට ලැබෙනවා.
  - එමඟින් වල් පැළ පැලවීම පාලනය කරයි.
  - පාංශු ජීවීන්ගේ සංඛ්‍යාව වැඩි කරයි.
  - දිරාපත් වීමෙන් පසට පෝෂක එකතු කරයි. සිටුවන බීජ ආදිය පක්ෂීන්ගෙන් ආරක්ෂා කරයි.
  - අවසානයේ දී බෝග පැළෑටි වර්ධනයට අවශ්‍ය ස්වභාවික පාංශු පරිසරයක් බිහිකරයි.



වසුන් යෙදූ බටු වගාවක්

## 4.4 බිම් සකස් කිරීම හා ක්ෂේත්‍ර සංස්ථාපනය

- ගෙවත්තක් යනු කුඩා වගා වපසරියක් නිසා බිම් සැකසීමට විශාල යන්ත්‍ර සූත්‍ර භාවිතා නොකරයි.
- පස හා තෙතමනය ආරක්ෂා කර ගැනීම සඳහා ගෙවතු වගාවක දී අවම බිම් සැකසීම සුදුසු වෙයි.
- පාත්ති සකසන ස්ථානවල සහ පැළ සිටුවන ස්ථානවල පමණක් පස බුරුල් කිරීම සුදුසුය. අවශ්‍ය ස්ථානවල පස බුරුල් කිරීමෙන් පසුව කොළ පොහොර, ගොම පොහොර, කොම්පෝස්ට් පොහොර වැනි කාබනික පොහොරක් හොඳින් පස සමඟ කළවම් කිරීම අත්‍යාවශ්‍ය වේ. එලෙසම කාබනික පොහොර භාවිතය මඟින් වාසි රැසක් ලබා ගත හැකි වේ.
  - එමඟින් පසට යොදන ශාක පෝෂක හා ජලය හොඳින් අවශෝෂණය කර ගනියි. පස බුරුල්ව තබාගන්නා අතරම පැළෑටිවල මූල මණ්ඩල කලාපයේ වාතනය ද හොඳින් සිදු කරයි.
  - පසට හොඳින් කාබනික පොහොර යෙදීමෙන් ගෙවතු වගාවේ දී ජල සම්පාදනයට සහ පොහොර යෙදීමට වැයවන මුදල ද අවම කර ගත හැක.
- ගෙවතු වගාවක දී බෝග ක්ෂේත්‍රයේ පිහිටුවන ආකාරය පදනම් කරගෙන බිම් සකස් කිරීමේ ක්‍රමය වෙනස් කළ යුතුව ඇත. එනම්
  - i. ගෙවතු බිමේ පාත්ති සකස් කර බෝග පිහිටුවීම.

ii. ගෙවත්තේ සකස් කරනු ලබන වලවල්වල බෝග පිහිටුවීම.

iii. බඳුන්වල බෝග පිහිටුවීම.

**ගෙවතු බිමේ පාත්ති සකස් කර බෝග පිහිටුවීමේ ක්‍රමය**

- පාත්ති සැකසීම බොහෝවිට අවශ්‍ය වන්නේ බොහොමයක් එළවළු බෝග ඇතුළු වාර්ෂික බෝග සඳහා සහ කොළ එළවළු බෝග සඳහාය.
- ගෙවතු වගාවේ දී ආකාර 02 කට පාත්ති සකස් කරනු ලබන අතර වර්ෂාව, ජලය සුලබතාවය, ජල වහනය හා යොදන බෝග වර්ග අනුව යොදන පාත්ති වර්ග තීරණය කළ හැක. උදා: උස් පාත්ති ක්‍රමය හා ගිල්වූ පාත්ති ක්‍රමය

*උස් වූ පාත්ති ක්‍රමය*

- වර්ෂාව වැඩි ප්‍රදේශවල වාර්ෂික බෝග වගා කිරීමේ දී උස් පාත්ති සකසා ගන්න. මෙමඟින් පසේ ජල වහනය හොඳින් සිදුවෙයි.
- එමෙන්ම භූමියේ ජලවහනය දුර්වල නම් උස් පාත්ති භාවිතා කිරීම සුදුසුය. එලෙසම අවශ්‍ය වන අවස්ථාවක දී පාත්ති වටා කාණුවල ගැඹුර වැඩි කළ විට ද තවදුරටත් ජල වහනය උසස් කළ හැක.



*උස් තවාන් පාත්ති සැකසීම*

- උස් පාත්තිවල කොළ එළවළු බෝග, ලූණු, අර්තාපල්, මිරිස්, බීට්, රාබු, නෝකෝල්, කැරට්, ගෝවා වැනි බෝග වගා කරගත හැකියි.
- සාමාන්‍ය පාත්තියක් අඩි 2 $^{1}/_{2}$ - 3 පමණ පළලට ද අඟල් 8 - 10 උසට ද සකසා ගන්න. පාත්තියේ දිග භූමියේ ඉඩ ප්‍රමාණය අනුව සකසා ගන්න.

*ගිල්වූ පාත්ති ක්‍රමය*

- ජල හිඟතාවක් ඇති ප්‍රදේශවලට පමණක් ගිල්වූ පාත්ති සුදුසු වෙයි.
- ගිල්වූ පාත්ති සැකසීමේ දී මූලික අරමුණ වනුයේ ජලය රඳවා ගැනීමයි. එහෙත් අධික වර්ෂාවක් ඇති වූ අවස්ථාවල දී ජලවහනය (වැඩිපුර ඇති ජලය බැස්සවීම) ඉක්මනින් සිදුවීම සඳහා ගත යුතු විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව අවධානය යොමු කර ඒ සඳහා විධිමත් විසඳුම් ක්‍රියාමාර්ග වගාව ඇරඹීමට පෙර සැලසුම් කර තිබිය යුතුය.



*ගිල්වූ පාත්ති*

- ගිල්වූ පාත්තියක පළල අඩි 3 ක් පමණ ද පාත්තියේ වැටියේ උස අඟල් 4 - 6 පමණ ද වන සේ සකසා ගන්න.

උස් වූ පාත්ති හෝ ගිල්වූ පාත්ති සකසා ගැනීමේ දී වර්ග මීටරයක් සඳහා හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර කිලෝ 4-5 පමණ දමා හොඳින් පසට මිශ්‍ර කරන්න.

**ගෙවත්තේ සකස් කරනු ලබන වලවල්වල බෝග පිහිටුවීමේ ක්‍රමය**

- කුඩා ගෙවත්තක ඉඩකඩ සීමිත බැවින් පාත්ති සැකසීම වෙනුවට භූමියේ බීජ හෝ පැළ හෝ රෝපණ ද්‍රව්‍ය කෙළින්ම සිටුවීම වඩාත් සුදුසු වේ.
- ජලවහනය සතුටුදායක කුඩා ප්‍රමාණයේ ගෙවතු සඳහා පාත්ති සෑදීමක් නොකර අවශ්‍ය ස්ථාන වල පමණක් පස බුරුල් කර කාබනික ද්‍රව්‍ය හොඳින් මිශ්‍රකර බෝග සිටුවීමට සකස් කර ගැනීම මෙහි දී සිදු කරයි.
- බෝග ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා අවශ්‍ය ස්ථාන සලකුණු කරගෙන වලවල් සකස් කර ගැනීම කළ හැක. මෙම ක්‍රමයේ දී වලක ප්‍රමාණය බෝග වර්ග අනුව වෙනස් වේ.
  - කෙටි කාලීන බෝග සඳහා සෙ.මී. 30 x 30 x 30 (අඩි 1x1x1) ප්‍රමාණයේ වලක්
  - බහුවාර්ෂික බෝග සඳහා සෙ.මී. 60 x 60 x 60 (අඩි 2x2x2) ප්‍රමාණයේ වලක්
- වළ හෑරීමේ දී ලැබෙන මතුපිට පස සමඟ හොඳින් සැකසූ කාබනික පොහොර/ ගොම පොහොර 1:1 අනුපාතයට මිශ්‍රකර වල පුරවා ගැනීම කළ හැක. එම වලෙහි බීජ හෝ පැළ හෝ රෝපණ ද්‍රව්‍ය සිටුවීමට පෙර පසේ ප්‍රශස්ත තෙතමනය පවත්වා ගැනීමට කටයුතු කර සිටුවීම කරන්නේ නම් වඩාත් සුදුසුය.

**බඳුන් වල බෝග පිහිටුවීමේ ක්‍රමය**

- ගෙවතු වගාවක දී පාත්තිවල වගා කිරීම, කෙළින්ම භූමියේ වලවල් සාදා පැළ සිටුවීමට අමතරව බඳුන්වල වගා කිරීම ද කළ හැකිය.
- භූමියේ වගා කිරීම කළ නොහැකි ස්වභාවික පාෂාණ සහිත ස්ථාන, කොන්ක්‍රීට් ඇතිරූ භූමි, බැල්කනි ආදියෙහි බඳුන්ගත වගාව සිදු කළ හැකිය.
- මේ සඳහා සිමෙන්ති, ප්ලාස්ටික්, මැටි, පොලිතින් බෑග් ආදී බඳුන් සුදුසු වෙයි.
- කුමන ආකාරයක බඳුනක් භාවිතා කළ ද එහි ජලවහනය වීම සඳහා ක්‍රමවේදයක් සැකසීම ඉතා වැදගත්ය.
- බඳුන්වල වගා කිරීමේ දී වැලි කොම්පෝස්ට් පොහොර, එකට එක හොඳින් මිශ්‍ර කර බඳුන පුරවා ගැනීමෙන් සාර්ථක බෝග වගාවක් ලැබෙයි.



බඳුන්ගත වගාවක්

## 4.5 ගෙවත්තේ විවිධ බෝග වර්ග සිටුවීම

- ගෙවත්ත සඳහා භූමිය සකස් කර ගත් පසු අපගේ ඊළඟ පියවර වන්නේ කලින් තෝරාගත් විවිධ ආකාරයේ බෝග භූමියේ සිටුවීමයි.
- ගෙවත්තක් යනු එක බෝග වගාවක් නොව බෝග රාශියකින් සමන්විත වූ පරිසර පද්ධතියක් වන බැවින් එහි එළවළු, අල බෝග, පලතුරු, කොළ එළවළු, ඖෂධ බෝග වැනි ගෙදරට අවශ්‍ය සියලුම ශාක වර්ග වගා කරනු ලබයි.
- මෙහිදී බෝග අතර පරතරය නිර්දේශිත ප්‍රමාණයම වීම අත්‍යවශ්‍ය නැත. එක් බෝග වියනක් යට තවත් බෝග උස වෙනස් කරමින් භාවිතා කිරීමත්, බහු වාර්ෂික ශාක වලට වැල් අල වැනි බෝග යැවීම වැනි උපක්‍රමත් ගෙවත්ත තුළ භාවිතා කළ හැක.
- ගෙවත්තේ බෝග ස්ථාපනය කිරීමේ දී, තවාන් මගින් සකසා ගත් බීජ පැළ ද, අතු කැබලි, බද්ධ පැළ හා අතු බැඳීමෙන් ලබාගත් පැළ ද සිටුවීම කළ හැක. මීට අමතරව සෘජුවම බීජ ගෙවතු බිමේ සිටුවීම ද සිදු කළ හැක.
- ඔබ තෝරා ගන්නා බෝග අනුව සිටුවීමට වඩාත් සුදුසු වන්නේ බීජ හෝ බීජ පැළ හෝ රෝපණ ද්‍රව්‍ය යන ආකාරවලින් කුමක්ද යන්න තීරණය කර සුදුසු ආකාරය තෝරා ගන්න.

**පලතුරු සහ වෙනත් බහු වාර්ෂික බෝග ගෙවත්තේ පැළ ලෙස සිටුවීම**

- අඹ, දොඩම්, කොස්, පේර, දෙළුම් වැනි පලතුරු බෝග ද කරාබු නැටි, සාදික්කා, ගම්මිරිස්, වැනිලා වැනි කුළුබඩු බෝග ද ක්ෂේත්‍රයේ සිටුවීමේ දී හැකි සෑම අවස්ථාවකදීම බඳුන්ගත බද්ධ පැළ සිටුවා ගන්න.
- බද්ධ කිරීමට අවශ්‍ය නොවන බෝගවල බඳුන්ගත අතු පැළ හෝ බීජ පැළ සිටුවීම සඳහා ගන්න.
- මෙම බෝග සිටුවීමේ දී කලින් සූදානම් කරගත් භූමියේ සැළසුම් කරගත් ස්ථානවල සෙ.මී. 60 x 60 x 60 (අඩි 2 x 2x 2) ප්‍රමාණයේ වලවල් සෑදිය යුතුය. වලවල් සෑදීමේ දී මතුපිට පස් වෙනම ද වල ඇතුළත පස් වෙනම ද ගොඩ ගසා ගැනීම කළ යුතුය.
- වල සෑදීමෙන් අනතුරුව මතුපිට පස් හා හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර 1:1 අනුපාතයෙන් පිහිටි පොළවට මදක් ඉහළට සිටින සේ වල පුරවා ගැනීම සිදු කරන්න.
- පසුව බඳුන්ගත පැළය ගෙන ඉතා පරිස්සමින් එහි පොලිතින් කවරය ඉවත් කර සදාගත් කුහරයේ තැන්පත් කර හොඳින් පස් යොදා තද කරගත යුතුය.



*සිටුවීමට පොලිතීන් කවරය ඉවත් කිරීම*



බඳුන් පැළය සිටුවීම

- වගා බඳුනේ මාධ්‍ය මට්ටම හා වලෙහි මාධ්‍ය මට්ටම හා එක සමාන වීම අත්‍යාවශ්‍යය. පැළය සිටවූ වහාම හොඳින් ජලය සැපයීම සිදු කරන්න.
- වියළි කාලගුණයක් පවතියි නම් වළ වටා ඉතිරිව ඇති මතුපිට පස්වලින් වළල්ලක් ආකාරයට පස් වැටියක් යෙදීමෙන් පැළයට සපයන ජලය ඉවතට යා නොදී හොඳින් සංරක්ෂණය කර ගැනීමට ඉඩ ලබාදෙයි.



සිටුවන ලද පැළය වටා පස් වැටියක් යෙදීම

- අලුතින් පැළ සිටුවීමේ දී වියළි තද හිරු එළිය වැටෙන කාලගුණයක් පවතී නම්, කොළ අතුවලින් දින කීපයක් යන තුරු සෙවන ලබාදීම අවශ්‍ය වේ. පැළය වටා පවතින පස වසුනක් මඟින් ආවරණය කිරීමෙන් ද පසේ තෙතමනය ආරක්ෂා කරගත හැක.



පැළය වටා වසුනක් යෙදීම

## බීජ ලෙස බෝග වර්ග ගෙවත්තේ සිටුවීම

- බණ්ඩක්කා, වට්ටක්කා, මෑ, පතෝල, වැටකොළු, දඹල, කරවිල වැනි බෝග කෙළින්ම බීජ ලෙස ගෙවත්තේ සිටුවා ගැනීම කළ හැක.
- එම බෝග සිටුවීමේ දී කලින් සැළසුම් කරගත් ස්ථානවල සෙ.මී. 30 x 30 x 30 (අඩි 1x1x1) ප්‍රමාණයේ වලවල් සකස් කර ගන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| බණ්ඩක්කා | 90 x 60 |
| වට්ටක්කා | 250 x 250 |
| මෑ (වැල් ආකාර) | 90 x 30 |
| වැටකොළු | 150 x 100 |
| කරවිල | 150 x 100 |
| දඹල | 75 x 60 |
| පිපිඤ්ඤා | 120 x 90 |

- එම වලවල් මතුපිට පස් හා හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර 1:1 අනුපාතයට මිශ්‍රකර පුරවා ගත් පසු බීජ 2 - 3 අතර ප්‍රමාණයක් එක වලක සිටුවන්න.
- බීජ සිටුවා අවසන් වූ පසු බීජ සිටවූ ස්ථානය හැර ඉතිරි පාත්තිය/භූමිය වියළි කොළ රොඩු, කොළ අතු, බෝග අවශේෂ ආදී අජීවී වසුනක් යොදා පස ආවරණය කරන්න.

- වසුන මගින් පස හා ජලය සංරක්ෂණය මෙන්ම වල් පැළ පාලනයක් ද සිදු වෙයි.

- බීජ හොඳින් ප්‍රරෝහණය වූ පසු සවිමත් එක පැළයක් ඉතිරිකර අනිත් දුර්වල පැළ ඉවත් කරන්න. පතෝල, වැටකොළු, දඹල වැනි බෝග සඳහා ආධාරක සකසන්න.

**බීජ තවාන් කර ලබා ගත් පැළ ගෙවත්තේ සිටුවීම**

- මිරිස්, මාළුමිරිස්, තක්කාලි, වම්බටු, එළබටු වැනි තවාන්කර පැළ ලබාගන්නා එළවළු පැළ උස් පාත්තිවල කලින් සැළසුම් කරගන්නා ලද ස්ථානවල සිටුවන්න.



මාළු මිරිස් වගාවක්

- පැළ සිටුවීමේ දී සෙ.මී 30x30x30 (අඩි 1x1x1) ප්‍රමාණයේ වලවල් සකසා ගෙන, කොම්පෝස්ට් පොහොර හා මතුපිට පස් මිශ්‍රණය වළවල් වලට යොදා ඒ මත එක් ස්ථානයක එක පැළය බැගින් සිටුවයි.

- හොඳින් ජලවහනය වන ගෙවත්තක නම් පාත්ති සැකසීමෙන් තොරව කෙළින්ම ක්ෂේත්‍රයේ වලවල් සකස් කර පැළ සිටුවීම සිදු කරන්න.

- පැළ සිටුවා අවසන් වූ පසු හොඳින් ජලය යොදන්න. එමෙන්ම වියළි තද හිරු එළිය වැටෙන කාළගුණයක් පවතී නම් කොළ අතුවලින් අළුත් පැළ දින කීපයක් යන තුරු සෙවණ කරන්න.

- පැළ සිටුවා අවසන් වූ පසු එම පාත්තිය/ භූමිය වියළි කොළ රොඩු, කොළ අතු, බෝග අවශේෂ ආදී අජීවී වසුනක් යොදා පස ආවරණය කරන්න. එමගින් පස හා ජලය ආරක්ෂා කර ගත හැකි අතර වල් පැළ පාලනයක් ද සිදු වෙයි.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| මිරිස් | 60 x 45 |
| තක්කාලි | 80 x 50 |
| වම්බටු | 90 x 90 |
| එළබටු | 90 x 90 |
| මාළුමිරිස් | 40 x 40 |

- බීට්, ගෝවා, ලීක්ස් වැනි එළවළු බෝග සිටුවීමේ දී තවාන් මඟින් සකසා ගත් පැළ පාත්තිවල හෝ සැළසුම් කර ගත් ස්ථානවල සිටුවීම සිදු කරන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| බීට් | 30 x 10 |
| ගෝවා | 50 x 40 |
| ලීක්ස් | 15 x 10 |

- පැළ සිටුවීමේ දී ඉතා පරිස්සමින් තවානෙන් ගලවා ගැනීම ද පැළ සිටුවූ පසු හොඳින් ජලය යොදා සෙවණ කිරීම ද සිදු කරන්න.

**ගෙවත්තේ සකස් කළ පාත්තිවල සෘජුවම බීජ හා රෝපණ ද්‍රව්‍ය සිටුවීම**

- රාබු, කැරට් වැනි බෝග සිටුවීමේ දී සෙ.මී. 90-100 ක් පළල පාත්ති සකසා ගන්න.

- පාත්ති සකසා ගැනීමේ දී වර්ග මීටරයක් සඳහා හොඳින් සැකසූ කොම්පෝස්ට්

පොහොර කිලෝ 4-5 පමණ දමා හොඳින් පසට මිශ්‍ර කරන්න.

- පාත්තියේ සෙ.මී. 25 පරතරයට කෝටුවකින් කුඩා ඇලියක් සකසා එහි බීජ තැන්පත් කර මතුපිට පස් වලින් වසන්න. බීජ පැළවී සති 2-3 න් වැඩි පැළ උදුරා දමන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| රාබු | 30 x 10 |
| කැරට් | 30 x 5 |

**කොළ එළවළු ක්ෂේත්‍රයේ සිටුවීම**

- හොඳින් බිම පෙරළා සකසා ගත් පාත්තිවල ගොටුකොළ, මුකුණුවැන්න, කංකුං වැනි කොළ එළවළු බෝග වගා කරන්න.
- පාත්ති සකසා ගැනීමේ දී මීටරයක් පළලකින් යුතු පාත්ති ඉතා සුදුසු වෙයි. කංකුං සඳහා පමණක් ගිල්වූ පාත්ති සකසන්න.
- පාත්ති සකස් කිරීමේ දී වර්ග මීටරයකට හොඳින් සැකසූ කොම්පෝස්ට් කිලෝ 6 ක් හෝ දිරාපත් වූ කුකුල් පොහොර කිලෝ 06 ක් පමණ එකතු කර පස සමග මිශ්‍ර කරන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| මුකුණුවැන්න | 20 x 10 |
| ගොටුකොළ | 20 x 20 |

**මුකුණුවැන්න**

- මුකුණුවැන්න සෙ.මී. 10-12 ප්‍රමාණයේ දඬු කැබලි සිටුවන්න. දඬු කැබලි සිටවූ පසු ජලය යොදා සෙවණ කරන්න.

**කංකුං**

- සෙ.මී 20-30 ප්‍රමාණයේ දඬු කැබලි කලින් සකසා ගත් පාත්තිවල සිටුවන්න. වෙළඳපොලේ ඇති බීජ මගින් ද කංකුං පැළ කර ගත හැකිය.

***නිවිති/ සාරණ/තම්පලා***

- සකසා ගත් පාත්තිවල බීජ පේළියට යොදා පසුව පරතරයට පැළ තුනී කරන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| නිවිති | 45 x 45 |
| සාරණ | 20 x 20 |
| තම්පලා (පැළ තුනී කිරීම) | 15 x15 |
| කංකුං | 30 x 30 |

## 4.6 අල බෝග වගා කිරීම

- වැල් අල, මඤ්ඤොක්කා, කිරි අල වර්ග වැනි කාණ්ඩ කීපයක අල බෝග ගෙවත්තේ සිටුවා ගැනීමෙන් හොඳ බෝග විවිධත්වයක් ලබාගත හැකිය.

***වැල් අල ක්ෂේත්‍රයේ සිටුවීම***

- වැල් අල ක්ෂේත්‍රයේ සිටුවීමේ දී කලින් සැළසුම්කරගත් ස්ථානවල සෙ.මී. 45 x 45 x 45 (අඩි $1\,^1/_2$ x$1\,^1/_2$ x$1\,^1/_2$) ප්‍රමාණයේ වලවල් සකසා වලේ පතුළට දිරාගිය පොල්ලෙලි කැබලි හෝ කොළරොඩු තට්ටුවක් දමන්න.
- පසුව හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර සහ මතුපිට පස් මිශ්‍රකර පොළව මට්ටමෙන් සෙ.මී. 10 පමණ ඉහළට සිටින සේ වල පුරවන්න.
- මෙසේ සකසාගත් වලෙහි මතුපිට සිට සෙ.මී. 10 පමණ ගැඹුරින් බීජ අල තැන්පත් කරන්න.
- පසුව ග්ලිරිසීඩියා වැනි කොළ පොහොර භාවිතා කර වසුනක් යොදන්න. සිටුවාගත් බීජ අල පැළ වන විට ලණු මගින් හෝ ඉපල් මගින් වැල ඉහළ ගසකට යොමු කරන්න.

### මඤ්ඤොක්කා ක්ෂේත්‍රයේ සිටුවීම

- කලින් සැලසුම් කරගත් ස්ථානවල සෙ.මී. 30 x 30 x 30 (අඩි 1 x 1 x 1 ) ප්‍රමාණයේ වලවල් සකසා මතුපිට පස් සහ හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර මිශ්‍රකර පොළව මට්ටමින් සෙ.මී. 15 ක් පමණ උසට සිටින සේ වලවල් පුරවන්න.
- මෙසේ පුරවාගත් වලක සෙ.මී. 15 ක් පමණ දිග මේරූ දඬු කැබැල්ල සිරස් අතට තරමක් ආනතව සිටුවන්න.



මඤ්ඤොක්කා වගාවක්

### කිරිඅල

- කලින් සැලසුම් කරගත් ස්ථානවල සෙ.මී. 30 x 30 x 30 (අඩි 1 x 1 x 1 ) ප්‍රමාණයේ වලවල් සකසා අඩියට දිරූ පොල්ලෙලි හෝ කොළරොඩු තට්ටුවක් දමන්න.
- මෙම වලට හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර සහ මතුපිට පස් මිශ්‍රකර දමා වල පුරවාගන්න.
- මෙසේ පුරවාගත් වලෙහි කිරි අල පැළ හෝ පෙර වගාවේ මවි අල කැබලි සෙ.මී. 4 වන සේ සකසා ගෙන සෙ.මී. 5 ක් පමණ ගැඹුරින් සිටුවන්න.

### බතල

- බතල සිටුවීම සඳහා උදළු මුල්ලුවක් ආධාරයෙන් හෝ පස පෙරලන යන්ත්‍රයකින් අඟල් 8 - 10 පමණ පස හොඳින් පෙරළා කැට පොඩි කර ගන්න.
- පසුව වර්ග මීටරයකට හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර කිලෝ 4-5 පමණ මිශ්‍රකර සෙ.මී. 20 ක් පමණ උස වැටි සහ ඇලි සකසා ගන්න. එම වැටිවල බතල දඬු සිටුවා ගන්න.

| බෝගය | පරතරය (සෙ.මී.) |
|---|---|
| මඤ්ඤොක්කා | 90 x 90 |
| වැල් අල | 100 x 100 |
| කිරි අල | 100 x 100 |

## 4.7 කුළුබඩු, ඖෂධීය, දැව ශාක වගා කිරීම

### කුළුබඩු බෝග

- ආහාර පිළියෙල කිරීමේ දී ඒවායේ රසය, ගුණය හා සුවඳ ඇති කිරීම සඳහා ගම්මිරිස්, රම්පේ, කරපිංච, සේර, කහ, ඉඟුරු, කුරුඳු, එනසාල්, කරාබු සහ වැනිලා ආදී කුළු බඩු බෝග උපයෝගී කර ගැනේ.
- එනසාල් සහ කරාබු සෑම ප්‍රදේශයකම වගා කිරීම අපහසු වුවත් අනෙක් කුළුබඩු බෝග සෑම ගෙවත්තකම පහසුවෙන් වගා කර ගත හැකි වේ. ගෙවත්තක මේවා එක් ශාකය බැගින් වගා කර ගැනීම සෑහේ. කහ සහ ඉඟුරු ගෙවත්තේ සෙවණ සහිත ස්ථානවල සිටුවිය හැකිය. (අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් කුළුබඩු බෝග වගා කිරීම පිළිබඳ ප්‍රකාශන නිකුත් කර ඇත).

**ඖෂධීය බෝග**

- එදිනෙදා ප්‍රයෝජනවත් වන කෝමාරිකා, හාතාවාරිය, පාවට්ටා, රසකිඳ, පොල්පලා, කුප්පමේනිය ආදී ඖෂධීය බෝග ගෙවත්තේ සුදුසු ස්ථානවල රෝපණය කර ගැනීම ප්‍රයෝජනවත් වේ. හාතාවාරිය, එළ ඔළිඳ, පොල්පලා, පෙනෙල ආදී ශාක වර්ග උපයෝගී කොට සාදා ගන්නා කැඳ වර්ගවල ඉතා ඉහළ ඖෂධීය වටිනාකමක් තිබේ. (ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් ඖෂධීය බෝග වගා කිරීම පිළිබඳ ප්‍රකාශන නිකුත් කර ඇත).

**දැව ශාක**

- ගෙවත්තේ වැට මායිමේ කොස්, හල්මිල්ල, තේක්ක, මැහෝගනී ආදී දැවමය වටිනාකමක් ඇති ශාක සිටුවීම අනාගතය සඳහා කළ හැකි ඉතාමත් වටිනා ආයෝජනයකි. වසර 25-30 ක කාලයක් වර්ධනය වීමෙන් පසු ඒවා ඔබේ අනාගත පරම්පරාවට දයාදයක් වනු ඇත.
- දැව ශාක වගා කොට ඒවායේ කඳ කෙළින් වැඩෙන සේ පුහුණු කිරීම වැදගත් වේ. මේ සඳහා කඳේ හට ගන්නා අතු කුඩා අවධියේ සිටම ක්‍රමානුකූලව කප්පාදු කළ යුතුය. ගම්මිරිස්, බුලත්, අල වැල් හා වෙනත් ප්‍රයෝජනවත් වැල් වර්ග යැවීම සඳහා ආධාරක ලෙස ද දැව ශාක පාවිච්චි කළ හැකිවේ.
- ග්ලිරිසීඩියා එදිනෙදා සියළු සරල වැඩට ද, දඹල හා බෝංචි ආදී වැල් වර්ග සඳහා ආධාරක වශයෙන් ද, සත්ත්ව ආහාරයක් වශයෙන් ද උපයෝගී කර ගත හැකි වටිනා ශාකයකි. වැට, පලතුරු පැළ හා දැව ශාක කප්පාදු කිරීමෙන් ලැබෙන දැව මුළුතැන්ගෙයි ඉන්ධන දැව අවශ්‍යතාවය සපුරාලීම සඳහා යොදා ගත හැකිවේ.

## 4.8 සත්ත්ව පාලනය

- මූල්‍ය ප්‍රතිපාදන, ඉඩකඩ හා අමතර කාල වේලාවක් ඇත්නම්, ගෙවත්තෙහි සත්ත්ව පාලන ඒකකයන් පිහිටවා ගැනීම සිදුකළ හැක.
- ගෙවත්තෙන් හා අවටින් සපයාගනු ලබන ශාකමය හා සාන්ද්‍ර ආහාර සත්වයින්ට ලබාදී පවුලේ ප්‍රයෝජනය සඳහා හෝ අමතර අලෙවිය සඳහා සත්ත්ව නිෂ්පාදන ලබාගත හැකිවේ. මෙමගින් පවුලේ සාමාජිකයන්ගේ සත්ත්ව ප්‍රෝටීන අවශ්‍යතාවය සපුරාගැනීමට හැකියාවක් ලැබීම විශේෂයෙන් සඳහන් කළ හැක.
- සතුන්ගේ වසුරු හා මූත්‍රා වෙන වෙනම එකතු කොට ගෙවතු වගාව සඳහා අගනා පොහොරක් ලෙස උපයෝගී කර ගත හැකිවේ.
- සත්ත්ව වසුරු ජීව වායු නිපදවා ගැනීමට හා ඉන් අනතුරුව කාබනික පොහොරක් ලෙස භාවිතා කිරීමට ද යෝග්‍ය වේ. ජීව වායු නිපදවීමෙන් පසු ලබා ගන්නා පොහොර, ජීව වායු උත්පාදකය තුළ වූ දැඩි උණුසුමට ලක් වී ඇති බැවින් ඒවායේ වල් පැළෑටි බීජ අක්‍රිය වී ඇත. එබැවින් බීජ සහිතව වල් පැළෑටි ආහාරයට ගන්නා ගවයින්ගේ ගොම වුවද ජීව වායු ඒකකය හරහා පොහොර බවට පත්කර ගැනීමෙන් ක්ෂේත්‍රයේ වල් පැළ බෝවීම වළක්වා ගත හැකි වේ. ජීව වායු පොහොර සාමාන්‍ය ගොම පොහොරවලට වඩා කාර්යක්ෂම බව පෙනී ගොස් ඇත.

එමගින් පොහොර ලබා ගැනීමට අමතරව ආහාර පිසීම හා ලාම්පු දැල්වීමට අවශ්‍ය වන ගෑස් ද ලබා ගත හැකිවේ. ජීව වායු නිපදවීම තරමක් මිල අධික වන ශ්‍රමය හා කාලය වැය වන කටයුත්තක් බැවින් එසේ සම්පත් වැයවීම පියවා ගැනීම සඳහා අඩු තරමින් අර්ධ වෘත්තීය ලෙස හෝ ගොවිතැනේ යෙදීම සුදුසුය. සුළු බිම් ප්‍රමාණයක තිබෙන සම්පත් උපරිම ලෙස හා චක්‍රීය ලෙස ප්‍රයෝජනයට ගැනීම සඳහා සත්ත්ව පාලනය ඈඳා ගැනීම සුදුසුය. එමගින් ගොවීන්ගේ ශ්‍රමය ද උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනේ. එබැවින් කාර්යක්ෂම ලෙස භූමිය, සම්පත් හා ශ්‍රමය මුදල් බවට පරිවර්තනය වේ.

- කිරිදෙනුන්, එළුවන් හා කුකුළන් පාලනය කිරීම මේ සඳහා යෝග්‍ය වන අතර ඒ පිළිබඳ විස්තර සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් එළි දක්වා ඇති ප්‍රකාශන මගින් ලබාගත හැකිය.

මෙම අත්පොතෙහි 10 හා 11 වන පරිච්ඡේද තුළ ඖෂධ වගාව හා ගම්මිරිස්, කහ, ඉඟුරු, වැනිලා, කුකුල් පාලනය පිළිබඳ වැඩිදුර විස්තර අඩංගු කර ඇත.

## 4.9 වගා පාලන කටයුතු

ක්ෂේත්‍රයේ හෝ බඳුන් වල පැළ සිටවූ පසු ඒවාට අවශ්‍ය පොහොර, ජලය මෙන්ම බෝග කළමනාකරණ අවශ්‍යතා ද සම්පූර්ණ කරමින් අස්වැන්න ලබාගැනීම කළ යුතු වෙනවා. එක් එක් බෝගය අනුව මෙම අවශ්‍යතා ද වෙනස් වෙනවා. ඒවා නම් ජල සම්පාදනය, වසුන් යෙදීම, පස් ළං කිරීම, පුහුණු කිරීම, කප්පාදුව, ආධාරක සැපයීම, අනවශ්‍ය හෝ වැඩි ගෙඩි ඉවත් කිරීම වැනි වගා පාලන කටයුතු ආදියයි.

### ජල සම්පාදන ක්‍රම

- බෝග සඳහා පැළ කුඩා අවධියේ දී දිනකට වරක් හැකිතාක් දුරට උදය කාලයේ දී ජලය සැපයීම සුදුසුයි. කුඩා පැළ මුල් ඇද පසේ තිරවූ පසු දින 2, 3 කට වරක් ජලය සැපයීම සෑහේ.
- වැසි කාළයට ජලය සැපයීම අවශ්‍ය නොවන අතර, අවශ්‍ය ප්‍රමාණට පමණක් ජලය සැපයීම සෑහේ. අනවශ්‍ය ලෙස ජලය සැපයීමෙන් ශාකය අනවශ්‍ය ලෙස වැඩීමත්, ආර්ද්‍රතාවය වැඩිවන නිසාත් වගාව දිලීර හා බැක්ටීරියා රෝග වලට පාත්‍ර වීම ඉහළ යා හැක. එසේම පස සේදීයාම හා පසේ සාරවත්භාවය අඩුවීම සිදුවේ.
- ගෙවත්තේ බෝග වලට ජලය සැපයීම සඳහා ඕනෑම ජල ප්‍රභවයක් භාවිතා කළ හැකියි. ළිඳ, නළ ජලය, ගංගා, ඇල දොළ, උල්පත් ආදී ඕනෑම ජල ප්‍රභවයකින් ජලය ලබාගත හැකි වෙනවා.
- අපට අතින් ජලය යෙදීම මෙන්ම නළ ජලය, බිංදු හෝ විසුරුම් ජල සම්පාදනය මගින් ද යෙදිය හැකි වෙනවා.
- අවශ්‍යතාවය, පහසුව, යෙදවිය හැකි මුදල් ප්‍රමාණය හා ගෙවත්තේ වපසරිය අනුව සරල බිංදු ජල සම්පාදන ක්‍රමයක් හෝ විසුරුම් ජල සම්පාදන පද්ධතියක් භාවිතා කිරීම කළ හැක.
- ජලය සීමිත කාළ වලදී හෝ ජලය සීමිත ප්‍රදේශ වල දී නිවසේ නෑමට, භාජන සේදීමට යොදා ගන්නා ජලය ද සුදුසු පරිදි වළකට

හෝ භාජනයකට එකතු කරගෙන ගෙවතු වගාව සඳහා යොදාගත හැකියි.

- ජලය අඩු ප්‍රදේශවල දී ජලය වැඩියෙන් අවශ්‍ය නොවන බෝග ගෙවතු වගාව සඳහා යොදාගත හැකියි. උදා : කැකිරි, අළු කෙසෙල්, මුරුංගා, වම්බටු, තලන බටු, තිබ්බටු ආදිය
- ජලය සීමිත සම්පතක් මෙන්ම බොහෝ ගෙවතුවල දී ඒ සඳහා මූල්‍යමය වටිනාකමක් ද ඇත. එහෙයින් ජලය කාර්යක්‍ෂමව භාවිතා කිරීමට විශේෂ අවධානයක් යොමු කිරීමට අවශ්‍ය වේ. ඒ සඳහා භාවිතා කළ හැකි උපාය මාර්ග ගණනාවක් පවතින අතර ඒවා නිසි පරිදි සංකලනය කර භාවිතා කිරීමට ගෙවතු හිමියන් කටයුතු කිරීම අවශ්‍ය වේ.
  - එවැනි ප්‍රදේශ වලදී අපිට ගිල්වූ පාත්ති සාදා බෝග සිටුවන්නත් පුළුවන්.
  - බෝග සඳහා වසුන් යොදා ගැනීමෙන් පසෙන් ජලය වාෂ්ප වීම අඩු කර ගන්න පුළුවන්.
  - පසට කාබනික ද්‍රව්‍ය වැඩිපුර යෙදීමෙන්, පසේ ජලය රඳවා ගැනීමේ හැකියාව වැඩි කර ගන්න.
  - ඒ වගේම අපිට දවල් හෝ සවස් කාලයේ බෝගවලට ජලය යොදනවාට වඩා උදේ කාලයේ ජලය යෙදීමෙන් යොදන ජලය අපතේ යාම අඩුවෙනවා.
  - වර්ෂා ජලය එක්රැස් කර ගැනීම සඳහා ටැංකි වැනි උපකරණ භාවිතා කර වැසි ජලය ද කාර්යක්ෂමව ගෙවත්ත සඳහා භාවිතා කිරීම.

### පුහුණු කිරීම

- සමහර බෝග නඩත්තුවේ පහසුව සඳහා පුහුණු කළ යුතු වෙනවා. විශේෂයෙන්ම වැල් බෝග, වැටකොළු, පතෝල, කරවිල, පිපිඤ්ඤා, කැකිරි, නිවිති, වැල් අල, වට්ටක්කා වැනි බෝග පුහුණු කළ යුතු වෙනවා.
- මෙහිදී වැටකොළු, පතෝල, කරවිල වැනි බෝග සඳහා අඩි 5-6 පමණ උසට මැහි සකස් කළ හැකියි. උස ලී ආධාරයෙන් මැස්ස සකසා ඒවා එකිනෙක යා කිරීමට කොහු ලණු භාවිතා කළ හැකියි. එම මැස්සට බෝගය පුහුණු කරන්න.
- කැකිරි, වට්ටක්කා වැනි බෝග සඳහා ඉඩ කඩ අනුව බිම වැතිරී වැඩීමට ඉඩදී අනවශ්‍ය අංකුර වැල් කපා දමන්න.
- මෑ, වැල් බෝංචි වැනි බෝග සඳහා එක් එක් වැලට ඉණි සැපයීම කළ හැකියි. (අඩි 5-6 උසට)
- නිවිති බෝගය සඳහා අඩි 2 පමණ උසට ලී වලින් මැස්සක් සකස් කර හෝ වැටකට මෙම වැල් පුහුණු කරන්න.
- වැල්දොඩම් වැනි පලතුරු බෝග මෙන්ම අගුණ, කුරිඤ්ඤං, හාතාවාරිය වැනි බෝග ද ඉඩමේ වැටට හෝ ආරුක්කුවකට පුහුණු කරන්න.
- වැල් අල සඳහා ද අඩි 5-6 පමණ උසට ඉණි සපයා වැල් ඇදීම ආරම්භ වන විටම ආධාරක වලට වැල් පුහුණු කිරීම කරන්න.

### කප්පාදුව

- ගෙවත්තක එළවළු හා පලතුරු පැළ නඩත්තු කිරීමේ දී අනවශ්‍ය හා එල හට නොගන්නා

අතු කපා ඉවත් කිරීම ද රෝග හා පළිබෝධ හානි ඇතිවූ අතු කපා ඉවත් කිරීම ද කළ යුතු වෙනවා.

- මෙය ගසට හානි නොවන ලෙස ප්‍රවේශමට කරන්න. එළවළු නම් හොඳින් සියුම්ව කැපෙන පිහියකින් කපා ඉවත් කරන්න.
- පලතුරු අතු ඉවත් කිරීම මුවහත් කියතක් වැන්නකින් කළයුතු වෙනවා. එසේ කළ පසු කැපුම් තලයේ දිලීර නාශකයක් ආලේපකර වසා තබන්න.
- බොහෝ පලතුරු (රඹුටන්, අඹ වැනි) අස්වැන්න නෙළූ පසු මෙසේ අනවශ්‍ය අතු ඉවත් කර ගැනීම නව අතු ඇතිකර ගැනීමට වැදගත් වෙනවා.

### ආධාරක සැපයීම

- සමහර බෝග වල ගෙඩි හටගන්නා විට ගස හෝ අතු කඩා වැටීමට ලක්වීමට ඉඩ තියෙනවා උදා : තක්කාලි, මිරිස්, මාළුමිරිස්
- එවැනි එළවළු බෝග සඳහා ඉණි සපයා කෙසෙල් පට්ටා, රෙදි පටි හෝ ළණුවලින් ඉන්නට කිහිප තැනකින් බැඳ ගන්න.



බෝගවලට ආධාරක සැපයීම

- එසේම සමහර පලතුරු බෝගවල අතු කඩා වැටීමට පාත්‍ර වෙනවා. උදා : රඹුටන්, අඹ, අලිපේර, උගුරැස්ස, දොඩම්, කෙසෙල් අස්වැන්න ලබාගන්නා තෙක් මෙවැනි ශාක වලට ද අවශ්‍ය පරිදි අතුවලට ද ආධාරක සපයා ගස් ආරක්ෂා කරගන්න.



පලතුරු බෝගවලට ආධාරක සැපයීම

### අනවශ්‍ය හෝ වැඩි ගෙඩි ඉවත් කිරීම

- සමහර බෝගවල ඉතා විශාල ඵල සංඛ්‍යාවක් හටගන්නා නිසා ඒවායේ ඵල අතර ඉඩකඩ හා පෝෂණය සඳහා තරඟයක් පවතින බැවින් ඒවායේ ඵල ඉතා කුඩා වේ. උදා : තක්කාලි, පැපොල්
- මෙම ඵලවල තත්වය හා විශාලත්වය වැඩිකර ගැනීමට අනවශ්‍ය කුඩා ඵල මුල් අවස්ථාවේදීම ඉවත් කරගැනීම වැදගත් වෙනවා.
- එසේම කෙසෙල් පඳුරු පාලනය ද සිදු කිරීම ගෙවතු වගාවේ දී ඉතා වැදගත් වෙනවා.
- එක් කෙසෙල් පඳුරක මව් ශාකය හා පැළ කිහිපයක් පමණක් ඉතිරි කර වැඩි පැළ

ඉවත්කර විකුණා ගැනීම හෝ වෙනත් තැනක සිටුවාගන්න. මාස හතරකට පමණ වරක් හොඳ වයස් පරතරයක් සහිත පැළ දෙකක් හෝ තුනක් ඉතිරි කර අනෙක් ඒවා ඉවත් කරන්න.

**වසුන් යෙදීම**

- එළවළු බෝග මෙන්ම පලතුරු බෝග සඳහා ද අපට වසුන් යෙදීම වැදගත් වෙනවා.
- වසුන් යෙදීම මඟින් ජලය ආරක්ෂා වෙනවා, පසට කාබනික ද්‍රව්‍ය එකතු වෙනවා, වල් පැළෑටි පාලනය වෙනවා, පසට අවශ්‍ය ක්ෂුද්‍ර ජීවීන් මෙන්ම අනෙකුත් හිතකර පාංශු ජීවීන් ද ආරක්ෂා වෙනවා. පස සේදී යාමෙන් ද වළකිනවා. (ගෙවත්තේ පාංශු ජෛව විවිධත්වය සුරකිනවා)
- මේ සඳහා පිදුරු, වගාවෙන් ඉවත් කරන වල් පැළෑටි, ගෙවත්තේ අතුගා ඉවත් කරන දිරාපත් වන කොළ රොඩු ආදිය ද යොදාගන්න පුළුවන්.

**පස් ළං කිරීම**

- සමහර බෝග සඳහා ගසට පස් ළං කිරීම අවශ්‍ය වෙනවා. උදා : කැරට්, රාබු, අල බෝග ආදිය.
- අල පිටතට නිරාවරණය වීමෙන් ප්‍රභා සංස්ලේෂණය සිදුවී කොළ පාට වීමක් ද, පළිබෝධ හානි ඇති වීමක් ද වෙන්න පුළුවන්.
- එමනිසා වල් පැළ අයින් කරනවාත් සමඟම පස් ළං කිරීම කරන්න. එහෙත් පස් ළං කිරීමේ දී ගස්වල මුල් වලට හානි නොවන ලෙස එය සිදු කිරීමට විශේෂ අවධානයක් යොමු කරන්න.

## 4.10 පලතුරු බෝග වගා කිරීම

ගෙවත්තේ පලතුරු ශාක කිහිපයක් සිටුවා ගැනීම පාරම්පරිකව එන සිරිතකි. එමගින් පවුලේ පාරිභෝජන අවශ්‍යතා සපුරා ගැනීමට අමතරව, ආදායමක් ලබා ගැනීමට ද හැකි වේ.

අප රටේ වගා කරනු ලබන ජනප්‍රිය පලතුරු වර්ග කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| - අඹ | - කෙසෙල් |
| - දිවුල් | - පැපොල් |
| - වෙරළු | - මිදි |
| - සැපදිල්ලා | - අන්නාසි |
| - නාරං | - දෙළුම් |
| - දොඩම් | - අනෝදා |
| - ජම්බෝල | - උගුරැස්ස |
| - පේර | - ලොවි |
| - බෙලි | - පෙයාර්ස් |
| - දූරියන් | - වැල් දොඩම් |
| - මැංගුස් | - රඹුටන් |
| - වැල/ වරකා | - ගඩුගුඩා |
| - ජම්බු | - ස්ට්‍රෝබෙරි |
| - අලිගැටපේර | |

- මෙවායින් බොහොමයක් දිවයිනේ සෑම ප්‍රදේශයකම පහසුවෙන් වගා කළ හැකි වේ. අන්නාසි, කෙසෙල්, සහ පැපොල් හැර අන් සියළු පලතුරු වර්ගවල වසරකට වරක් හෝ දෙවරක් නිශ්චිත කාලයක් තුළ දී ඵල හට ගනී.

- අන්නාසි, කෙසෙල් හා පැපොල්වලින් වසර පුරාම ඵල ලබා ගත හැකිවීම වාසියකි. එබැවින් සෑම ගෙවත්තකම අනිකුත් පලතුරු ශාකවලට අමතරව මෙම වර්ග වලින් ශාක කිහිපයක් වවා ගැනීම වැදගත් වේ. විශේෂයෙන්ම ඉඩ ඇති පරිදි කෙසෙල් පඳුරු කිහිපයක් තිබීම ඉතා ප්‍රයෝජනවත් වේ.
- පලතුරු ශාක සිටුවීමේ දී ප්‍රදේශයට නිර්දේශ කර ඇති වර්ග වලට අයත් බද්ධ පැළ සිටුවා ගැනීම වාසි සහගත වේ. බද්ධ පැළ සිටුවීමෙන් කෙටි කලක දී අස්වැන්න ලබා ගැනීමට හැකිවේ. එමෙන්ම වැඩි උසකට වර්ධනය නොවීමත් හොඳින් අතු බෙදී වැඩෙන ශාකයක් ලබා ගැනීමට හැකි වීමත් වාසීන් ලෙස සඳහන් කළ හැක.
- බීජ සිටුවීමෙන් පැළ ලබා ගන්නා ශාකවල වර්ගය හෝ ගුණාත්මය පිළිබඳව අවබෝධයක් ලබාගත හැකි වනුයේ ඵල හට ගැනීමෙන් පසුවයි. ඒ සඳහා වැඩි කාලයක් ගතවේ. එමෙන්ම බීජ පැළ ඉතා විශාල ලෙස වැඩී සෙවන ඇති කරන බැවින් කුඩා ගෙවතු සඳහා යෝගය නොවේ.
- නමුත් බද්ධ පැළවල එවැනි අවදානමක් නැත. අනාගත වගාවේ ප්‍රභේද පිළිබඳව නිශ්චිතව තහවුරුවක් ලැබෙන හෙයින් අස්වැන්නේ ගුණාත්මය පිළිබඳව සිටුවීමට පෙර දැන ගත හැකි වේ. ඒ අනුව සුදුසු හා කැමති බද්ධ පැළ වර්ග තෝරා සිටුවීමට පුළුවන. පලතුරු පැළ සිටුවීමේ දී සෙ.මී. 60 x 60 x 60 (අඩි 2 x 2 x 2) ප්‍රමාණයේ හෝ ඊට වඩා ලොකු වලවල් සකස් කොට මතුපිට පස් සහ කාබනික පොහොර ඒවාට එකතු කළ යුතුය. ඉන්පසු පැළය සිටුවා නැවත මතුපිට පස් දමා වළ පුරවා දැමිය යුතුය. පොලිතීන් බඳුන්වල සකස් කොට ඇති පැළ සිටුවීමට පෙර පොලිතීන් බෑගය කපා ඉවත් කිරීමට මතක තබා ගන්න.
- අස්වැන්න නෙළා ගැනීමෙන් පසු අඹ, රඹුටන් ආදී ශාකවල අතු කප්පාදු කිරීමෙන් ඒවා අනවශ්‍ය ලෙස විශාලව වර්ධනය වීම වළක්වා මධ්‍යම ප්‍රමාණයේ පැතිරී වැඩෙන ශාක ලෙස පුහුණු කරගත හැකිවේ. කප්පාදු කිරීමෙන් හා පුහුණු කිරීමෙන් ප්‍රශස්ත ඵලදාවක් ලබාගත හැකිවේ. අනවශ්‍ය වදුල නැතිවේ. තම නිවසට හා අන්‍යයන්ගේ නිවාස උඩට අතු ඇදී යාම වැළකීම හා ගෙවත්තට අලංකාරයක් ලබාදීම සිදුවේ.
- අපේ රටේ බොහෝ පලතුරු වර්ග හොඳින් මේරීමට ප්‍රථම අස්වැන්න නෙළා කාබයිඩ් යෙදීමෙන් ඒවා ඉදීමට හා කහ පැහැ ගැන්වීමට සළසනු ලැබේ. මේ නිසා වෙළෙඳපොලන් මිලදී ගන්නා බොහෝ පලතුරු වල ආවේණික රසය අත්විඳීමට මිලදී ගන්නන් හට නොහැකි වී ඇත. පිටතින් හොඳින් ඉදී ඇති බව පෙනුනත් දිය රසැති පැපොල්, අඹ හා කෙසෙල් ආදිය වෙළඳපොලෙන් ලබා ගැනීමට සිදුවී ඇත්තේ මේ නිසාය. එබැවින් ගෙවත්ත තුළදී ම හොඳින් පරිණත වූ ඉදීමට ආසන්න පලතුරු පමණක් නෙළා ගැනීමට මතක තබාගත යුතුය. මෙහිදී ඵල සතුන්ගෙන් බේරා ගැනීම සඳහා ආවරණ යෙදීම වැනි විවිධ උපක්‍රම භාවිතා කළ යුතුව ඇත.
- අඹ බොහෝ ගෙවතුවල වගා කරනු ලබන ඉතා ජනප්‍රිය පලතුරු වර්ගයකි. බද්ධ කරන ලද අඹ ගසක් පුහුණු කිරීම හා කප්පාදු කිරීම මගින් ප්‍රශස්ථ මට්ටමකට පාලනය කළහොත්,

ඒවායේ කොළදාව පාලනය කළ හොත් හා ගසට ඔරොත්තු දෙන ඵල සංඛ්‍යාවක් ඉතුරු කොට සෙසු ඒවා ඉවත් කළ හොත් මනා ප්‍රමාණයේ ඵල සංඛ්‍යාවක් ලබා ගත හැකිවේ. අඹ ඵල වලට ගුල්ලන් හා පලතුරු මැස්සන් විද හානි පමුණුවන බැවින් කුඩා කල සිටම ඒවා තෙල් කඩදාසි හෝ කඩදාසි භාවිතා කොට ආවරණය කොට තැබීම සුදුසුය. මෙලෙසම කිලෝ පේර වගාවේ දීත් ඵල ආවරණ භාවිතා කරයි.



පේර සඳහා ඵල ආවරණ යෙදීම

- ඵල වර්ග ආවරණය කොට තැබීමෙන් බර හා පැහැය යහපත්ව ලබාගත හැකිය. නෙළීමට ආසන්නව දින 3-4 ක් ආලෝකයට නිරාවරණය කිරීමෙන් පැහැය වඩා ගත හැකිය. රෝග උවදුරුවලින් බොහෝ දුරට ආරක්ෂා වේ.
- කෙසෙල් වගා කිරීමේ දී එක් පඳුරකට විවිධ වයස් කාණ්ඩ වල පැළ 3-4 ක් පමණක් ඉතුරුවන සේ ඉතිරි සියල්ල ඉතා කුඩා අවස්ථාවේදීම ඉවත් කිරීමට හෝ විනාශ කර දැමීමට කටයුතු කළ යුතුය.
- කෙසෙල් කැන් ආවරණය කොට තැබීමෙන් 25% ක් පමණ බර වැඩිවේ.



කෙසෙල් කැන් ආවරණ යෙදීම

- කෙසෙල් පඳුරු පාලනය කොට වියළි කොළ කපා ඉවත් කිරීමෙන් කඳ ගුල්ලාගෙන් හා අල ගුල්ලාගෙන් වන හානි අවම කරගත හැකිවේ. කැන් කපාගත් පසු කඳ කුඩා කැබලි වලට කපා ගස වටා පොහොරවීමට දැමීම යෙහෙකි. (පලතුරු බෝග වගා කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශන කිහිපයක් එළි දක්වා ඇති අතර ඒවා පරිශීලනය කරන්න)



කුඩා කැබලිවලට කැපූ කෙසෙල් කඳන්



# 05 ගෙවත්තේ පොහොර භාවිතය

## 5.1 හැඳින්වීම

''සරු පසකින් සරු අස්වැන්නක්'' යනු බෝගයක් වගා කර ඉහළ අස්වැන්නක් බලාපොරොත්තු වන විට පසේ සරු බව පිළිබඳව සැළකිල්ලක් දැක්වීම ඉතා වැදගත් කරුණක් බවයි.

සාරවත් පසක ශාකවලට අවශ්‍යවන පෝෂක ද්‍රව්‍ය පැවතීම පමණක් නොව ඒවා ශාකවලට ලබාගත හැකි ආකාරයෙන් තිබීමත්, ලබා ගත හැකි ප්‍රශස්ත මට්ටමකින් පැවතීමත් වැදගත් වේ.

සාරවත් වූ පසක මීට අමතරව භෞතික හා රසායනික ගුණාංග ද බෝගවලට හිතකර තත්ත්වයෙන් පැවතිය යුතුය. පසක භෞතික ගුණාංග යන්නෙන් හැඳින්වෙන්නේ පසේ ඇති සච්චර බව, පාංශු කැටිතිවල ස්වභාවය, ජලය රඳවා ගැනීමේ හැකියාව හා ජලවහනය වැනි කරුණුය. පසක රසායනික ගුණාංග ලෙස හැඳින්වෙන්නේ පසේ ආම්ලික භාෂ්මිකතාවය (pH අගය), විද්‍යුත් සන්නායකතාවය සහ කැටායන හුවමාරු ධාරිතාවය වැනි කරුණුය.

## 5.2 පොහොර භාවිතය

- පොහොර භාවිතයෙන් බලාපොරොත්තු වන්නේ බෝග වර්ධනයට හා බෝගයේ අස්වැන්නට අවශ්‍ය පෝෂක කොටස් පසට මිශ්‍ර කිරීමයි.
- ශාක සඳහා අවශ්‍ය ප්‍රධාන පෝෂක (මූලද්‍රව්‍ය) 09 ක් සහ ක්ෂුද්‍ර පෝෂක 07 ක් පවතී. මෙයට අමතරව විශේෂිත වූ ශාක පෝෂක ද ඇත. උදා: පැපොල් වගාව සඳහා බෝරෝන් අවශ්‍ය වීම
- ප්‍රධාන පෝෂක 09 න් කාබන්, ඔක්සිජන් හා හයිඩ්‍රජන් ස්වභාවිකවම ජලයෙන් හා වාතයෙන් ලබාගනී. නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් හා අනෙකුත් ශාක පෝෂක සියල්ලම බාහිරින් ලබාදිය යුතුය.
- වනාන්තරයක වැනි දීර්ඝ කාලයක් වගා නොකළ බිමක ප්‍රතිචක්‍රීකරණය මගින් ස්වභාවිකවම පසෙහි මෙම පෝෂක සුලභව ඇති වේ.

- නමුත් වගා කිරීමේ දී අස්වනු නෙළීමෙන් ඉවත්වන ශාක පෝෂක ද්‍රව්‍ය නැවත පසට ලැබීම නිසි ලෙස සිදු නොවේ. මේ හෙයින් වගා බිම් වලට පෝෂක ද්‍රව්‍ය ලබා දීමට උපක්‍රම යෙදීමට අපට සිදු වී ඇත.
- හොඳින් පාංශු හා ජල සංරක්ෂණ ක්‍රම යොදන්නේ නම් අස්වනු ලෙස ඉවත් වන ශාක පෝෂක ප්‍රමාණය පමණක් පොහොර ලෙස යෙදීම ප්‍රමාණවත් වනු ඇත.
- ගෙවත්ත බෝග රාශියකින් සමන්විත පරිසර පද්ධතියක් නිසා තනි බෝග වගාවට වඩා පොහොර කාර්යක්ෂමතාව වැඩිය.

**ශාක පෝෂක ලබාදෙන ප්‍රධාන ආකාර**

1. *අකාබනික පොහොර (රසායනික පොහොර)*

- අකාබනික පොහොර මඟින් බෝගයට අවශ්‍ය පෝෂ්‍ය ද්‍රව්‍ය කෘත්‍රිමව ලබාදෙයි.
- බහුල වශයෙන්ම මෙමඟින් ලබාදෙනුයේ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් යන ප්‍රධාන පෝෂ්‍ය ද්‍රව්‍ය 03 යි.
- අංශු මාත්‍ර ශාක පෝෂක ලබාදෙන අකාබනික පොහොර ද වෙළඳපොලෙහි ඇති අතර මෙවැනි බොහෝ ක්ෂුද්‍ර පෝෂක පසට නොව බෝගයේ පත්‍ර වලට යොදයි.
- රසායනික පොහොර ඉක්මනින් ක්‍රියාකර බෝගයේ පෝෂක අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට හැකියාවක් පවතින නමුදු රසායනික පොහොර නිසා පසෙහි භෞතික හෝ ජෛවීය ගුණාංග දියුණු කරන්නේ නැත. තවද එමඟින් පරිසර දූෂණයට ද මග පාදයි. එමෙන්ම ඒ සඳහා සැළකිය යුතු වියදමක් දැරීමට ද සිදුවෙයි.
- එම නිසා ගෙවතු වගාවේ දී රසායනික පොහොර භාවිතයට දිරි ගැන්වීමක් නොකරයි. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථාවල දී පමණක් යෙදීමට සිදු වන අතර රසායනික පොහොර යොදන්නේ නම් කාබනික පොහොර භාවිතා කළ පසකට රසායනික පොහොර යෙදීම වඩා සුදුසුය.
- එවැනි අවස්ථාවක දී භාවිතා කිරීමට රසායනික පොහොර අඩංගු එළවළු, පලතුරු හා මල් වගාවන් සඳහා පොහොර මිශ්‍රණ වෙළඳපොලෙන් මිලදී ගැනීමට හැකිය.

2. *කාබනික පොහොර (ස්වභාවික පොහොර)*

- කාබනික පොහොර භාවිතය මඟින් දිගු කාලීනව පස තිරසරව භාවිතා කිරීමේ හැකියාව වැඩිදියුණු වන අතරම තවත් වාසි ගණනාවක් ලබා ගැනීමට හැකි වේ.
- ප්‍රධාන වශයෙන් කාබනික පොහොර වර්ග 02 ක් දැකිය හැකිය. එනම්, සැකසීමෙන් තොරව භාවිතා වන කාබනික පොහොර සහ සකස් කළ කාබනික පොහොර වශයෙනි.
- සැකසීමෙන් තොරව භාවිතා වන කාබනික පොහොර වන්නේ ගස්වල කොළ, අතු රිකිලි, බෝග අවශේෂ, රනිල ශාක, ගොම, කුකුල් පොහොර වැනි සත්ත්ව අපද්‍රව්‍ය ආදියයි.
- සැකසීමෙන් තොරව භාවිතා කරනු ලබන පොහොර වර්ගයක් වන කොළ පොහොර සපයා ගන්නා ආකාරය අනුව ප්‍රධාන කාණ්ඩ 02 කට නැවත බෙදා වෙන් කළ හැක. පළමු කාණ්ඩය වනුයේ ගෙවත්තේම වගාකර පසට එකතු කරනු ලබන කොළ පොහොරයි. (උදා: සන්හෙම්, එළවළු, කව්පි වැනි ශාක වර්ග)



සන්හෙම් වගාවක්

- දෙවන කාණ්ඩය වනුයේ වෙනත් ස්ථානයක වගාකර ගෙවත්තට යොදනු ලබන කොළ පොහොරයි. (උදා: ග්ලිරිසීඩියා, ඉපිල් ඉපිල්, පාවට්ටා වැනි වර්ග)



ග්ලිරිසීඩියා අතු

- සැකසීමෙන් පසුව භාවිතා කළ හැකි කාබනික පොහොර ලෙසින් හඳුන්වනු ලබන්නේ ඉහත කී අමුද්‍රව්‍ය භාවිතා කර ජීවීන් මාර්ගයෙන් සරල කාබනික ද්‍රව්‍ය බවට පරිවර්තනය කළ පොහොර වර්ගයි. (උදා: කොම්පෝස්ට් පොහොර සහ කාබනික දියර පොහොර)

*කාබනික පොහොර ගෙවත්තට එකතු කළ විට ලැබෙන ප්‍රයෝජන*

- කාබනික පොහොර පසට එකතු කිරීමෙන් පසේ සච්ඡිද්‍ර බව වැඩිවී ජලය හා වාතය රඳවා ගැනීමේ හැකියාව දියුණු වේ. එමෙන්ම පාංශු කැටිති ස්වභාවය ද දියුණු වේ. මෙම තත්ත්වය බෝගවල මූල වර්ධනයට හිතකර තත්ත්වයකි.
- කාබනික පොහොර භාවිතා කළ පසක් පාංශු ඛාදනයට ලක්වීම අවම කරයි.
- පසට කාබනික පොහොර එකතු කිරීමෙන් පාංශු පරිසරයේ සිටින ක්ෂුද්‍ර ජීවීන් හා ගැඩවිලි පණුවන් වැනි පාංශු ජීවීන්ට ද හිතකර තත්ත්වයන් ඇතිවී ඔවුන්ගේ ගහණය හා ක්‍රියාකාරීත්වය වැඩිවේ. මෙම තත්ත්වය මත ලබා ගත නොහැකි පසේ පවතින පෝෂක ද්‍රව්‍ය ශාකවලට ලබා ගැනීමට හැකි තතත්වයට පත් කිරීමට සමහරක් ක්ෂුද්‍ර ජීවීන් ක්‍රියා කරයි.
- කාබනික පොහොර මඟින් ප්‍රාථමික පෝෂක වර්ග පසේ සුලබ කිරීම මෙන්ම ක්ෂුද්‍ර පෝෂක වර්ග පසට එකතු කිරීම වැදගත් කරුණක් ලෙස සඳහන් කළ හැක. එහෙත් රසායනික පොහොර පමණක් අඛණ්ඩව භාවිතා කිරීම මඟින් මෙයට වඩා වෙනස් තත්ත්වයක් පස තුළ ඇතිවන අතර එය වළක්වා ගැනීමට කාබනික පොහොර වර්ග භාවිතා කිරීම උපකාරී වේ.
- කාබනික ද්‍රව්‍ය පසකට එකතු කිරීම මඟින් පසේ ඇති ශාක පෝෂක පසෙන් ඉවත්ව යෑම වළක්වා පස තුළ එම පෝෂක ද්‍රව්‍ය රඳවා ගැනීම සිදු කරයි. මේ නිසා ශාක වලට අවශ්‍ය අවස්ථා වල දී පසෙන් පෝෂක ද්‍රව්‍ය ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු වේ. මේනිසා රසායනික පොහොර වල කාර්යක්ෂමතාවය ද ඉහළ යයි.

- කාබනික ද්‍රව්‍ය වලට ස්වාරක්‍ෂක පද්ධතීන් ලෙසින් ක්‍රියාකිරීමට හැකියාවක් ඇති බැවින් කාබනික පොහොර භාවිතය මගින් පස බෝග වගාවට හිතකර ආකාරයෙන් පවත්වා ගෙන යාමට උපකාරී වේ.
- කාබනික පොහොර ප්‍රශස්ත ලෙස භාවිතා කළ වගාවක දී ශාකවල පෘෂ්ඨීමත් බව හා දිරිමත් බව ඉහළ නැංවෙන බැවින් සාපේක්‍ෂව රෝග වලට ඔරොත්තු දීමේ හැකියාව ද ඉහළ නැංවේ.

## 5.3 ගෙවත්ත සඳහා සැකසූ කාබනික පොහොර භාවිතය

- සැකසූ කාබනික පොහොර ආකාර 02 කින් ගෙවතු වගාව සඳහා භාවිතා කළ හැක. එනම්, කාබනික පොහොර ඝන ආකාරය හා දියර පොහොර ආකාරයයි.
- ඝන ආකාරයේ කාබනික පොහොර සඳහා ගෙවතු වගාවේ දී බහුලව භාවිතා කරනු ලබන්නේ කොම්පෝස්ට් පොහොරයි.
- කාබනික දියර පොහොර ආකාරයට කොම්පෝස්ට් දියරය (කොම්පෝස්ට් තේ), කොළ දියර පොහොර හා ගැඩවිලි පණු දියර ආදිය අයත් වේ.

**කොම්පෝස්ට් පොහොර සැකසීම**

- ගෙවතු වගාවේ දී ඉතා පහසුවෙන් සකසාගත හැකි කාබනික පොහොර වන්නේ කොම්පෝස්ට් පොහොරයි. කොම්පෝස්ට් අර්ධව ජීර්ණය වූ කාබනික පොහොරක් බැවින් මෙහි අඩංගු ශාක පෝෂක ඉතා පහසුවෙන් ශාකවලට අවශෝෂණය කර ගැනීමට ද හැකිය.
- ග්‍රාමීය හා අර්ධ ග්‍රාමීය ප්‍රදේශවල ගෙවත්තේ ඇති ශාක කොටස්, ගොම ආදී සත්ත්ව අපද්‍රව්‍ය, නීරෝගී වගාවකින් ගත් බෝග අවශේෂ, මුළුතැන්ගේ අපද්‍රව්‍ය ආදිය භාවිතා කර පහසුවෙන් ගෙවත්ත තුළදීම කොම්පෝස්ට් පොහොර සාදා ගත හැකිය.
- අපිට අවශ්‍ය පොහොර අපිම සකසා ගැනීමෙන් අපේ පසුම්බියටත් හොඳයි. පරිසරයත් සුරකෙනවා. එමෙන්ම කොම්පෝස්ට් නිපදවීමෙන් ගෙවත්ත සහ ගෘහ පරිසරය පිරිසිදු වෙනවා.

*අවශ්‍ය අමුද්‍රව්‍ය*

- ශාක කොටස් - අමු කොළ, වියළි කොළ, නීරෝගී වගාවකින් ගත් බෝග අවශේෂ, වල් පැළෑටි, එළවළු, පලතුරු මුළුතැන්ගේ ඉවතලන කොටස් ආදී ඕනෑම ශාක කොටස්
- සත්ත්ව අපද්‍රව්‍ය - ගොම පොහොර හා එළු පොහොර වැනි ශාක භක්ෂක සතුන්ගේ අපද්‍රව්‍යය හා කුකුල් පොහොර
- මුහුම් ස්වල්පයක් (හොඳින් සැකසූ කොම්පෝස්ට් පොහොර)
- අවශ්‍ය දිගින්, පළලින් යුතු කළු පොලිතින් කැබැල්ලක්
- එප්පාවල රොක් පොස්පේට් ස්වල්පයක්

කොම්පෝස්ට් ගොඩ සැකසීමේ දී මෙම ද්‍රව්‍ය සියල්ල සූදානම් කර තබා ගෙන සැකසීම ආරම්භ කරන්න.

*සකසන ආකාරය*

- මද සෙවණ ඇති, ජලය නොරැඳෙන, සමතලා ස්ථානයක් කොම්පෝස්ට් ගොඩ සැකසීම සඳහා වෙන් කර ගන්න.

- එම ස්ථානයේ කොම්පෝස්ට් ගොඩ සෑදීම සඳහා අවශ්‍ය දිගින් හා පළලින් යුතු කොටුවක් බිම මත සළකුණු කර ගන්න.



බිම සළකුණු කිරීම

- පළමුව යටම ස්ථරය සඳහා වියළි කොළ රොඩු හෝ පිදුරු තට්ටුවක් අසුරන්න.



පළමු ශාක අපද්‍රව්‍ය ස්ථරය

- ඒ මත මාරුවෙන් මාරුවට ශාක හා සත්ත්ව අපද්‍රව්‍ය තට්ටු වශයෙන් අතුරන්න. එක් තට්ටුවක ඝණකම සෙ.මී. 15 (අඟල් 6) ක් පමණ වේ.
- ශාක අපද්‍රව්‍ය භාවිතා කිරීමේ දී වියළි හා අමු කොළ තට්ටු මාරුවෙන් මාරුවට යෙදීමට වගබලා ගන්න.
- සෑම අමුද්‍රව්‍ය තට්ටුවක් අතරටම මුහුන් ස්වල්පයක් විසුරුවා හරින්න. (වර්ග මීටරයකට හොඳින් සැකසූ කොම්පෝස්ට් ග්‍රෑම් 50 පමණ වන ලෙසින් යොදන්න) එමෙන්ම හැකියාවක් පවතී නම් සෑම තට්ටුවක් අතරටම එප්පාවල රොක් පොස්පේට් ස්වල්පයක් යොදන්න. (වර්ග මීටරයකට රොක් පොස්පේට් ග්‍රෑම් 30 බැගින් වන ලෙසින් යොදන්න)




කොම්පෝස්ට් ගොඩක හරස්කඩ

- ගොඩ සකසන අවස්ථාවේදීම අමුද්‍රව්‍ය හොඳින් තෙත්වන ලෙස ජලය යොදන්න.
- සාමාන්‍යයෙන් කොම්පෝස්ට් ගොඩක් පළල සෙ.මී. 150 (අඩි 5) පමණ ද උස සෙ.මී. 165 (අඩි 5 1/2) පමණක් වන ලෙසින් ද සකස් කර ගත හැක. එහෙත් කොම්පෝස්ට් ගොඩේ දිග පවතින අමුද්‍රව්‍ය ප්‍රමාණය අනුව සහ ස්ථානය අනුව සුදුසු දිගකින් සකස් කර ගන්න.
- ගොඩ සැකසීමෙන් පසුව ගොඩෙහි යට කොටසෙහි සෙ.මී. 25 (අඟල් 10) ක් පමණ නිරාවරණය වන ලෙස කළු පැහැති පොලිතීනයකින් ගොඩ වසා තබන්න.



පොලිතීනයකින් වැසූ කොම්පෝස්ට් ගොඩ

- දින දෙකකට වරක් තෙතමනය පරීක්ෂාකර බලා තෙතමනය අඩු නම් ජලය යොදන්න.
- කොම්පෝස්ට් ගොඩ සකස් කර සති 04 කින් පසු පළමු පෙරලීම සිදු කර නැවත ගොඩක් ලෙස සකස් කර වසා තබන්න. (කොම්පෝස්ට් ගොඩ පෙරළීම් 2 ක් අතර කාලාන්තරය සති 04 කට වඩා වැඩි නොවිය යුතුය)
- ඉන්පසු කෙටි කාලාන්තර වලින් කොම්පෝස්ට් ගොඩ නැවත නැවත පෙරළීම මගින් වඩාත් ඉක්මනින් හොඳින් සකස් වූ කොම්පෝස්ට් ලැබේ. මාස 3 ක් පමණ ගිය පසු හොඳින් සැකසුණු කොම්පෝස්ට් පොහොර ලබා ගත හැකිය.

**කූඩා (කෝටු රාමු) ක්‍රමයට කොම්පෝස්ට් පොහොර සැකසීම**

- ඒකාකාරී ලෙසින් කොම්පෝස්ට් නිෂ්පාදනයක් නොලැබුනත් ගෙවත්තක් සඳහා මෙම ක්‍රමය ද සුදුසු වෙයි.
- පහත රූපයේ පෙන්වා ඇති ආකාරයට ඇටවුම සකස් කර ගන්න. මේ සඳහා ග්ලිරිසීඩියා වැනි පහසුවෙන් සොයාගත හැකි කෝටු වර්ග සුදුසුය.



කූඩා/කෝටු රාමු ක්‍රමයට සැකසූ කොම්පෝස්ට් ගොඩක්

- කොම්පෝස්ට් පොහොර ලබාගැනීමේ පහසුව සඳහා කූඩයේ පහළින් සෙ.මී. 30 x 30 (අඩි 1x1) ප්‍රමාණයේ කවුළුවක් ඉතිරි කර ගන්න.
- ගෙවත්තෙන් ඉවත්කරන වල් පැළෑටි, නීරෝගී වගාවකින් ලබාගත් බෝග අවශේෂ වැනි දිරාපත්වන ශාකමය ද්‍රව්‍ය මෙම කෝටු රාමුව තුළට දමන්න.
- කාලයත් සමග සැකසුණු කොම්පෝස්ට් පොහොර කෝටු රාමුවේ පහළින් ඉවත්කර ගන්නා අතරම දිගටම අමුද්‍රව්‍ය ඉහළින් දමන්න.
- මීට අමතරව බොහෝ නාගරික හා අර්ධ නාගරික ගෙවතු වල කොම්පෝස්ට් සකස් කර ගැනීම සඳහා පිටතින් මිලදී ගත් බැරල් භාවිතා කරනු දැකිය හැක.



මිලදී ගතහැකි කොම්පෝස්ට් බැරලයක්

**කාබනික දියර පොහොර**

- ගෙවත්ත සඳහා අවශ්‍ය දියර පොහොර ද ඔබටම සාදාගත හැකිය.
- බෝග ක්ෂේත්‍රයේ සංස්ථාපනය කර කලක් ගත වන විට පෝෂක ඌනතාවයක් පෙන්වන අවස්ථාවල දී කාබනික දියර පොහොර යෙදීමෙන් ඌනතා ලක්ෂණ ඉක්මනින් මඟහරවා ගත හැකිය.
- එවැනි දියර පොහොර වර්ග කීපයක් මේ සමඟ ඉදිරිපත් කර ඇත.
  - කොළ දියර පොහොර
  - කොම්පෝස්ට් දියරය (කොම්පෝස්ට් තේ)
  - ගැඩවිල් පණු දියර පොහොර

**කොළ දියර පොහොර සැකසීම**

*අවශ්‍ය ද්‍රව්‍ය*

ශාක කොළ (ග්ලිරිසීඩියා, වල් සූරියකාන්ත, කැප්පෙටියා වැනි) කි.ග්‍රෑ. 10 ක් පමණ, ලීටර් 20 භාජනයක්, ඝන ගෝනියක් හා කපු රෙදි කැබැල්ලක්

*සාදන ආකාරය*

- ශාක කොළ සිහින්ව කපා ගන්න. ඒවා පොට්ටනියක් බැඳ ලීටර් 20 භාජනයට ජලය දමා එහි ගිල්වා තබන්න.



ශාක කොළ සිහින්ව කපා ගැනීම



ශාක කොටස් සහිත පොට්ටනිය

- දිනපතා ලී දණ්ඩක් ආධාරයෙන් මිශ්‍ර කරන්න. මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා භාජනයේ කට මදුරු දැලකින් වසා තබන්න.

*භාවිතා කරන ආකාරය*

- සති 3 ට පසු මෙම දියරයෙන් කොටස් 1 ට ජලය කොටස් 05 ක් වන සේ මිශ්‍රකර සවස් කාලයේ වගාවට ඉසින්න.

**ගැඩවිල් පණු දියර පොහොර සැකසීම**

*අවශ්‍ය ද්‍රව්‍ය*

ලීටර් 50 ප්ලාස්ටික් බැරල් 01, කරාම 01, මැටි කළයක්, වියළි කොළ රොඩු, වියළි හෝ අමු ගොම තාච්චි 02, ගඩොල් කැබලි සහ වැලි තාච්චි 02 බැගින්, ගැඩවිල් පණුවන්

මේ සඳහා රතු පැහැති, කුඩා, සීඝ්‍රයෙන් බෝවන ගැඩවිලි පණුවන් වර්ග (*Esinia* spp) භාවිතා කළ හැකි නම් වඩාත් සුදුසු වේ. එහෙත් එවැනි පණුවන් සොයා ගැනීමට අපහසු අවස්ථා වල දී ගෙවත්තේ පසේ සිටින සාමාන්‍ය ගැඩවිලි පණුවන් ද භාවිතා කළ හැක.

*සාදන ආකාරය*

- පහත ඇටවුමේ ආකාරයට සියල්ල සකසා ගන්න.




- අඩියේ සිට තට්ටු වශයෙන් අඟල් 02 බැගින් ගඩොල් කැබලි සහ දල වැලි ද අසුරන්න. ඒ මත අඟල් 06 ක ගොම අසුරන්න. අමු ගොම ස්ථරය මතට ගැඩවිල් පණුවන් දමන්න.
- මාසයකට පසුව බැරලය පිරෙන තෙක් කාබනික ද්‍රව්‍ය එකතු කරන්න. ඇටවුම දිනපතා තෙත් කිරීම මගින් ගැඩවිලි පණුවන්ට හිතකර තත්ත්වයක් ඇටවුම තුළ ඇතිවේ.
- මාස $1\,^{1}/_{2}$ ක් පමණ ගතවූ පසු රූප සටහනේ ආකාරයට ඇටවුමට ඉහළින් මැටි කලයක් සවි කර ජල බිංදු කාබනික ද්‍රව්‍ය මත වැටීමට සලස්වා පැය 24 පමණ පසු බැරලය පතුලේ සවිකර ඇති කරාමය විවෘත කර පණු දියර බඳුනකට ලබා ගත හැකිය.

*භාවිතා කරන ආකාරය*

- එම දියරය 1:5 අනුපාතයට ජලය සමඟ මිශ්‍රකර කෙළින්ම බෝග පත්‍රවලට සවස් කාලයේ ඉසින්න. පණු දියර කල්තබා ගන්නේ නම් දුඹුරු පැහැති බෝතල් වල අසුරා ගන්න.

**කොම්පෝස්ට් දියරය (කොම්පෝස්ට් තේ) සැකසීම**

*අවශ්‍ය ද්‍රව්‍ය*

ලීටර් 50-100 පමණ බඳුනක්, කොම්පෝස්ට් කි.ග්‍රෑ. 10, උක් හකුරු හෝ සීනි කි.ග්‍රෑ. 01 පමණ, හන ගෝනියක් හෝ කපු රෙදි කවරයක්, මීටර් 01 ලණු කැබැල්ලක්, ලී දණ්ඩක් සහ බඳුනෙහි කට ආවරණය කිරීමට මදුරු දැල් කැබැල්ලක්, ඔක්සිජන් සැපයුම් උපකරණයක්

*සාදන ආකාරය*

- ඇටවුමේ ආකාරයට සියල්ල සකසා ගන්න. ජලය ලීටර් 10 ට කොම්පෝස්ට් කි.ග්‍රෑ. 01 පමණ වන සේ කොම්පෝස්ට් බහාලූ මල්ල සකසා ගන්න.




ඇටවුමේ දික්කඩක්

- වාතනය කිරීම සඳහා දිනකට කිහිපවරක් ලී දණ්ඩකින් පෙන නගින සේ මිශ්‍ර කරන්න.
- නැත්නම් මාළු ටැංකියකට භාවිතා කරන ඔක්සිජන් සැපයුමක් භාවිතා කරන්න. සතියකට පමණ පසු භාජනයේ ඇති කොම්පෝස්ට් දියරය භාවිතය සඳහා සුදුසු වෙයි.

*භාවිතා කරන ආකාරය*

ජලය, කොම්පෝස්ට් දියරය 3:1 අනුපාතයට මිශ්‍රකර සවස් කාලයේ වගාවේ පත්‍ර මතට යොදන්න.



# 06 නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ගෙවතු වගාව සැලසුම්කරණය හා නිර්මාණය කිරීම

නාගරික සහ අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන බොහෝ දෙනා තමන්ගේ පවතින සීමිත ඉඩකඩ තුළ ගෙවත්තක් පවත්වා ගැනීමට දැඩි ආසාවක් දක්වති.

නමුත් ඒ සඳහා ප්‍රමාණවත් ඉඩකඩක් තමන්ටම නොමැති බව සිතීම නිසාම ගෙවත්තක් නිර්මාණය කර පවත්වා ගැනීම එම ප්‍රදේශවල ජීවත් වන බොහෝ දෙනා ගැටළුවක් ලෙස සළකමින් ගෙවතු වගාවෙන් ඈත් වී සිටී.

එසේම බෝග සංස්ථාපනය සඳහා අවශ්‍ය මාධ්‍ය සොයා ගැනීමේ දුෂ්කරතා, ප්‍රමාණවත් හිරු එළිය නොලැබේ යැයි සිතීම, බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා ගන්නා ආකාරය පිළිබඳ නොදැනුවත්කම වැනි විවිධ හේතූන් මත මෙම තත්ත්වය තවත් උග්‍ර කරයි.

කරුණු මෙසේ වුව ද, ඉඩකඩ අඩු බිම් සඳහා විවිධ උපක්‍රම භාවිතා කරමින් පවතින සීමිත වූ ඉඩකඩ ඉතා කාර්යක්ෂමව භාවිතයට ගැනීම තුළින් ගෙදරට අවශ්‍ය එළවළු, පලතුරු, පලා වර්ග, ඖෂධ වගේම කුළුබඩු බෝගයන් ඉතා හොඳින් වගා කර තමන්ටම අවශ්‍ය පරිදි පහසුවෙන් ගෙවතු වගාවක් පවත්වා ගත හැකිය.

ඒ සඳහා පළමුවෙන්ම කළ යුත්තේ ගෙවත්තේ පවතින සීමිත ඉඩකඩ තුළ බෝග වගා කළ හැකි ස්ථාන හඳුනා ගැනීමයි.

උදාහරණ:

- ඔබගේ සඳළු තලය, පියැස්ස
- තට්ටු නිවසක නම් ඉහළ මාලයේ සඳළුතලය
- ගෙදරට පිවිසෙන ස්ථානය, ඉදිරිපස සහ නිවස අවට ඇති භූමි කොටස
- පස් රහිත/ගල් සහිත/ගල් බොරළු අධික වගාකළ නොහැකි ස්ථාන
- ගෙවත්තේ මායිම් වැට හෝ තාප්පය
- වහලයේ පියැසි මුදුන ආදී සියලුම ස්ථාන බෝග වගාවට ඉතා පහසුවෙන් යොදා ගත හැකියි.

## 6.1 හඳුනාගත් ස්ථාන සඳහා සුදුසු බෝග වගාවන් තෝරා ගැනීම

- ගෙවත්තේ හඳුනාගත් ස්ථාන සඳහා සුදුසු බෝග වර්ග තේරීම ඉතා කල්පනාකාරීව කළ යුතුවේ. මෙහිදී සළකා බලන කරුණු වනුයේ,
  - අදාළ ස්ථානයේ පවතින සම්පත්වල ස්වභාවය සහ සුලභතාවය
  - මූල පද්ධතිය සහ අතු පතර විහිදීමට ඇති ඉඩකඩ සහ බෝගවල වගා විලාසය
  - බඳුන්වල වගා කිරීමට ඇති හැකියාව
- විශේෂයෙන් නාගරික ප්‍රදේශවල ඉතා ඉහළට වැඩෙන බහු වාර්ෂික බෝග වගා කිරීම හා පවත්වා ගැනීම තරමක් දුෂ්කර වේ.
- නමුත් අපට අවශ්‍ය පලතුරු වැනි බහු වාර්ෂික බෝග වගා කිරීම සඳහා හොඳින් හිරු එළිය වැටෙන සඳලු තලය වගේම ඉහළ මාලයේ පියැසි මුදුන පහසුවෙන් යොදා ගත හැකියි.
- සෙවන සහිත ස්ථානවලට පළා වර්ග වන කංකුන්, නිවිති, මුකුණුවැන්න ආදිය යොදන්න.
- තරමක් අව්ව පවතින ස්ථානවලට ගොටුකොළ, බතල වැනි බෝග යොදා ගන්න.
- එළවළු සඳහා හොඳින් හිරු එළිය අවශ්‍ය වන බැවින් හොඳින් හිරු එළිය වැටෙන ස්ථාන එළවළු බෝග වගාව සඳහා තෝරා ගන්න. මෙහිදී ඉහළ මාලයේ පියැසි මුදුන හොඳින් හිරු එළියට නිරාවරණය වී ඇත්නම් එළවළු බෝග වගාව සඳහා වඩාත් සුදුසුම එක් ස්ථානයක් ලෙස හැඳින්විය හැක. ඒ තුළ පන්දලම් බෝග ද ස්ථාපනය කර වඩාත් අලංකාර කර ගත හැකියි.
- එසේම නිවසේ ඉදි රිපස හා අවට පවතින සීමිත ඉඩ කඩ තුළ ඉහළ අවකාශය මැනවින් භාවිතා කරමින් පන්දලම් බෝග නැත්නම් ආරුක්කු බෝග සිටුවන්න. මේ සඳහා කරවිල, පතෝල, වැටකොළු, ආලංගා, දඹල, අවර වැනි බෝග භාවිතා කළ හැකිය.
- එසේම කෙසෙල්, පැපොල් වැනි බෝග ද පහසුවෙන් එම පවතින ඉඩකඩ තුළ වගා කළ හැකියි.
- මීට අමතරව නිවසේ පියස්සේ එල්ලා තැබිය හැකි බඳුන් වර්ග භාවිතා කරමින් කොළ එළවළු වගාවන් කළ හැක.
- ඉතා ලේසියෙන් හා පහසුවෙන් ගෙදරින් ඉවතලන දේවල්වලින් ද සකසා ගත හැකි වගා බඳුන් ගෙවත්ත සඳහා භාවිතා කළ හැක. මීට අමතරව ගෙවතු හිමියන් විසින්ම නිර්මාණය කරගනු ලබන බෝග වගා ආකෘති හා බඳුන් මගින් ද, වෙළෙඳපොලෙන් මිලදී ගැනීම මගින් ද බෝග වගා ආකෘතීන් හා බඳුන් සපයා ගැනීම කළ හැක. එවැනි ආකෘතීන් හා බඳුන් ගෙවත්තේ බෝග වගාවට යොදවා ගැනීම නිසා අලංකාර වගේම ගෙවතු හිමින්ගේ නිර්මාණාත්මක හැකියාව පෙන්වීමට සමත්වීම තුළින් තෘප්තිමත් බවක් ලබා දීමට හැකි වේ. එලෙසම සීමිත ඉඩකඩකින් ගේ දොර ආහාර අවශ්‍යතාව ද ඉතා පහසුවෙන් සපුරා ගත හැකිය.

## 6.2 ඉඩකඩ අඩු ගෙවතු සඳහා යොදා ගතහැකි වගා ක්‍රම

**ඉවතලන ප්ලාස්ටික් බඳුන්වල වගාව**

- බඳුන්වල ප්‍රමාණය අනුව ඒවා එළවළු, පලතුරු සහ අනෙකුත් බෝග වගා සඳහා භාවිතා කළ හැකියි.
- එළවළු පැළයක් සිටුවීම සඳහා අවම වශයෙන් අඟල් 12 පමණ විශ්කම්භය ඇති අඩි 01 - 1 $^{1}/_{2}$ ක් පමණ උස ඉවතලන භාජන පහසුවෙන් භාවිතා කළ හැකිය.
- පලතුරු පැළයක් සිටුවන්නේ නම් ඒ සඳහා ඉවතලන බැරල්, ඉවතලන හිස් බඳුන් අඩි 1 $^{1}/_{2}$ - 02 ක් පමණ විශ්කම්භය ඇති අඩි 2 - 2 $^{1}/_{2}$ ක් පමණ උස් වූ (ලීටර් 200) ප්ලාස්ටික් බැරල් හෝ බැරල් භාග පහසුවෙන් භාවිතා කළ හැක.
- ඉවතලන බඳුන් භාවිත කිරීමේ දී සිටුවන බෝගයට අනුව සුදුසු බඳුන් තෝරා ගැනීම කළ යුතුය. එමෙන්ම එම බඳුන්වල වැඩිපුර ජලය බැස යාමට පතුලේ සිදුරු සකස් කර ගැනීම අවශ්‍ය වේ.



ප්ලාස්ටික් බඳුනක සිටවූ ජම්බෝල ගසක්



ප්ලාස්ටික් බඳුන්වල සිටවූ පලතුරු පැළ

- ඔබ සිටුවන්නේ මිරිස් පැළයක් නම් ඒ සඳහා අවම අඟල් 8 ක් වත් විශ්කම්භය ඇති අවම අඩි 01 ක් හෝ අඩි 1 $^{1}/_{2}$ ක් පමණ උස බඳුනක් භාවිතා කිරීමෙන් සාර්ථක වගාවක් පවත්වා ගත හැකිය.



බඳුන්ගත වගාවක්

- ගෙවත්තට අවශ්‍ය පැළ නිපදවා ගැනීමේ තවානක් ලෙස කුඩා ප්‍රමාණයේ ඉවතලන ප්ලාස්ටික් බඳුන් භාවිතා කළ හැකිය.

## මිලදී ගන්නා ප්ලාස්ටික් බඳුන්වල වගාව

- විවිධ ප්‍රමාණයේ හා විවිධ හැඩයේ ප්ලාස්ටික් බඳුන් වර්ග වෙළඳපොළේ ඇති අතර, ඒවා අතුරින් ගෙවත්තේ වගාකරන බෝගවලට ගැළපෙන බඳුන් මිල දී ගෙන බෝග වගාව සඳහා යොදා ගත හැක.



විවිධ හැඩැති ප්ලාස්ටික් බඳුන් භාවිතය



විවිධ හැඩැති ප්ලාස්ටික් බඳුන් භාවිතය

## ඉවතලන අනෙකුත් භාජන තුළ වගාව

- මේ සඳහා විවිධ ඇසුරුම්, ටයර්, ටින්, මෙගා ප්ලාස්ටික් බීම බෝතල් වගේම උණ බම්බු වැනි දේ පහසුවෙන් භාවිතා කළ හැක.
- මෙම බඳුන් ගොටුකොළ, නිවිති, කංකුන්, වැනි දේ වගා කිරීම සඳහා පහසුවෙන් භාවිතා කළ හැක. මේවා ඉතාම නිර්මාණශීලි ලෙස සකස් කර ගැනීම තුළින් ගෙවත්තට අලංකාරයක් එකතු කරයි.



ඉවතලන මෙගා බෝතල් භාවිතය




ඉවතලන ඇලුමිනියම් බඳුන් භාවිතය



ඉවතලන වැහිපිහිලි තුළ වගාව



ප්ලාස්ටික් බෝතල් තුළ වගාව

## වගා මළු තුළ වගාව

- නිවසින් ඉවතලන හාල් මළු තුළ ඉතා පහසුවෙන් බෝග සිටුවා ඒවා ඔබගේ නිවසේ ඉඩකඩ ඇති තැන්වල අලංකාරව සැකසීමෙන් නිවසට අලංකාරයක් ද ගෙන දෙයි. උදා : කි.ග්‍රෑ.10 හාල් මළු තුළ ඉතා පහසුවෙන් බතල වැනි බෝග වැවිය හැක.



පොලිසැක් මළු තුළ වගාව

- එසේම ගේජ් 150 ක් ඝනකම ඇති අඟල් 8 x අඩි 1 $^{1}/_{2}$ ප්‍රමාණයේ වගා මළු සකසා ගැනීම මගින් එළවලු වර්ග පහසුවෙන් වගා මළු තුළ වගා කර ගත හැකිය.

## සිමෙන්ති බඳුන් තුළ බෝග වගාව

- සිමෙන්ති වලින් සාදන ලද බඳුන් යොදා ගනිමින් විශේෂයෙන්ම බහු වාර්ෂික පලතුරු බෝග ඉතා පහසුවෙන් සීමිත ඉඩකඩ ඇති ස්ථානයක පවා ඉතා පහසුවෙන් වගා කළ හැක. මේ සඳහා අඩි 2x2 ප්‍රමාණයේ බඳුන් භාවිතා කළ හැකිය.
- මෙහි ඇති එක් අවාසියක් වන්නේ මෙම භාජන පහසුවෙන් එහා මෙහා කළ නොහැකි වීමයි. එහෙයින් එම බඳුන්වල පැළ ස්ථාපනය කරන අවස්ථාවේදීම ඒවා නිශ්චිතව තැබිය යුතු ස්ථාන පිළිබඳව කල් ඇතිව සැළසුම් කරගත යුතුව ඇත.



විවිධ හැඩැති සිමෙන්ති බඳුන්



සිමෙන්ති බඳුන් ආධාරකය

## 6.3 විවිධ සිරස් ව්‍යුහ භාවිතයෙන් බෝග වගාව

- ගෙවත්තේ සිරස් අවකාශය භාවිතා කරමින් බෝග වගාව සිදුකිරීම සඳහා විවිධ වූ සිරස් ව්‍යුහයන් භාවිතා කළ හැක. එමගින් ගෙවත්තෙහි සීමිත බිමක් පැවතීමේ ගැටළුව මග හරවා ගෙන බෝග ගණනාවක් වගා කිරීමට ඉඩ ලැබෙනු ඇත.
- ගෙවත්තේ ඉඩකඩ අඩු නිවාස වෙනුවෙන් විවිධාකාරයේ සිරස් ව්‍යුහ සකස් කර ගැනීමත්, ඒවායේ විවිධ වූ බඳුන් වර්ග එල්ලා ගැනීමත් කළ හැක. එනම් පොල් ලෙලි, ටින්, ප්ලාස්ටික් බෝතල්, උණ බම්බු වැනි දේ භාවිතා කර සකස් කර ගන්නා බඳුන් වලට අමතරව එල්ලා තැබිය හැකි ප්ලාස්ටික් පෝච්චි වෙළෙඳපොලෙන් මිලදී ගෙන මෙම සිරස් ව්‍යුහවල එල්ලා තැබිය හැක. මෙම බඳුන්වල බොහෝවිට ගැඹුරට මුල වර්ධනයක් නොවන බෝග වර්ග, පළා වර්ග හා මල් වර්ග භාවිතා කළ හැකිය.




බඳුන් එල්ලිය හැකි සිරස් ව්‍යුහයන්



ලී වලින් කරන ලද සිරස් ව්‍යුහයක්

- මෙම සිරස් ව්‍යුහ ලී වලින් මෙන්ම දිගුකල් පවතින සේ යකඩවලින් ද නිර්මාණය කර ගත හැක. තවද මෙම ව්‍යුහය පොළවේ ස්ථාවරව සිටුවිය හැකි ලෙස හෝ එසේ නැතහොත් පළල් පතුලක් සහිත වන ලෙස නිර්මාණය කර ගැනීම කළ හැක. එලෙස පළල් පතුලක් සහිත සිරස් ව්‍යුහයන් ගෙවත්තේ තැනින් තැනට මාරු කරගත හැකිවීම විශේෂ වාසියකි.
- සිරස් ව්‍යුහයන් කිහිපයකට උදාහරණ පහතින් විස්තර කර ඇති අතර ගෙවතු හිමියන්ගේ නිර්මාණශීලීත්වය මත වෙනස් වූ සිරස් ව්‍යුහයන් ද සකස් කරගත හැක.
- මෙම සිරස් ව්‍යුහය සඳහා යකඩ බට භාවිතා කරන්නේ නම්, ප්‍රධාන ආධාරකය සඳහා අඟල් $1^1/_2$ විශ්කම්භය ඇති යකඩ දණ්ඩක් භාවිතා කරන්න. එම ප්‍රධාන ආධාරකය වටා තිරස් ආධාරක දඬු මට්ටම් කිහිපයකින් සවිකර ගැනීම කළයුතු වෙනවා. මෙහිදී තිරස් ආධාරක දඬු එකිනෙකින් ආවරණය නොවන ලෙස සවි කර ගැනීම කළහොත් හොඳින් හැරුඑළිය ලැබෙන ව්‍යුහයක් සකස් කර ගැනිමට හැකිවේ.

**යකඩ රාමු සහ නොගැඹුරු ප්ලාස්ටික්/ මැටි බඳුන් යොදා සකස් කරන ලද බෝග වගා ව්‍යුහ**

- මෙම බෝග වගා ව්‍යුහය හරියට කරකැවෙන සීසෝවක් වැනිය. මෙම වගා ව්‍යුහ ලී සහ යකඩ දඬු භාවිතා කරමින් සකස් කර ගත හැක. ලී වලින් සකස් කර ගන්නේ නම්, පහසුවෙන් හා අඩු වියදමකින් සකස් කරගත හැකි වුවද කැරකෙන ආකාරයේ ව්‍යුහයක් ලෙස සකස් කර ගැනීම අපහසු වේ.
- මෙම වගා ව්‍යුහයේ පොළව මට්ටමේ සිට අඩි $1^1/_2$ - 2 ක් පමණ ඉහළින් ප්‍රධාන දණ්ඩට තිරස් දඬු වටේටම සවි කරගන්න. මෙම තිරස් දඬුවල විවිධ වූ බඳුන් වර්ග එල්ලා ගතහැක.




යකඩ බට වලින් කරන ලද සිරස් ව්‍යුහයක්

- යකඩ දඬු භාවිතා කරන්නේ නම් අඟල් ¾ හෝ අඟලක් පමණ විශ්කම්භය ඇති යකඩ බටයක් ප්‍රධාන දණ්ඩ සඳහා භාවිතා කරන්න. තිරස් දඬු සඳහා විශ්කම්භය අඩු හතරැස් හෝ රවුම් යකඩ දඬු භාවිතා කළ හැක.
- මෙම ව්‍යුහය විශේෂයෙන්ම පලා වර්ග ගැඹුරට මුල් නොඇදින එළවළු (වැල් බෝග), විසිතුරු මල් වර්ග ද සහිත බඳුන් මිශ්‍ර කිරීමෙන් අලංකාර වගා ව්‍යුහයක් ගෙවත්තට ලැබේ.

- මෙම ව්‍යුහය යකඩින් නිර්මාණය කිරීමේ දී ප්‍රධාන දණ්ඩේ කෙළවරට බෙයාරින් කට්ටලයක් සවි කිරීමෙන් කැරකෙන වගා ව්‍යුහයක් ලෙස නිර්මාණය කර ගත හැකි අතර එක ස්ථානයක සිට ඔබට සියලුම බෝග වර්ග පහසුවෙන් පරික්ෂා කිරීම හා නඩත්තු කටයුතු සිදු කළ හැක.
- ලී වලින් නිර්මාණය කර ගන්නා ව්‍යුහයක් සඳහා බඳුන් ස්ථාන ගත කිරීම සඳහා ලී රවුම් නිර්මාණය කිරීම අපහසු බැවින් බඳුන් එල්ලීම (දණ්ඩේ අග) සිදු කළ හැක.

**Over Knee Technology (OK) වගා තාක්ෂණය හෙවත් දණහිසෙන් ඉහළට බෝග වවන බෝග වගා කුළුණ**

- බිම් මට්ටමේ සිට අඩි එකහමාරත්, පහහමාරත් අතර උස පරාසය තුළ තබන රාක්ක මත ඇති ව්‍යුහ බඳුන් තුළ එළවළු වගා කිරීම OK තාක්ෂණය (දණහිසෙන් උඩ තාක්ෂණය) ලෙස හඳුන්වයි.



OK තාක්ෂණය භාවිතා කළ වගා කුළුණක්

- මෙය ගුණාත්මක නිමැවුමට සකස් කළ අඩි 5 $^{1}/_{2}$ ක් පමණ උස වන බෝග වගා බඳුන් තැබිය හැකි වළලු සහිත ව්‍යුහයකි. මේ සඳහා සිරස් 20 mm යකඩ කම්බි 03 භාවිතා කරමින් 16 mm ඝනකමින් යුත් යකඩින් නිර්මිත චක්‍රාකාරව සකස් කළ කම්බි 03 ක් භාවිතා කරයි.
- මෙහි මුල්ම බෝග වලල්ල බිම සිට අඩි 1 $^{1}/_{2}$ ක් පමණ උසින් අඩි 04 ක් පමණ විශ්කම්භයක් ඇතිව පළමු තිරස් වළල්ල ලෙස ස්ථාන ගත කළ යුතුයි.




පළමු පියවර

- ඉන්පසු පළමු තිරස් වලල්ලේ සිට අඩි 02 ක් උසින් අඩි 03 ක විශ්කම්භයක් සිටින සේ දෙවන තිරස් වලල්ල සකස් කර ගන්න.




දෙවන පියවර

- ඉන්පසු දෙවන තිරස් වලල්ලේ සිට අඩි 02 ක් ඉහළින් තෙවන හෙවත් අවසාන තිරස් වලල්ල සකස් කර ගත යුතුයි. එම අවසාන තිරස් වලල්ලේ විෂ්කම්භය අඩි 02 ක් වේ.




තුන්වන පියවර

- මෙම ව්‍යුහයේ වලලු 03 හි කම්බි මත T හැඩයට (සෙ.මී. 8 පමණ උස් වන) සකස් කළ යකඩ කුරු අඩියක පමණ දුරක් සහිතව වලලුවලට සවි කරන්න. මෙහිදී එම යකඩ කුරු යටිකුරු T ආකාරයට වලල්ලට වෑල්ඩින් කර සවි කර ගත යුතුය.
- 30 cm පමණ උස 15 cm පමණ විෂ්කම්භයක් ඇති ඝනකමින් වැඩි පොලිතීන් බෑග් හෝ 5 Kg පොලිසැක් බෑග් වගා මලු මෙම ව්‍යුහය සඳහා භාවිතා කළ හැකිය.
- පළමුව වගා බඳුන්වල අඟල් 3 පමණ ඉහළ සිට වටේට සිදුරු සකසා ගන්න. මතුපිට පස් කොටස් 01 ක්, ගොම පොහොර කොටස් 01 ක් හෝ කොම්පෝස්ට් පොහොර කොටස් 01 ක් මිශ්‍රකර සාදාගත් බඳුන් මිශ්‍රණයෙන් ඉහත කී බඳුන් පුරවාගන්න. එහෙත් මතුපිට පසේ මැටි ප්‍රතිශතය වැඩි නම් ගංගා වැලි කොටස් $^{1}/_{2}$ සහ දහයියා අඟුරු කොටස් $^{1}/_{2}$ මිශ්‍ර කර ගත හැකිය. බඳුන් මිශ්‍රණය පුරවා ගැනීමේ දී බඳුනේ ඉහළ සිට 3 cm පමණ ඉතිරිවන ලෙසින් රෝපණ මාධ්‍ය පුරවා ගැනීම කළ යුතුය.
- සකස් කරගත් බඳුන් යටිකුරු T හැඩැති කුරු තුළට බස්සා ගත යුතුවේ. මේ ආකාරයට වගා බඳුන් තිරස් වළලු 03 මතම ස්ථාන ගත කරන්න. මෙහිදී සෙවන වැඩි වශයෙන් අවශ්‍ය බෝග සහිත බඳුන් පහළ තට්ටුවේ ද, අලෝකය වැඩි වශයෙන් අවශ්‍ය හා ජල සම්පාදනය අඩුවෙන් අවශ්‍ය වන බෝග සහිත බඳුන් ඉහළ තට්ටුවේ ද ස්ථාන ගත කළ යුතුය.



වගා කුළුණේ බඳුන් තැන්පත් කිරීම

- නිර්දේශිත පොහොර යොදා දින 03 පසු බීජ, පැළ හෝ දඬු කැබලි සිටුවා ගත හැකිය. බෝගයේ අවශ්‍යතාවය මත ජල සම්පාදනය කළ යුතුයි.

### ගෙදර සඳළු තලයේ වගාව

- ඔබගේ නිවසේ පහළ ඉඩකඩ ඇති සඳලුතලය කොළ එළවළු වගාව, වැල් බෝග වගේම පලතුරු බෝග බඳුන් වගාව සඳහා ඉතා පහසුවෙන් යොදා ගත හැක. මෙය නිවසට ඉතා අලංකාරමත් බවක් මෙන්ම වර්ණවත් බවක් ද ලබා දේ.
- පහළ සඳළු තලයේ ඉඩකඩ ඇති ස්ථානවල බෝග වගා බඳුන් ස්ථාන ගත කිරීමෙන්

නිවසට ඉතා අලංකාර බවත් ගෙන දෙන අතර පවුලේ ආහාර අවශ්‍යතාවය ද ඉටු වෙයි.



සඳළු තලයේ වගාවක්



සඳළු තලයට විවිධ බඳුන්

## 6.4 ඉහළ මාලයේ පියැසි මුදුන මත බෝග වගාව

- ඒ සඳහා නිවසේ ඉහළ මාලයේ පියැසි මුදුන බෝග වගාව සඳහා සකස් කර ගත යුත්තේ ඉංජිනේරු උපදෙස් මතයි.
- ගෙවත්තෙහි ඉහළ මාලයේ පියැසි මුදුන ගෙවත්තක් බවට පත්කිරීමේ අභිලාෂයක් ඇත්නම් නිවස තනන අවස්ථාවේදීම ඒ පිළිබඳව ඉංජිනේරු උපදෙස් ලබාගෙන සකස්කර ගැනීමේ කටයුතු සිදු කරන්න.
- ඉහළ මාලය තුළ ගෙවත්තක් පවත්වාගෙන යන්නේ පස් වගා මාධ්‍යක් සහිතව නම් ඒ සඳහා ඔරොත්තු දෙන ලෙස පියැසි මුදුන නිර්මාණය කර ගත යුතුයි.



ඉහළ මාලය භාවිතා කළ ගෙවත්තක්

- එසේම ඉහළ මාලයේ පියැසි මුදුන ජලය බැසයාමට මෙන්ම ජලයට ප්‍රතිරෝධී වන සේ බිම සකස් කිරීම ද කළ යුතුය.
- පියැසි මුදුන ගෙවත්ත සඳහා යොදා ගන්නේ බඳුන් භාවිතා කරන වගාවක් නම් ඒ සඳහා යොදා ගන්නා බඳුන් ප්‍රමාණය, යොදා ගන්නා මාධ්‍ය ප්‍රමාණය හා ඒවායේ බර ප්‍රමාණය සම්බන්ධයෙන් දැනුවත්ව ඉංජිනේරු උපදෙස් මත ඉහළ මාලය නිර්මාණය කර ගන්න ඔබට හැකිය.
- එසේම දැනටමත් ඉදිකර ඇති නිවසක නම් ඉහළ මාලයේ පියැසි මුදුන ගෙවත්තක් සඳහා යොදා ගැනීමේ දී සැළකිලිමත් විය යුතුය. එහිදී,
  - එය ජල ප්‍රතිරෝධී කර ඇති ද යන්න ගැන දැනුවත් විය යුතුයි.
  - එසේම ප්‍රමාණවත් ලෙස ජලය බැස යාමේ

පහසුකම් සහිත ද යන්නත් ගැනත් සොයා බැලිය යුතුය.

- එසේම පියැසි මුදුනේ කෙතරම් බර ප්‍රමාණයක් දරා ගත හැකි ද යන්න ගැන ද අවබෝධයක් ඇතිව, ඔබ විසින් ගෙවත්ත නිර්මාණය කර සැළසුම් කර ගැනීම සිදු කළ යුතුය.



ඉහළ මාලයේ බඳුන් තුළ වගාව

## 6.5 එල්ලෙන වගා මළු තුළ බෝග වගාව

- එල්ලෙන වගා බඳුන් භාවිතා කරමින් ඉතා පහසුවෙන් පළා වර්ග වවා ගත හැකි අතර ඔබගේ වහලයේ පියස්ස මෙන් ම අවට ඇති ගස් කොළන් ද, මේ සඳහා භාවිතා කළ හැක.
- එසේම විවිධ සිරස් ව්‍යුහ නිර්මාණය කරමින් ඒවා ද එල්ලෙන වගා මලු ක්‍රමයට බෝග වගාව සඳහා යොදා ගත හැක.
- මෙම එල්ලෙන මලු තුළ වගා කරන බෝග සඳහා ඉහළින් එල්ලන කුඩා සිදුරකින් යුත් සේලයින් බටයක් සවි කරන ලද මැටි බඳුනක් මගින් ඉතා පහසුවෙන් බෝගයේ ජල අවශ්‍යතාවය සපුරාලීමට ද ඔබට හැකි වේ.



සරල ජල සම්පාදන ක්‍රමයක්

## 6.6 නිවසේ ඇතුළත පවා වගා කළ හැකි ජල රෝපිත වගා බඳුන්

- ජල රෝපිත වගාව යනු ශාක පෝෂක අඩංගු ජලීය මාධ්‍යක් භාවිතා කරමින් ශාක පෝෂණය සිදු කරමින් පවත්වාගෙන යනු ලබන වගා ක්‍රමයක්.
- මේ මගින් බෝග වර්ධනය සීමාකාරී වන අවස්ථාවන්හි දී මෙන් ම පසෙහි වගා කිරීමේ දී මතුවන විවිධ සීමාකාරී සාධක මගහැර වීම සඳහා භාවිතා කළ හැකි විකල්ප ක්‍රමයකි.
- මේ සඳහා සෑප්ෆෝම් බඳුන් මෙන්ම සිමෙන්ති බඳුන් ද, ප්ලාස්ටික් බඳුන් ද භාවිතා කළ හැක. නමුත් පහසුවෙන් හා ලාභදායීව ලබා ගත හැකි සෑප්ෆෝම් බඳුන් මේ සඳහා වඩාත් සුදුසුය.
- ඕනෑම ප්‍රමාණයේ සෑප්ෆෝම් බඳුනක් මේ සඳහා සුදුසුය. අල බෝග හැර වෙනත් ඕනෑම බෝග වර්ගයක් ඉතා පහසුවෙන් වගා කළ හැකි ක්‍රමයක් ලෙස ඉතා ප්‍රචලිතව ඇත.

- අවශ්‍යතාවයට ගැළපෙන පරිදි සෘප්ුෆෝම් පෙට්ටියක් ගෙන එහි ඇතුළත ඝනකම් කළු පොලිතීනයකින් (ගේජ් 150) ආවරණය කරන්න. ඒ සඳහා පොලිතීනය පෙට්ටියේ ඇතුළත ඇලවිය යුතුයි. ඇලවීම සඳහා ගම් ටේප් යොදා ගත හැකිය.



සකස් කළ සෘප්ුෆෝම් බඳුනක්



සකස් කළ සෘප්ුෆෝම් පෙට්ටියක්

- පැළ සිටුවීම සඳහා නිවසින් ඉවත ලන ප්ලාස්ටික් කෝප්ප හෝ ඒ ආකාර බඳුන් භාවිතා කරන්න. එසේ නොමැති නම් එවැනි බඳුන් වෙළඳපලින් මිල දී ගත හැක.
- එසේම නිවසේ ඉවතලන මෙගා බීම බෝතල්වල අඩක් වන සේ කැපූ කොටස් ද මේ සඳහා භාවිතා කළ හැක.
- ඔබ භාවිතා කරනු ලබන සෘප්ුෆෝම් පෙට්ටියේ පියනෙහි යොදා ගනු ලබන ප්ලාස්ටික් කොප්ප හෝ බඳුන්වල විශ්කම්භයට සමාන වන ආකාරයේ සිදුරු සකස් කරගන්න. එම සිදුරු සමාන පරතරයක් ඇතිව පියන මත පිහිටා තිබිය යුතුය.
- මෙම ප්ලාස්ටික් කොප්පවල පතුල හා වටේ බිත්තිවල මි.මී. 5 ක් පමණ වන සිදුරු සකස් කර ගන්න. එය බෝග පැළවල මූල මණ්ඩලයේ වර්ධනයට මෙන්ම ජලීය මාධ්‍යයේ පෝෂණය උරා ගැනීම සඳහාත් වැදගත් වේ.
- මෙම ප්ලාස්ටික් කොප්පවල ඇතුළත සිදුරු සහිත දැලකින් (කොළපාට දැල් කැබැල්ලකින් බඳුනේ ප්‍රමාණය අනුව) ආවරණය කර ඒ තුළට වගා මාධ්‍ය පුරවා බීජ හෝ පැළ සිටුවීම කළ හැක.



සකස් කළ බඳුන්

- දැලකින් ආවරණය කරන්නේ වගා මාධ්‍යය පෙට්ටියට යොදන ජලීය මාධ්‍යය තුළ දියවී යාම වැළැක්වීම සඳහාය.
- ඉන්පසු බඳුන ජලීය පෝෂක මාධ්‍යයෙන් පුරවා බඳුන් ස්ථාන ගත කළ හැකිය. ජලීය මාධ්‍යයේ යම්තම් ගෑවෙන මට්ටමට සිටින සේ වගා බඳුන් ස්ථාන ගත කළ යුතුයි.



සකස් කළ බඳුනක අභ්‍යන්තර පෙනුම

- ජලීය පෝෂක මාධ්‍යය සකස් කර ගැනීම සඳහා ඔබට වෙළඳපලින් ඇල්බට් පොහොර මිල දී ගත හැක. (එහි ඇති උපදෙස් අනුව ජලීය පෝෂක මාධ්‍ය සකස් කරගන්න)



ජලරෝපිත තාක්ෂණයෙන් සකස් කළ වගාවක්

- ද්‍රාවණ මට්ටම වරින්වර පරීක්ෂා කිරීමත් මසකට වරක් නව ද්‍රාවණයක් යෙදීම කරන්න.
- ජලරෝපිත වගාවන් සඳහා එළවළු, පළා වර්ග, ඖෂධ, කුළුබඩු බෝග ඉතා පහසුවෙන් වගා කළ හැකිය.
- ඔබේ නිවසේ ආලින්දයේ පවා පවත්වා ගෙන යා හැකි ජල රෝපිත වගාව නිවසට අමුතුම සුන්දරත්වයක් එක් කරයි.



ජල රෝපිත තාක්ෂණය භාවිතා කළ බඳුන් රැසක්

## 6.7 සිරස් ජීව ව්‍යුහ

**වගා පැළැල්ල**

- ඉඩකඩ නොමැති හා පසක් නොමැති ස්ථානවලට සුදුසුයි.
- සිරස් ඉඩ මෙම ව්‍යුහය සඳහා භාවිතා කරන බැවින් ඉහළ අවකාශය කාර්යක්ෂමව වගා කටයුතු සඳහා යොදා ගත හැකි ක්‍රමයකි. වැහි පිහිලි ආධාර කරගෙන මෙම ව්‍යුහය සකස් කර ගත හැක. ආධාරකයේ උස අනුව වැහි පිහිලි ප්‍රමාණය වැඩි කර ගත හැකිය.
- අඩි 2 $^1/_2$ දිගින් යුතු වැහි පිහිල්ලක් ගෙන දෙපස විවෘත කොටස වසා ගත යුතුය. ඉන්පසු වැහිපිහිල්ල යටින් ජලය බැස යන සේ අඟල් භාගයක් පමණ වන කුඩා සිදුරු සාදාගත යුතුය.
- මෙම වගා ව්‍යුහය එල්ලෙන ලෙස සකසන බැවින් වැහි පිහිල්ල දෙපසින් සිදුරු කර එල්ලා ගැනීමට සුදුසු සේ සකස් කර ගත යුතුයි.

- වැහි පිහිලි පිරවීම සඳහා හලාගත් පස්, කාබනික පොහොර හා කොහු බත් සම ප්‍රමාණයෙන් ගත යුතුය.
- ඕනෑම පළා වර්ගයක් වගා කළ හැකියි.



වගා පැළැල්ලක්

- වගා දඬු සිටුවා මුල් අද්දවා ගන්නා තෙක් මෙම ව්‍යුහය මද ආලෝකයක් සහිත ස්ථානයක තැබිය යුතුය.
- වගා පැළැල්ල සවි කරන ආධාරකය අඟල් ¾ ගැල්වනයිස් හෝ ලී ආධාරකයක් යොදා ගත හැකි අතර, යොදා ගන්නා ආධාරකය වැහිපිහිලිවලට වඩා දිගින් වැඩි වන ලෙස ද අපට පාලනය කළ හැකි උසකින් යුක්ත වන ලෙස ද සකස් කර ගත යුතුයි. ආධාරකය බිම රඳවා ගත යුතු ආකාරයට අඩියක් භාවිතා කළ යුතුයි.
- වැහිපිහිලි වෙනුවට උඩ කොටසින් ඉවත් කළ (යට කුහරයක් සිටින) උණ බට ද මේ සඳහා යොදාගත හැක.

**වගා කුළුණ**

- ඉඩකඩ අඩු ස්ථානවල වඩාත් සුදුසු අහස ජයගත හැකි වායව සිරස් පාත්තියකි.



සකස් කළ වගා කුළුණක්

- වගා කුළුණ පහසු උසකින් සකසා ගතහැකි අතර කුකුල් දැලක් රවුමක ආකාරයෙන් සකස් කර එහි ඇතුළත පෘෂ්ඨයේ ගේජ් 300 කළු පොලිතීනයක් හෝ පොලිසැක් මළු හෝ දැල් ගෘහ වලට භාවිතා කරන කොළ පැහැති දැළ අතුරා වගා කුළුණ සකස් කර ගන්න.
- පස් මිශ්‍රණය පිරවීමට පෙර වගා කුළුණට ජලය ලබාදීම සඳහා ඇතුළතින් අඟල් 2 විෂ්කම්භය සහ අඩි 6 ක් පමණ උස සිදුරු සහිත P.V.C බටයක් තැබීම අවශ්‍ය වේ.
- ඒ සඳහා බටයේ එක් කෙළවරක වැසුම් පියනක් (end cap) යොදා වසා ගන්න. වැසුම් පියන ඇති පහළ පැත්තේ සිට අඟල් 6 ක් පමණ ඉහළින් පටන්ගෙන පරතරය අඟල් 6 සිට අඟල් 3 ක් පමණ පරතරයක් දක්වා අඩුවන ලෙසින් රත් කරන ලද අඟල් දෙකේ ඇණයකින් සර්පිලාකාරව සිදුරු විදගන්න.

- එම බටය වගා කුළුනේ මැදට සම්බන්ධ කර වගා කුළුනේ බාහිර සහ එස්ලෝන් බටය අතර කොටසට මතුපිට පස්, කොම්පෝස්ට් හා කොහුබත් කොටස් 01 බැගින් යොදාගත් මිශ්‍රණයෙන් පුරවාගත යුතුයි.
- ඉන්පසු එම සිදුරු සහිත බටයට ජලය පිරවූ විට බිංදු ආකාරයට මුළු බෑගයම තෙමෙන ලෙස ජලය කාන්දු වී ජල සම්පාදනය සාර්ථකව සිදුවේ.
- සූර්යාලෝකය වැඩිපුර අවශ්‍ය බෝග ඉහළ මට්ටමේ ද, සූර්යාලෝකය අඩුවෙන් අවශ්‍ය වන බෝග පහළ මට්ටමේ ද වගා කර ගත හැකියි.
- සිරස් කුළුණ මත ත්‍රිකෝණාකාර ක්‍රමයකට අඟල් 6 ක පමණ පරතරයකින් පැළ සිටුවා ගත හැකියි. (බෝග අනුව පරතරය වෙනස් කරගත හැකිය) මෙහිදී බෝග වගා කිරීම සඳහා බඳේ යටිකුරු T හැඩැති කැපුමක් සිදු කර පැළය සිටුවීමට හැකි ලෙස පස් ඉවත් කර සාදා ගත යුතුයි. එවන් ස්ථානවල මුල් ඇද්දවූ බෝග සිටවූ විට ඉක්මනින් පැළවීම සිදු වී සාර්ථක වගාවක් දැකිය හැක.
- මීට අමතරව වෙනත් විවිධ ව්‍යුහයන් භාවිතා කරමින් ඉඩකඩ අඩු ස්ථානවලට යොදාගත හැකි වගා කුළුනු නිර්මාණය කර ගැනීමෙන් ඔබගේ ගෙවත්ත අලංකාර බව හා විවිධත්වයකින් යුක්ත ස්ථානයක් බවට පත් කරගත හැක. උදා : උණ බම්බු භාවිතා කිරීම, සිදුරු කරන ලද පරණ බැරල් හා ප්ලාස්ටික් බැරල් භාවිතා කිරීම වැනි අවස්ථා



*උණ බටවලින් නිර්මාණය කරගත් වගා කුළුණක්*

**වගා පොහොට්ටුව**

- ඉඩකඩ සීමා වී ඇති නිවසේ ඉදිරිපස ඉඩකඩ ඇති ස්ථානයක වගා රාමුවක් සකස් කර ගත හැක.
- ඒ මගින් ඔබට අවශ්‍ය පළා වර්ග, එළවළු පැළ කිහිපයකුත් වගා කර ගත හැකි සේම මෙය ඔබේ ගෙවත්තට අලංකාරයක් ගෙනඑනු ලැබේ.
- පියවරෙන් පියවර පහත විස්තර කර ඇති ආකාරයට වගා රාමුව සකස් කර ගන්න.

- හොඳින් හිරු එළිය වැටෙන තැනක් තෝරාගත යුතුයි.
- එම ස්ථානයේ වෘත්තාකාර ලෙස අඩියක පමණ ගැඹුරු වලක් සකසා ගැනීම.
- අඩි 04 පමණ දිගට කපාගත් පොල් පිති 06 ක් හෝ 08 ක් පමණ ගන්න.

- සකස් කරගත් වල වටේට පොල්පිත්තේ හිස කොටස උඩට සිටින සේ පොල්පිති කවාකාරව සිටුවා වගා මළු දමා තද කර ගන්න.
- දැන් නෙලුම් මලක් සේ පෙනෙන ව්‍යුහයක් ඔබට දැක ගත හැකියි.



පොල් පිතිවලින් සකස් කරගන්නා ලද ව්‍යුහය

- පොල් පිතිවල සිදුරු විද එකිනෙක කම්බි මගින් බැඳ ගැනීම.



කම්බිවලින් පොල් පිති බැඳ ගැනීම

- වගා බිමේ මතුපිට පස්, කොම්පෝස්ට්, ගොම සමානුපාතිකව ගෙන සකසා ගත් වගා මාධ්‍යයක් භාවිතා කර සම්පූර්ණ ව්‍යුහය පුරවන්න.
- උළු කැට මගින් පොල්පිති රාමුවට පිටතින් නැවත රවුමක් ඇති වන ලෙස සකස් කර ගෙන එම රවුම ද නැවත වගා මාධ්‍යයෙන් පුරවන්න.

- වගා මාධ්‍ය පොල් පිති සිදුරු මගින් බිමට වැටීම වළක්වා ගැනීම සඳහා කුඩා පොල් පිති මගින් සිදුරු ආවරණය කළ හැකියි.



සම්පූර්ණ කරනලද ව්‍යුහයක්

- පැළ සිටුවීමට පෙර මල් බාල්දියක් මගින් ජලය සම්පාදනය කළ යුතුයි.
- වසර එකහමාරක් පමණ වගා කටයුතු සඳහා යොදා ගත හැකියි.



සම්පූර්ණ කරන ලද වගා ව්‍යුහයක්

- වගා කුඩ, වගා රාක්ක, වගා ඉනිමං වගේ ඔබගේ නිර්මාණශිලීභාවය අනුව ඕනෑම ආකාරයක වගා ව්‍යුහයන් නිර්මාණය කර පවතින ඉඩකඩ ඵලදායි ලෙස පහසුවෙන් යොදා ගන්න පුලුවන්.
- එසේම සීමිත ඉඩක් තුළ ඔබේම ගෙවත්ත ඉතා නිර්මාණාත්මක, කළාත්මකව මෙන්ම ඔබගේ අවශ්‍යතාවයන් ඉටුවන පරිදි සකස් කර ගන්න ඔබට හැකියාව ඇත.

# 6.8 කුඩා ඉඩක් සඳහා වගා ව්‍යුහ


සිරස් වගා කුළුණ


වගා රාක්ක


සිරස් වගා කුළුණ


එල්ලන බඳුන් තුළ වගාව


උළු කැට ව්‍යුහය තුළ වගාව


ටයර් තුළ වගාව


උණ බට තුළ වගාව


සිරස් වගා මළු


වගා ආරුක්කු


සිරස් වගා බඳුන්



# 07 පලතුරු වගාවේ මුහුණ දෙන ගැටළු හා ඒවාට ලබා දිය හැකි විසඳුම්

## 7.1 පලතුරු ගස් වල එල හට නොගැනීම සඳහා විසඳුම්

- බොහෝමයක් පලතුරු වර්ග හා ඒවායේ ප්‍රභේද නිශ්චිත වූ දේශගුණය හා පාරිසරික තතත්ව යටතේ වගා කළ විට පමණක් ගුණාත්මයෙන් උසස් හොඳ අස්වැන්නක් ලබා දීමට සමත් වේ. එහෙයින් ගෙවත්තක් සඳහා අදාළ පලතුරු පැල තේරීමේ දී එම බෝගය හා අදාල ප්‍රභේදය තම ගෙවත්තට ගැළපේ ද යන්න පිළිබඳ අවධානය යොමුකර කටයුතු කළයුතුව ඇත.
- එහෙත් ඉහත කී කරුණට අමතරව සමහරක් ගෙවතු වල පවතින පලතුරු ගස් වල එල හට නොගැනීම හෝ ඉතා අඩු එලදාවක් ලැබීම බොහෝ ගෙවතුවල මතුවන ප්‍රධාන ගැටළුවක් ලෙස සඳහන් කළ හැක.
- මේ සඳහා විවිධ හේතු බලපාන අතර මෙම ගැටළු හඳුනාගෙන නිවැරදි කිරීම තුළින් එල හට ගැනීම උත්තේජනය කළ හැක.

**ජලය හා පෝෂක අධිකව ලැබීම**

- පලතුරු ගස් සඳහා ජලය හා පෝෂක අධිකව ලැබීමෙන් වර්ධක වර්ධනය උත්තේජනය වී පත්‍ර ප්‍රමාණය වැඩිවේ. ශාකය දළු දමමින් වර්ධනය වන නිසා ප්‍රජනක වර්ධනයට එළඹී මල් හට ගැනීම ප්‍රමාද වේ.
- විශේෂයෙන්ම නයිට්‍රජන් සහිත පොහොර වැඩිපුර යෙදීම මඟින් අනවශ්‍ය ලෙස ශාකයේ වර්ධක වර්ධනය වැඩි වේ.
- එම නිසා අනවශ්‍ය ආකාරයට ජලය හා පොහොර යෙදීමෙන් වැළකී තුලිත පොහොර භාවිතයක් කළ යුතුයි.

**ශාකය වයස්ගත වීම**

- එල දරන කාලය ඉක්මවූ පැරණි පලතුරු ගස් ගෙවත්තේ තිබිය හැක. එවැනි ගස් කප්පාදු කර පුනරුත්ථාපනය කිරීමෙන් එල දරණ තත්වයට පත් කළ හැක.
- මෙහිදී පහළ මට්ටමේ සිට අඩි 1 $^{1}/_{2}$ - 2 ක් පමණ උසකින් ප්‍රධාන කඳ ආනතව කපා ඉවත් කර එමගින් ලියලන රිකිලි 3-4 ක් විවිධ

දිශාවන්ට සිටින සේ වර්ධනය වීමට ඉඩ හරී. මෙවිට වසර 3-4 ක් ගතවන විට ඵල හට ගැනීම ආරම්භ වෙයි.

## පිරිමි මල් පමණක් හටගන්නා පලතුරු ශාක



මුදුන් සැකසීම කළ ශාකයක්

- සමහර පලතුරු ශාකවල පුමාංගි මල් (පිරිමි මල්) පමණක් හට ගනී. රඹුටන්, උගුරැස්ස වැනි බෝග වල මෙය බහුලව දැකිය හැක. මෙය ප්‍රවේණිකව සිදුවන නිසා රෝපණ කටයුතු මගින් වෙනස් කළ නොහැක.
- මෙහිදී මුදුන් සැකසීම මගින් ශාකය පුනරුත්ථාපනය කිරීමෙන් ඵල දරණ තත්වයට පත් කළ හැක.
- මෙහිදී පොලොව මට්ටමේ සිට අඩි $1\,^{1}/_{2}$ - 2 ක් පමණ උසකින් ගස කපා ඉවත් කර එයින් ලියලන නව රිකිලි 3-4 ක් සඳහා බද්ධ කිරීම කළ හැකිය. විවිධ දිශාවන්ට සිටින සේ ඇතිවන මෙම රිකිලි සඳහා හොඳින් ඵලදරණ ගසකින් ලබාගත් අනුජයන් යොදා ගෙන රිකිලි බද්ධය සිදු කර ගත හැකිය. ඉන් වසර 3-4 ක් ගතවන විට ගස නැවත ඵල දරණ තත්වයට පත්වේ.
- මෙලෙස මුදුන් සැකසීම සිදු කරන අවස්ථාවේ දී ශාකයට අවශ්‍ය පමණට පෝෂ්‍ය ද්‍රව්‍ය හා ජලය කාලයක් පුරාවට ලබා ගත හැකි තත්ත්වයක් තිබීම අවශ්‍ය වේ.

## පලතුරු ශාකය සෙවණ සහිත ස්ථානයක තිබීම

- පලතුරු ගස්වල ගෙඩි හට ගැනීම සඳහා පත්‍ර වලට හොඳින් හිරු එළිය ලැබිය යුතුය. එමගින් ශාකයේ ආහාර නිෂ්පාදනය වැඩිවන අතර ශාකයේ නඩත්තුවට වැය වී අතිරික්ත ආහාර ප්‍රමාණය ශාකයේ තැන්පත් වේ. එමගින් ශාකයේ පවතින නයිට්‍රජන් ප්‍රමාණයට සාපේක්ෂව කාබෝහයිඩ්‍රේට් ප්‍රමාණය වැඩිවීම මගින් කාබන්/නයිට්‍රජන් අනුපාතය (C/N) වැඩි වී ගෙඩි හට ගැනීම උත්තේජනය වේ.
- මෙහිදී අවට ගස්වලින් සෙවණ ලැබේ නම් අනවශ්‍ය සෙවණ ඉවත් කර හොඳින් හිරු එළිය ලැබීමට සැලැස්විය යුතුය.



හොඳින් හිරුඑළිය ලැබෙන අඹ වගාවක්

- දැනට පවතින තත්ත්වයට අමතරව ඉදිරියේ දී ගෙවත්තේ ඇති විය හැකි වෙනස්වීම් ගැනද සැළකිල්ලට ගෙන හොඳින් හිරු එළිය වැටෙන ස්ථානයක් තෝරා පලතුරු ශාක සිටුවීම කරන්න.

## ශාකයේ අනවශ්‍ය අතු හා රිකිලි බහුලව තිබීම

- අන්‍යෝන්‍ය සෙවණ සහිතව අතු පිහිටීම මගින් සෙවණ සහිත පත්‍ර ආහාර නිෂ්පාදනයට

දායක නොවේ. ආලෝකය ලැබෙන පත්‍ර නිපදවන ආහාර සෙවණ සහිත පත්‍ර ප්‍රයෝජනයට ගැනීම නිසා ශාකයේ සංචිත ආහාර ප්‍රමාණය අඩුවේ.

- එමෙන්ම ලෙඩ රෝග වැළඳුනු ශාක කොටස් මඟින් ද ආහාර නිෂ්පාදනය අඩුවේ.
- මේ නිසා සෑම පත්‍රයකටම හොඳින් හිරු එළිය ලැබෙන පරිදි අනවශ්‍ය අතු හා රිකිලි කප්පාදු කර ඉවත් කළ යුතුය.



*අනවශ්‍ය අතු රිකිලි ඉවත් කර ගස් පුහුණු කිරීම*

- එමෙන්ම මැරුණු අතු හා ලෙඩ රෝග වැළඳුනු අතු ඉවත් කළ යුතුය.

**අතුවල පොතුවළලු ඉවත් කිරීම**

- බහුවාර්ෂික කාෂ්ඨීය කඳක් සහිත පලතුරු බෝග සඳහා මෙම ක්‍රමය යොදා ගත හැකිය.
- හොඳින් හිරු එළිය වැටෙන අතු කිහිපයක් තෝරාගෙන ප්‍රධාන කඳට ආසන්නව සෙ.මී. 1-2 ක් පමණ පළලට පොත්ත වළල්ලක් ආකාරයට කපා ඉවත් කිරීම මගින් අතුවල ගෙඩි සෑදීම උත්තේජනය කළ හැක.
- ශාක පත්‍ර වල නිපදවන ආහාර පොත්තේ ඇති ප්ලෝයම පටක හරහා ගමන් කරන අතර පොතු වළල්ලක් කැපීම මගින් එම ආහාර පහලට ගමන් කිරීම වළක්වා අතුවල ඉතුරු වේ. එවිට නයිට්‍රජන් ප්‍රමාණයට සාපේක්ෂව කාබන් (C) ප්‍රමාණය එම අතුවල වැඩිවීම මගින් කාබන්/නයිට්‍රජන් අනුපාතය (C/N) වැඩි වී ගෙඩි හට ගැනීම උත්තේජනය වේ.

**කම්බි ගැට ගැසීම**

- බහුවාර්ෂික කාෂ්ඨීය කඳක් සහිත පලතුරු බෝග සඳහා යොදා ගත හැකිය.
- අතුවල කම්බි ගැට ගැසීම මගින් අතු වර්ධනය සමග ප්ලෝයම පටක හිරවීමකට ලක්වන හෙයින් එම අතුවල පවතින සංචිත ආහාර ප්‍රමාණය වැඩි වේ. එමගින් කාබන්/නයිට්‍රජන් අනුපාතය (C/N) වැඩි වී ගෙඩි හට ගැනීම උත්තේජනය වේ.

**අතුවල පොල්ලෙලි එල්ලීම හෝ අතු පොළවට ඇද ගැට ගැසීම**

- මෙම ක්‍රමය දෙහි, දොඩම් වැනි ශාක වලට බහුලව භාවිතා කරයි.
- මෙනිසා සෙවන වන පත්‍රවලට හා ශාක අභ්‍යන්තරයට හොඳින් හිරු එළිය වැටීම නිසා ආහාර නිෂ්පාදනය වැඩි වේ.
- තවද මෙම ක්‍රමය භාවිතය මඟින් අතු නැවීමකට ලක්වන නිසා නැමෙන පෘෂ්ඨයෙන් ආහාර පහළට පරිසංක්‍රමණය වීම නවතී. එවිට අතුවල සංචිත ආහාර ප්‍රමාණය වැඩිවන නිසා කාබන්/නයිට්‍රජන් අනුපාතය (C/N) වැඩිවී පුෂ්ප අංකුර උත්තේජනය වේ.

**දුම් ගැසීම**

- ශාක වියනට දුම් වැදෙන පරිදි ගස අවට කොළ රොඩු එකතු කර පුළුස්සා පැයක් පමණ දුම් ගැසීම සිදු කරයි.

- එසේ නැතිනම් පොල්කොල අත්තක් පත්තු කර දුම් ගැස්වීම සිදු කරයි.
- මෙහිදී දුම්වල ඇති එතිලීන් මගින් එල හට ගැනීම උත්තේජනය වේ.

**පීඩාකාරී තත්ත්ව වලට ලක් කිරීම**

- මෙම ක්‍රමය සිට්‍රස් කුලයේ ශාක වලට බහුලව භාවිතා කරයි. (උදා -දෙහි,දොඩම්)
- මෙහිදී ශාකයේ කඳේ සිට එක් පැත්තකින් අඩි 2 ක් පමණ දුරකින් අඩකවයක් ආකාරයට අඩියක් පමණ ගැඹුරට කානුවක් කපා එම සීමාවේ පවතින මුල් කපා ඉවත් කර නැවත කානුවට කොම්පෝස්ට් මිශ්‍ර පස් පුරවයි. මෙහිදී මතුපිට මුල් ඉවත්වීම මගින් ගස්වලට තාවකාලික ජල හිඟතාවකට මුහුණ දීමට සිදු වේ. නැවත මුල් වර්ධනයත් සමඟ ජලය ප්‍රමාණවත් තරම් උරාගත හැකි තත්ත්වයට ශාකය පත්වේ.
- මෙම කෘතිමව ඇති කරනු ලබන පීඩාකාරී තත්වය මගින් වර්ධක අංකුර, පුෂ්ප අංකුර බවට පත්වීම උත්තේජනය කළ හැක.

**ගස වටා ලුනු යෙදීම**

- මෙහිදී සියුම් මුල් මියයාමකට ලක්වන අතර, සාන්ද්‍රනය වැඩිවීම නිසා උරාගන්නා ජල ප්‍රමාණය අඩු වේ. එවිට තාවකාලික ජල ඌණතාවයකට ලක්වීම නිසා පුෂ්ප අංකුර වර්ධනය උත්තේජනය වේ.

## 7.2 ඒකාන්තර එලදාව

- එක් කන්නයකදී වැඩි අස්වනු ලැබීමෙන් පසුව නැවත කන්න කිහිපයක් ගත වන තෙක් අස්වනු හට නොගැනීම මෙහිදී දැකිය හැකි තත්ත්වයකි. මෙම තත්ත්වය වලක්වා ගැනීම සඳහා උපාය මාර්ග කිහිපයක් ඇති අතර ඉන් එකක් භාවිතා කළහැක.

**දේශගුණික තත්ත්ව වලට ගැළපෙන ප්‍රභේද**

සමහර පලතුරු ප්‍රභේද නොගැලපෙන දේශගුණික තත්ත්වවලදී ඒකාන්තර එලදාව පෙන්නුම් කරයි.

උදා:- කර්තකොලොම්බන් අඹ ප්‍රභේදය තෙත් කලාපයේ දී ඒකාන්තර එලදාව පෙන්නුම් කරයි

- දේශගුණික තත්ත්වවලට ගැලපෙන ප්‍රභේද පමණක් තෝරා ගෙන වගාකිරීම මඟින් මෙම ගැටලුව ඇතිවීම වළක්වාගත හැකිවේ.

**එක් කන්නයකදී වැඩි අස්වැන්නක් පමණක් ලැබීමෙන් පසු ශාකය ශක්තිමත් කිරීම**

- එක් කන්නයකදී වැඩි අස්වැන්නක් ලැබීම මඟින් ශාකයේ සංචිත ආහාර විශාල ලෙස අඩුවේ. ඊලග කන්නයේදී ගෙඩි හට ගැනීම සඳහා ප්‍රමාණවත් සංචිත ආහාර නොමැති බව නිසා එලදාව අඩුවිය හැක.
- ඒ අනුව එක් කන්නයක වැඩි අස්වැන්නක් ලැබුනහොත් ඊලග කන්නයේ දී හොඳ අස්වැන්නක් ලබා ගැනීම සඳහා ශාකයට ප්‍රමාණවත් තරම් ජලය හා පෝෂක ලබාදීම මගින් ගස ශක්තිමත් කළ යුතුය.



අවශ්‍ය තරමට ජලය හා පෝෂක ලබාදුන් සාරවත් වගාවක්

**මල් හා ඵල කප්පාදුව**

- ගස්වල අධික ලෙස මල් හා ඵල හටගැනීම සිදු වූ විට එමඟින් අතුවල සංචිත ආහාර විශාල ලෙස අඩුවිය හැක.
- ඒ නිසා එවැනි අවස්ථාවක් එළඹුනු විට (අධික ලෙස මල් හා ඵල හටගත් විට) මල් වලින් කොටසක් කප්පාදු කිරීම සහ ඵල වලින් කොටසක් ඉවත් කිරීම මගින් නිපදවන ඵලවල ගුණාත්මක බව වැඩිකර ගත හැකි වේ, තවද එමගින් ගසෙහි සංචිත ආහාර විශාල ලෙස අඩුවීම වලක්වා ගත හැක.
- මෙහිදී අඹ, අලිපේර වැනි ශාක වල එක පොකුරක ගෙඩි 2-3 ක් පමණ ඉතිරි කිරීම වඩාත් සුදුසුයි. එමගින් ඒකාන්තර ඵලදාව ඇතිවීම වළක්වා ගත හැක.



# 08 අස්වනු නෙළීම

## 8.1 අස්වනු නෙළීමේ දර්ශක

- එක් එක් බෝග වර්ග සඳහා ප්‍රශස්ථ අස්වනු නෙළීමේ අවස්ථාව නිවැරදිව හඳුනා ගත යුතුය. උදාහරණ :

  එළවළු - හොඳින් වර්ධනය වී මේරීමට ප්‍රථම

  පලතුරු - හොඳින් වර්ධනය වී ඉදීම ආරම්භ වූ පසු

- විවිධ අස්වනු නෙළීමේ දර්ශක භාවිතා කරමින් විවිධ බෝගවල අස්වනු නෙළීම මගින් උපරිම ගුණාත්මයකින් යුක්තව අස්වනු පරිභෝජනයට ගත හැකි අතර, අතිරික්තය අපතේ යාමකින් තොරව අලෙවි කර අමතර ආදායමක් ලබා ගත හැකිය. විවිධ බෝග වර්ග අනුව භාවිතා කරන අස්වනු නෙළීමේ දර්ශක වෙනස් වේ.

### විවිධ අස්වනු නෙළීමේ දර්ශක

#### *බාහිර වර්ණය*

- බොහෝ පලතුරු වර්ග ඉදෙන විට කොළ පැහැයෙන් කහ පැහැයට පත් වේ. උදාහරණ

  අන්නාසි - ගෙඩියේ පහළ සිට 1/3 පමණ කහ පැහැයට හැරුණු විට නෙළීම

  ගස්ලබු - ගෙඩියේ පහළ දාර අතර කහ පැහැයට හැරෙන විට නෙළීම



*අස්වැන්න නෙළිය යුතු නිවැරදි අවස්ථාවක්*

#### *ප්‍රමාණය*

- බොහෝ පලතුරු හා එළවළු වර්ග පරිණත වන විට එලවළු ප්‍රමාණය විශාල වී පිරුණු ස්වභාවයක් ගනී.

#### *හැඩය*

- පලතුරු ගෙඩිවල හැඩය ලපටි අවස්ථාවට වඩා පරිනත වන විට හැඩය වෙනස් වේ.

උදාහරණ

- පරිනත කෙසෙල් ගෙඩිවල හැඩය පිරුණු හා වටකුරු හැඩයක් ගනී.

### සුවඳ හා රසය

- පලතුරු වර්ග බොහෝමයක් ඉදෙන විට සුවඳ හමන අතර රසය වැඩි වේ.

### මෘදු බව

- එළවළු අස්වනු මෘදු ස්වභාවය තිබෙන අවස්ථාවේදී නෙළා ගත යුතුය. උදාහරණ බණ්ඩක්කා, වැටකොළු



මෘදු ස්වභාවය තිබෙනවිට අස්වැන්න නෙළීම

### මේද ප්‍රමාණය

- සමහර පලතුරු වල පරිණත වන විට මේද ප්‍රමාණය වැඩි වේ. උදාහරණ අලිපේර

### ආම්ලිකතාවය

- දෙහි, දොඩම් වැනි සිට්‍රස් වර්ග පරිනත වන විට ආම්ලිකතාවය වැඩි වේ. අනෙකුත් පලතුරු වර්ග වල ආම්ලිකතාවය අඩු වේ.

### සීනි ප්‍රමාණය

පලතුරු ඉදෙන විට සීනි ප්‍රමාණය වැඩි වී පැණිරස වැඩි වේ.

### වගාවේ වයස

- සිටුවීමේ සිට පරිනත වීමට ගතවන දින ගණන බොහෝ එළවළු වර්ග වල අස්වැන්න නෙළීම සඳහා යොදා ගත හැකිය. උදාහරණ
  - රාබු - දින 45 ක් පමණ
  - කැරට් - දින 90- 100 ක් පමණ
  - ගෝවා - දින 90 - 100 ක් පමණ

### අස්වනු නෙළන කාලය

- දෛනිකව පරිභෝජනයට ගන්නා එළවළු අවශ්‍ය අවස්ථා වලදී අවශ්‍යතාවයට අනුව ගෙවත්තෙන් නෙළා ගැනීම කරනු ලැබේ. එහෙත් අතිරික්ත අස්වනු අලෙවි කිරීමට අදහස් කරයි නම් එක් එක් බෝගවලට ගැලපෙන ලෙස අස්වනු නෙළන කාලය තීරණය කළ යුතුය.

උදාහරණ

- උදෑසන කාලයට කොළ එළවළු වල ජල ප්‍රතිශතය වැඩි බැවින් අස්වනු නෙළීම උදෑසන සිදු කිරීම මගින් අස්වැන්න වඩාත් ප්‍රාණවත්ව තබා ගත හැකිය.
- ගෙඩි එළවළු පිණි බිංදු ඉවත් වූ පසු නෙළීම සුදුසුය.

- අඹ වැනි කිරි සහිත පලතුරු වල හිරු එළිය වැටුනු පසු අස්වැන්න නෙළීම සුදුසුය. උදෑසන වන විට ශාකයේ ජල ප්‍රතිශතය වැඩි වන නිසා කිරි වෑස්සීම වැඩිය. කිරි වෑස්සීම නිසා ඉදෙන විට එලය කුණු විය හැක. පෙ.ව. 9.00 සිට ප.ව 3.00 දක්වා කාලය තුළ අඹ අස්වනු නෙළීම වඩාත් සුදුසුය.

- කෙසෙල් තද හිරු එළියට නිරාවරණය වීම සුදුසු නොවේ. තද හිරු එළිය වැටීම මගින් ගෙඩිවල පැහැය වෙනස් වේ.

**අස්වනු නෙළන ක්‍රමය**



*නිවැරදි ආකාරයට අස්වනු නෙළීමෙන් ශාකයට සහ ඵලවලට සිදුවන හානි අවම කිරීම*

- සෑම විටම ගෙඩි වලට හානියක් නොවන පරිදි අස්වනු නෙළීම කළ යුතුය.
- ගෙවත්තේ අතින් අස්වනු නෙළීම සිදු කළ හැකි අතර, අස්වනු ගසෙන් වෙන් කිරීම සඳහා පිහියක් භාවිතා කළ හැකිය.
- පලතුරු නෙළීමේදී සකසා ගත් අස්වනු නෙළීමේ උපකරණ භාවිතා කළ හැක.
- එමගින් අස්වනු නෙළීමේදී ඵල වලට තුවාල නොවන සේ අස්වනු නෙළිය හැක. ඵල සීරීම හෝ තැලීම සිදුවුවහොත් වෙළඳ පොල වටිනාකම අඩුවන අතරම එම ස්ථාන වලින් දිලීර ආසාධනය වී ඵල කුණුවිය හැකිය.
- අල බෝග අස්වනු නෙළීමේදී අල වලට තුවාල නොවන සේ අස්වනු නෙළිය යුතුය. උදාහරණ
  - මඤ්ඤොක්කා තුවාල වූ විට වාතයට නිරාවරණය වූ ස්ථාන වල හයිඩ්‍රජන් සයිනයිඩ් (HCN) නම් විෂ සහිත සංයෝගය ඇතිවිය හැකි බැවින් හැකි තරම් අල වලට හානි නොවන සේ ගලවා ගත යුතුය.

## 8.2 පසු අස්වනු හැසිරවීම

- දෛනික පරිභෝජනය සඳහා අස්වනු නෙළීමේදී අවශ්‍යතාවය අනුව අස්වනු නෙළන නිසා එතරම් වැදගත් නොවුවද අතිරික්තය අලෙවි කරන අවස්ථාවේදී පසු අස්වනු හැසිරවීම වැදගත් වේ. මෙමගින් අස්වනු නෙලා ගත් අවස්ථාවේ සිට වෙළඳපොළ දක්වා ඉදිරිපත් කිරීමේදී ඇති විය හැකි හානිය අඩුකර ගත හැකි අතර වැඩි මුදලකට ගුණාත්මක අස්වැන්නක් අලෙවි කළ හැකිය.

***පිරිසිදු කිරීම***

- අපද්‍රව්‍ය ඉවත් කර පිරිසිදු කළ යුතුය. බෝග වර්ගය අනුව පිරිසිදු කරන ආකාරය වෙනස් වේ. උදාහරණ
  - කොළ එළවළු - සෝදා පිරිසිදු කිරීම
  - අල බෝග - සේදීම සුදුසු නැත. පස් පිසදා ඉවත් කරයි.
- ගෙඩි, පලතුරු වර්ග සේදීම අවශ්‍ය නොවේ. හානි වූ කුණු වූ ඵල ඉවත් කළ යුතුය.

### තේරීම

- ඉදුණු හා ප්‍රමාණවත් තරමට වඩා මේරූ ඵල තෝරා ඉවත් කළ යුතුය. එමෙන්ම කුණු වූ හා පලිබෝධ හානි සහිත ඵල හෝ ශාක කොටස් තෝරා ඉවත් කළ යුතුය.

### ශ්‍රේණි කිරීම

- වෙළඳපොල අවශ්‍යතාවය අනුව අස්වනු ශ්‍රේණි කර අලෙවි කළ හැකිය. විවිධ ලක්ෂණ පදනම් කර ගනිමින් ශ්‍රේණිකළ හැකි අතර, එක් එක් බෝග වර්ගය අනුව ශ්‍රේණි කරන ආකාරය වෙනස් වේ. උදාහරණ
  - ඵල වල ප්‍රමාණය අනුව (විශාල, මධ්‍යම, කුඩා ලෙස) ශ්‍රේණි කිරීම

### ඉදුනු ප්‍රමාණය

- ඉදුනු ප්‍රමාණය අනුව වෙන් වෙන්ව තෝරා වෙන්කර ගත් විට ප්‍රවාහනය පහසුවන අතර අස්වනු හානිය ද පහළ වැටේ. උදාහරණ
  - තක්කාලි හා පලතුරු වර්ග

### ඇසිරීම

- අතිරික්ත අස්වැන්න අලෙවි කරන්නේ නම් අස්වනු හානි අවම වන සේ සුදුසු ඇසුරුම් භාවිතා කර වෙළඳපල වෙත යැවිය යුතුය.
- සෑම විටම අස්වනු වලට සිදුවන හානි අවම වන ලෙස නිවැරදිව ඇසුරුම් කළ යුතුය. මෙහිදී ඵලවළු හා පලතුරු සඳහා කූඩ භාවිතා කිරීම මගින් තැලීම අඩුකර ගත හැක. තක්කාලි සඳහා ලී පටි වලින් සැකසූ පෙට්ටි වඩාත් සුදුසු වේ. කෙසෙල් ඇසිරීමේදී වියළි පත්‍ර සමඟ ඇසිරිය හැක.

### ගබඩා කිරීම

- අඩු උෂ්ණත්වයක් යටතේ ගබඩා කිරීම මගින් අස්වනු කල් තබා ගත හැකිය. මෙහිදී එළවළු හා පලතුරු එකට ගබඩා කිරීම සුදුසු නොවේ. පලතුරු ඉදීමේදී පිටවන එතිලින් මගින් එළවළු මේරීම හා කොළ වර්ණය කහ පැහැයට හැරීම සිදු විය හැක.



පසු අස්වනු කූඩ භාවිත කිරීම

## 8.3 අගය එක් කිරීම

- ගෙවත්තේ අතිරික්ත නිෂ්පාදන අලෙවි කර අමතර ආදායමක් ලබා ගත හැකි අතර, අගය එක් කිරීමේ ක්‍රියාකාරකම් මඟින් ලැබෙන ආදායම් වැඩි කරගත හැකි වේ.
- පලතුරු හෝ එළවළු හොඳින් පිරිසිදු කර සෞඛ්‍යාරක්ෂිත ඇසුරුම්වල බහා අලෙවි කිරීම මඟින් වැඩි ඉල්ලුමක් හා වැඩි මිලක් ලබා ගත හැක.





පිරිසිදු හා සෞඛ්‍යාරක්ෂිත ඇසුරුම්

- මඤ්ඤොක්කා, බතල වැනි අල වර්ග සිහින්ව පෙති කපා අයිස් වතුරෙන් සෝදා ගැඹුරු තෙලේ බැද ලුණු කුඩු හා මිරිස් කුඩු එක් කර චිප්ස් ලෙස වෙළඳපලට ඉදිරිපත් කිරීම.
- කොස්, දෙල්, මඤ්ඤොක්කා, බිම්මල් වැනි වර්ග වියළා පැකට් කර වෙළඳපලට ඉදිරිපත් කිරීම.
  - (උතුරන ජලයේ විනාඩියක් පමණ තිබීමට හැර වියළීම මඟින් අවපැහැ ගැන්වීම වළක්වා ගත හැක)
- එළවළු පෙති කපා උතුරන ජලයේ විනාඩි 1-2 ක් ගිල්වා තබා ඉවතට ගෙන වියළීම මඟින් අව පැහැයක් ඇතිවීම වළක්වා වියළා ගත හැක. උදා : කැරට්, බෝංචි, පොලොස්, කරවිල



විජලනය කරන ලද කෘෂි නිපැයුම්

- අතිරික්ත පලතුරු වලින් ජෑම්, ජෙලි, කෝඩියල් ක්ෂණික පලතුරු බීම, චට්නි සකසා වෙළඳපලට ඉදිරිපත් කිරීම.





අගය එකතු කළ නිෂ්පාදන



# 09 ගෙවත්තෙහි බෝග පළිබෝධකයින්ගෙන් ආරක්ෂා කර ගැනීම

## 9.1 හැඳින්වීම

- ගෙවත්තෙහි පවතින බෝග වලින් පෝෂණය ලබමින් සහ ඒවාට හානි කරමින් වගාකරුවාගේ තරඟකරුවෙකු බවට පත්වන සියලුම ජීවීන් පළිබෝධකයින් ලෙස සළකනු ලැබේ.
- ශාකවලට රෝග ඇති කරන වෛරස් බැක්ටීරියා, දිලීර හා වට පණුවන් වැනි ජීවීන් මෙන්ම බෝගවලින් පෝෂණය ලබා ගන්නා කෘමීන්, මයිටාවන්, ගොලුබෙල්ලන්, ක්ෂීරපායින් හා කුරුල්ලන් වැනි සතුන් ද පළිබෝධකයන් වේ. තවද ගෙවත්තේ පවතින ශාක අසල වැඩෙමින් ඒවා සමඟ තරඟ කරන වල් පැළෑටි ද ගෙවත්තෙහි පළිබෝධකයින් කාණ්ඩයට අයත් වේ.
- ගොවිතැන් කරන බොහෝ දෙනෙකු පළිබෝධ මර්ධනය පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වන අතර, එහි දී ඔවුන් ප්‍රමුඛ ස්ථානය ලබාදෙනුයේ රසායනික ද්‍රව්‍ය මඟින් පළිබෝධ මර්දනය කිරීමටය. එහෙත් ඒ නිසා මේ වනවිට ගැටළු රැසක් පැන නැගී ඇත.
  - පළිබෝධනාශක අනවශ්‍ය ලෙස භාවිතය මඟින් වගා වියදමෙන් සැළකිය යුතු කොටසක් රසායනික පළිබෝධනාශක වෙනුවෙන් වැය කිරීමට සිදුවේ. මීට අමතරව අධික ලෙස හා වැරදි පළිබෝධනාශක වර්ග භාවිතය, අනවශ්‍ය ලෙස වැඩි වාර ගණනක් භාවිතා කිරීම හා පෙර අස්වනු කාලය පිළිබඳව සැළකිල්ලක් නොදක්වමින් අස්වැන්න වෙළඳපොලට යැවීම වැනි වැරදි රැසක් ද සිදුවන බව සොයාගෙන ඇත.

- ඉහත කී වැරදි පිළිවෙත මඟින් සිදුවන්නා වූ තවත් අයහපත් ප්‍රතිඵලයක් වනුයේ නෙළාගනු ලබන අස්වැන්නේ විස සහිත අවශේෂ ද්‍රව්‍ය අන්තර්ගතව පැවතීමයි
- තවද මෙමගින් ගෙවත්තේ සිටින පළිබෝධකයන් නොවන වෙනත් ජීවීන් ද විනාශ වී යාම සිදු විය හැක. (උදා. පරාගනයට උදව් කරන ජීවීන්, පළිබෝධකයින්ට හානි කරන ස්වභාවික සතුරන්)

- එහෙත් ගෙවත්තක් යනු පරිසර හිතකාමී පද්ධතියක් ලෙසින් නඩත්තු කිරීමට අප උත්සහ දරනු ලබන ස්ථානයක් වන බැවින් ගෙවත්ත සඳහා "ඒකාබද්ධ පළිබෝධ පාලන සංකල්පය" භාවිතා කරවීම ඉතා වැදගත්ය.
- ඒකාබද්ධ පළිබෝධ පාලනය මඟින් සිදුකරනු ලබන්නේ යොදා ගත හැකි පළිබෝධ පාලන පිළිවෙත් සියල්ලම යම් සැළැස්මක් යටතේ එකට සංකලනය කරමින් වගාවට හානි නොකරන මට්ටම දක්වා පළිබෝධ ගහනය අවම කරලීමයි.
- තව ද පළිබෝධකයින් ලෙසට බෝගවල හානි නොකරන ගෙවත්තේ සිටින වෙනත් ජීවින් විසින් පසේ පෝෂණීය ගුණය වැඩි දියුණු කිරීම, කාබනික ද්‍රව්‍ය දිරාපත් කිරීම, පරාගනයට උපකාරී වීම, පළිබෝධකයින්ගේ ජෛව පාලනය, ජෛව විවිධත්වය සුරැකීම මෙන්ම ආහාර හා ඖෂධ ලබා දීම, සඳහා ද දායක වී ඇත. ඒකාබද්ධ පළිබෝධ පාලනය මඟින් ඔවුන් සුරැකීම ද සිදු වේ. මේ නිසා ඒකාබද්ධ පළිබෝධ පාලනය පරිසර හිතකාමී ක්‍රමවේදයක් ලෙස සළකනු ලැබේ.
- ජීව පරිසර පද්ධතියක ක්‍රියාකාරීත්වය, එහි සමතුලිත බව, ආහාර දාමය වැනි ප්‍රායෝගික කරුණු අධ්‍යයනය කිරීමට පෙළඹවීම මත ළමුන් තුළ පරිසර හිතකාමී නැඹුරුවක් ඇති කිරීමට ගෙවත්ත ඉවහල් වේ.

## 9.2 ගෙවත්තේ ඒකාබද්ධ පළිබෝධ පාලනය

- පළිබෝධනාශක වල ශේෂයන් ගෙවත්තේ නිපැයුම් වල අඩංගු නොවීම තුළින් සෞඛ්‍යාරක්ෂිත ආහාර ද්‍රව්‍ය පරිභෝජනයට ලැබේ. මෙය අපගේ සෞඛ්‍යයට ද හිතකර ආහාර ගෙවත්තෙන් ලැබීම තහවුරු කරයි.
- ගෙවත්තෙන් නිපදවන ආහාර ද්‍රව්‍යවලින් සමහරක් පිසීමක් නොකර අමුවෙන් හෝ සලාද ලෙස ආහාරයට ගැනීමේ පුරුද්දක් අප සතුව ඇත. ඒකාබද්ධ පළිබෝධ පාලනය මඟින් එවැනි ආහාර වලට පළිබෝධ නාශක වල ශේෂ ද්‍රව්‍යයන් එකතු වීම වළක්වා ගනු ලබන හෙයින් වඩා සුරක්ෂිත වූ වස විසෙන් තොර ආහාර පවුලේ සැමට ලබාගත හැකි වේ.
- පළිබෝධනාශක වලට වැයවන අනවශ්‍ය වියදම ඉතා අවම වීම මත අඩු වියදමකින් ගෙවත්ත නඩත්තු කළ හැකි වීම.
- නිවස අවට පරිසර හිතකාමී වටපිටාවක් ඇති වීම
- ඔබගේ ගෙවත්ත මඟින් ජෛව විවිධත්වය සුරැකීමට දායක වීම
- අපට හිතකර ජීවීන් සුරැකීමට ගෙවත්ත දායක වීම

- පරිසරය පිළිබඳව දරුවන්ගේ අධ්‍යාපනයට දායක වීම හා රසවින්දනයට අවස්ථාවක් ලැබීම.

## 9.3 පළිබෝධක සතුන්

### බලපෑම

- මොවුන් සියලුදෙනාම පරිසරයේ ජීවත්වන ශාක භක්ෂකයින් වේ. බෝගවල ඇති ආහාරමය ගුණාත්මක බව සහ අඩු ප්‍රතිරෝධීතාවය නිසා ඒවා මත හොඳින් පෝෂණය ලබමින් වගාවේ අස්වනු හානිය සිදු කරයි.
- මොවුන් ගෙවත්තේ බෝග වලට ඇති කරනු ලබන අහිතකර බලපෑම් වල ස්වභාවය මත ආකාර කීපයක් දැකගත හැක.
    - ශාක විද යුෂ උරා බොන කෘමීන් වන සුදු මැස්සන්, කුඩිත්තන්, කීඩෑවන්, මකුණන් පිටි මකුණන්, පැළ මැක්කන් හා කොර පොතු කෘමීන්
    - බෝග ශාක කොටස් හපා කන කෘමීන්වන දළඹුවන්, කුරුමිණියන්, ගුල්ලන් හා එම කීටයන්
    - ගෙඩි, කඳන් හා පත්‍රවලින් පෝෂණය ලබන පළතුරු මැස්සන්, පත්‍ර කණින්නන්, බෝංචි මැස්සන් වැනි කීමීන්ගේ ඉහඳ පණුවන්
    - ශාකවලින් පෝෂණය ලබන මයිටාවන්, වටපණුවන්, හංගොල්ලන්, ගොලු බෙල්ලන්, ක්ෂීරපායීන් හා කුරුල්ලන් වර්ග
- ගෙවත්තක් තුළ ශාක භක්ෂක පළිබෝධකයින්ට අමතරව බෝග වර්ග වලට හානි නොකරන ජීවීන් හා පළිබෝධකයින්ට හානි කරන සතුන් ද (පළිබෝධකයන්ගේ ස්වභාවික සතුරන්) ද දැකගත හැක. එබැවින් මෙම සතුන් කාණ්ඩ සියල්ලම නිවැරදිව වෙන්කර හඳුනාගැනීම අවශ්‍ය වේ.
- එමෙන්ම පරාගනයට උපකාර කරමින් ගෙවත්තේ බෝගවල අස්වැන්න ඉහළ නැංවීමට උපකාරී වන මී මැස්සන්, බඹරුන්, කනෙයි මැස්සන් හා සමහර කුරුළු වර්ග වැනි සතුන් ගෙවත්ත තුළ දැකිය හැක.

### හඳුනා ගැනීම

#### සුදු මැස්සන්



සුහුඹුලන් හා ශිෂුවන්

- මි.මී. 2 ක් පමණ දිග සුදු පැහැති පියෑඹිය හැකි කෘමියෙකි. ශිෂුවා පැතලි කොළ/දුඹුරු කොරපොත්තක් වැනිය. ශාක පත්‍ර විද යුෂ උරා බොයි. වෛරස් රෝග වාහකයෙකි.

#### කුඩිත්තන්



සුහුඹුලන් හා ශිෂුවන්

මී.මී. 1-3 ක් පමණ දිග කහ/කොළ/දුඹුරු/කළු පැහැති මෘදු හා දිගටි ගෝලාකාර සිරුරු සහිත රංචු ලෙස වර්ධනය වන කෘමීන් ශාක කොටස් මත නිසොල්මන්ව සිටිනු දැකිය හැක. ඔවුන් අතර පියාපත් රහිත හා සහිත සතුන් සිටී. විශේෂයෙන් වර්ධනය වන ශාක පටක මත රංචු ලෙස විද යුෂ උරා බොයි. වෛරස් රෝග වාහකයෙකි.

**කීඩෑවන්**



සුහුඹුලන්

ලා කොළ, සුදු, කළු වැනි වර්ණවලින් යුතු ශරීරය මී.මී 2-30 අතර ප්‍රමාණයේ ශරීර දිගැති පියාපත් සහිත කෘමීන් වේ. ශිෂුවන් පියාපත් රහිත සහ සිග් සැග් ආකාරයේ රටාවකට ඇවිදීමට හැකියාවක් ඇති අතර ශාක පත්‍ර හා වර්ධනය වන කොටස්වලින් විද යුෂ උරා බොයි. සමහර අවස්ථාවල දී වෛරස් රෝග වාහකයෙකි.

**මකුණන්**



රතු කපු මකුණන්

- ගොයම් මකුණා, රතු කපු මකුණා, හබල් පාද මකුණා, පස් මුලු මකුණා උදාහරණ වේ. මී.මී 2-30 අතර ශරීර දිගක් සහිත හා කොළ/කළු /දුඹුරු වැනි වර්ණ ඇත. වැඩුණු මකුණන් පියාපත් සහිත වන අතර මොවුන්ගේ පැටවුන්/ශිෂුවන්ට පියාපත් නැත. බිත්තර පොකුරු ලෙස දමන අතර ශිෂුවන් රංචු ලෙස සිටී. මුහුණ ඉදිරිපසින් ඇති දිගු හොටක් වැනි ශුණ්ඩාවකින් ශාක පටක විද යුෂ උරා බොයි. සමහර වර්ග ආවේණික මකුණු ගඳක් නිකුත් කරයි.

**පිටි මකුණන්**



සුහුඹුලන්

- සුදු පැහැති, මෘදු සිරුරු සහිත, රංචු ලෙස ශාක කොටස්වලට ඇලී සිටින මී.මී 1-5 ක් අතර දිගක් ගන්නා කෘමීන්ගේ ශරීරය මතුපිට පුලුන්/පිටි වැනි ද්‍රව්‍යයක් ඇත. ශාක පටක විද යුෂ උරා බොයි.

## කොරපොතු කෘමීන්



සුහුඹුලන්

- මී .මී 1-5 ක් පමණ දිගැති දුඹුරු / සුදු / කොළ වැනි වර්ණවලින් යුතු කොරපොත්තක් මෙන් පෙනෙන දැඩි ශරීර ආවරණයක් සහිත රංචු ලෙස ශාක පටකවලට ඇලී විද යුෂ උරා බොන කෘමියෙකි.

## කුරුමිණියන්



එපිලැක්නා කුරුමිණියා

- ශක්තිමත් ශරීර ආවරණයක් සහිතය. පූර්ව පියාපත් ඉතා ශක්තිමත් වේ. පත්‍ර,මල්, ගෙඩි කරල් සපා ආහාරයට ගන්නා වර්ග මෙන්ම සමහර කුරුමිණි කීටයන් කඳන් විදීමෙන් හා මුල් කෑමෙන් හානි සිදු කරයි.

## දළඹුවන්



දළඹුවෙක්

- සමහර සලබයින් හා සමනලයින්ගේ බිත්තර වලින් පිටවන කීටයන්ය. වගාවේ පවතින පත්‍ර, කඳ, ගෙඩි ආහාරයට ගැනීම හා සිදුරු කිරීම සිදු කරයි.
- දළඹුවන් ලෙස හඳුන්වන මොවුන් හොඳින් වැඩුනු පසු කෝෂ ගත වී නැවත සළබයින් හෝ සමනලයින් (සුහුඹුලන්) බවට පත්වේ.

## ගුල්ලන්



ගුල්ලෙක්

- හිස ඉදිරිපස උල් හැඩයක් ඇති මොවුන් ද කුරුමිණි වර්ගයකි. බතල ගුල්ලා, රතු පොල් ගුල්ලා, අඹ ඇට ගුල්ලා, කෙසෙල් කඳ හා අල ගුල්ලන් මෙයට උදාහරණ වේ. මොවුන්ගේ කීටයන් ශාක පටක සිදුරු කරමින් හා ආහාරයට ගනිමින් හානි කරයි.

### පළතුරු මැස්සා සහ ඉල් මැස්සා



ඉල් මැස්සා

- පැසුණු පළතුරු සහ කරවිල කුළයේ නොමේරූ ගෙඩි විද බිත්තර දමයි. එයින් ඇතිවන පාද රහිත සුදු පැහැති ඉහළ පණුවන් ගෙඩියේ මදය ආහාරයට ගෙන විනාශ කරයි. හොඳින් වැඩුනු මෙම කීටයින් පසට ඇතුළු වී කෝෂගත වීමෙන් පසු නැවත පළතුරු මැස්සන්/ ඉල්මැස්සන් බවට පත් වී දිගින් දිගටම හානිය සිදු කරයි. මොවුන් මී. මී 8 ක් පමණ දිග පියාපත් යුගලයක් සහිත දුඹුරු පැහැති මැස්සෙකි.

### පත්‍ර කනින්නන්



පත්‍ර කණින්නා

- මී.මී.2 ක් පමණ දිගැති කහ, දුඹුරු පාට මැස්සෙකි. මොවුන්ගේ කීටයා කහ පාටය. පත්‍ර යේ උඩු හා යටි අපිචර්මය අතර මැද කොටස ආහාරයට ගැනීම නිසා අක්‍රමවත් හැඩැති සිදුරු ඇති වේ. කීටයා පත්‍රය තුළ සිටින නිසා කෘමිනාශකවලින් ආරක්ෂා වේ.

### බෝංචි මැස්සන්



බෝංචි මැස්සා

- මී.මී 2 ක් පමණ දිග දිලිසෙන කළු පැහැති මැස්සෙකි. බෝංචි ඇතුළු රනිල කුඩා පැලවල පත්‍රයේ බිත්තර දමයි. එයින් බිහිවන සුදු ඉහළදයන් පත්‍ර නටුව හරහා කඳ තුළට ආහාර ගනිමින් ගමන් කර නටුව හෝ කඳ පාමුල කෝෂ ගත වේ. එම ස්ථාන ඉදිමී මහත්වන අතර පැලයේ වර්ධනය නවතී. අස්වැන්න බොහෝ අඩු වේ. පැළ මිය යා හැකිය.

### මයිටාවන්



සුහුඹුලන්

- ඇසට පෙනන නොපෙනෙන තරම් කුඩාය. අවර්ණ රතු, තැඹිලි පැහැති වර්ග සිටී. පත්‍ර මත ඉතා හෙමින් ඇවිදිමින් ජීවත් වේ. පත්‍ර මතුපිට සුරා යුෂය ආහාරයට ගනී. උෂ්ණ හා පායන විට හානිය වැඩි වේ. වෙනත් කෘමි පළිබෝධකයන් ගොදුරු කරගන්නා මයිටා වර්ග ද ඇත.

### වටපණුවන්



වටපණු හානියට ලක්වූ ශාකයක මුල්වල ගැටිති

- ඇසට පෙනෙන නොපෙනෙන තරම් කුඩා ජීවියෙකි. වටපණුවන් ශාක පටකවලින් පෝෂණය ලබා ගැනීම සිදු කරයි. බාහිර සහ අභ්‍යන්තර පරපෝෂිත වර්ග සිටින අතර සමහර වර්ග මුල්වල ගැටිති සාදා ඒ තුළ ජීවත් වේ.

### ගොලු බෙල්ලන් සහ හංගොල්ලන්



ගොලු බෙල්ලන් හා හංගොල්ලන්

- මොවුන් සිසිල් තෙත් ස්ථානවලට ප්‍රිය කරයි. බිත්තර විශාල වශයෙන් දමා අධික ලෙස බෝවේ. සමහර වර්ග ශාක පටක සුරා ශාක පත්‍ර හා වර්ධනය වන කොටස් ආහාරයට ගෙන විනාශ කරයි.

### වගාවට හානි කරන වෙනත් සතුන්



වගාවට හානි කරන වෙනත් සතුන්

ඉත්තෑවන්, වල් ඌරන්, මීයන්, වඳුරන්, රිලවුන් හා ලේනුන් වැනි සතුන් වගා හානි ඇති කරයි. ශාකවල අල, ගෙඩි හා වර්ධනය වන කොටස් කා දමා විනාශ කරයි.

### කුරුල්ලන්



වගාවට හානි කරන මොණරෙක්

- වගාවන්ට හා අස්වැන්නට හානි කරන මොණරුන් හා ගිරවුන් වැනි කුරුල්ලන් ය. බෝග ශාකවල වර්ධනය වන කොටස් පැළ, බීජ හා ගෙඩි කා දමයි.

## 9.4 ශාක රෝග

### බලපෑම

- රෝග ඇති කරන ක්ෂුද්‍ර ජීවින් (වෛරස්, ෆයිටොප්ලස්මා, බැක්ටීරියා, දිලීර) ශාකවලට ආසාදනය වී හානි ඇති කිරීම නිසා රෝග ඇතිවේ. මෙහිදී පත්‍ර කහවීම, විචිත්‍ර වීම, පත්‍ර කුඩාවීම, කැඩෙන සුළු වීම, ගස් කුරු වීම, පත්‍ර ගොටු ගැසීම, පත්‍ර ළප, පටක කුණු වීම, පටක මියයාම, ශාක මැල වීම හා මිය යාම වැනි විවිධ රෝග ලක්ෂණ පෙන්නුම් කරයි.
- යම් වගාවක මෙම රෝග ආසාදනය වීම නිසා ශාකවල වර්ධනය අඩු වන අතර එබැවින් බෝග අස්වැන්න ද අඩු කරයි.
- එමෙන්ම තවදුරටත් වගාවේ පවතින නීරෝගි ශාක වෙත රෝග පැතිරීමෙන් ආර්ථිකව හානිදායි බලපෑමක් ඇති කරයි.

### පැතිරෙන ආකාරය

- යුෂ උරා බොන කෘමීන් මගින් වෛරස් හා ෆයිටෝප්ලාස්මා රෝග ශාක අතර පැතිරෙයි. මෙසේ වන්නේ ආසාදිත ශාකවල යුෂයේ ඇති රෝගකාරකයින්, වාහකයින් මගින් නිරෝගී ශාක පටක තුළට ඇතුල්වීම නිසාය. මෙය අතින්, පිහිය වැනි උපකරණ මගින් හෝ යාන්ත්‍රිකව වුවද සිදුවිය හැක.
- බැක්ටීරියා රෝග තවානෙහි ඇති පස්වලින්, වගා බිමේ පස්වලින් හා ආසාදිත ශාක කොටස්වලින් ව්‍යාප්ත වේ. ගලායන ජලය මගින් ද පස් හා පැළ ආදිය මගින් ද බැක්ටීරියා රෝග ව්‍යාප්තිය සිදුවිය හැක.
- දිලීර රෝග සහිත ශාකවලින් පිට කරනු ලබන බීජානු සුළඟින් හා ජලයෙන් නිරෝගී ශාක වෙත පැමිණ රෝග ව්‍යාප්ත කරයි. ආසාදිත ශාක කොටස් හා ආසාදිත පැළ ගෙන ඒමෙන් ද මෙය සිදුවිය හැක.

### රෝග හඳුනා ගැනීම

#### *වෛරස් රෝග*



ආසාදිත වූ රනිල ශාකයක්

- විශේෂයෙන් ශාකයේ ළපටි කොටස් ආශ්‍රිතව පත්‍ර විචිත්‍ර වීම, කොළ කොඩ වීම, පත්‍ර කහ

වීම, පත්‍ර විකෘති වීම, ශාකය කුරු වීම හා ශාක වර්ධනය අක්‍රමවත් වීම වැනි ලක්‍ෂණ ඇති කරයි.

### ෆයිටොප්ලාස්මා රෝග



ෆයිටොප්ලාස්මා රෝග ලක්ෂණ පෙන්වන ශාක

- විශේෂයෙන් ශාකයේ ලපටි කොටස් ආශ්‍රිතව පත්‍ර සිහින්වීම, කුඩා වීම, එක් ස්ථානයකින් පත්‍ර සියල්ලම ඇති වීම, පුෂ්ප හා පුෂ්ප අංකුර කොළ පැහැවීම හා ශාකය ඉපල් ආකාර වීම වැනි ලක්‍ෂණ ඇති කරයි.

### බැක්ටීරියා හිටු මැරීම



බැක්ටීරියානු හිටු මැරීමට ලක්වූ ශාකයක්

- පසේ තෙතමනය තිබුන ද බටු, තක්කාලි වැනි බෝගවල දිනක් වැනි කෙටි කාලයක දී ශාක පත්‍රවල කොළ පැහැය තිබිය දීම ශාකය මැල වීමක් සිදු වේ.

- යම් ශාකයක මැලවීමක් සිදු වන්නේ නම් එම කඳේ පාදස්ථය කපා පිරිසිදු ජලය වීදුරුවකට ඇතුළු කර යන්තම් අතින් තද කළවිට කැපුම් පෘෂ්ඨයේ සිට සුදු පැහැති නූල් වැනි උකු ද්‍රවයක් ජලයට නිකුත් වේ. මෙම පරීක්‍ෂාව මඟින් බැක්ටීරියා හිටු මැරීම රෝගය වෙනත් මැළවීමේ රෝගයන් වලින් වෙන්කර හඳුනාගත හැක.



කැපුම් පෘෂ්ඨයෙන් නිකුත් වන නූල් වැනි ද්‍රවය

### බැක්ටීරියානු කුණු වීම



බැක්ටීරියානු කුණුවීමට ලක් වූ ගෝවා ශාකයක්

මාංශලමය කොටස්වල තෙත් හා කළු පැහැති දුගඳ හමන කුණු වීමක් ඇති වේ.

*මුලට ඇතිවන දිලීර රෝග*



දිලීර හානියට ලක්වූ මුලක්

ආසාදනය වූ බීජ පැල දුර්වල වී කඩා වැටේ. රෝගය වැළඳුණු ශාකවල වර්ධනය අඩු වීම හා කඩා වැටීම, පත්‍ර ලා කොළ කහ වීම, ශාක මැල වීම වැනි ලක්ෂණ පෙන්වයි. එවැනි ශාකයක් ගලවා බැලූවිට මුල් වර්ධනය අඩු වීම, කඳේ පාදස්ථය හා මුල් සිහින් වීම, මුල් දුඹුරු පාට වීම හා මුල් මත සුදු පාට පුස් ඇති වීම දැකිය හැක.

*ශාකයේ පත්‍ර, ගෙඩි හා කඳන් වලට ඇතිවන දිලීර රෝග*



දිලීර හානියට ලක්වූ පත්‍රයක්

- ශාකයේ පත්‍ර, ගෙඩි හා කඳන් මත කහ/ දුඹුරු/කළු පැහැ ලප ඇති වීම, ඒ මත දිලීර බීජානු හා පුස් ඇති වීම, කුණු වීම හා මැරී යාම සිදුවිය හැක. මෙහි දී බොහෝ විට දිලීර සූත්‍රිකා, පුස් හා ඉතා කුඩා දිලීර බීජානු ද දැකිය හැකිය.

## 9.5 ගෙවත්තේ කෘමි පළිබෝධකයින් පාලනය

- ශාකවලින් විවිධ අයුරින් පෝෂණය ලබා ගන්නා පළිබෝධීන් නිසා ගෙවත්තේ වගාවන්හි පැළ වර්ධනය හා අස්වැන්න අඩු කරයි.
- වගා ආරම්භයටත් පෙර සිටම පළිබෝධකයින් පාලනයට කටයුතු කරන්න.
- මේ සඳහා විවිධ උපක්‍රම රැසක් සැළසුම් සහගතව සහ එකිනෙකට සම්බන්ධව (ඒකාබද්ධව) යොදා ගැනීමෙන් වඩාත් සාර්ථක, සෞඛ්‍යාරක්ෂිත, අඩු වියදම් හා පරිසර හිතකාමී පළිබෝධ පාලනයක් සිදු කරගත හැක. මේ සඳහා පහත උපක්‍රම භාවිතා කරන්න.

**ශෂ්‍ය විද්‍යාත්මක උපක්‍රම**

- පළිබෝධකයන්ට ඇතුල් විය නොහැකි ලෙස අඩි 07 ක් පමණ උසට ගෙවත්තේ ජීව වැට යොදන්න. කෙසෙල් පරඬැල්, පොල් අතු ආදිය භාවිතා කර වැට ආවරණය කරන්න.



කෙසෙල් පරඬැල් වගා වැටක්

- පස පිළිස්සීමෙන් හෝ සිදුරු රහිත පොලිතීන්වලින් පස ආවරණය කර සති 03 ක් පමණ තබා හිරු එළියෙන් තැම්බීමෙන් පසේ සිටින පළිබෝධකයන් අවම කර ගත හැකිය.



හිරු එළියෙන් පස් තැම්බීම

- පළිබෝධකයන්ට ප්‍රතිරෝධීතාවය ඇති දේශීය හා පාරම්පරික බෝග වර්ග හා ප්‍රභේද වර්ග ගෙවත්තෙහි හැකිතාක් වගා කරන්න. උදා - තිත්ත තිබ්බටු, දඹල, හාල් මැස්සන් දඹල, දේශීය පලා, දේශීය එළවළු හා පලතුරු වර්ග
- සෑම විටම පළිබෝධකයන්ගෙන් තොර බීජ පැළ හා වර්ධක කඳ කොටස් භාවිතා කර වගාව ඇරඹීම සිදු කරන්න.
- එකම ඉඩමක නැවත නැවත වගා කරන විට විවිධ කුලයන්ට අයත් බෝග වර්ග මාරුවන ලෙස තෝරා ගන්න.
- ගෙවත්තෙහි විවිධ බෝග හා ප්‍රභේද විවිධත්වය වැඩි වන ලෙස හා මිශ්‍ර වගාවක් ලෙස පවත්වා ගන්න.
- මිශ්‍ර බෝග වගා තත්ත්වය ඇතිවන ලෙස මීටර එකක් පමණ පළලට වගා තීරු ඇති කිරීම හා එම එක් එක් තීරුවෙහි වෙනස් කුලයන්ට අයත් බෝග මාරු කරමින් වගා කරන්න.
- වගා නොකරන ස්ථානවල පැණි හා පරාග සහිත මල් පිපෙන විවිධ දේශීය ශාක වර්ග පවත්වා ගෙන හිතකර ජීවීන් ආරක්ෂා කර ගන්න.
- කුකුල් අතුරණුව, ගොම, එළු පොහොර, කොළ පොහොර කොම්පෝස්ට් වැනි කාබනික පොහොර වගාව ඇරඹීමට පෙර පසට මිශ්‍ර කර දිරිමත් වගාවක් ලබා ගන්න.
- යම් පළිබෝධ හානියක් ආරම්භ වන විටම විමසිල්ලෙන් සිට හානි වූ ශාක කොටස් කඩා ඉවත්කර විනාශ කරන්න.
- පොලිතීන් බෑග්, තෙල් කඩදාසි වැනි ද්‍රව්‍යයකින් ඵල ආවරණය කරන්න.
- වගාව අවසාන වූ විගසම හානි සහිත බෝග අවශේෂ වගා බිමෙන් ඉවත් කර විනාශ කරන්න.

**භෞතික උපක්‍රම**

- පළිබෝධ හානියක් දුටු විගස ඒවා කඩා එකතු කර විනාශ කරන්න.
- කරවිල කුළයේ එළවළු සඳහා ඵල ළපටි අවස්ථාවේ දී ම ඵලාවරණ යොදා ආවරණය කර ඉල් මැස්සා බිත්තර දැමීම වළක්වා ගන්න.



ඵලාවරණ යෙදූ පතෝල වගාවක්

- පලතුරු මෝරන අවස්ථාවේ දී කවර යොදා ආවරණය කර පලතුරු මැස්සා බිත්තර දැමීම වළක්වා ගන්න.
- සුදු මැස්සන්, පිටි මකුණන්, කොරපොතු කෘමීන් වැනි ඉතා කුඩා ශරීර සහිත පළිබෝධකයන් මර්දනය සඳහා වේගයෙන් ජලය ඉස ඔවුන්ගේ කුඩා ශිෂුවන් සෝදා හරින්න. මෙය සන්ධ්‍යා කාලයේ සිදු කළ යුතුය. මීට අමතරව හානියේ ආරම්භක අවස්ථාවේදීම අතින් හෝ බුරුසුවකින් සූරා එම සතුන් රංචුව එකතුකර විනාශ කරන්න. නැතහොත් එම කොටස් ද සමග කඩා විනාශ කරන්න.

**රසායනික උපක්‍රම**

- පළිබෝධනාශක ඉසීම වෙනුවට කළහැකි වෙනත් පළිබෝධ පාලන උපක්‍රම ඒකාබද්ධව භාවිතා කරමින් හා ස්වභාවික සතුරන් හැකිතාක් දුරට රැක ගැනීම කෙරෙහි අවධානය යොමු කරන්න.
- කොහොඹ බීජ ග්‍රෑම් 300 - 500 පමණ ජලය සමග හොඳින් අඹරා පැය 8 - 12 ක් ජලයේ පෙඟීමට හැර කිහිපවරක් ජලය එක් කරමින් මිරිකා පෙරාගෙන එයට සබන් ග්‍රෑම් 30 ක් හොඳින් මිශ්‍ර කර අවසන් මිශ්‍රණය ලීටර් 10 ක් වන ලෙස ජලය එක්කර මිශ්‍ර කර සකස් කරගත් කොහොඹ බීජ නිස්සාරකය නිර්දේශිත පරිදි හානි පවතින ස්ථානවලට පමණක් ඉසින්න.
- එලෙස සකස් කර ගැනීමට අපහසුනම් වෙළෙඳපොලේ ඇති කොහොඹවලින් නිපදවන ලද කාබනික කෘමිනාශක වර්ග ගෙවතු වගාව සඳහා මිලදී ගෙන භාවිතා කළ හැක.
- පලතුරු මැස්සා සහ ඉල් මැස්සා පාලනයට ප්‍රෝටීන් ඇම ක්‍රම දෙකකට භාවිතා කළ හැක. එනම් ප්‍රෝටීන් ඇම පත්‍ර මතට ඉසීම හෝ උගුලක් ලෙස තැබීම යන ආකාරයන්ය. මෙහිදී පෙ.ව. 9.00 ට පෙර අඩි 10 - 15 ක පරතරයක් සහිතව වගාවේ තැනින් තැන පත්‍ර යටි පැත්ත තෙමෙන ලෙස දින 07 කට වරක් ඉසීම හෝ උගුලක් ලෙස එල්ලා තැබීම කළ හැක.

*ප්‍රෝටීන ඇම ඉසීම සඳහා*

- ප්‍රෝටීන ඇම ඉසීම සඳහා - ප්‍රෝටීන ඇම මී.ලී. 200 ක් ස්පිනොසාඩ් මී.ලී. 10 සමඟ සම්පූර්ණ මිශ්‍රණය ලීටර් 8 ක් වන ලෙස ජලය එකතු කර සකස් කරගත් ද්‍රාවණය ඉසින්න.

*ප්‍රෝටීන් ඇම උගුලක් ලෙස*

- ප්‍රෝටීන් ඇම මී.ලී 200 කට ස්පිනොසාඩ් 2.5 g /l SC 0.4 ml සමග මිශ්‍ර කර උගුලෙහි ඇති ස්පෝන්ජ් කැබැල්ලේ ආලේප කරන්න.

- පෙරමෝන් උගුල් භාවිතයෙන් ඉල් මැස්සා මර්ධනයට කියුලියෝර් උගුල ද පළතුරු මැස්සා සඳහා මීතයිල් ඉයුජිනෝල් උගුල ද යොදා ගන්න. මෙම උගුලට හසුවන්නේ පිරිමි මැස්සන් පමණක් වන නිසා මෙය දිගු කාලීනව භාවිතා කළ යුතුව ඇත.



*පෙරමෝන උගුල් භාවිතා කළ පතෝල වගාවක්*

**ගොලුබෙල්ලන් හා හංගොල්ලන් පාලනයට ඇම වර්ග**

හානිය පාලනය අපහසු නම් මෙටැල්ඩිහයිඩ් 3% RB හෝ 4% RB හෝ 6.5% RB හෝ $10m^2$ කට 15g වන ලෙස හා හාල් පිටි/බත්/හාල් නිවුඩු, ජලය මිශ්‍ර කර ගුලි සාදා වගාවේ තැනින් තැන ඇම ලෙස තබන්න.

## 9.6 ගෙවතු වගාවේ රෝග පාලනය

- ශාක රෝග නිසා ගෙවතු වගාවේ අස්වැන්නට හා වගාවට හානි වන බැවින් මුල් අවස්ථාවේ දීම ඒවා පාලනය කළ යුතු වේ.

**වළක්වාගැනීමේ සහ ශෂ්‍ය විද්‍යාත්මක උපක්‍රම**

- කෙසෙල් පරඬැල්, පොල් අතු ආදියෙන් රෝග වාහකයින්ට ඇතුළු විය නොහැකි ලෙසින් ගෙවත්තේ ජීව වැට ආවරණය කරන්න.
- පස පිළිස්සීමෙන් හෝ සිදුරු රහිත පොලිතීන් ආවරණය කර සති 03 ක් හිරු එළියෙන් තැම්බීමෙන් පසේ සිටින රෝගකාරකයින් අවම කර ගන්න.
- ශාක රෝගවලට ප්‍රතිරෝධීතාවය ඇති දේශීය හා පාරම්පරික බෝග වර්ග/ප්‍රභේද වර්ග හැකිතාක් වගා කරන්න. උදා - දේශීය එළවළු වර්ග (හාල් මැස්සන් දඹල, වදුරු මෑ, ආලංගා, දඹල)
- ශාක රෝගවලින් තොර නිරෝගී බීජ හා රෝපණ ද්‍රව්‍යය භාවිතා කරන්න.
- නැවත නැවත එකම බිමක වගා කරන විට විවිධ කුළයන්ට අයත් බෝග වර්ග මාරුවන ලෙස තෝරා වගා කර ගන්න.
- ගෙවත්තෙහි විවිධ බෝග හා ප්‍රභේද විවිධත්වය වැඩි වන ලෙස හා මිශ්‍ර වගාවක් ලෙස පවත්වා ගන්න.
- කුකුල් අතුරුණුව, ගොම, එළු පොහොර කොළ පොහොර, කොම්පෝස්ට් වැනි කාබනික පොහොර වගාවට පෙර පසට මිශ්‍ර කොට දිරිමත් වගාවක් ලබා ගන්න.
- බීජ මගින් දිලීර රෝග පැතිරීමේ අවදානමක් පවතී නම් දිලීර නාශක නිර්දේශිත පරිදි බීජ ප්‍රතිකාර ලෙස යොදා ගන්න.

යම් රෝගයක් ආරම්භ වන විටම විමසිල්ලෙන් සිට වෛරස් හෝ බැක්ටීරියා රෝගයක් නම් මුළු ගසම හෝ දිලීර රෝගයක් නම් එම කොටස හෝ කඩා විනාශ කරන්න.

**භෞතික උපක්‍රම**

- වෛරස් හෝ ෆයිටොප්ලාස්මා රෝගී ශාකයක් දුටු විගස උදුරා වියළීමට හරින්න.
- බැක්ටීරියා ආසාදිත ශාක දුටු විගසම එම ස්ථානයේ ඇති පස් සමඟ සම්පූර්ණ ශාකයම ගලවා වගා බිමෙන් ඉවත්කර මීටරයක් ගැඹුර වළකට දමන්න. නැතහොත් ගිනි තබා විනාශ කරන්න.
- දිලීර ආසාදිත පත්‍ර සහ ශාක කොටස් දුටු විගස කඩා පුළුස්සා දමන්න.

**රසායනික උපක්‍රම**

- මුලට ඇතිවන දිලීර රෝග සඳහා හානිය ඇති නම් පමණක් නිර්දේශිත පරිදි දිලීර නාශක ආසාදිත ශාකවල මුල් සහිත ස්ථානයට පස තෙත් වන ලෙස යොදන්න.

## 9.7 වල් පැළෑටි

### වල් පැළ හඳුනා ගැනීම

- ගෙවත්තේ පවතින වල් පැළ ප්‍රධාන කාණ්ඩ 3ක් යටතේ වර්ග කළ හැක. එනම් තෘණ , පළල් පත්‍ර හා පන් වර්ග ලෙස කාණ්ඩ තුනකි .
  - තෘණ වර්ග :- තුත්තිරි, බැලතණ, ගිනිතණ, ඇටවරා, කම්බි තණකොළ ආදිය
  - පළල් පත්‍ර වර්ග :- උදුපියලිය, නිදිකුම්බා, හුලංතලා, පොඩි සිංඤ්ඤෝමරන්, වතුපාලු,
  - පන් වර්ග :- කලාඳුරු


තෘණ වර්ග


පළල් පත්‍ර වර්ග


පන් වර්ග

### වල් පැළ පාලනය

- බෝග ශාක අසල පැළවන වල් පැළ සියල්ල මුලත් සමග උගුල්ලා පස් ඉවත් කර කොම්පෝස්ට් නිපදවන්න.
- කලාඳුරු, ඇටවරා වැනි භූගත කොටස්වලින් නැවත පැල වන වර්ග සඳහා පස පෙරලා එම භූගත කොටස් රේක්කයෙන් එකතු කර වියළීමට හැර පුලුස්සා දැමීම සහ වසුන් යොදා නැවත වර්ධනය නැවැත්වීම සිදු කරන්න.
- ඉතා ඉක්මනින් ව්‍යාප්ත වන ආක්‍රමණශීලි වල් පැළෑටි වන ගිනි තණ කොළ, කම්බි තණකොළ ගඳපාන, යෝධ නිදිකුම්බා වැනි වල් පැළ වර්ග පැළ අවස්ථාවේ දීම නිතර නිතර ගලවා දමන්න.
- වැට, නියර, කානු දෙපස වැනි බෝග වර්ග නොමැති ස්ථානවල උදුපියලිය, නිදිකුම්බා, තෝර වැනි වල් පැළ තිබීමෙන් පළිබෝධකයින්ට හානි කරන සතුන් (ස්වභාවික සතුරන්ට) හා පරාගනයට හිතකර කෘමින්ට ජීවත් වීම සඳහා උපකාර වන බැවින් හැකි සෑම අවස්ථාවකම එම වල් පැළ ආරක්ෂා කර ගන්න.



ස්වභාවික සතුරන්ට හිතකර ස්ථාන ආරක්ෂා කිරීම

- වගා කරනු ලබන බෝග අසල වල් පැළ තිබුනොත් ඒවා බෝග ශාක සමඟ පසේ පොහොර, ජලය හා ඉඩකඩ සඳහා තරඟ කොට වගාවේ වර්ධනය හා අස්වැන්න අඩු කරයි. මෙම තරඟ කිරීමේ හැකියාව වඩාත් තර්ජනාත්මකව පවතින්නේ ගිනි තෘණ, කම්බි තෘණ වැනි ආක්‍රමණශිලි වල් පැළෑටිවලින් වන අතර වගාවේ මුල සිටම සහ සම්පූර්ණයෙන්ම ඒවා මර්දනය කරන්න.
- වගා කරන බෝග වලට නෑකම් ඇති එකම ශාක කුලයට අයත් සමහර වල් පැළෑටි සමහර අවස්ථාවක දී ශාක රෝග සහ පළිබෝධ සඳහා ද්විතියික ධාරක ලෙස ක්‍රියා කිරයි. මේ නිසා සමහර රෝග මෙන්ම විද යුෂ උරා බොන කෘමීන්, පළිබෝධක කුරුමිණියන් වැනි පළිබෝධකයින් වැඩි වීමේ අවදානමක් ද පවතී.
- එමෙන්ම සමහර වල් පැළ ඖෂධ හා ආහාරයට ගත හැකි පලා ලෙස ප්‍රයෝජනවත් වන බැවින් ඒවා ගෙවත්තේ බෝග වලට තරඟයක් ඇති නොවන ලෙස පවත්වා ගන්න.



බෝග ශාක පාදස්ථයේ පමණක් වල් පැළ ඉවත් කිරීම

- තවත් සමහර වල් පැළවල ඇති මල් පැණි හා පරාග මී මැස්සන් වැනි අපට හිතකර සතුන්ගේ ආහාරය සඳහා අවශ්‍ය වේ. එහෙයින් ගෙවත්තේ බෝගවලට තර්ජනයක් නොවන මල් පිපෙන වල් පැළ ඉතිරි කර ගැනීම මඟින් හිතකර කෘමීන්ගේ ගහනය වැඩි වනවාට අමතරව පරාගනයට ද උපකාරී වේ.



ගෙවත්තට මීමැසි ජනපදයක්

- බෝගයට හානියක් නොවන සහ ප්‍රයෝජනවත් පැළෑටි නිකරුනේ විනාශ නොකරන්න. එමඟින් ගෙවත්තේ ජෛව විවිධත්වය රැක ගැනීමට හැකි වේ.



# 10 ගෙවත්තට ඔසු වගාව

නිරෝගී දිවි පැවැත්මක් සෑම කෙනෙකුගේම පැතුමයි. ඒ සඳහා අපට වඩාත් සහාය වනුයේ අප ගන්නා දෛනික ආහාරයයි. මනා පෝෂණයක් ලැබෙන ඔසු ගුණ සපිරි ශාකමය ආහාර ද්‍රව්‍ය අපගේ ගෙවත්තේ සිටුවා ගැනීමෙන් ඒවා නිතර පරිභෝජනයට වැඩි ඉඩක් සැලසේ.

ඖෂධීය ශාකයක් යනු, රෝගයකට ප්‍රතිකාර පිණිස හෝ රෝග නිවාරණය සඳහා භාවිතා වන ශාකයකි. ඖෂධීය ශාක වාර්ෂික හෝ බහු වාර්ෂික ලෙස වර්ගීකරණය කළ හැකි අතර ශාකය වැඩෙන ආකාරය, භාවිතා වන ආකාරය හා වැඩෙන පරිසර අනුව ද වර්ග කළ හැක.

ඖෂධීය ශාකවල වර්ධන විලාශය හා ඉඩකඩ අවශ්‍ය වන ආකාරය අනුව විශාල ශාක, මධ්‍යම ප්‍රමාණයේ ශාක, පඳුරු ශාක (විශාල පඳුරු, මධ්‍යම ප්‍රමාණයේ පඳුරු, කුඩා පඳුරු), බිම දුවන හෝ ඉහළ නගින වැල් ශාක, පැළෑටි සහ ජලජ ශාක ලෙස ද වර්ග කර ගත හැක. මෙම වර්ගීකරණය පිළිබඳ මනා අවබෝධයක් තිබීම ගෙවත්තට බෝග ස්ථාපනයේ දී ඉතා වැදගත් වේ. එනම්, ගෙවත්තේ පවතින ඉඩකඩ හා එක් එක් ස්ථානයන්හි පවතින තත්ත්වයන් සළකා බලා කුමන ආකාරයක ශාක වර්ග තෝරා ගත යුතු ද යන්න පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම ගෙවතු ශාක ස්ථාපනයේ දී ඉතා වැදගත් කරුණකි.

## 10.1 පවුලේ විවිධ අවශ්‍යතා සපුරාලීම සඳහා ගෙවත්තට ඔසු පැළ

- මිනිසාගේ හා අනෙකුත් සත්ත්වයින්ගේ ආහාරයට හා මනා පෝෂණයක් ලබා ගැනීම සඳහා ඖෂධීය ශාක ගෙවත්තේ වගා කරගත හැකි අතර එය එදිනෙදා පවුලේ වියදම් අවම කරලීමට ද ප්‍රයෝජනවත් වේ. මෙහි දී ඖෂධීය ශාක පලතුරක් ලෙස, ධාන්‍ය වර්ගයක් ලෙස, අල වර්ග ලෙස හෝ එළවළු හෝ පලා වර්ගයක් ලෙස භාවිතා කළ හැකි අතර පවුලේ සැම වෙනුවෙන් කොළ කැඳ හා පාන වර්ග සකසා ගැනීම සඳහා ද භාවිතා කළ හැක.

- සුළු ආබාධවල දී අත් බෙහෙතක් ලෙස විවිධ ප්‍රතිකාර සඳහා යොදා ගත හැකි ඉඟුරු, කෝමාරිකා, කහ, ඉරිවේරිය, අක්කපාන වැනි ශාක ගෙවත්තට ඇතුළත් කර ගැනීම අවශ්‍ය වේ.
- ගෙවත්තෙහි අලංකාරය උදෙසා රත්මල්, රණවරා, පොකුරු වද, මලිත, බිං කොහොඹ, අක්කපාන, මදුරුතලා, විෂකුම්භ, ඇට්ටේරියා, මයුරපාද එඬරු, උඳුපියලිය, සේපාලිකා වැනි ශාක සිටුවිය හැක.
- පරිසරයේ සිසිලස හා සෙවණ ලබා ගැනීම සඳහා කොහොඹ, අඹ, අශෝක, බෙලි වැනි ශාක වර්ග ගෙවත්තට ඇතුළත් කළ හැක.
- පළිබෝධ පාලනයේ දී භාවිතා කරනු ලබන දාස්පෙතියා, කොහොඹ, ආඩතෝඩා, නික, වදකහ වැනි ශාක ගෙවත්තේ වගා කිරීම වැදගත් වේ.
- ආහාරය රසවත් කරන හා ආහාරයේ අගය වැඩි කරගත හැකි කුළුබඩු ශාක ලෙස රම්පේ, කරපිංචා, සාදික්කා, එනසාල්, කුරුඳු, ගම්මිරිස්, සේර වැනි ශාක සිටුවාගත හැක.
- ඉඩකඩ ඇති ගෙවත්තක ආර්ථික ලාභ ලැබීමේ පරමාර්ථය උදෙසා හීං අරත්ත, තිප්පිලි, සැවැන්දරා, කපුකිනිස්ස, බිං කොහොඹ, නිල් අවරිය වැනි ඖෂධීය ශාක වර්ග පාත්ති වශයෙන් වගා කිරීම සිදු කළ හැක.
- වෙනත් අවශ්‍යතා සඳහා ද ගෙවත්තේ ඔසු පැළ සිටුවා ගත හැක.
  - පාංශු සංරක්ෂණයේ දී වැටි ලෙස යෙදීම සඳහා සැවැන්දරා, හීං අරත්ත, ආඩතෝඩා ගෙවත්තෙහි වවා ගත හැක.
  - ගෙවත්තෙහි පාරවල් දෙපස මායිම් සඳහා අනිත්ත, හීං අරත්ත, කප්පරවල්ලිය, ඉරිවේරිය සිටුවා ගත හැක.
  - වැටවල් සඳහා රන්වන් කටු කරඹු, පොකුරු වද, ගඟවැරැල්ල, කටු කරඬු, ආඩතෝඩා, නික සිටුවිය හැක.
  - ආරුක්කු සඳහා හාතාවාරිය, සප්සඳ, සමන්පිච්ච, වැල් දොඩම්, වැල් පෙනෙල, කිරිඅඟුණ, කුරිඤ්ඤදං, කිරිබදු, ඔලිඳ, හීරැස්ස, පලු වැනි ශාක යොදා ගත හැක.
- විවිධ ඇදහිලි හා විශ්වාසයන් මත යහපත උදාකර ගැනීම සඳහා ගෙවතුවල හීං මදුරුතලා, කෝමාරිකා, බෙලි, කොහොඹ, අඹ, සමන්පිච්ච වැනි ශාක සිටුවිය හැක.



*කෝමාරිකා වගාවක්*

## 10.2 කලාපවලට අනුව ඔසු පැළ

- දේශගුණික තත්ත්ව අනුව ඖෂධ පැළෑටි පහසුවෙන් වගා කිරීම හා අස්වනු ලබා ගැනීම වෙනස් වන හෙයින් ගෙවත්තට බෝග තේරීමේ දී ඒ පිළිබඳව සැළකිල්ල යොමු කිරීම ඉතා වැදගත් වේ.
- පහත වගුවේ දේශගුණික කලාප අනුව ඖෂධීය ශාක, වර්ග කර දක්වා ඇත.

**කලාපවලට අනුව ඔසු පැළ**

| විවිධ යොදා ගැනීම් | කලාපය | | |
|---|---|---|---|
| | අතරමැදි කලාපය | වියළි කලාපය | තෙත් කලාපය |
| *ආහාර හා පෝෂණය සඳහා* | | | |
| ධාන්‍ය | බඩඉරිඟු | තල, කුරක්කන්, මෙනේරි | බඩඉරිඟු |
| මාෂ බෝග | මුං, කව්පි, සෝයා බෝංචි, දඹල | උඳු, මුං, කව්පි, සෝයා බෝංචි | දඹල |
| පලතුරු | කටු අනෝදා, දෙළුම්, වැලි අනෝදා, අඹ, වෙරළු, ඇඹරැල්ල, උගුරැස්ස, නාරං, බෙලි, මාදං, පැපොල්, දිවුල්, පේර, කෙසෙල්, පැණි දොඩම්, නෙල්ලි, අලිගැටපේර, සැපදිල්ලා, වැල් දොඩම් | කටු අනෝදා, දෙළුම්. වැලි අනෝදා, අඹ, වෙරළු, ඇඹරැල්ල, උගුරැස්ස, නාරං, බෙලි, මාදං, පැපොල්, දිවුල්, පේර, පැණි දොඩම්, නෙල්ලි, සැපදිල්ලා, කෙසෙල් | නමිනං, හිඹුටු, කීන, වෙරළු, කටු අනෝදා, දෙළුම්. වැලි අනෝදා, අඹ, ඇඹරැල්ලා, කාමරංගා, උගුරැස්ස, නාරං, බෙලි, මාදං, සියඹලා, පැපොල්, පේර, පැණි දොඩම්, නෙල්ලි, වැල් දොඩම්, අලිගැටපේර |
| පලා වර්ග | ගොටුකොළ, මුකුණුවැන්න, කිරි හැන්ද, කංකුං, තෙබු, කිරි අගුණ, වාතහංග, තිත්ත අගුණ, කුරිඤ්ඤදං, ඇඹුල් ඇඹිලිය, කෝවක්කා, කුර තම්පලා, කතුරුමුරුංගා, ගැටතුඹ, පෙති තෝර, සාරණ, මොණරකුඩුම්බිය, මැල්ල | ගොටුකොළ, මැල්ල, මුකුණුවැන්න, කිරි හැන්ද, කංකුං, තෙබු, කිරි අගුණ, තිත්ත අගුණ, වාතහංග, කුරිඤ්ඤදං, ඇඹුල් ඇඹිලිය, කෝවක්කා, කුර තම්පලා, කතුරුමුරුංගා, ගැටතුඹ, පෙති තෝර, සාරණ, මොණරකුඩුම්බිය | ගොටුකොළ, මැල්ල, මුකුණුවැන්න, කිරි හැන්ද, කංකුං, තෙබු, කිරි අගුණ, තිත්ත අගුණ, වාතහංග, කුරිඤ්ඤදං, ඇඹුල් ඇඹිලිය, කෝවක්කා, කුර තම්පලා, කතුරුමුරුංගා, ගැටතුඹ, පෙති තෝර, සාරණ, මොණරකුඩුම්බිය |
| කොළ කැඳ සඳහා | මුකුණුවැන්න, ගොටුකොළ, කුප්පමේනිය, කොහිල, කිරි අගුණ, එළබටු, මොණරකුඩුම්බිය, හාතාවාරිය, පොල්පලා, කරපිංචා, යකිනාරං, වැල් පෙනෙල, හීන් බෝවිටියා, වැල් තිබ්බටු | මුකුණුවැන්න, ගොටුකොළ, කුප්පමේනිය, කොහිල, කිරි අගුණ, එළබටු, මොණරකුඩුම්බිය, හාතාවාරිය, පොල්පලා, කරපිංචා, යකිනාරං, වැල් පෙනෙල, හීන් බෝවිටියා, වැල් තිබ්බටු | මුකුණුවැන්න, ගොටුකොළ, කුප්පමේනිය, කොහිළ, කිරි අගුණ, මොණරකුඩුම්බිය, හාතාවාරිය, පොල්පලා, කරපිංචා, යකිනාරං, වැල් පෙනෙල, හීන් බෝවිටියා, වැල් තිබ්බටු |

| | | | |
|---|---|---|---|
| එළවළු | එළබටු, නිවිති, කරවිල, කොහිල, කැකිරි, අළු කෙසෙල්, මුරුංගා, වට්ටක්කා, තුඹ කරවිල, තිබ්බටු, තැල්කොළ | එළබටු, නිවිති, කරවිල, කොහිල, කැකිරි, අළු කෙසෙල්, මුරුංගා, වට්ටක්කා, තුඹ කරවිල, ලබු, තිබ්බටු, පුහුල්, වැටකොළු, තැල් කොළ | එළබටු, නිවිති, කරවිල, කොහිල, අළු කෙසෙල්, මුරුංගා, වට්ටක්කා, තුඹ කරවිල, තිබ්බටු |
| අල වර්ග | බුත්සරණ, කොහිල, ඉන්නල. කිරිඅල, ගහල, රාජාල, මඤ්ඤොක්කා, බතල, හිගුරල, කිඩාරම්, හුලංකීරිය | බුත්සරණ, කොහිල, ඉන්නල. කිරිඅල, ගහල, රාජාල, මඤ්ඤොක්කා, බතල, හිඟුරල, කිඩාරම්, නෙළුම් අල, හුලංකීරිය | බුත්සරණ, කොහිල, ඉන්නල. කිරිඅල, ගහල, රාජාල, මඤ්ඤොක්කා, බතල, හිගුරල, කිඩාරම්, හුලංකීරිය |
| ඖෂධීය පාන වර්ග | රණවරා, පොල්පලා, බෙලි මල්, නීරමුල්ලිය, කෝමාරිකා, පොකුරු වද, නෙල්ලි | රණවරා, පොල්පලා, බෙලි මල්, නීරමුල්ලිය, කෝමාරිකා, ඉරමුසු, පොකුරු වද, නෙල්ලි | රණවරා, පොල්පලා, බෙලිමල්, නීරමුල්ලිය, කෝමාරිකා, පොකුරු වද, නෙල්ලි |
| කුළුබඩු ලෙස ඖෂධ | ගම්මිරිස්, ඉගුරු, කොත්තමල්ලි, කහ, කුරුඳු, ගොරකා, කරාබු නැටි, කරපිංචා, සේර, රම්පේ, එනසාල් | කුරුඳු, ඉගුරු, කහ, කොත්තමල්ලි, කරපිංචා, සේර, රම්පේ, උළුහාල් | ගම්මිරිස්, ඉගුරු, කොත්තමල්ලි, කහ, කුරුඳු, ගොරකා, කරාබු නැටි, කරපිංචා, සේර, රම්පේ, එනසාල්, සාදික්කා, සුදුරු, කළුදුරු |
| *අලංකරණය සඳහා* | රත්මල්, පොකුරු වද, කෝමාරිකා, සමන්පිච්ච, හාතාවාරිය, සේපාලිකා, මලිත, රත්නිටුල්, කටු කරඬු, රන්වන් කටු කරඬු, කොබෝලීල, ඉරිවේරිය, බටකිරිල්ල, හීං තඹල, ඉඟුරුපියලි, රණවරා, විෂ්ණුක්‍රාන්ති, හීන් බෝවිටියා, ඇට්ටේරියා, ඕලු, නෙළුම්, මානෙල්, කුමුදු | රත්මල්, පොකුරු වද, කෝමාරිකා, සමන්පිච්ච, හාතාවාරිය, සේපාලිකා, මලිත, රත්නිටුල්, කටු කරඬු, රන්වන් කටුකරඬු, කොබෝලීල, රණවරා, විෂ්ණුක්‍රාන්ති, හීන් බෝවිටියා, ඇට්ටේරියා, ඕලු, නෙළුම්, මානෙල්, කුමුදු, ඇහැළ, | රත්මල්, පොකුරු වද, කෝමාරිකා, සමන්පිච්ච, හාතාවාරිය, සේපාලිකා, මලිත, කටුකරඬු, ඉරිවේරිය, බටකිරිල්ල, හීං තඹල, හීං බෝවිටියා, ඉඟුරුපියලි, ගල්දෙමට, කොබෝලීල, රන්වන් කටුකරඬු, රණවරා, විෂ්ණුක්‍රාන්ති, හීන් බෝවිටියා, ඇට්ටේරියා, ඕලු, නෙළුම්, මානෙල්, කුමුදු |

| | | | |
|---|---|---|---|
| ආර්ථික බෝග සඳහා | සැවැන්දරා, නිල් අවරිය, ඉගුරුපියලි, කටුවැල්බටු, රත්නිටුල්, අමුක්කරා, බිං කොහොඹ, හීන් බිං කොහොඹ, එළබටු පොල්පලා, හීන් අරත්ත, විෂ්ණුක්‍රාන්ති, කපුකිනිස්ස | සැවැන්දරා,රත්නිටුල්, අමුක්කරා, බිං කොහොඹ, පොල්පලා, නිල්අවරිය, විෂ්ණුක්‍රාන්ති, කපුකිනිස්ස, එළබටු, කටුවැල්බටු | සැවැන්දරා, තිප්පිලි, හීන් බිං කොහොඹ, පොල්පලා, හීන් අරත්ත, ඊකාවේරිය, කපුකිනිස්ස |
| අත් බෙහෙත් හා ඖෂධ ලෙස යොදා ගන්නා ශාක | කෝමාරිකා, දෙහි, කහ, ඉඟුරු, සියඹලා, ඉගුරුපියලි, ඉරිවේරිය, රසකිඳ, සැවැන්දරා, රන්වන් කටුකරඬු, නික, ආඩතෝඩා, තිප්පිලි, වදකහ, හරංකහ, බටකිරිල්ල, කප්පරවල්ලිය | කෝමාරිකා, දෙහි, කහ, ඉඟුරු, සියඹලා, ඉගුරුපියලි, ඉරිවේරිය, රසකිඳ, සැවැන්දරා, රන්වන් කටුකරඬු, නික, ආඩතෝඩා, තිප්පිලි, වදකහ, හරංකහ, බටකිරිල්ල, කප්පරවල්ලිය | කෝමාරිකා, දෙහි, කහ, ඉඟුරු, සියඹලා, ඉගුරුපියලි. ඉරිවේරිය, රසකිඳ, සැවැන්දරා, රන්වන් කටුකරඬු, නික, ආඩතෝඩා, තිප්පිලි, වදකහ, හරංකහ, බටකිරිල්ල, කප්පරවල්ලිය |

## 10.3 රෝපණ ද්‍රව්‍යය ලබා ගැනීම

රෝපණ ද්‍රව්‍යය ලෙස භාවිතා කළ යුත්තේ සතුන් විසින් හානි නොකරන ලද නිරෝගී මව් ශාකයකින් ලබාගත් ශාක කොටසකි.

| රෝපණ ද්‍රව්‍ය ආකාර | උදාහරණ |
|---|---|
| බීජ | කටුවැල්බටු, අමුක්කරා, නිල් අවරිය, එළබටු, නෙල්ලි, පොල් පලා, රණවරා, මලිත, බිං කොහොඹ, මදුරුතලා, බෙලි, දෙළුම්, පේර, මාදං, කොහොඹ, මස්බැද්ද, නාරං, දෙහි, දොඩම්, හාතාවාරිය, සුදු හඳුන්, වැල් පෙනෙල, සේපාලිකා, කොබෝලීල, හෙන්දිරික්කා, සප්සඳ, කුරිඤ්ඤං |
| අල වර්ග | රටල, ගහල, ඉන්නල, බුත්සරණ, කිඩාරම් |
| රෛසෝම | කහ, ඉඟුරු, හරංකහ, ඉගුරුපියලි, හීං අරත්ත |
| පත්‍ර | අක්කපාන |

| රෝපණ ද්‍රව්‍ය ආකාර | උදාහරණ |
|---|---|
| දඬු කැබලි | සමන්පිච්ච, තිප්පිලි, රත්නිටුල්, හීරැස්ස පලු, කිරි අගුණ, කටු කරඬු, අනිත්ත, රත්මල්, නීර මුල්ලිය, නික, ආඩතෝඩා, පොකුරු වද, ඉරිවේරිය, කප්පරවල්ලිය, ඊකාවේරිය |
| ධාවක | ගොටුකොළ, උළුපියළිය, විළඳවැන්න, සාමදාන |
| මුල් කැබලි | බෙලි, නෙල්ලි, කරපිංචා, ඊකාවේරිය |
| මොරෙයියන් (අංකුර පැළ) | කෝමාරිකා, කෙසෙල්, සැවැන්දරා, සේර |

## 10.4 බීජ හා රෝපණ ද්‍රව්‍යය සඳහා ප්‍රතිකාර කිරීම

ඖෂධීය ශාක වර්ගවල බීජ හා රෝපණ ද්‍රව්‍ය සිටුවීමට පෙර බීජ ප්‍රතිකාර භාවිතා කිරීම මගින් ඒවා පැළවීම සාර්ථකව සිදු වේ.

- *සියුම් බීජාවරණ ඇති බීජ සඳහා ප්‍රතිකාර කිරීම*
  - බීජ ජලයෙන් හොඳින් සෝදා ජලයේ පැය 12ක් තැබීම උදා : එළබටු, කටුවැල් බටු, අමුක්කරා
- *ඝන බීජාවරණ ඇති බීජ සඳහා ප්‍රතිකාර කිරීම*
  - බීජ ලපයට විරුද්ධ දෙසින් සිදුරු කර ජලයේ පැය 24ක් තැබීම. උදා:-සුදු හඳුන්
  - අභ්‍යන්තරයට හානි නොවන සේ බීජාවරණය තැලීම හෝ පිළිස්සීමෙන් පසු පැය 24ක් ජලයේ පෙඟවීම. උදා:-අරළු
- *දඬු කැබලි සඳහා ප්‍රතිකාර කිරීම*
  - ජලය යට දී කපා ගැනීම උදා: සමන්පිච්ච, නික දළු කොටස්
  - අභ්‍යන්තරයට හානි නොවන සේ බීජාවරණය තැලීම හෝ පිළිස්සීමෙන් පසු පැය 24ක් ජලයේ පෙඟවීම. උදා: අරළු
  - තැඹිලි වතුරේ හෝ ගොම දියරවල ගිල්වා සිටුවීම.
    උදා: මස්බැද්ද, කොතලහිඹුටු

## 10.5 ඖෂධ පැළ නිපදවා ගැනීම

ගෙවත්තට ඖෂධ පැළ ස්ථාපනය කිරීමේ දී ආකාර කීපයකට එම පැළ ලබා ගැනීම කළ හැක. මෙහි දී ගෙවතු හිමියන් විසින්ම පැළ නිපදවා ගැනීම හෝ බාහිර විශ්වාසනීය ආයතනයකින් පැළ ලබා ගැනීම සුදුසු වේ.

- *තවාන් කර පැළ ලබා ගැනීම*
  - සමහරක් ඖෂධ ශාක වර්ගවල බීජ තවානක සිටුවා පැළ අඟල් 4ක් පමණ උස්වූ පසු ගලවා කෙළින්ම ක්ෂේත්‍රයේ සිටුවිය හැක. උදා:- කටුවැල්බටු, අමුක්කරා
  - මෙහි දී තවාන් මිශ්‍රණය තවාන් ජීවාණුහරණය කර ගැනීම වැදගත් වේ. මිශ්‍රණයක් ලෙස වැලි 1: මතුපිට පස් 1: කොම්පෝස්ට් 1 අනුපාතයට තවාන් සකස් කර ගත හැක. තවද වැලි පමණක් භාවිතා කිරීම ද කළ හැක. මලිත වැනි සියුම් බීජ සඳහා ගඩොල් කුඩු තවාන් ද භාවිතා කළ හැක.
  - මීට අමතරව සමහර ඖෂධ ශාක බඳුන් භාවිතා කර පැළ නිපදවා ගැනීම කළ හැක. මෙහි දී බඳුන් මිශ්‍රණය ලෙස මතුපිට පස් 2 : ගොම පොහොර හෝ කොම්පෝස්ට් 1: වැලි 1/2 : අවශ්‍ය නම් කොහුබත් 1/8 භාවිතා කළ හැක.
- *බීජ පැළ/දඬු කැබලි සිටුවීම*
  - දඬු කැබලි බඳුන්වල සිටුවා මුල් ඇදුණු පසු හෝ බීජ තවාන් කර ලබා ගන්නා ලද පැළ බඳුන්වල සිටුවා මුල් ඇදුණු පසු නඩත්තු කර ගෙවත්තෙහි සිටුවා ගත හැක.

- බීජ තවානක තවාන් කර පැළවූ පසු බීජ භූමියේ වැපිරීම මගින් ද වගා කළ හැක. පොල්පලා, තම්පලා, කටුවැල්බටු

## 10.6 වගා නඩත්තුව හා අස්වැන්න නෙළීම

- ගෙවතු වගාවේ දී තම සිතැඟි පරිදි ඉඩම මනා ලෙස සැළසුම් කරමින් පැළයේ ප්‍රමාණය අනුව පාත්ති, පෝච්චි හෝ ඉවත දමන ලද බඳුන් භාවිතයෙන් අලංකාර ලෙස පැළ සිටුවා ගත යුතුය.
- පැළය ක්ෂේත්‍රයේ සිටවූ මුල් අවධියේ දී පැළ වටා ආරක්ෂිත වැටක් යෙදීම අවශ්‍ය වේ.
- දැඩි හිරු එළියෙන් ආරක්ෂාවට ආවරණයක් අවශ්‍ය වේ නම් මුල් අදින තෙක් ආවරණය කිරීම.
- වර්ෂාව නොමැති කාලවල දිනකට වරක් හෝ දෙවරක් අවශ්‍යතාවය මත ජලය යෙදීම.
- පස බුරුල් කළ යුතු බෝග සඳහා පස් බුරුල් කිරීම සහ ගස් මුලට පස් ලං කිරීම.
- ඉහළ නගින වැල් වැනි ශාක සඳහා ආධාරක සිටුවීම. පෝච්චි හෝ බිම සිටුවන පඳුරු හෝ කුඩා ගස් කප්පාදු කිරීම. (ආඩතෝඩා, රත්මල්, නික)
- කාබනික පොහොර යෙදීම.
- පළිබෝධ හානි හා රෝගී කොටස් ඇත්නම් අතින් ඉවත් කිරීම කරන්න. අවශ්‍ය ම වේ නම් ඖෂධීය පළිබෝධනාශක (ශාකසාර) භාවිතා කිරීම කළ යුතුයි.
- ඖෂධීය ශාකවල අස්වනු නෙළීම විවිධාකාර වේ. ඖෂධ ලෙස ශාකයෙන් ලබා ගන්නා කොටස්, ගෙඩි, මල්, කොළ, බීජ, දළු, මුල්, රෙරසෝම, අල, කඳ කැබලි, පොතු හා මුළු ශාකය යනා දී ලෙස විවිධ වීම මීට හේතුවයි.
- ඖෂධීය ශාකවල පසු අස්වනු සැකසීම ද ශාකයෙන් ශාකයට හා අස්වැන්නේ ස්වභාවය අනුව වෙනස් වේ.

## 10.7 ඖෂධ පැළ හා බීජ ලබා ගැනීම

- ඖෂධීය පැළ හා බීජ වර්ග මිල දී ගනු ලබන්නේ නම් වඩාත් විශ්වාසදායක ස්ථානයකින් ඒවා මිල දී ගැනීම ඉතා වැදගත් වේ. මන්ද යත් බොහෝ අවස්ථාවල දී ඖෂධීය ශාක නිවැරදිව හඳුනා නොගැනීම නිසා එකම නම විවිධ ශාකවලට යෙදීම හා ගුණාත්මයෙන් අඩු රෝපණ ද්‍රව්‍ය අලෙවි කිරීම ගැටළුවක්ව පැවතීමයි.
- එබැවින්, ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු ඔසු උයන් හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සතු ඔසු උයන්හි ඇති පැළ තවාන්වලින් පැළ හා රෝපණ ද්‍රව්‍ය මිල දී ගත හැක.
- තවද, උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුවේ තවාන්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තවාන්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ඇති තවාන් හා මහවැලි පරිසර හා වන වගා අංශයේ තවාන්වලින් ඖෂධ පැළ මිල දී ගත හැක. එමෙන්ම ලියාපදිංචි පෞද්ගලික පැළ තවාන් මගින් ද ඔබට අවශ්‍ය පැළ ලබා ගත හැක.

## 10.8 ගෙවත්තෙන් අත් බෙහෙත්

අප වෙසෙන පරිසරය තුළ වැඩෙන ගහකොළ විවිධ රෝගාබාධ සුව කිරීමට සමත්වන ඖෂධීය ගුණයන්ගෙන් පවතින බව අපි සැවොම දන්නා කරුණකි. ඒවා අතුරින් සමහරක් අපට එදිනෙදා වැළඳෙන සුළු ආබාධ සඳහා ප්‍රතිකාර ලෙස යොදා ගත හැකි අත් බෙහෙත් වර්ග සාදා ගැනීමට උපකාරී වේ. එවැනි බහුලව භාවිතාවන ගහ කොළ ගෙවත්තට එක්කර ගැනීමෙන් සුළු ආබාධයක් පහසුවෙන් සුව කර ගෙන නිරෝගී දිවියක් ගත කිරීමට ගෙවත්තට අත්වැලක් වනු නොඅනුමානය.

එහෙත් අත් බෙහෙත් ලෙස ඔසු පැළ භාවිතා කිරීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කර කටයුතු කිරීම ඉතා අවශ්‍ය වේ.

- අත් බෙහෙත් භාවිතා කළ යුතු අවස්ථාව නිවැරදිව හඳුනා ගැනීම.
- ඔසු පැළ නිවැරදිව හඳුනාගැනීම.
- අත් බෙහෙත් සැකසීමට ගන්නා ශාක හා ඒවායේ කොටස් පිරිසිදුව භාවිතා කිරීම.
- නිවැරදිව අත් බෙහෙත් පිළියෙළ කර ගැනීම.
- නිවැරදි ප්‍රමාණය නිවැරදි වේලාවට භාවිතයට ගැනීම (මාත්‍රාව නිවැරදි වීම).

**හෘදයාබාධ, සිහිමූර්ජාවීම, අභ්‍යන්තර තුවාල හෝ ලේ වහනය, දියේ ගිලීම් වැනි ක්ෂණිකව වෛද්‍යවරයෙකු වෙත ලගා වී උපදෙස් ලබා ගත යුතු රෝගාබාධ සඳහා අත් බෙහෙත් මෙම ග්‍රන්ථයට ඇතුළත් කර නැත.**

### ආහාර මාර්ගය ආශ්‍රිත රෝග

- *වාතයෙන් බඩ පුරවා දැවීම*
  - ගම්මිරිස් ඇට ස්වල්පයක් සුදුළූණු සමග තම්බා බීමට දීම.
- *වමනයට*
  - දෙහි යුෂ බීමට දීම.
  - සාදික්කා, දෙහි ඇඹුලින් ගලගා බීමට දීම.
  - අඹ, දළු කොටා වණ්ඩුවේ තම්බා මිරිකා මී පැණි දමා තේ හැඳි එක බැගින් වරින් වර බීමට දීම.
  - ඉඟුරුපියළි අල කැබැල්ලක් සැපීමට දීම.

- *ආහාර අරුචියට*
  - කොහොඹ කොළ යුෂවලට, ලුණු එකතු කොට, මී පැණි සමඟ මේස හැඳි දෙක බැගින් ආහාර වේලාවට පැය $^1/_2$ කට කලින් බීමට දීම
  - ඉඟුරු ඉස්ම, දෙහි ඇඹුල් වලට සහිඳ ලුණු එක් කොට, පානයක් ලෙසින් ආහාර වේලකට පෙර ගැනීම
  - ඇඹුල් දොඩම් යුෂ හා ඉඟුරු ඉස්ම සීනි සමඟ බීමට දීම
  - අමු ඉඟුරු යුෂ තේ හැඳි 1-2 මී පැණි සමඟ බීමට දීම
  - කපුකිනිස්ස ඇට කබලේ බැද කෝපි මෙන් බීමට දීම
  - ගැට තුඹ පැළෑටිය සහමුලින් ගෙන තම්බා බීමට දෙන්න. නැතහොත් දළු උයා කෑමට දීම
  - දෙහි ගෙඩියක යුෂ පානයක් ලෙසට බීමට දීම.
- බඩේ කැක්කුමට
  - ඉරිවේරිය කොළ කොටා වණ්ඩුවේ තම්බාගත් යුෂට මී පැණි දමා බීමට දීම.
  - කප්පරවල්ලිය කොටා, වණ්ඩුවේ තම්බා ගත් යුෂ මේස හැඳි 1 ක් පමණ සීනි සමඟ බීමට දීම.
- බඩ පිපුමට
  - සුදුරු කබලේ දමා බැද කෝපි මෙන් වත්කර පානයට දීම.
  - සුදුළූණු කබලේ දමා බැද කෝපි මෙන් වත්කර පානයට දීම.
- අජීර්ණයට
  - කරපිංචා කොළ, නැටි, පොතු, මුල් තම්බා බීමට දීම.
  - ඉරිවේරිය දළු කොටා උතුරන වතුර දමා මිරිකා ලබාගත් යුෂ තේ හැන්දක් මී පැණි සමඟ බීම.
  - ඉරිවේරිය දඬු, කළාදුරු අල සමඟ තම්බා වතුර බීමට දීම.
- මල බුරුල්ව යන විට
  - තැඹිලි වතුරට සීනි, ලුණු සහ දෙහි ඇඹුල් තේ හැන්දක ප්‍රමාණයක් මිශ්‍ර කොට තුන් වේලක් බීම.
  - කෝපි කෝප්පයකට ලුණු, දෙහි සහ සීනි ස්වල්පයක් එක්කොට බීමට දීම.
- මලබද්ධය
  - ඉදුණු බෙලි මද කෑමට දීම.

## සම ආශ්‍රිත රෝග

- *ශරීර දුගඳට*
  - දිවුල් කොළ තැම්බූ වතුරෙන් ඇඟ සේදීම.
- *කැසීම් සහිත සමේ රෝග*
  - නෙල්ලි කොළ තම්බා ගත් ජලයෙන් ඇඟ සේදීම. පින්න කොළ අමු කහ තැම්බූ ජලයෙන් සේදීම.
- *කොරලවලට*
  - කොකුම් පොතු ඇල්දියෙන් අඹරලා කොරල සහිත සම මතුපිට ආලේප කොට පසුව ස්නානය කිරීම.
  - ඕලිඳ කොළ යුෂ කොරල ඇති තැන්වල ගා මඳ වේලාවකට පසු ස්නානය කිරීම.
- *ඉන්නන්ට*
  - කැකුළු සහල් ඊයක් පෙඟෙන්නට තබා අඹරා ඉන්නා මතුපිට දින 7ක් ගෑම.
  - සුදුළූණු ගෙඩියක් ඇල්දියෙන් අඹරා ඉන්නා මත තැබීම.
- *අළුහම්වලට*
  - ඇත්තෝර කොළ දෙහි ඇඹුලින් අඹරා, නෑමට පෙර අළුහම් ඇති තැන්වල ඇතිල්ලීම.
  - කළුවා අල දෙහි ඇඹුලින් අඹරා නෑමට පෙර හොඳින් අළුහම් ඇති තැන්වල ගැල්වීම.
- *ඇඟේ දැවිල්ලට*
  - ඉරමුසු මුල් තම්බා බීමට දීම.
  - පොල්පලා කැඳ බීමට දීම.
  - හාතාවාරිය කොළ කැඳ බීමට දීම.
  - කැපූ අත්තික්කා මුලකින් ලබා ගත් වතුර පානය කිරීමට දීම.
- *තුවාල කැලැල් මැකීමට*
  - වියළි කහ ගලගා කැලැල් මත ගා පැය කිහිපයකට පසු නෑම.

## හිස ආශ්‍රිත රෝග

- *හිසරදය*
  - සැවැන්දරා මුල් දවා ගත් දුම් ඇල්ලීම.
  - බෙලි කොළ හා කොත්තමල්ලි තම්බා දුම් ඇල්ලීම.
  - ඉගුරුපියලි අල පොල්කටු අඟුරු මත දවා දුම් ඇල්ලීම.
  - කළාඳුරු අල ඇල්දියෙන් අඹරා නලලට පැලැස්තරයක් දැමීම.
  - නිවිති කොළ අඹරා පැලැස්තරයක් නලල මත එලීම.
  - දෙහි කොළ තම්බා දුම් අල්ලීම.
  - අමුකහ, අමු ඉඟුරු සෝදා පිට සිවිය හැර පිරිසිදු කොට අඹරා රෙදි කඩක තවරා නලලේ පැලැස්තරයක් දැමීම.
- *පීනසට*
  - ගොටු දඬු, රතුළූණු, වලගසාල්, ඉගුරුපියලි සමානව ගෙන තම්බා බීමට දීම.
  - ගොටුකොළ කොටා මිරිකා ගත් යුෂ මදක් රත් කොට ගම්මිරිස් කුඩු ස්වල්පයක් හා මිශ්‍රකර උදයේ පානය කිරීම.
  - වියළි කහ, වියළි ඉඟුරු කලං (ග්‍රෑම්) 1 $^{1}/_{2}$ බැගින් ගෙන කුඩුකර තැඹිලි ගෙඩියක දමා එළිමහනේ තබා පසු දින උදේට හිස් බඩට පානය කිරීම.
  - ගොටුකොළ මුල් වියළා සකස් කර ගත් චූර්ණය කෝපි මෙන් වත්කර බීමට දීම.
- *උඳුගොව්වා කෑමට*
  - වරා කොළයක් හෝ කොස් කොළයකින් ස්වල්ප වේලාවක් අතුල්ලා මහ නිදිකුම්බා කොළ සිහින්ව අඹරා ආලේප කිරීම.
  - එළබටු ගෙඩි යුෂ, මී පැණි සමඟ ආලේප කිරීම සහ එළබටු ඇට දෙහි ඇඹුලින් අඹරා ගෑම.
  - කටුවැල්බටු ඇට සියුම් ලෙස අඹරා ආලේප කිරීම.
- *ඉස්සොරි*
  - නෙල්ලි, දෙහි ගැට, ගොඩපර, උළුහාල් ගෙන තම්බා හිස සේදීම.
  - ඉදුණු කෝලිකුට්ටු ගෙඩි 3ක් දිය නුමුසු පොල් කිරෙන් අනා හිසේ ආලේප කොට, නැවත පැයකින් පමණ හිස සේදීම.
- *හිසකෙස් ගැලවීයාම වැළැක්වීමට*
  - ඉගුරුපියලි වේලා ගත් චූර්ණය (කුඩ) තලතෙල් සමඟ මිශ්‍ර කර හිසේ ගෑම.

## මුඛය ආශ්‍රිත රෝග

- **ඉක්කාවට**
  - ඉඟුරු පියලි දවාගත් දුම ඇල්ලීම.
  - ඉදුණු දෙළුම් යුෂ බීමට දීම.
- **සෙම්ගෙඩි**
  - ඉඟුරු, ගම්මිරිස්, තිප්පිලි, සහිඳ ලුණු සමව ගෙන ඇඹුල් දොඩම් ලෙලි සමග අඹරා දින දෙකක් උගුර අභ්‍යන්තරයේ ආලේප කිරීම.
- **දත් කැක්කුමට**
  - කුඹුරු දළු, දෙහි ඇඹුලින් ගලගා කැක්කුම ඇති දත් කුහරයේ තැබීම.
  - අක්මැල්ල මලක් කැක්කුම ඇති දතින් සැපීම.
  - පොල්කටු අඟුරු මතට ඉදුණු බටු ගෙඩියක් දමා එම දුම ඉරීම.
  - විදුරු මස් දියවීමට සහ දත්වලින් ලේ ගැලීම. දෙහි යුෂවලට සීනි දමා අළුයම හා නින්දට පෙර පානය කිරීම.
  - විදුරුමස් දියවීමේදී විදුරුමසින් ලේ ගැලීම සහිත රෝගවලදී අරළු බැද කුඩු කර සිනිඳුව සකසා ගත් චූර්ණය දත් මැදීම සඳහා යොදා ගත හැක හැක.
- **තොල් පැලීමට**
  - කතුරුමුරුංගා කොළ සහ මල්, රතුළූණු සමග ගිතෙලින් උයා උදේ සවස ආහාරයට දීම.
  - ගොටුකොළ, සමන්පිච්ච, රතුළූණු, බටර් ස්වල්පයක් සමග අඹරා තොල් මත තැබීම.
- **විදුරුමස් ඉදිමුම**
  - විදුරුමස් ඉදිමුමට අත්තික්කා පොතු කසායෙන් කට සෝදීම හෝ ළපටි ගෙඩි තම්බා හෝ උයා ව්‍යාංජනයක් ලෙස භාවිතා කළ හැක.
- **මුඛ දුර්ගන්ධයට**
  - අත්තික්කා සාරය $^1/_2$ කට ජලය භාග අටක් මිශ්‍ර කොට කට සෝදීම.
  - පිලමුල්, මුණමල් පොතු තැම්බූ වතුරෙන් කට සෝදීම.
- **උගුරේ වේදනාව**
  - කරපිංචා කොළ කොටා මිරිකා ගත් යුෂ පානයට දීම.
  - හීන්මදුරුතලා සහ මුල තම්බා කට සෝදීම.

## තැලීම්/උළුක්කු

- *තැල්මට*
    - රත්හඳුන් දෙහි ඇඹුලින් උරගා තැල්ම මත ආලේප කිරීම.
    - හීන් නාරං කොළ, පොල්, කහ සහ ලුණු සමග කොටා මලවා බැඳීම.
    - මුං ඇට පොල් කිරෙන් අඹරා ගෑම.
    - කොහොඹ කොළ, අමුකහ, දියලුණු දමා කොටා මලවා බැඳීම.
    - පෙනෙල වැල් හා අමුකහ දියලුණු සමග කොටා යුෂ ගෙන කුරහන් පිටි සමග කකාරා ගෑම.
    - ඇහැළ කොළ හා අමුකහ දියලුණු සමඟ කොටා මලවා බැඳීම.
- *උළුක්කු, පෙරළුම් හා ඉදිමුම්*
    - සියඹලා දළු කොටා, පත්තුවක් සාදා උළුක්කුව වූ තැන බැඳීම.
    - කොහොඹ කොළ, පොතු හා අමුකහ ලුණු සමග කොටා මලවා දින 3-4ක් බැඳීම.
    - කතුරුමුරුංගා කොළ සහ පොතු සිහින්ව අඹරා රෙදි කැබැල්ලක තවරා එම ස්ථානය වෙළීම.

## විවිධ විෂ

- *ගෝනුසු විෂට*
    - පෙරුම්කායම් බුලත් කොළ යුෂයෙන් අඹරා ගෑම.
    - එරබදු ඇට දෙහි ඇඹුලින් අඹරා ගෑම.
    - කඩුපහර පැළෑටියක් බත් දංකුඩ සමග අඹරා ගෑම.
- *පත්තෑ විෂට*
    - මුණමල් ඇට, දෙහි ඇඹුලින් ගලගා ආලේප කිරීම.
    - මුණමල් පොතු, ඉදුණු පුවක් ගෙඩි යුෂයෙන් අඹරා නැවත දෙහි ඇඹුලින් අනා ආලේප කිරීම.
    - කඩුපහර පැළෑටියක් ඇල්දියෙන් අඹරා තුවාලය මත ගෑම
    - ගරුඬරාජ දෙහි ඇඹුලෙන් අඹරා ගෑම.
- *දළඹු විෂට*
    - ගැටතුඹ, අමුකහ කොටා පෙරාගත් යුෂ ආලේප කිරීම.
    - දළඹු රෝම ඉවත් කර පොල් තෙල් ගාන්න. නැතහොත් ගැටතුඹ, අමුකහ කොටා ලබා ගත් යුෂ ගෑම.
- *කැරපොතු විෂට*
    - කබලකින් බැදගත් තල, එළඟි තෙලෙන් අඹරා ආලේප කිරීම.

- *මී මැසි විෂට*
  - අමු කහ, වෙනිවැල්ගැට හා සිවංගුරු එකම ප්‍රමාණවලින් ගෙන ඇල්වතුරෙන් අඹරා ගෑම. නැතහොත් අමු පුවක් ගෙඩියක ලෙල්ලේ යුෂ ගෑම.

## තුවාල

- *තුවාල කැලැල් මැකීමට*
  - වියලි කහ උරගා කැලැල් මත ගා පැය කිහිපයකට පසු නෑම.

- *වෙනත් ආබාධ හෝ රෝග තත්වයන්*
  - සන්ධි ඉදිමුමට හා වේදනාවට
  - කුඹුරු ඇට මඳ, ලුණු වතුරින් අඹරා ගෑම.
  - වියළි ඉඟුරු විනාකිරෙන් අඹරා ගෑම.
  - සතකුප්ප කබලේ බැද කුඩුකර, එළකිරෙන් අඹරා ගෑම.
  - එරඬු ගසේ කොළ , පොතු , මල් , මුල් හා ඇට කොටා මලවා බැදීම.

# 10.9 නිතර භාවිතා වන ඖෂධ ශාක

## පැළෑටි



මොණරකුඩුම්බිය



කළුකම්බේරිය



කප්පරවල්ලිය



කීකිරිදිය

## වැල්



පෙනෙල



හාතාවාරිය



සමන්පිච්ච



ඉරමුසු

## කුඩා පඳුරු


කටුවැල්බටු


හීන්අරත්ත


එළබටු


රත්වන්කටුකරඬු

## විශාල පඳුරු


පොකුරු වද


තෙබු


ආඩතෝඩා


රණවරා

| මධ්‍යම ප්‍රමාණයේ ශාක | විශාල ප්‍රමාණයේ ශාක |
|---|---|
|  අරළු |  මාදං |
|  සුදු හඳුන් |  බුළු |
|  නෙල්ලි |  ඇත්දෙමට |
|  ඇහැළ |  කොහොඹ |



# 11 ගෙවත්ත ආර්ථික ඒකකයක් බවට පත් කර ගැනීම

තම ගෙවත්තේ වැඩෙන වගාවකින් නෙළා ගත් අස්වැන්න එදිනෙදා ආහාර වේලට එකතු වී තිබෙනු දැක්ම විශාල තෘප්තියක් ලබා දෙන බව සැබෑවකි. එමෙන්ම එම ආහාර ද්‍රව්‍ය නැවුම් බවකින් හා වස විසෙන් තොරව ලැබීම තුළින් පවුලේ සැමගේ සෞඛ්‍ය සුරක්ෂිත කර ගැනීමට මහත් පිටුවහලක් වනු ඇත. එපමණකුදු නොව ගෙවත්තක් යනු පවුලේ ආර්ථිකයට මහත් පිටුවහලක් වන ගෘහාශ්‍රිත පරිසර පද්ධතියකි.

ගෙවත්තකින් පවුලේ ආර්ථිකයට ශක්තියක් ඇතිවීම ආකාර කීපයක් ඔස්සේ සිදු කර ගත හැක.

- ගෙදර දොර එදිනෙදා අවශ්‍යතාවයට පිටතින් මිල දී ගනු ලබන එළවළු, පලතුරු, ඇතුළු ආහාර ද්‍රව්‍ය සඳහා වැය වන මුදලින් සැළකිය යුතු ප්‍රතිශතයක් ගෙවත්ත නිසා ඉතිරි කර ගත හැකි වේ. මෙමගින් මාසික ආදායමෙන් ආහාරවලට වැයවෙන මුදලින් සැළකිය යුතු කොටසක් ඉතිරි කර ගැනීමට හැකිවීම තුළින් පවුලේ ආර්ථිකයට ගෙවත්ත ශක්තියක් වී ඇත.
- පවුලේ ශ්‍රමය යොදවා ගනිමින් ගෙවත්තෙන් ලබා ගන්නා වූ නිපැයුම්වලින් අතිරික්තව පවතින ප්‍රමාණය අසල්වාසින් සමග බෙදා ගැනීමට අමතරව අලෙවි කිරීම සඳහා ඉදිරිපත් කිරීම තුළින් ගෘහ ආර්ථිකයට පිටුවහලක් ලබා ගැනීමේ හැකියාවක් පවතී.
- ඊට අමතරව ආර්ථිකව වැදගත් වන අංග ගණනාවක් පවතින අතර ඒවායින් එකක් හෝ කිහිපයක් සැළසුම් සහගතව ගෙවත්තට එකතු කර ගැනීම තුළින් අතිරේක ආදායම් මාර්ගයක් ලබා දෙන භූමි කොටසක් බවට ගෙවත්ත පත්වේ. මෙහි ඇති විශේෂත්වය වනුයේ බොහෝ විට පවුලේ ශ්‍රමය හා පවුලේ සාමාජිකයන්ගේ විවේකි වේලාවන් භාවිතා කරමින් මෙම ආදායම් මාර්ගය විවෘත කර ගැනීමට හැකියාවක් පැවතීමයි. උදා:- කහ වගාව, ඉගුරු වගාව, ගම්මිරිස් වගාව, වැනිලා වගාව, පලා වගාව, නයි මිරිස් වගාව, වැල් අල වගාව

- දැල් ගෘහ හෝ සරල හරිතාගාරයක් භාවිතා කරමින් ගෙවත්තේ ඉඩ ඇති ස්ථානයක් හෝ පස් රහිත ස්ථානයක් ආර්ථික ඒකකයක් බවට පත් කර ගත හැකිය. උදා : බෙල්පෙපර් වගාව, ඇන්තූරියම් වගාව, කැපූ මල් සහ විසිතුරු පැළ වගාව

- බිම්මල් ඒකකයක්, මිරිදිය මසුන් ඇති කරන පොකුණු සහ කුඩා කුකුල් ගෘහයක් වැනි අංගයන් ගෙවත්තට එකතු කිරීම තුළින් පවුලේ ශ්‍රමය යොදා ගෙන අතිරේක ආදායම් මාර්ගයක් ලබා ගැනීමට අවස්ථාව උදා වේ.

- ගෙවත්ත තුළ පවතින බොහොමයක් බෝගවල අස්වැන්න පදනම් කරගෙන අගය එකතු කළ නිෂ්පාදන සඳහා යොමු වීම මඟින් ගෘහස්ථ මට්ටමෙන් අගය එකතු කළ නිපයුම් වෙළඳපොලට එකතු කිරීමට පවුලේ සැමට දායක විය හැක. උදා : අටුකොස්, බිලිං අච්චාරු, චට්නි වර්ග

## 11.1 කහ වගාව



කහ බෝගය

උද්භිද විද්‍යාත්මකව *Curcuma domestica* (කර්කුමා ඩොමෙස්ටිකා) ලෙස හඳුන්වන කහ බෝගය සින්ජිබරේසියේ කුලයට අයත්ය. අස්වැන්න ලෙස ග්‍රාහක කඳ (රෛසෝමය) ලබාගන්නා වාර්ෂික බෝගයක් වේ. ඉහළ ආර්ථික වටිනාකමක් සහිත කහ පිළිකානාශක ගුණයකින් ද යුක්ත වේ.



ආහාර පිසීමේදී ද, විෂබීජ නාශකයක් හා ආයුර්වේද ඖෂධයක් මෙන්ම, රෙදිපිළි වර්ණ ගැන්වීමට ද රූපලාවන්‍ය කටයුතු සඳහා අමුද්‍රව්‍යයක් ලෙස ද කහ යොදා ගැනේ. තව ද හින්දු භක්තිකයන්ගේ ආගමික කටයුතු වල දී කහ සහ කහ මිශ්‍ර දියර සඳහා වැදගත් ස්ථානයක් හිමිව ඇත.

### ශ්‍රී ලංකාවේ වගා කරන ප්‍රදේශ

දේශීය අවශ්‍යතාවය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකාව තුළදීම සපුරා ගැනීමේ විභවයක් පවතින එක් බෝගයක් ලෙසින් කහ හඳුන්වනු ලැබේ. මේ සඳහා දිවයිනේ වැඩි විභවයක් ඇති තෙත් කලාපය හා අතරමැදි කලාපය මෙන්ම, ජල සම්පාදන තත්ත්ව යටතේ වියළි කලාපයට අයත් ප්‍රදේශවල කහ වගා කළ හැකිය. හොඳින් ජල වහනය සිදුවන වැලි ලෝම පස වගාව සඳහා වඩාත් සුදුසුය. බහු වාර්ෂික බෝගවල මුල් කාලයේ දීත්, පොල් ගස් යට අතුරු බෝගයක් ලෙසත් කහ වගා කළ හැක. පවුලේ වාර්ෂික කහ අවශ්‍යතාවය සපුරාගත හැකි පරිදි ගෙවතු වගාව තුළ පහසුවෙන් පවත්වාගෙන යා හැකි බෝගයක් ලෙස සළකනු ලැබේ.

### කහ වගාව සඳහා සුදුසු දේශගුණික අවශ්‍යතා

- වාර්ෂික වර්ෂාපතනය - මි.මී. 1500-1750
- මුහුදු මට්ටමේ සිට උස - මි.මී. 1500 ක් දක්වා
- උෂ්ණත්වය - සෙ.ශ්‍රේ. 20-32

### කහ බෝගයේ ප්‍රභේද

ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවල දී දේශීය කහ ප්‍රභේද බහුලව වගා කරනු ලබන අතර විදේශීය ප්‍රභේදයන් ලෙස, ගන්ටර්, පූනා, මදුරාසි, මන්ජල්, ඇල්පී වර්ග භාවිතා කරයි.

### වගා ආරම්භය

කහ වගාව යල කන්නයේ වැසි සමඟ මාර්තු, අප්‍රේල් යන මාසවල දී ආරම්භ කළ හැකි අතර වියළි ප්‍රදේශවල දී නම් මහ කන්නයේ වර්ෂාව සමඟ සැප්තැම්බර්, ඔක්තෝම්බර් මාසවල දී කහ වගාව ආරම්භ කළ හැක.

### රෝපණ ද්‍රව්‍ය

සිටුවීම සඳහා රෝග හා පළිබෝධවලින් තොරව හොඳින් වර්ධනය වී වැඩි අස්වැන්නක් ලබා දුන් වගාවලින් රෝපණ ද්‍රව්‍ය තෝරා ගන්න. මේ සඳහා මව් අලවලට වඩා ඇඟිලි අල වඩාත් සුදුසු වන අතර ඒවා හොඳින් මේරූ හා ග්‍රෑම් 30-35 පමණ වන අල කැබලි වීම වඩාත් සුදුසුය. සෙ.මී. 120 x සෙ.මී. 300 (අඩි 4x අඩි 10) පාත්තියකට බීජ අල කිලෝ ග්‍රෑම් 1.4 ක් අවශ්‍ය වේ.

### ක්ෂේත්‍රය සකස් කිරීම හා සිටුවීම

සෙ.මී. 22.5 -30 ක් (අඟල් 9-12 ක්) ගැඹුරට පස් පෙරළා කැට පොඩි කරගත යුතුයි. උස සෙ.මී. 22.5 (අඟල් 9ක්) වන ලෙසට සහ සෙ.මී.120ක් (අඩි 4ක්) පළලට උස් පාත්ති සකස් කර ගන්න. ගෙවත්තට ගැලපෙන පරිදි හා කැමති දිගකට පාත්ති සකස් කර ගෙන එම පාත්තිවලට දිරූ කාබනික පොහොර, සත්ත්ව පොහොර හා කරකළ දහයියා යොදා හොඳින් පස් සමග මිශ්‍ර කරගත යුතුයි. (ගෙවතු වගාවේ දී පාත්ති වෙනුවට එම පස් මිශ්‍රණය භාවිතා කළ පෝච්චිවල ද කහ වගාව කළ හැක)

### බීජ කහ සිටුවීම

- පැළ අතර පරතරය සෙ.මී. 30 (අඩි 1) ක් හා පේළි අතර පරතරය සෙ.මී. 30 (අඩි 1) වන ලෙස බීජ කහ අල සිටවා ගන්න.
- පාත්තියේ දාරයේ සිට ඇතුල් පැත්තේ සෙ.මී. 15 (අඟල් 6) බැගින් ඉඩතබා සිටුවන තැන් ලකුණු කරන්න. මෙම ක්‍රමය යටතේ සිටුවීමේ

දී එක් පාත්තියකට පේළි 4ක් වන සේ බීජ කහ අල සිටුවා ගත හැක.



පේළියට සිටවූ කහ වගාව

- එක් ස්ථානයක කහ බීජ අල ග්‍රෑම් 30-35 ක් පමණ වන පරිදි සෙ.මී 5-7.5ක් (අඟල් 2-3ක්) පමණ ගැඹුරින් සිටුවන්න.
- අඟල් 1ක පස් තට්ටුවකින් සිටුවන ලද කහ අල වසා ඒ මතට අඟල් 2 ක ඝනකමට වසුන යොදන්න. වසුන් සඳහා දහයියා, පිදුරු හෝ පොල් අතු පිල්ල උඩට සිටින පරිදි භාවිතා කළ හැක. වසුන සඳහා ග්ලිරිසීඩියා පත්‍ර යොදන්නේ නම් මසකට වරක් වසුන නැවත නැවත යෙදිය යුතුය.
- ත්‍රිත්ව සුපර් පොස්පේට් ග්‍රෑම් 50 ක් සහ කාබනික පොහොර අවම වශයෙන් කිලෝ ග්‍රෑම් 5 ක් සෙ.මී 120 X 300 (අඩි 4x10) ප්‍රමාණයේ එක් පාත්තියකට මූලික පොහොර ලෙස යෙදිය යුතුය.
- සිටුවන අවස්ථාවේ දී පසේ ප්‍රමාණවත් තෙතමනයක් නැත්නම් ජල සම්පාදනය කරන්න.

### නඩත්තු කටයුතු

- පැළ පාමුලට පස් එකතු කිරීම වරින් වර සිදුකරමින් කහ අල ආලෝකයට විවෘත නොවන ලෙස තබාගත යුතුය.

අමිශ්‍ර පොහොර ගෙන මිශ්‍ර කර කහ පැළ පේළි අතර යොදා පස් සමඟ මිශ්‍ර කර පිදුරු දහයියා වැනි වසුනක් භාවිතා කර පස් ආවරණය කරන්න. සෙ.මී 120 X 300 (අඩි 4x10) ප්‍රමාණයේ පාත්තියක් සඳහා අවශ්‍ය වන පොහොර වර්ග සහ ප්‍රමාණ පහතින් දක්වා ඇත.

| පොහොර වර්ගය | සිටුවා මාස $1\,^1/_2$ (දින 45) | සිටුවා මාස 3 (දින 90) |
|---|---|---|
| යූරියා | ග්‍රෑ. 33 | ග්‍රෑ. 33 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | ග්‍රෑ. 50 | ග්‍රෑ. 50 |

### වල් මර්දනය

වගාවේ පළමු මාස $1\,^1/_2$ දී හා 3 දී වල් පැළෑටි අතින් ගලවා ඉවත් කරන්න.

### ජල සම්පාදනය

වියළි තත්ත්වයක් පවතී නම් දින 3 කට වරක් ජල සම්පාදනය කරන්න.

### රෝග පාලනය

#### *කඳ විදින දළඹුවාගේ හානිය*

- කහ බෝගයට වැඩියෙන්ම හානි ගෙන දෙන පළිබෝධකයා වේ. සුහුඹුලා කහ තැඹිලි පාට පියාපත් මත කුඩා කළු තිත් ඇති සළඹයෙකු වන අතර පත්‍ර කොපුව තුළ බිත්තර දමයි. බිත්තරවලින් පිටවන කීටයා ලා දුඹුරු පැහැයෙන් යුතු වන අතර කීටයා විසින් ව්‍යාජ කඳේ අභ්‍යන්තර පටක කා දමනු ලබයි.
- හානිය මුල් අවධියේ දී අලුතින් වර්ධනය වන ගොබ කහ පැහැ වීමත් අතින් ඇද්දවිට පහසුවෙන් ගැලවී යාමත් දැකිය හැකිය. හානිය උග්‍ර වූ විට සම්පූර්ණ කහ පඳුරම කහ පැහැ ගැන්වී ඉන්පසු මැරී යයි.

- වගාව හොඳින් පරීක්ෂා කර බලා එහි සිදුරු සහිත කඳන් දැකිය හැකිනම් සිදුරට පහළින් කපා පුළුස්සා දැමිය යුතුය. එමඟින් පැතිරීම පාලනය කළ හැකිය.

*කොළ පුල්ලි රෝගය*

- කහ වගාවේ පත්‍රවල තැනින් තැන සුදු පැහැති ප්‍රදේශ ඇතිවී ඒවා පසුව දුඹුරු පාටට හැරී වියළී යයි. මෙලෙස කහ පත්‍ර මත දුඹුරු පුල්ලි දැකිය හැකි වේ.
- මෙම දිලීර රෝගය සඳහා 1% බෝඩෝ මිශ්‍රණය හෝ මැන්කොසෙබ් දිලීරනාශකය යෙදිය හැකිය.

*අල කුණුවීමේ රෝගය*

- කඳේ පාදස්ථය කොටසට සහ රෛසෝමවලට ආසාදනය වන දිලීර රෝගයකි. පත්‍ර දාරය වියළී පසුව පත්‍ර සහ මුළු ශාකයම වියළී ගස කඩා වැටේ.
- බීජ අල සිටුවීමට පෙර පස ජීවාණුහරණය කිරීම, බීජ අල 0.3% ක මැන්කොසෙබ් දිලීර නාශක ද්‍රාවණයේ විනාඩි 30 ක් ගිල්වා තබා පවනේ වියළා සිටුවීම, රෝගී වගාවන් සඳහා 0.3% මැන්කොසෙබ් දිලීර නාශකය ඉසීම මඟින් මෙම රෝගය පාලනය කළ හැකිය.

**අස්වනු නෙළීම**

- කහ පත්‍ර වියළී ගිය විට අල උපරිම ලෙස මෝරා ඇති අතර මේ අවස්ථාවේ දී අස්වැන්න නෙළා ගත හැක. මේ සඳහා බීජ අල සිටුවා මාස 8-10ක් පමණ ගතවේ. සාමාන්‍ය අස්වනු නෙළන කාලය ජනවාරි - පෙබරවාරි වේ.
- කහ වගාවකින් අමු කහ අල 1:20 හෝ 1:30 ක් පමණ අස්වැන්නක් ලබාගත හැක. එනම් කහ බීජ අල කිලෝ ග්‍රෑම් එකක් සිටුවා අස්වනු කිලෝ ග්‍රෑම් 20-30 ක්

**ප්‍රධාන නිෂ්පාදනය**

අමු කහ, වියළි කහ, වියළි කහ කුඩු, වියළි කහ පෙති, කහ ඔලියොරෙසීන්, කහ තෙල්

**ගෙවතු තුළ පොලිසැක් මළුවල කහ වගාව**

මෙය නාගරික ගෙවතු තුළ සිදු කළ හැකි ඉතා හොඳ අස්වැන්නක් ලබාදෙන ක්‍රමයකි. මෙහිදී කිලෝ 25 ක් හෝ කිලෝ 50 ප්‍රමාණයේ පොලිසැක් මළු භාවිතා කළ හැක. මෙහිදී එක් මල්ලකට අවශ්‍ය වන බීජ ප්‍රමාණය පිළිවෙළින් ග්‍රෑම් 50 ක් හෝ 100 ක් වේ.

වැලි, දිරූ ගොම හෝ කොම්පෝස්ට්, කොහුබත් හා මතුපිට පස් සමාන ප්‍රමාණ වලින් මිශ්‍ර කර පොලිසැක් මල්ල පුරවා ගන්න. පොලිසැක් බඳුන පිරවීමේ දී එය දෙකට නවා එම අර්ධයට අඟල් දෙකක් ඉතිරි වන සේ පුරවන්න. මූලික පොහොර ලෙස පොලිසැක් මල්ලකට (කිලෝ ග්‍රෑම් 50 ප්‍රමාණයේ මල්ලකට) ත්‍රිත්ව සුපර් පොස්පේට් ග්‍රෑම් 100 ක් මිශ්‍ර කර ගන්න.

ඉන්පසු මල්ලෙහි මතුපිට බීජ අල සිටුවීම කළ හැක. මෙහිදී අදාළ බීජ අල ප්‍රමාණය කොටස් 3 කට බෙදා වෙන් කර ත්‍රිකෝණාකාර හැඩයට අඟල් 3ක් ගැඹුරින් සිටුවා ගන්න. බීජ සිටවූ පසු අමු ග්ලිරිසීඩියා කොළ වසුනක් ලෙස යොදා පොලිසැක් මල්ලේ ඉතිරි අඟල් දෙක පුරවා ගන්න.

මාස $1\,^{1}/_{2}$ කට පසු යූරියා හා මියුරේට් ඔෆ් පොටෑෂ් පිළිවෙළින් ග්‍රෑම් 7 ක් හා ග්‍රෑම් 10 ක ප්‍රමාණයක් ජලය ලීටරයක දියකර එක් මල්ලකට යොදන්න.

කිලෝ ග්‍රෑම් 50 ප්‍රමාණයේ මල්ලක වගාවෙන් කිලෝ ග්‍රෑම් 6 ක පමණ අස්වැන්නක් ලැබිය හැක.

## 11.2 ඉඟුරු වගාව



ඉඟුරු බෝගය

### හැඳින්වීම

මහෞෂධ ලෙස හැඳින්වෙන ඉඟුරු ශාකයේ නිජබිම ඉන්දියාවයි. ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට මීටර 2,000 ක් දක්වා ප්‍රදේශවල ඉඟුරු සාර්ථකව වගා කළ හැකිය. සාමාන්‍යයෙන් තෙත් කලාපයේ ගෙවතු ආශ්‍රිතවත්, පොල් වගාවල අතුරු බෝග ලෙසත්, මහා පරිමාණයෙන් ඉඟුරු වගා කෙරේ. ඊට අමතරව ජල සම්පාදනය යටතේ වියළි කලාපයේ ද සාර්ථකව වගා කළ හැකිය. දේශීය ඉඟුරු ප්‍රභේද සඳහා වෙළෙඳපොල ඉල්ලුම වැඩිය.

ඉඟුරු වගාව ඉතා කුඩා ඉඩකඩක් හා සුළු ආයෝජනයකින් ආරම්භ කළ හැකි අතර මාස 9ක් වැනි කෙටි කලකින් ආදායම් ලැබිය හැකි බෝග යක් ලෙස සලකනු ලැබේ. මෙහෙයින් ගෙවතු වගාව සඳහා සුදුසු වන තවත් ආර්ථික බෝගයක් ලෙස මෙය හැඳින්වේ.

#### ශ්‍රී ලංකාවේ ඉඟුරු වගා කරන ප්‍රධාන ප්‍රදේශ

කුරුණෑගල, මහනුවර, මාතලේ, කෑගල්ල, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, රත්නපුර, බදුල්ල, මොණරාගල හා පොළොන්නරුව වැනි දිස්ත්‍රික්ක වල ගෙවතු සඳහා මේ බෝගය උචිත වේ.

#### ඉඟුරු වගාව සඳහා සුදුසු දේශගුණික අවශ්‍යතා

- වාර්ෂික වර්ෂාපතනය - මි.මී. 2500 (වසර පුරාම පැතිරුණු)
- උච්චත්වය - මුහුදු මට්ටමේ සිට මීටර් 1500 ක් දක්වා
- උෂ්ණත්වය - සෙ.ශ්‍රේඩ් 18 - $32^0C$

#### ඉඟුරු ප්‍රභේද

දේශීය ඉඟුරු ප්‍රභේදයට අමතරව රැන්ගුන්, චීන, කැලිකට් හා කොචින් යන ප්‍රභේද භාවිතා කරයි.

#### බීජ ඉඟුරු අල අවශ්‍යතාවය

සෙ.මී 120 X 300 (අඩි 4x10) ප්‍රමාණයේ පාත්තියකට බීජ ඉඟුරු අල කිලෝ ග්‍රෑම් $1\ ^1/_2$ ක් පමණ අවශ්‍ය වේ. ඒ ඒ ප්‍රදේශ සඳහා අවශ්‍ය බීජ ඉඟුරු අල අදාළ ප්‍රදේශවලින්ම සපයා ගැනීමට කටයුතු කිරීම සුදුසු වේ. සෑමවිටම නිරෝගී වගාවකින් බීජ අල සපයා ගන්න. බීජ ඉඟුරු අල දහයියා හෝ වැලි මත ලිහිල්ව අසුරා පිදුරු වලින් වැසීමෙන් කල්තබා ගත හැකිය.

#### වගා ආරම්භය

- තෙත් කලාපය - මාර්තු හා අප්‍රේල් (යල කන්නය)
- වියළි කලාපය - සැප්තැම්බර් හා ඔක්තෝම්බර් (මහ කන්නය)

#### පාත්ති සැකසීම

පාත්ති ක්‍රමය හෝ වැටි ක්‍රමය හෝ ඇලි සහ වැටි ක්‍රමය යටතේ ඉඟුරු වගා කළහැක. එහෙත් ගෙවතු වගාවේ දී ජනප්‍රිය ක්‍රමයක් ලෙස පාත්ති ක්‍රමය යොදාගනී.

මෙහිදී සෙ.මී 120 X 300 (අඩි 4x10) ප්‍රමාණයේ පාත්ති සකස් කරගෙන එය වටා සෙන්ටිමීටර් 30ක් පමණ ගැඹුරු කාණුවක් යොදා ගැනීම කළ හැක. ගෙවත්තේ පවතින ඉඩකඩ අනුව පාත්තියේ දිග සුදුසු පරිදි වෙනස් කරගත හැක.

අඩි 01 ක් ගැඹුරට සී සා පස් කැට පොඩිකර සකස් කරගත් පාත්තිය මතට කරකළ දහයියා සහ කාබනික පොහොර ලෙස දිරූ ගොම හෝ කොම්පෝස්ට් අවම වශයෙන් කිලෝ ග්‍රෑම් 05 ක ප්‍රමාණයක් සෙ.මී 120 X 300 (අඩි 4x10) පාත්තියකට එකතු කරන්න.

ඉඟුරු බීජ අල සිටුවීමට පෙර සෙවන සහිත ස්ථානයක සති 2 ක් පමණ ගොඩකර වසා තැබීමෙන් ප්‍රරෝහණය වීම උත්තේජනය වේ. මෙලෙස සුදු පැහැති මෙටෙයියන් වර්ධනය වූ ඉඟුරු බීජ සිටුවීමෙන් ඒකාකාරී වර්ධනයක් ලබාගත හැකිය.

නිවැරදි පස් මිශ්‍රණයම භාවිතා කරමින් පෝච්චි වල ද ඉඟුරු වගා කිරීම ගෙවතු වගාවේ ජනප්‍රිය පුරුද්දක් වී ඇත.

### බීජ ඉඟුරු අල සිටුවන පරතරය

පේළි අතර හා පේළිය තුළ පැළ අතර පරතරය සෙ.මී. 25 ක් (අඟල් 10) වන ලෙසින් සිටුවා ගත යුතුය. සිටුවීමට පෙර බීජ ඉඟුරු අල කැප්ටාන් හෝ මැන්කොසෙබ් වැනි දිලීර නාශකයක මිනිත්තු 5-10 ක් පමණ ගිල්වා ප්‍රතිකාර කර ගැනීම අවශ්‍ය වේ.

### ඉඟුරු සිටුවීම

ග්‍රෑම් 30-35 ක් අතර වූ ඉඟුරු කැබැල්ලක් එක් ස්ථානයක සිටුවිය යුතු වේ. අඟල් 01 ක පස් තට්ටුවකින් බීජ අල වසා ඒ මතට වසුන් යොදන්න. වසුන් සඳහා දහයියා, පිදුරු හෝ පොල් අතු භාවිතා කළ හැක. අඩි 4x10 පාත්තියක් සඳහා අවශ්‍ය වන ඉඟුරු බීජ ප්‍රමාණය කි. ග්‍රෑම් 1.5 පමණ වේ.

### වගා නඩත්තු කටයුතු

- වගාව ආරම්භයේ දී සෙ.මී 120 X 300 (අඩි 4x10) එක් පාත්තියකට දිරූ ගොම හෝ කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 5ක් එකතු කරන්න.
- වසුන් යෙදීම හා වල් මර්දනය ඉතා වැදගත් වන අතර වසුන ලෙස ග්ලිරිසීඩියා පත්‍ර යොදන්නේ නම් මසකට පසු (දිරාපත් වනවිට) නැවත යොදන්න. වගා කාලය තුළ 5-6 වතාවක් පඳුර මුලට පස් එකතු කරන්න. සෙවණ ඉවත් කරන්න.

**සෙ.මී 120 X 300 (අඩි 4x10) ප්‍රමාණයේ පාත්තියකට පෙහොර යෙදීම**

| පොහොර වර්ගය | සිටුවීමට පෙර | දින 45 කට පසු | දින 90 කට පසු |
|---|---|---|---|
| කාබනික පොහොර | අවම කි.ග්‍රෑ 05 | - | - |
| යූරියා | - | ග්‍රෑ. 41 | ග්‍රෑ. 41 |
| ට්‍රිපල් සුපර් පොස්පේට් | ග්‍රෑ. 50 | - | - |
| මියුරේට් ඔෆ් පොටෑෂ් | - | ග්‍රෑ. 21 | ග්‍රෑ. 21 |



*පේළියට සිටවූ ඉඟුරු වගාව*

**අස්වනු නෙළීම**

- ඉඟුරු අල භාවිතා වන අවසන් නිෂ්පාදනයේ ස්වභාවය මත අස්වැන්න නෙළිය යුතු අවස්ථාව තීරණය වේ. ඒ අනුව මාස 8-9 කින් අස්වනු නෙළාගත හැකිය.
- ඉඟුරු ගස් පරිණත වනවිට ක්‍රමයෙන් ගස් වියළී යයි. ඒ අස්වනු නෙළීමට වඩාත් සුදුසු කාලයයි. ඉඟුරු අල ගැලවීම පිණිස මුල්ලුවක් භාවිතා කිරීමෙන් අලයට හානි සිදු නොවේ.



ඉඟුරු අල

- සාමාන්‍ය අස්වනු නෙළන කාලය - දෙසැම්බර් - ජනවාරි
- ඊළඟ කන්නයට සිටුවීම සඳහා බීජ අල හොඳින් වාතාශ්‍රය ඇති ස්ථානයක ගබඩා කර තැබිය යුතුය.
- අස්වැන්න වගා කරන වර්ග අනුව වෙනස් වේ. හෙක්. 01 කින් චීන ඉඟුරු වලින් 1:20 - 25 පමණ ද, දේශීය ඉඟුරු වලින් 1:15 - 20 ක් පමණ ද ලබාගත හැකිය. චීන ඉඟුරු වල ගුණාත්මකභාවය දේශීය ප්‍රභේද වලට වඩා අඩුය.

**රෝග පාලනය**

- අල කුණුවීමේ දිලීර රෝගය
- අල කුණුවීමේ බැක්ටීරියා රෝගය
- නෙමටෝඩා හානිය

(නිර්දේශිත පාලන ක්‍රම අනුගමනය කරන්න)

**ඉඟුරු කඳ පණුවාගේ හානිය**

- බෝග වගාවේ මුල් අවස්ථාවේ දී වගාව නිරීක්ෂණය කර හානිවී ඇති කඳන් කපා පුළුස්සා දැමීමෙන් පාලනය කළ හැක.
- බෝග මාරුව අනුගමනය කර රෝග පැතිරීම පාලනය කළ හැක.

**ගෙවතු තුළ පොලිසැක් මළුවල ඉඟුරු වගාව**

මෙය නාගරික ගෙවතු තුළ සිදු කළ හැකි ඉතා හොඳ අස්වැන්නක් ලබාදෙන ක්‍රමයකි. මෙහිදී කිලෝ 25 ක් හෝ කිලෝ 50 ප්‍රමාණයේ පොලිසැක් මළු භාවිතා කළ හැක. මෙහිදී එක් මල්ලකට අවශ්‍ය වන ඉඟුරු බීජ අල ප්‍රමාණය පිළිවෙළින් ග්‍රෑම් 50 ක් හෝ 100 ක් වේ.

වැලි, දිරූ ගොම හෝ කොම්පෝස්ට්, කොහුබත් හා මතුපිට පස් සමාන ප්‍රමාණ වලින් මිශ්‍ර කර පොලිසැක් මල්ල පුරවා ගන්න. පොලිසැක් බඳුන පිරවීමේ දී එය දෙකට නවා එම අර්ධයට අඟල් දෙකක් ඉතිරි වන සේ පුරවන්න. මූලික පොහොර ලෙස පොලිසැක් මල්ලකට (කිලෝ ග්‍රෑම් 50 ප්‍රමාණයේ මල්ලකට) ත්‍රිත්ව සුපර් පොස්පේට් ග්‍රෑම් 100 ක් මිශ්‍ර කර ගන්න.

ඉන්පසු මල්ලෙහි මතුපිට බීජ අල සිටුවීම කළ හැක. මෙහිදී අදාළ බීජ අල ප්‍රමාණය කොටස් 3 කට බෙදා වෙන් කර ත්‍රිකෝණාකාර හැඩයට අඟ් 3 ක් ගැඹුරින් සිටුවා ගන්න. බීජ සිටවූ පසු ග්ලිරිසීඩියා කොළ වසුන මඟින් පොලිසැක් මල්ලේ ඉතිරි අඟල් දෙක පුරවා ගන්න.

මාස $1\,^{1}/_{2}$ කට පසු යූරියා හා මියුරේට් ඔෆ් පොටෑෂ් පිළිවෙළින් ග්‍රෑම් 7 ක්, ග්‍රෑම් 10 ක ප්‍රමාණයක් ජලය ලීටරයක දියකර එක් මල්ලකට යොදන්න.

කිලෝ ග්‍රෑම් 50 ප්‍රමාණයේ මල්ලක ඉඟුරු වගාවෙන් අමු අල කිලෝ ග්‍රෑම් 4 ක පමණ අස්වැන්නක් ලැබිය හැක.

**ප්‍රධාන නිෂ්පාදන**

| | |
|---|---|
| - අමු ඉඟුරු | - සීනි මිශ්‍ර ඉඟුරු පෙති |
| - විරංජනය කළ ඉඟුරු | - ලුණු මිශ්‍ර ඉඟුරු පෙති |
| - වියළි ඉඟුරු කුඩු | - ඉඟුරු ඔලියොරෙසීන |
| - වියලි ඉඟුරු පෙති | - ඉඟුරු තෙල් |
| - ඉඟුරු බීම | - ඉඟුරු අච්චාරු |
| - ඉඟුරු රසැති ටොෆී | - වියළි ඉඟුරු කුඩු |

**ඉඟුරු කල් තබා ගැනීමේ ක්‍රම**

- අමු ඉඟුරු කපා වියළා ගැනීම
- හුණු ජල ප්‍රතිකාර කර වියළා ගැනීම (විරංජනය කළ ඉඟුරු)

**ඉඟුරු වල ප්‍රයෝජන**

ව්‍යාංජන රසකාරක, බේකරි නිෂ්පාදන හා බීම නිෂ්පාදන වල රසකාරක ලෙස ප්‍රධාන වශයෙන් යොදාගනී. මීට අමතරව ඖෂධ හා සුවඳ විලවුන් ලෙස ද ඉඟුරු භාවිතා වේ.



## 11.3 වැනිලා වගාව



වැනිලා යනු වටිනාකමින් ලොව දෙවැනි කුළුබඩු වර්ගය වේ. උඩවැඩියා ශාක විශේෂයක් වන වැනිලා වගා කළ හැක්කේ සීමිත රටවල් කීපයක් පමණක් වන අතර ශ්‍රී ලංකාව ද ඉන් එක රටකි. මෙහෙයින් ඉතා හොඳ මිලක් සහිත ආර්ථික බෝගයක් ලෙස මෙය හැඳින්විය හැක. අවම මහන්සියකින් ගෘහාශ්‍රිතව වැනිලා වගාව සිදු කළ හැකි අතර, ඒ සඳහා ගෘහණියගේ ශ්‍රමය පහසුවෙන් යොදවා ගත හැක.

වැනිලා කර්මාන්තයෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට නම් යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කළ යුතුවේ. සාමාන්‍යයෙන් මෙම බෝගය තනි වගාවක්, ගෙවතු ආශ්‍රිතව මිශ්‍ර වගාවක් මෙන්ම පොල් හා තේ වැනි වැවිලි ආශ්‍රිතව අතුරු වගාවක් ලෙස ද සංවර්ධනය කළ හැකිය.

**ශ්‍රී ලංකාවේ වැනිලා වගා කරන ප්‍රධාන ප්‍රදේශ**

තෙත් හා අතරමැදි දේශගුණික කළාපවල වැනිලා සාර්ථකව වගා කෙරේ. මහනුවර, මාතලේ, කෑගල්ල, නුවරඑළිය, ගම්පහ හා කුරුණෑගල

යන දිස්ත්‍රික්කවල වැනිලා වගාව සාර්ථකව සිදු කළහැක.

**වැනිලා වගාව සඳහා අවශ්‍ය පරිසර තත්ත්ව**

- උෂ්ණත්වය 21⁰C - 32⁰C (වියළි කාලගුණය හා මුහුදු සුළඟ නුසුදුසුය.)
- වර්ෂාපතනය වසරකට මාස 10 ක පමණ කාලයක් පුරා පැතිරුණ හා මි.ලී. 2000-2500ක වර්ෂාපතනයක් යෝග්‍යවන අතර, මල් පිපීම උත්තේජනය වීමට මාස 02ක පමණ වියළි කාලයක් අවශ්‍ය වේ. උච්චත්වය මුහුදු මට්ටෙමි සිට අඩි 3000ක් දක්වා වැනිලා වගා කළ හැකිය.
- පස හොඳින් ජලය බැස යන කාබනික ද්‍රව්‍ය බහුල ලෝම පසක් වීම
- සෙවණ 70%-75% දක්වා අධික සෙවණ ද අවශ්‍ය විටක එම සෙවන 30%ක් දක්වා අඩු කිරීමට ද හැකිවිය යුතුය. උස් සෙවන සඳහා මාර, එරබදු හා සබුක්කු ද පහළ මට්ටමේ සෙවණ සඳහා කෝපි, කෙසෙල් ද සුදුසුය.
- ආධාරක ශාක ග්ලිරිසිඩියා හා එරබදු ශාක ද යොදාගනී.

**වැනිලා වගාව සඳහා පාංශු අවශ්‍යතාවය**

ඉතා හොඳින් ජලය බැස යන කාබනික කොළ වසුනක් සහිත ලොම් පසක් වඩාත් සුදුසු වේ. එනම්. ජලය රඳා පවතින පසක් සුදුසු නොවේ.

**රෝපණ ද්‍රව්‍ය සකස් කර ගැනීම**

අඩි 03-07 දක්වා දිග වැල් කැබලි සුදුසු වේ. මවු ශාකයේ හොඳින් වැඩුණු මාංසලමය පත්‍ර සහිතවීම, රෝග පළිබෝධවලින් තොරවීම, වේගවත් වර්ධනය හා වැඩි අස්වනු ලබාදෙන බව වැනි ලක්ෂණ තිබිය යුතුය. මල් පිපුණු වැල් හෝ කරල් නෙළන ලද වැල් පැළ කිරීම සඳහා කැබලි ලබා ගැනීමට නුසුදුසුය.

ලබාගන්නා වැල් කැබලි සිටුවීමට පෙර පූර්ව ප්‍රතිකාර වලට භාජනය කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙහිදී අඩි 03 ක් පමණ දිග හා පැන්සලක පමණ ඝනකමක් ඇති වැල් කැබලි ගෙන එහි පාදස්ථ කෙළවරේ වූ පත්‍ර 03ක් ද මුල් පුරුක ආසන්නයෙන් කඳ කොටස ද කපා දමන්න. පසුව දින 5-6ක් පමණ වැල්වල ඉහළ කෙළවර පහතට සිටින සේ එල්ලා තබන්න. මෙම නිසා වැල්වල ජලය වාෂ්පවීම, කැපුම් කෙළවරෙහි කිණකය සෑදීමත් අංකුර හා මුල් වර්ධනය උත්තේජනය වීමත් සිදුවේ.

බඳුන්ගත පැළ සකසා ගන්නේනම් පුරුක් 3 ක් සහිත අර්ධ ලෙස මේරූ වැල් කැබලි ගෙන එය අඟල් 7 X 10 ප්‍රමාණයේ පොලතීන් බැගයක එක් පුරුකක් යට වනසේ සිටුවා සකස් කරගත හැකිය.

**වැනිලා වගාව පිහිටුවීම**

ප්‍රධාන වශයෙන් වැනිලා වගාව පියවර 05 ක් යටතේ කරගෙන යා හැක.

1. ආධාරක සිටුවීම සහ බිම් සැකසීම
2. වැනිලා වැල් සිටුවීම
3. වගා නඩත්තුව හා වැල් පුහුණු කිරීම
4. මල් හට ගැනීම සහ පරාගනය
5. අස්වනු නෙළීම

***පියවර 01 - වැනිලා වගාවට ආධාරක සිටුවීම සහ බිම් සැකසීම***

වැනිලා වැල වර්ධනයටත්, අවශ්‍ය සෙවන සපයාදීමටත්, කොළ පොහොර ලබා ගැනීමටත් ග්ලිරිසීඩියා හා එරබදු ශාක නිර්දේශිතයි. ආධාරක සඳහා ග්ලිරිසීඩියා (Gliricidia) කෝටු වඩාත් සුදුසු වේ. ආධාරක කෝටුව අඩි 07 ක් පමණ දිගට අඟල් 04 ක් පමණ වට ප්‍රමාණයක් වීම වඩාත් සුදුසු

වේ. ආධාරක ශාක සෙන්ටිමීටර 240 X 150 (අඩි 8 X 5) පරතරයකින් සිටුවා මාස 3-4 ක් ගියපසු (ග්ලිරිසීඩියා ගස් වැඩුණු පසු) වැනිලා පැළ සිටුවීම වඩාත් සුදුසුයි. ආධාරක ශාකය වටේ අඩි 3 ක විෂ්කම්භයකට අඩි $^{1}/_{2}$ ගැඹුරට පස බුරුල් කර පොහොර සමග හොඳින් මිශ්‍ර කරන්න.

*පියවර 02 - වැනිලා වැල් සිටුවීම*

වැනිලා වැල් සිටුවීමේදී ආධාරකයේ පාදස්ථයේ සිට පසේ තිරස් අතට අඟල් 03 ක් පමණ ගැඹුරට ඇලියක් සාදන්න. දැනටමත් පත්‍ර ඉවත් කර ඇති, වැල් කොටසින් අඩි 1.5 ක් පමණ දිගක් ඒ ඇලිය දිගේ තබා පසෙන් යට කරන්න. මෙහිදී වැලෙහි යට කෙළවරට පසෙන් ඇතිවන ආසාදනයන් වැළැක්වීමට එය පස මතුපිට අවකාශයට නිරාවරණය වන සේ යට කිරීම සිදු කරන්න.

*පියවර 03 - වගා නඩත්තුව හා වැල් පුහුණු කිරීම*

වගාවේ පාළු සිටුවීම, වල් මර්දනය, පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යෙදීම, සෙවන පාලනය, වසුන් යෙදීම, පොහොර යෙදීම, රෝග හා පළිබෝධ පාලනය මේ යටතේ සිදු කරයි. වගාවේ මනා නඩත්තුව ඉහළ අස්වැන්නක් හා නිෂ්පාදන වියදම අවමකර ගැනීමට හේතුවේ.

වැලේ පාදස්ථය වැසී යන පරිදි අඟල් 4 - 5 ක් පමණ උසට වසුනක් යොදන්න. නයිට්‍රජන් බහුල කොළ පොහොර හෝ කොම්පෝස්ට් පොහොර ද යොදන්න.

වගා නඩත්තුව සිදු කරන අවස්ථාවේ දී වැල් පුහුණු කිරීමක් අවශ්‍ය වේ. මෙහිදී ආධාරක ශාකයේ උස අඩි 5ක් දක්වා හරස් අතු ඉවත් කරන්න. අනතුරුව හරස් අතු 2-3 ක් වර්ධනය වීමට සලස්වන්න. එම ආධාරකය අනුසාරයෙන් වැනිලා වැල් අඩි 5ක් උසට යවා නැවත පහළට වැඩීමට සළස්වා බිම ගෑවෙන අවස්ථාවේ දී පුරුක් දෙකක් පමණ පොළවට යටකර පුඩු ලෙස හෝ (හරස්) තිරස් අතට වැල් පුහුණු කරන්න. (වැඩෙන්නට සළස්වන්න)

*පියවර 04 - මල් හට ගැනීම සහ පරාගනය*

වැනිලා වැලක් හොඳින් වර්ධනය වූ පසු වැල ආතතියට ලක්කර පසුව මාස 04 ක් ගියපසු වැනිලා මල් හට ගැනීම සිදුවේ. ආතතියට ලක් කරනුයේ ආධාරකයේ සෙවණ 30% ක් දක්වා අඩු කරමින් හා එල්ලී ඇති වැල්වල අග්‍රස්ථය පුරුක් කිහිපයක් කපා දැමීමෙනි.

සාමාන්‍යයෙන් මාර්තු අප්‍රේල් කාලය තුළදී මල් පිපෙන අතර එවිට සිදුකරන කෘතිම පරාගනයකින් (උදේ 7-11 දක්වා) හටගන්නා වැනිලා කරල් දෙසැම්බර් පමණ වනවිට අස්වැන්න නෙළිය හැකිය.

**රෝග හා පළිබෝධ**

| රෝගය | රෝග ලක්ෂණ | ප්‍රතිකාර | වෙනත් |
|---|---|---|---|
| පයිටොප්තෙරා රෝගය | කරල් අග්‍රස්ථය කුණුවීම | ආසාදිත වැල් කපා වෙන් කරන්න | අවශ්‍ය අවස්ථා වලදී ක්ෂේත්‍ර නිලධාරි වරයෙකුගේ සහාය ලබා ගන්න |
| පියුසේරියම් දිලීර හානිය | කඳ පසට සම්බන්ධ වන ස්ථානයේ කුණුවේ | බෝඩෝ මිශ්‍රණය යොදන්න | |

*පියවර 05 - අස්වනු නෙළීම*

අප්‍රේල් මාසයේ මලකින් හටගත් කරලක් මාස 8 කට පසුව දෙසැම්බර් මාසයේ දී නෙළිය හැකිය. කරලේ අග සෙ.මී. 01 ක් පමණ ලා කහ පැහැ ගැන්වෙන විට නෙළීම සිදුවේ.

නොමේරූ හෝ අධිකව මේරූ කරල් ගුණාත්මයෙන් අඩුය. පරිනත වූ සාමාන්‍ය අමු කරල් 60 කින් පමණ වැනිලා කිලෝ ග්‍රෑම් 01ක් එකක් සාදා ගැනීමට වැනිලා කරල් 200 ක් පමණ අවශ්‍ය වේ. වසර 1 $^{1}/_{2}$ - 2 කදී ඇරඹී වසර 10 ක් දක්වා අස්වැන්න ලැබේ.

**අස්වනු නෙලූ පසු වැල් කප්පාදුව**

මල් හටගත් වැල් කොටස්වල නැවත මල් හට නොගනී. එම නිසා එම කොටස් ඉවත්කර නව වැල් වැඩීමට සළස්වන්න.

තවද වැනිලා වගාව ආරක්ෂිත ගෘහ තුළ වගා කිරීමෙන් ඉහළ ඵලදාවක් ලබාගත හැක. අවම මහන්සියකින් ගෘහ ආශ්‍රිත වැනිලා වැල් 25 කින් වාර්ෂිකව ආදායම අවම  250,000 කට වඩා ආදායමක් ලබාගත හැකිය.

**වැනිලා සැකසීම**

අමු වැනිලා කරලක කිසිදු ප්‍රසන්න සුවඳක් හෝ රසක් නොමැත. එම නිසා වැනිලා රස හා සුවඳ වර්ධනය කර ගැනීමටත් ආකර්ශනීය පෙනුමක් හා කල් තබා ගැනීමේ අරමුණ ඇතිවත් වැනිලා සකසනු ලැබේ. වැනිලා ලෙස හැඳින්වුව ද එහි අඩංගු රසායනික සංඝටක වැනිලීන් ලෙස හඳුන්වයි. වැනිලා සැකසීමේ ක්‍රියාවලියේදී එහි ඇති පොස්පො වැනිලීන්, වැනිලීන් බවට පත් වේ. මෙම නිෂ්පාදන වෙළඳපොළට හා පරිභෝජනයට සැකසීමේ දී විශේෂ නිපුණතාවක්, විශේෂ තාක්ෂණයක් හා මාස 03ක පමණ කාලයක් අත්‍යාවශ්‍ය වේ. (මේ සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැනිලා තාක්ෂණික පොත/තාක්ෂණික නිලධාරියෙකුගේ සහාය හා වීඩියෝ දර්ශනවල උපකාර ලබාගන්න.)

**වැනිලා නිෂ්පාදන සඳහා වෙළඳපොළ**

ලෝකයේ මිල අධිකම බෝගයක් වන වැනිලාවල වාර්ෂික නිෂ්පාදනය මෙ.ටො. 5000 ක් පමණ වේ. ඉන් 90%ක්ම සපයන්නේ ඉන්දුනීසියාව හා මැඩගස්කරය යන රටවලිනි. මෙම ස්වභාවික වැනිලා නිෂ්පාදනවල ප්‍රධාන ගැනුම්කරුවන් වන්නේ අමෙරිකාව, ජර්මනිය හා ප්‍රංශයයි. ඒක පුද්ගල වැනිලා පරිභෝජනය වැඩිම රට ඩෙන්මාර්කයයි. එහෙත් ලෝකයේ කෘත්‍රිම වැනිලා ඉල්ලුම මෙ.ටො. 28,000.00 ක් පමණ වේ. මෙම රසායනික වැනිලාවලට ඇති ඉල්ලුම දිනෙන් දින අඩුවන නිසා ඉදිරියේ දී ස්වභාවික වැනිලාවලට ඉහළ ඉල්ලුමක් ඇතිවනු ඇත.

**වැනිලා නිෂ්පාදන**

සැකසූ වැනිලා කරල්/කැබලි/නිස්සාරක/ ඔලියොරෙසින/කුඩු/ද්‍රාවණ

**වැනිලා වගාවේ වාසි**

- ගෙවතු ආශ්‍රිත කුඩා ඉඩම්වලට වඩාත් සුදුසුය.
- අධික සෙවණ සහිත ඉඩම්වල පවා සාර්ථකව වගාකළ හැකිය.
- නඩත්තුව ඉතා පහසුය.
- ලෙඩ රෝග අවම බෝගයක්වීම
- කුඩා වගාවකින් වුවද විශාල ආදායමක් ලබාගත හැකිවීම
- වැනිලා මල් පරාගනය හා අස්වනු සැකසීම ආශ්‍රිතව විශේෂ රැකියා අවස්ථා පැවතීම

**විශේෂ උපදෙස්**

- වැනිලා රස හා සුවඳ ඇතිවන්නේ මේරූ කරල්වලය. එම නිසා පරිනත නොවූ කරල් නෙලීම නොකළ යුතුය.
- කරල්වල මේරීම අනුව සති 08-10 පුරා අසුවනු නෙළිය යුතුය.
- වැනිලා වැල් උද්‍යාන අලංකරණය සඳහා ද වඩාත් යෝග්‍යයි.

## 11.4 ගම්මිරිස් වගාව



### හැඳින්වීම

කුළුබඩු ලොවේ රජු ලෙස හැඳින්වෙන ගම්මිරිස් බෝගයේ උප නිජ බිමක් ලෙස ශ්‍රී ලංකාව ද සැළකේ. දිවයිනේ තෙත් හා අතරමැදි දේශගුණික කළාප ගම්මිරිස් වගාව උදෙසා වඩාත් යෝග්‍ය වේ. නමුත් වාරි පහසුකම් යටතේ වියළි කලාපයේ ද වගා කිරීමට නිර්දේශිතයි. මාතලේ, මහනුවර, කෑගල්ල, බදුල්ල, රත්නපුර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක ප්‍රධාන වගා දිස්ත්‍රික්ක ලෙස කිව හැක.

මෙම කර්මාන්තයෙන් ඉහළ ආදායමක් ලබා ගැනීමට නම් යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. සාමාන්‍යයෙන් ගම්මිරිස් බෝගය තනි වගාවක් හෝ අතුරු වගාවක් හෝ මිශ්‍ර වගාවක් ලෙස වගා කළ හැකිය. මෙහෙයින් මෙම බෝගය ද ගෙවතු වගාව සඳහා ආර්ථික බෝගයක් ලෙස සළකනු ලැබේ.

#### ගම්මිරිස් වැල් හා ආධාරක ශාක සිටුවීම

ආධාරකය ලෙස මීටර් 2.5ක් (අඩි 8) උස, සෙ.මී. 04 ක විෂ්කම්භය සහිත ග්ලිරිසීඩියා දඬු යොදා ගත හැකිය. ගම්මිරිස් සිටුවීමට මාස 06කට පෙර ආධාරක සිටුවීම නිර්දේශයයි. ගම්මිරිස් සිටුවිය යුතු පරතරය අඩි 8x8කි. මේ සඳහා අඩි 1 $^1/_2$ x 1 $^1/_2$ x 1 $^1/_2$ ප්‍රමාණයේ වළවල් සැකසිය යුතුය. අනතුරුව ගොම/ කොම්පෝස්ට් කූඩ 01 (කි.ග්‍රෑ.12) මතුපිට පස් හා රොක් ෆෝස්පේට් ග්‍රෑම් 100ක් ලෙස වූ මිශ්‍රණයකින් එම වළ පිරවිය යුතුය. වර්ෂා කාලය ඇරඹුමත් සමඟ පැළ සිටුවීම සුදුසුය. පැළ සිට වූ වහාම කොළ අතු හෝ පොල් අතුවලින් තාවකාලික සෙවණ සපයන්න. පැළය මුල ආසන්නයට කොළ රොඩු, කොහුබත් ආදිය වසුනක් ලෙස එක් කිරීමෙන් තෙතමනය සුරැකිය හැකිය. වැට මායිමේ සිට අඩි 05ක් පමණ දුරින් පළමු පේළිය අරඹන්න. අක්කර 01ක් සඳහා ගම්මිරිස් පැළ 680 - 700ක් අතර ප්‍රමාණයක් අවශ්‍යයි.

#### ආධාරක නඩත්තු කිරීම

ග්ලිරිසීඩියා දණ්ඩෙන් රිකිලි මතුවන විට ඒවා එක් රිකිල්ලකට කප්පාදු කරමින් උස අඩි 10ක් පමණ වන තෙක් තනි කඳන් ලෙසින්ම පවත්වා ගන්න. ඉන්පසු රිකිලි 2ක් අඩි දෙකක් පමණ උසට වැඩෙන්නට හරින්න. මෙලෙස ආධාරක ශාකය අවම උස අඩි 12ක් පමණ වන සේ නඩත්තු කරන්න.

සාමාන්‍යයෙන් සෙවණ කප්පාදු කිරීම තෙත් කලාපයේ යල සහ මහ වර්ෂාව ආරම්භයේ දී හා වැසි සමය මැද දී ලෙස වසරකට සිව් වතාවක් වන ලෙස සිදු කළ යුතුය.

#### ගම්මිරිස් වැල් නඩත්තු කිරීම

ගම්මිරිස් වැලක් මූලිකව අතු 3ක් හෝ 4ක් සහිතව වැඩීම සුදුසු වේ. සාමාන්‍යයෙන් අලුතින් සිටවූ වැලක පුරුක් 8-10ක් යන තෙක් මූලික අතු (හරස් අතු) ඇති නොවූ යේ නම්, වැලේ පාමුල සිට පුරුක් 3කින් කප්පාදු කරන්න.

අනතුරුව වැල සිලින්ඩරාකාරව ඉහළට වැඩෙන්න හරින්න. පාමුලින් හටගන්නා නිරෝගී පා වැල් 2-3 ආධාරක ඉන්නට ඉහළට තබා බැඳීමෙන් පිරුණු වැලක් සාදා ගැනීම ද කළ හැකිය.

**පොහොර යෙදීම**

සාමාන්‍යයෙන් වැඩි අස්වැන්නක් සඳහා ගම්මිරිස් වැල්වලට පොහොර යෙදීම වැදගත්ය. සිටවූ දින සිට මාස 06කට පසු පළමුව පොහොර යෙදීම කළ හැක. පැළයේ සිට සෙ.මී. 15ක් පමණ ඈතින් කුඩා පැළ සඳහා ද වැඩුණු පැළ සඳහා අඩියක් පමණ ඈතින් ද, පැළය වටා පොහොර යොදා අත් හෝ උදළු මුල්ලුවකින් පසට මිශ්‍ර කළ යුතු වේ.

**පොහොර මිශ්‍රණය**

යූරියා, රොක් ෆොස්පේට්, මියුරේට් ඔෆ් පොටෑෂ්, කීසරයිට් - බර අනුව 4:5:3:1 අනුපාතයට මිශ්‍ර කර ගත යුතුය. පොහොර මිශ්‍රණය (පැළයකට/ග්‍රෑ.)

| වර්ෂය | පළමු මෝසම් වර්ෂාව ආරම්භයේ දී | දෙවන මෝසම් වර්ෂාව ආරම්භයේ දී |
|---|---|---|
| ප්‍රථම වසරේ දී | 125 | 125 |
| දෙවන වසරේ දී | 250 | 250 |
| තෙවන වසරේ දී හා ඉන් පසුව | 350 | 350 |

ග්ලිරිසීඩියා කොළ හා ළපටි පත්‍ර වර්ෂයකට කි.ග්‍රෑ. 10-15 (කි.ග්‍රෑ.2.5-3.75 බැගින් 4 වරක්) ගම්මිරිස් වැල වටා යොදන්නේ නම් රසායනික පොහොර යෙදීමේ අවශ්‍යතාවය අඩකින් අඩු කර ගත හැක.

**අස්වනු නෙළීම**

මනා නඩත්තුවක් යටතේ වගාව පරිනත විට අවුරුදු 2 $^1/_2$ කින් පමණ ගම්මිරිස් ඵල දැරීම ආරම්භ වේ. වැලකින් වසරකට වියළි ගම්මිරිස් කි.ග්‍රෑ. 1-2.5ක් පමණ විභව අස්වැන්නක් ලබා ගත හැකිය. (අක්කරයකින් කි.ග්‍රෑ 1,500ක්) ඇතැම්විට ප්‍රදේශ අනුව ගම්මිරිස් වැලකින් එක් වසරක දී අස්වනු වාර දෙකක් ලබා ගත හැකිය.

**ගම්මිරිස් නිෂ්පාදන**

**කළු ගම්මිරිස්**

හොඳින් මේරූ එහෙත් නොඉදුණු ගෙඩිවලින් සකසා ගැනේ. වගාවේ වැලක කරලක් හෝ කරල් කිහිපයක ගෙඩි කීපයක් කහ පැහැ ගැහෙන විට හා කරලේ අවසන් ඇට අතින් තද කළ විට තැලී නොයන්නේ නම් කළු ගම්මිරිස් සකස් කිරීම සඳහා අස්වනු නෙළීමට සුදුසුය.

නෙළාගත් ගම්මිරිස් කරල්වලින් ඇට වෙන් කර හිරු එළියේ පිරිසිදුව වියළා ගත යුතුය. වඩා ඒකාකාරී කළු ගම්මිරිස් නිෂ්පාදනය කිරීමට උණු වතුර ප්‍රතිකාර ක්‍රමය අනුගමනය කළ හැකිය.

ඒ සඳහා පිරිසිදු විශාල බැරල් භාගයකට වතුර පුරවා නටවා ගන්න. ගම්මිරිස් ඇට ගෝනියක දමා එම නටන ජලයේ විනාඩි 1-2ක් ගිල්වා ඉවත් කර ගෙන වියළන කමතක තුනීකර වියළා ගන්න. අමු ගම්මිරිස්වලින් ලබා ගත හැකි වියළි කළු ගම්මිරිස් ප්‍රමාණය 30-33%ක් පමණ වේ.

**සුදු ගම්මිරිස්**

ඉදුණු ගෙඩිවලින් සකසා ගැනේ. ඉදුණු ගෙඩි කිහිපයක් සහිතව නෙළාගත් කරල් දිනක් පමණ ගොඩගසා තැබීමෙන් ඉදවා ගත හැක. එම ඇට ගෝනිවල බහා, ගලා යන දිය පහරක දින 3-4ක් ගිල්වා තැබිය යුතුය. ජලය මාරු කළ හැකි නම් ටැංකි වුව ද යොදා ගත හැකිය. මින් පොත්ත ඉවත් කිරීම පහසු වේ. පසුව රළු පෘෂ්ඨයක

අතුල්ලා හෝ අතින් පොඩිකර පොත්ත ඉවත් කර හොඳින් සෝදා වියළා ගත යුතුය. වියළි ගම්මිරිස් පිරිසිදු වියළි ස්ථානයක ගබඩා කර තබන්න.

**විශේෂ :**

- වැඩුණු වැල් නඩත්තුවේ දී පොළොවේ සිට අඩි 1 1/2 පමණ උසට හරස් අතු ඉවත් කරන්න.
- හොඳින් ආලෝකය ලැබෙන සේ ආධාරක ශාකය කප්පාදු කරන්න.
- කොළ රොඩු හා ආධාරක අතු ගසේ මුලේ සිට අඩි 1 1/2 ක් පමණ ඈතින් යෙදීම මඟින් ගම්මිරිස් වැලේ සනීපාරක්ෂාව තහවුරු වේ.
- වෙළඳපොළ ඉල්ලුම අනුව කොළ ගම්මිරිස්, රතු ගම්මිරිස්, සෝස්, ගම්මිරිස් කුඩු, ගම්මිරිස් තෙල් ආදී විවිධ වාණිජ නිෂ්පාදන සකසා අලෙවි කළ හැකිය.
- ගම්මිරිස් ඇට ගැලවීම, ශ්‍රේණි කිරීම හා සුදු ගම්මිරිස් සැකසීම සඳහා සැකසූ යන්ත්‍ර ද, විවිධ වියළුම් යන්ත්‍ර ද වෙළෙඳපොළෙන් මිල දී ගත හැක.



## 11.5 නයි මිරිස් වගාව



### හැඳින්වීම

සොලනේසියේ කුළයට අයත් වන ලෝකයේ දැනට හදුනා ගෙන ඇති මිරිස් (කැප්සිකම්) විශේෂ 30 කට ආසන්න ප්‍රමාණයෙන් ගෘහාශ්‍රිතව වගා කරන විශේෂයන් ගණන 5 කි. ඒ අතරින් ශ්‍රී ලංකාවේ බහුලව දැකිය හැකි වන්නේ විශේෂයන් තුනකි ඒවා නම්

- කැප්සිකම් ඇනම් - මිරිස්
- කැප්සිකම් චයිනෙන්ස් - නයි මිරිස්
- කැප්සිකම් ෆෲටිසන්ස් - කොච්චි

මිරිස් පරිභෝජනය කළ විට දැනෙන දැවිල්ල ඇති කිරීමට හේතුවන්නේ එහි අඩංගු කැප්සයිසින් නැමැති සංයෝගයයි. මෙය කරලේ බීජ සවි වී ඇති කොටසේ පිහිටා ඇති ග්‍රන්ථි විශේෂයකින් ශ්‍රාවය කරයි. දැනට ලෝකයේ හඳුනාගෙන ඇති සැර අධිකම මිරිස් අයත් වනුයේ කැප්සිකම් චයිනෙන්ස් එනම් නයි මිරිස් අයත් වන විශේෂයටයි.

ශ්‍රී ලංකාව තුළ විශාල ජෛව විවිධත්ව පරාසයක පවතින මෙම නයි මිරිස් වල වගා දර්ශයන් බොහොමයක් දැකිය හැකි වේ. ශාකයේ වර්ධන විලාශය, මල් හටගන්නා ආකාරය, මලේ පැහැය, කරලේ ප්‍රමාණය, කරලේ හැඩය, කරල පිහිටන ආකාරය, සුවඳ හා සැර ප්‍රමාණය අනුව ද මෙම වගා දර්ශයන් එකිනෙකට වෙනස් වේ. නයි මිරිස් වල පවතින අධික සැරභාවය හේතුවෙන් භාවිතයේ දී විශේෂයෙන් බීජ වෙන්කර ගැනීමේ දී මෙන්ම පරිභෝජනයට ගැනීමේ දී ඇස් වල හා සංවේදී ස්ථානවල තැවරීමෙන් වැළකිය යුතු වේ.

නයි මිරිස් විටමින් A සහ විටමින් C වලින් පොහොසත් මෙන්ම ඖෂධීය ගුණයෙන් ද යුක්තයි. ස්වසන ආබාධ වලදී විශේෂයෙන්ම සෙම්ප්‍රතිශ්‍යාව වැළදීමට ආසන්න අවස්ථාවන්වල දී අනුභව කිරීමෙන් අහිතකර තත්ත්වය බොහෝ දුරට සමනය කර ගත හැකිය. ආහාර පිළියෙළ කර ගැනීමේදී කරවල බැදුමට මෙන්ම තම්බා ගත් අල, බතල, කොස් සඳහා කටගැස්මක් ලෙස ද යොදා ගත හැකිය.

අතීතයේ දී ගෙවතු ආශ්‍රිතව ස්වාභාවිකව වැඩෙන ශාකයක් ලෙස හැඳින්වුවද නයි මිරිස් වලට ඇති ඉල්ලුම නිසා වර්තමානයේ දී සුළු පරිමාණයේ සිට වාණිජ වගාවන් දක්වාද වගාව ව්‍යාප්තව ඇත. වසර පුරාම ඵල දරණ හෙයින් හා ශ්‍රී ලංකාවේ අතරමැදි හා තෙත් කලාප වල මෙම බෝගය සාර්ථකව වගාකළ හැකි වීම ඊට හේතු සාධක වී ඇත.

## ක්ෂේත්‍රය තෝරා ගැනීම

නයි මිරිස් වගාව සඳහා ජලය හොඳින් බැස යන ගැඹුරු ලෝම පසක් යෝග්‍යය. පසෙහි පෝෂක තත්ත්වය දියුණු කර ගැනීමට කාබනික පොහොර එනම් ගොම පොහොර හෝ කුකුල් පොහොර හෝ කොම්පෝස්ට් පොහොර යෙදිය හැකිය.

වගාව සඳහා මඳ වශයෙන් සෙවණ පැවතීම ඉතා යෝග්‍යය. එබැවින් පොල් වගාව හෝ වෙනත් ප්‍රධාන බෝගයන් යටතේ වුවද වගා කළ හැකි වීම වාසියකි. අධික සූර්යාලෝකය පතිතවන ක්ෂේත්‍රයක දී ග්ලිරිසිඩියා පැළ කිරීමෙන් ලැබෙන සෙවණ යටතේ හොඳින් වගා කළ හැකි වේ. තවද ගෙවතු වගාවේ දී විශාල බඳුන් වලද වගා කළ හැකිය.

## වගා දර්ශයන් හා බීජ සොයා ගැනීම

වගා දර්ශයන් හා බීජ සොයා ගැනීම වගාව ආරම්භ කිරීමේ දී ගොවීන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවක් වන්නේ ගුණාත්මක බීජ හා පැළ සොයා ගැනීමයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් මෙතෙක් නයි මිරිස් ප්‍රභේදයක් බිහි කර නොමැති හෙයින් දැනට ගොවීනට වගා කිරීමට සිදුව ඇත්තේ ඔවුන් සතුව පවතින වගා දර්ශයන්ය.

තම පැරණි වගාවේ සාර්ථකව ඵල දරණ ලද ශාකයකින් ලබා ගත් කරල් වලින් බීජ ලබා ගැනීම එසේත් නැත්නම් හොඳින් වගාව සිදු කළ වෙනත් ගොවියෙකුගේ වගාවකින් ලබා ගත් කරල් වලින් බීජ සපයා ගැනීම කළ හැකිය. මෙහිදී දම්පාට, තද කොළ පාට සිට ලා කහ පාට දක්වා වර්ණ පරාසයක පිහිටි වගා දර්ශයන් තිබුණ ද වෙළඳපල ඉල්ලුම පවතිනුයේ කොළ පාටට හුරු හෝ කහ පාට වගා දර්ශයන් කෙරෙහිය.

## පැළ ලබා ගැනීම

නයි මිරිස් බීජ කරලින් වෙන් කොට සාමාන්‍ය පරිසර තත්ත්වයන් යටතේ කෙටි කාලයක දී පැළ වීම අඩු වන බව බොහෝ ගොවීන්ගේ මතයයි. එබැවින් තවාන් දැමීම සඳහා ලබා ගත යුත්තේ අලුත් බීජයන්ය.

තවාන් දැමීමේ දී ක්ෂේත්‍ර තවාන්, බදුන් ගත තවාන් හෝ තවාන් තැටි උපයෝගි කර ගත හැකිය. මේ සඳහා සාරවත් වැලි ලෝම පසක් තිබීම, කාබනික පොහොර එකතු කිරීම හා පස ජීවානුහරණය කර ගැනීම ඉතා වැදගත් වේ. බීජ තවාන් දමා සතියකින් පමණ බීජ පැළ වීම සිදු වේ. බීජ පැළ වලට දින 21-25 පමණ වන තෙක් තවානේ රැක බලා ගැනීම අවශ්‍ය වේ. බීජ තවාන් දමා දින 30 ක් පමණ ගතවූ පැළ සිටුවීමට යෝග්‍ය වන අතර එම අවස්ථාවේ දී හොඳින් වැඩුන පත්‍ර 6-7 පවතින අතර පැළයක් අඟල් 6 ක් පමණ උසකින් ද යුක්ත වේ. තවාන් පැළ ක්ෂේත්‍රයේ ඍජුව සිටුවීමට සාපේක්ෂව  බදුන්ගත පැළ සිටු වීමෙන් වගාවේ පාළු ඇති වීම අවම කර ගත හැකිය.

**ක්ෂේත්‍රයේ පැළ සිටු වීම**

ක්ෂේත්‍රය පිළියෙල කර ගැනීමේ දී පස හොඳින් පෙරළා වල් පැළෑටි ඉවත් කර ගත යුතුය. නයි මිරිස් ශාකය හොඳින් අතුපතර විහිදී වැඩෙන හෙයින් හා මාස 7-8 කට වැඩි කාලයක් අස්වැන්න ලබා දෙමින් ක්ෂේත්‍රයේ පවතින නිසාත් සිටුවීමේ දී පැළ අතර පරතරය අඩි 3x3 ආකාරයට තබා ගැනීම වැදගත්ය.

අඩියක් පමණ ගැඹුරට වළවල් සකසා හොඳින් පිළියෙළ කළ කොම්පොස්ට් යොදා වගාව ආරම්භ කළ හැකිය. රසායනික පොහොර (මිරිස් පොහොර) වළකට යොදන්නේ නම් පැළ සිටු වීමට දින 2 කට පෙර යොදා පස සමඟ හොඳින් මිශ්‍ර කළ යුතුය. එක් වළකට පැළ 2 ක් සිටුවීම ප්‍රමාණවත්ය.

**වල් මර්දනය**

පැළ සිටුවා සති 2 කට පමණ පසු පැළ අවට පස හොඳින් බුරුල් කිරීම කළ යුතුය.
මෙහිදී වල් මර්දනය සිදු කිරීම හා පැළ අසලට පස් එකතු කිරීම එක වරම කළ හැකිය.

මිරිස් පැළ වර්ධනය වී පත්‍ර වියන මගින් පස ආවරණය වන තෙක් සති 2 කට වරක් වල් මර්දනය කොට පස බුරුල් කිරීම සිදු කළ යුතුය. මේ සමඟම මතුපිට පොහොර යෙදීම ද සිදු කළ හැකි වීම අමතර වාසියකි.

**පොහොර යෙදීම**

නයි මිරිස් ශාකය කාබනික පොහොර කෙරෙහි ඉතා හොඳින් ප්‍රතිචාර දක්වයි. කාබනික පොහොර ප්‍රමාණවත් ලෙස සපයා ගත හැකි නම් රසායනික පොහොර වලින් තොරව වුවද වගා කළ හැකි වේ. වගා ක්ෂේත්‍රයේ බිම් සකසන අවස්ථාවේ හෙක්ටයාරයකට ටොන්. 12-15 ක් පමණ යොදා හොඳින් පසට මිශ්‍ර කිරීම වඩාත් සුදුසුය. පසෙහි පෝෂක තත්ත්වය අඩු අවස්ථාවල දී කාබනික පොහොරට අමතරව රසායනික පොහොර ලෙස මිරිස් මිශ්‍රණය භාවිතා කළ හැක. එනම් සති දෙකකට වරක් එක් පැළයකට ග්‍රෑම් 10 ක් වන ලෙස රසායනික පොහොර යෙදීම ප්‍රමාණවත්ය.

**ජල සම්පාදනය**

වගාව ක්ෂේත්‍රයේ හොඳින් ස්ථාපනය වන තෙක් දින 2 කට වරක් ජල සම්පාදනය කිරීම හා අනතුරුව දින 5-6 කට වරක් ජලය යෙදීම ප්‍රමාණවත්ය. විසුරුම් ජල පද්ධතියක් උපයෝගී කර ගන්නේ නම් වඩාත් යෝග්‍යය. එහෙත් නිරන්තර ජලය යෙදීම හා ජල වහනය දුර්වල වීම දිලීර රෝග ඇති කරයි.

**පළිබෝධ පාලනය**

නයි මිරිස් ශාකය මිරිස් වලට වැළඳෙන රෝග හා පළිබෝධ බොහොමයකට ප්‍රතිරෝධීතාවක් පෙන්වයි. එහෙත් අහිතකර පරිසර තත්ත්වයන් යටතේ දී මිරිස් වගාවට හානි කරන කුඩිත්තන්, පැළ මැක්කන් හා මයිටාවන්ගේ හානිය නිසා සිදු වන කොළ කොඩවීමේ තත්ත්වය ඇති විය හැකිය. තවද සුදු මැස්සන් මගින් පතුරුවා හරින වෛරස රෝගය නිසා ද නයි මිරිස් වගාවට හානි සිදු වේ. එබැවින් විශේෂයෙන්ම පළිබෝධ මර්දනයේ දී හැකිතාක් දුරට ස්වභාවික ශාක සාර වලින් නිෂ්පාදිත පළිබෝධනාශක යෙදීම යෝග්‍යය. කොහොඹ සාරයෙන් නිපදවන පළිබෝධනාශක මේ සඳහා භාවිතා කළ හැකිය.

**රෝග පාලනය**

තවානේ දී පැළ මිය යාම පසේ ජීවත් වන රෝග කාරක දිලීර නිසා ඇති විය හැකිය. තවාන් නියමිත පරිදි ජීවාණුහරණය කිරීම හා බීජ ප්‍රතිකාර භාවිතය මෙම තත්ත්වය බොහෝදුරට පාලනය කරයි.

වර්ෂාව අධික කාලවල දී හා පරිසරයේ තෙතමනය වැඩි වු විට මිරිස් වගාවට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස්, සර්කස්පෝරා පත්‍ර ලප රෝගය හා රිකිළි කුණුවීමේ තත්ත්වය නයි මිරිස් වගාවට ද ඇති විය හැකිය. මනා ජල පාලනය මෙන්ම වගාව තුළ සනීපාරක්ෂාව පවත්වා ගැනීම දිලීර රෝග පාලනයේ දී ඉතා වැදගත්ය. රෝග තත්ත්වය බරපතල වේ නම් පමණක් දිලීර නාශක යෙදීම කළ යුතුය. ඒකාබද්ධ පළිබෝධ පාලනයේ දී යොදා ගන්නා කෘමි ප්‍රතිරෝධී ඇල් යොදා වගාව ආවරණය කිරීම හා නිරන්තර වගා පරීක්ෂාව හා වගාව තුළ සනීපාරක්ෂාව පවත්වාගෙන යාම රෝග හා පළිබෝධ මර්දනයේ දී වඩාත් වැදගත් වේ.

**අස්වනු නෙළීම**

සාමාන්‍යයෙන් වගාව පිහිටුවා මාස 2 ක දී පමණ මල් පිපීම ආරම්භ වී කරල් හට ගැනීම සිදු වේ. අස්වනු නෙළීමේ දී මේරූ කරල් පමණක් නෙළීම යෝග්‍යය. නොමේරූ කරල් බරින් අඩු වීම, සැර අඩු වීම හා පහසුවෙන් මැල වී අස්වනු ගුණාත්මය පහළ යාම සිදු විය හැකිය. හොඳින් නඩත්තු කල වගාවක දී එක් පඳුරකින් මාස 6-8 කාලයකදී කිලෝ ග්‍රෑම් 5 ක් පමණ අස්වනු ලෙස ගත හැකිය. අස්වනු නෙළීම සඳහා උදෑසන හෝ සවස් කාලය යොදා ගත යුතු වේ. නෙලූ අස්වනු සාමාන්‍ය පරිසර තත්ත්වයන් යටතේ දින 4-5 ක් තබා ගත හැකි අතර ශිතකරණයක හෝ වායුසමීකරණ තත්ත්වයන් යටතේ සති 2-3 ක් වුවද කල් තබා ගත හැකිය.



**වෙළඳපලට ඉදිරිපත් කිරීම**

අස්වනු නෙලූ පසු රෝග පළිබෝධ හානි සහිත කරල් ඉවත් කොට ප්‍රමාණය අනුව, වර්ණය හෝ හැඩය අනුව වර්ග කළ හැකිය. විශේෂයෙන්ම සුපිරි වෙළඳසැල් හෝ විදේශ වෙළඳපලට සපයන්නේ නම් ගුණාත්මය පිළිබඳ වැඩි සැළකිල්ලක් දැක්විය යුතු වේ.

## 11.6 පොල් වගාව



සාර්ථක පොල් වගාවක් සඳහා නියමිත ප්‍රදේශයේ පස හා දේශගුණික තත්ත්ව සළකා බලා යෝග්‍ය වර්ගය තෝරා ගැනීමත් උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැළයක් තෝරාගෙන ගෙවතු වගාව ආරම්භ කිරීමත් ඉතා වැදගත් වේ. වැඩි ඵලදාවක් ලබා ගැනීමට නම් නිවැරදි වගා ක්‍රම අනුගමනය කිරීමත් ඉතා වැදගත්ය.

**පොල් වගාව සඳහා අවශ්‍ය පරිසර තත්ත්ව**

බහු වාර්ෂික බෝගයක් වන පොල් ගසේ වර්ධනය හා අස්වැන්න සමග කාළගුණික ලක්ෂණවල වෙනස්වීම හා විවිධ පස් කාණ්ඩයන්හි භෞතික රසායනික හා ජීව විද්‍යාත්මක ලක්ෂණ ඍජුව බැඳී පවතී.

පොල් වගාවේ වර්ධනයට හා අස්වැන්නට බලපානු ලබන තීරණාත්මක සාධකයක් වනුයේ අවශ්‍ය ප්‍රශස්ථ තෙතමනය පසේ පැවතීමයි. එනම් වසර පුරා හොඳින් පැතිරුණු මි.මී. 1500කට වැඩි වර්ෂාපතයක් ඇති ප්‍රදේශ පොල් සඳහා වඩාත් උචිතය. වියළි කාලය මාස 2කට වඩා වැඩි වූ අවස්ථාවල දී අස්වැන්න හා වර්ධනයට අහිතකර ලෙස බලපාන හෙයින් ගෙවතු වගාවේ දී මේ සම්බන්ධව සැළකිල්ල යොමු කර සුදුසු ජල සම්පාදන ක්‍රමයක් භාවිතා කිරීම අවශ්‍ය වේ.

පොල් පැළයේ මුල් ඉතා ඉක්මනින් පොළවේ පැතිරී ස්ථාවර වීම සඳහා පැළය අවට තෙතමනය සහ පෝෂකවලින් පිරුණු සැහැල්ලු පසක් පැවතිය යුතුය. පොල් වගාවට ඉතා සුදුසු වන්නේ ගැඹුරු වැලි සහිත ලෝම් පසය. එසේම හොඳ ජල වහනයක් සහිත හා පසේ ජලය රඳවා ගැනීමේ හැකියාවක් පැවතීම ද හිතකර ලක්ෂණ ලෙස සළකනු ලැබේ. පොල් වගාව සඳහා පසේ පී.එච් අගය 5.5-7.5 අතර පරාසයක් වඩාත් සුදුසු වේ.

**ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු පොල් පැළ**

බිම් පැළ හා බඳුන් පැළ යන ආකාර දෙකකින් ගෙවත්ත සඳහා පොල් පැළ යොදාගත හැකි අතර දැනට පොල් වගා කිරීමේ මණ්ඩලයේ තවාන්වලින් ගුණාත්මයෙන් උසස් ඉහත කී ආකාර දෙකෙන් කැමති ආකාරයේ පැළයක් ලබා ගැනීමේ හැකියාව ඇත.

**1. බිම් පැළ**



බිම් පැළ තවානක්

බීජ පොල් තවාන්කර මාස 7ක් ගත වූ පසු තවානෙන් ලබා ගන්නා පොල් පැළ ගෙවත්තේ සිටුවීම සඳහා යොදා ගැනේ. බිම් පැළ සිටුවීමේ දී පළමුව පැරණි මුල් කපා ඉවත් කර සිටුවීම අවශ්‍ය වේ.

## 2. බඳුන් පැළ



බඳුන් පැළයක්

ක්ෂේත්‍රයේ සිටුවීමට සුදුසු තත්ත්වයට පත්කර බඳුන් ගත කරන ලද පොල් පැළ සිටුවීම තුළින් මුල්වලට හානි සිදුවීම අඩු වීම ද, පැළ මිය යාමේ ගැටලුව අඩුවීම ද දැකිය හැක. තව ද ඉක්මනින් වර්ධනය වීම හා පීදීම ද ඒකාකාරි වර්ධනයක් සහිත පොල් වගාවක් ගෙවත්ත තුළ ලබා ගැනීමට බඳුන් පැළ සිටුවීම උපකාරී වේ. සාපේක්ෂව මෙම පැළ නියගයට ද ඔරොත්තු දීමේ හැකියාවක් පවතී.

එමෙන්ම මිලදී ගනු ලබන පැළ යම් කිසි කාලයක් සිටුවීමට පෙර තබා ගැනීමට සිදුවන්නේ නම් බඳුන් පැළ වඩාත් යෝග්‍ය වේ.

**උසස් ගුණාත්මයෙන් යුතු පොල් පැළයක ලක්ෂණ**

පොල් පැළ මිළ දී ගැනීමේ දී ගෙවත්ත පවතින ප්‍රදේශය සඳහා සුදුසු ප්‍රභේදයක් තෝරා ගැනීම ඉතා වැදගත් වන අතර පහත සඳහන් ලක්ෂණ සහිත පැළයක් තෝරා සිටුවීම තුළින් සාර්ථක අස්වැන්නක් ලබා දෙන පොල් පැළයක් ගෙවත්තට ලබා ගැනීමට හැකි වේ.

- මහත කඳකින් යුක්ත වීම
- තද කොළ පැහැති අතු තිබීම
- කෙටි පිති සහිත වීම
- පත්‍ර 4-5 කින් පමණක් යුක්ත වීම
- තියුණු පත්‍ර දාර සහිත වීම
- උත්තල පත්‍ර සහිත වීම
- රෝග හා පළිබෝධවලින් තොරවීම
- වැඩි මුල් ප්‍රමාණයක් තිබීම

**ක්ෂේත්‍රයේ පැළ සිටුවීම**

සාමාන්‍යයෙන් පැළ සිටුවීම සිදු කළ යුත්තේ වර්ෂා කාලය ආරම්භයත් සමග වුව ද වර්ෂාවකට පසුව යම් වේලාවක් ගත වන තෙක් ජලය රැඳෙන ඉඩමක නම් වර්ෂා කාලය අවසානයත් සමග පැළ සිටුවීම වඩාත් සුදුසුය.

- වැලි ලෝම පසක නම් අඩි 3x3x3 වලක් සකසන්න.
- තද බොරළු පසක් නම් අඩි 4x4x4 වලක් සකසන්න.

**පැළ සිටුවීම සඳහා වල සැකසීම**

- වල කපන විට මතුපිට පොහොර සහිත පස එක් පැත්තකටත්, ඉතිරි පස් අනෙක් පැත්තටත් යොදන්න. වල නැවත පිරවීමේ දී මතුපිට සාරවත් පස පළමුවෙන් යෙදිය යුතු වේ.



සකස් කළ වළක්

- වලේ පතුලට පොල් ලෙලි තට්ටුවක් (කොහු පැත්ත උඩට සිටින සේ) අතුරා තුනී පස් තට්ටුවකින් වසන්න. ඉන්පසු පෙර පරිදිම නැවත දෙවෙනි පොල් ලෙලි තට්ටුවක් අතුරා

තුනී පස් තට්ටුවකින් වසන්න. මේ සඳහා පොල් ලෙලි 30-35ක ප්‍රමාණයක් වලකට අවශ්‍ය වේ.

- මීළඟට වල පිරවීමට ගන්නා පසට මූලික රසායනික පොහොර හා කාබනික පොහොර මිශ්‍ර කර ගන්න. පොල් වලකට කාබනික පොහොර ලෙස ගොම පොහොර/කුකුල් පොහොර/කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 10ක් හෝ එළු පොහොර කිලෝ ග්‍රෑම් 5ක් මිශ්‍ර කර ගන්න. එලෙසම පහත ආකාරයට ඔබගේ ප්‍රදේශයට නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය පස් සමඟ මිශ්‍ර කර ගන්න. පොල් පැළයකට මූලික රසායනික පොහොර යෙදීම අනිවාර්ය කටයුත්තක් වන අතර ඒ සඳහා මිශ්‍ර පොහොර සමඟ ඩොලමයිට් භාවිතා කරන්න.

*අමිශ්‍ර පොහොර භාවිතා කරන්නේ නම් වලකට යෙදිය යුතු පොහොර ග්‍රෑම්වලින්*

| පොහොර වර්ගය | තෙත් හා අතරමැදි කලාපය | වියළි කලාපය |
|---|---|---|
| යූරියා | 250 | 250 |
| එප්පාවල රොක් පොස්පේට් | 750 | 350 |
| මියුරියේට් ඔෆ් පොටෑෂ් | 250 | 250 |
| ඩොලමයිට් | 1000 | 1000 |

*මිශ්‍ර පොහොර භාවිතා කරන්නේ නම් වලකට යෙදිය යුතු පොහොර ග්‍රෑම්වලින්*

| පොහොර වර්ගය | තෙත් හා අතරමැදි කලාපය | වියළි කලාපය |
|---|---|---|
| පොල් පැළ පොහොර | | |
| මිශ්‍රණය/ වයි.පී.එම්.ඩබ්. | 1250 | 850 |
| ඩොලමයිට් | 1000 | 1000 |

- මෙලෙස මිශ්‍ර කරගත් පස් මිශ්‍රණයෙන් පොළොව මට්ටමේ සිට සෙ.මී. 15 ක් (අඟල් 6 ක්) ඉතිරිවන සේ වල පුරවා ගන්න. එහෙත් ජලය රැඳෙන ගෙවත්තක නම් වල සම්පූර්ණයෙන් පුරවා ගන්න.

**පොල් පැළයක් සිටුවීම**

සිටුවීමට යොදා ගන්නේ බිම් පැළයක් නම් පළමුව පැරණි මුල් කපා ඉවත් කර ගත යුතු වේයන් හානියට ප්‍රතිකාර කිරීම සඳහා ඉමිඩැක්ලෝප්‍රිඩ් 20% ක් (ඇඩ්මයර්) කෘමිනාශකය මිලි ලීටර් 1-2 ක් ජලය ලීටර් 1ක් තුළ දියකර සාදාගත් මිශ්‍රණය තුළ විනාඩි 3ක කාලයක් ගෙඩිය සහිත ප්‍රදේශය ගිල්වා තැබිය යුතුය. ඉන්පසු සැකසූ වලේ මැද පස් ඉවත් කර ඉඩ ලබාගෙන පැළය සිටුවා ගන්න.

බඳුන් කළ පොල් පැළ භාවිතා කරන්නේ නම් පළමුව බඳුනේ පතුල කපා ඉවත් කර ගන්න. පසුව පතුල රහිත බඳුන් පැළය සකස් කළ වලෙහි මැදින් තරමක් පස් ඉවත් කර ඉඩ ලබා ගෙන තැන්පත් කර පැළයේ මුල් වලට හා බඳුන් මිශ්‍රණයට හානි නොවන සේ බඳුන ප්‍රවේශමෙන් ඉවත් කර ගන්න. වේයන්ගේ හානිය සඳහා ප්‍රතිකාර කිරීමට ඉහත ආකාරයට සකසා ගත් ද්‍රාවණය මුල කලාපය හොඳින් තෙමෙන ලෙස යොදන්න.

**තෙතමන සංරක්ෂණය**

පොල් අතු, පොල් ලෙලි, පිදුරු, කොළ අතු වැනි දිරා යන ද්‍රව්‍යකින් සිටුවන ලද පැළය වටා වසුන් නඩත්තු කිරීම අවශ්‍ය වේ.

මෙලෙස තෙතමන සංරක්ෂණය කිරීම තුළින් පොල් පැළ අකාලයේ මිය යාම වළක්වා ගතහැකි වන අතර, හොඳින් වර්ධනය වූ පොල් ගසක් ලබා ගැනීම තහවුරු කරයි.



වසුන් යෙදීම

### පොහොර යෙදීම

වගා කාලය තුළ දී කාබනික පොහොර ලෙස සත්ත්ව පොහොර හා කොළ පොහොර වර්ග ද ප්‍රදේශය අනුව නිර්දේශිත රසායනික පොහොර වර්ග ද භාවිතා කිරීම තුළින් උසස් අස්වැන්නක් ලබා ගැනීමට හැකි වේ. පොල් පැළ සඳහා මාස 6 කට වරක් පැළයේ වයස අනුව යෙදියයුතු පොහොර ප්‍රමාණය පොල් පැළය වටා කවයක් සේ විසුරුවා හැර උදැල්ලකින් හෝ මුල්ලුවකින් පසට හොඳින් මිශ්‍ර වන ලෙස යොදන්න. පසුව පොහොර කවය වසුනක් යොදා ආවරණය කරන්න.

*පොල් පැළයක පොහොර කවයේ අරය පැළයේ වයස සමඟ වැඩිවන ආකාරය*

| පැළයේ වයස | පොහොර කවයේ අරය |
|---|---|
| මාස 06 | සෙ.මී. 30 (අඩි 01) |
| වසර 01 | සෙ.මී. 60 (අඩි 02) |
| වසර 02 | සෙ.මී. 90 (අඩි 03) |
| වසර 03 | සෙ.මී. 120 (අඩි 04) |
| වසර 04 සිට ඵල දරණ තෙක් | සෙ.මී. 150 (අඩි 05) |

*පොල් පැළයේ වයස අනුව යෙදිය යුතු මිශ්‍ර පොහොර ප්‍රමාණය ග්‍රෑම් වලින්*

| | | පැළයේ වයස | | | | |
|---|---|---|---|---|---|---|
| | පොහොර වර්ගය | මාස 06 | වසර 1 - 1 1/2 | වසර 2 - 2 1/2 | වසර 3 - 3 1/2 | වසර 4 සිට ඵල දරණ තෙක් |
| තෙත් හා අතරමැදි කලාපය | පැළ පොල් පොහොර මිශ්‍රණය/ වයි.පී.එම් ඩබ් | 800 | 1000 | 1300 | 1600 | 2000 |
| | ඩොලමයිට් | 500 | 500 | 500 | 500 | 500 |
| වියළි කලාපය | පැළ පොල් පොහොර මිශ්‍රණය/ වයි.පී.එම් ඩබ් | 540 | 670 | 910 | 1110 | 1340 |
| | ඩොලමයිට් | 500 | 500 | 500 | 500 | 500 |

### ජල සම්පාදනය

පොල් වගාවේ අස්වැන්න ප්‍රධානවම වර්ෂාව මත පදනම් වන බැවින් වර්ෂාපතනය නොමැති වියළි කාලයේ දී අවශ්‍ය පරිදි ජලය යෙදීම අත්‍යවශ්‍ය කටයුත්තකි. එමෙන්ම පස් හා ජල සංරක්ෂණය සඳහා පවතින උපාය මාර්ග අනුගමනය කිරීම මඟින් ද සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිය.

### පළිබෝධ පාලනය

පහත සඳහන් කෘමි උවදුරු පිළිබඳව සැළකිලිමත් විය යුතුයි.

*කළු කුරුමිණියා මර්දනය*

- වගාවේ පවිත්‍රතාවය
- දියතාර ආලේපය
- කපුරු බෝල භාවිතය
- පෙරමෝන උගුල භාවිතය

*ප්ලෙසිස්පා මර්දනය*

- කෘමි නාශක භාවිතය(කාබොසල්ෆාන් 20 SC)



## 11.7 පොකුණු තුළ මසුන් වගාව

මත්ස්‍ය පරිභෝජනය වැඩිවීමත් සමග මිරිදිය මසුන් සඳහා හොඳ ඉල්ලුමක් පවතී. එම ඉල්ලුමට අවශ්‍ය මත්ස්‍යන් නිෂ්පාදනය කර ගැනීම සඳහා පොකුණු තුළ මත්ස්‍ය වගාව හඳුන්වා දිය හැකිය. මේ යටතේ තිලාපියා වර්ගයේ පිරිමි සතුන් පමණක් වගා කිරීම තුළින් හොඳ ආදායම් තත්වයක් ලගා කර ගත හැකිය.

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් පාලනය කරනු ලබන ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන මගින් හෝ ඇඟිල්ලන් නිෂ්පාදනය කරන පුද්ගලික වගාකරුවන්ගෙන් අවශ්‍ය මත්ස්‍ය ඇඟිල්ලන් ලබා ගත හැකිය. එම ඇඟිල්ලන් යොදා ගනිමින් මාස 6 - 8 ත් අතර කාලයක් වර්ධනය කර අස්වැන්න ලබා ගත හැකිය.

**පොකුණක් සැකසීම සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීම**

- පහසුවෙන් හා අඩු වියදමින් ජලය ලබා ගතහැකි ස්ථානයක් විය යුතුය.
- අවම ලෙස මාස 6-8 පමණ කාලසීමාවක් ජලය රඳවා තබාගත හැකි මැටි පසක් සහිත ආම්ලික නොවන භූමියක් විය යුතුය.
- ගංවතුරට හසු නොවන, කෘෂි රසායනික හා වෙනත් විෂ අපද්‍රව්‍ය නොමැති ස්ථානයක් විය යුතුය.

**පොකුණු සකස් කිරීම**

- බැම් සේදී යැම වැළැක්වීමට එහි මුදුනේ හා දෙපැත්තේ තණකොළ පිඩලි ඇල්ලීමට හෝ ගොටු කොළ, මුකුණුවැන්න වැනි වගාවක් යෙදීම සුදුසු වේ.
- පොකුණට හොඳින් හිරු එළිය ලැබිය යුතුය.
- පොකුණට ජලය ලබා ගැනීමට හා ජලය

සම්පූර්ණයෙන් ඉවත් කිරීමටත් වැඩිපුර ජලය පිට කිරීමටත් බට යෙදිය යුතුය.

- පොකුණේ සිටින මසුන් පිටවීමට හෝ පිටතින් පොකුණට කොළ රොඩු, අනවශ්‍ය මසුන් පැමිණීම වැළැක්වීමට බටවල විවෘත කෙළවර දැල්වලින් ආවරණය කළ යුතුය.



සකස් කළ පොකුණක්

**භාවිත කළ පොකුණක් නැවත වගාව සඳහා සකස් කිරීම**

- පොකුණ තුළ ජලය ඉවත් කිරීම.
- පොකුණ හොඳින් වියළීම.
- ජලජ පැළෑටි හා අපද්‍රව්‍යය ඉවත් කිරීම.
- අනවශ්‍ය මසුන් වර්ග සිටී නම් එය ඉවත් කිරීම
- පොකුණේ විෂබීජහරණය සඳහා විරංජන කුඩු (ක්ලෝරීන්) වර්ග මීටරයකට ග්‍රෑම් 25 - ග්‍රෑම් 30 ක් යෙදිය හැකිය. නැතහොත් අළුහුණු යොදන්නේ නම් වර්ග මීටරයකට ග්‍රෑම් 50 - ග්‍රෑම් 60 පමණ යෙදිය හැකිය.

**ජලය පිරවීම**

- පළමුව මීටර් ½ ක් පමණ ජලය පුරවන්න.
- පොකුණ පොහොර කර දින 03 කට පමණ පසුව ජල ප්‍රමාණය මීටරය දක්වා වැඩි කරන්න.

**පොකුණට පොහොර යෙදීම**

- පොහොර කිරීමේ මූලික අරමුණ මසුන් ආහාරයට ගන්නා ස්වභාවික ආහාර (ප්ලවාංග) පොකුණේ වර්ධනය කිරීමයි.
- පොහොර වර්ග ලෙස ගොම, ඌරු, එළු, කුකුළු වැනි කාබනික පොහොර, යූරියා සුපර් පොස්පේට් වැනි අකාබනික පොහොර සහ ඇල්බීසියා හා වැටමාර වැනි කොළ වර්ගත් භාවිත කළ හැකිය.
- මූලික පොහොර ලෙස මීටරයකට ග්‍රෑම් 250 ක් ගොම පොහොර හෝ කුකුළු පොහොර ග්‍රෑම් 100 හා යූරියා ග්‍රෑම් 3 ක් පමණ හා ටී.එස්.පී ග්‍රෑම් 1 ක් පමණ යෙදිය හැකිය.
- පොහොර යොදා දින 3-7 අතර ජලය කොළ පාට වේ. එනම් ශාක ප්ලවාංග වැඩී ඇති බව පෙන්නුම් කරයි. මෙම පොහොර යෙදීම ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරී මහතාගේ උපදෙස් අනුව කරන්න.

**මසුන් තැන්පත් කිරීම**

වර්ග මීටරයට මත්ස්‍ය ඇඟිල්ලන් 5-7 අතර තැන්පත් කළ හැකිය. (ඇඟිල්ලෙක් සෙ.මී. 5 – සෙ.මී. 7 වේ,

**මසුන්ට ආහාර ලබා දීම**

- පොකුණේ නිෂ්පාදනය වී ඇති ස්වාභාවික ආහාරවලට අමතරව සාදා ගන්නා ලද ආහාර දිනකට දෙවරක් දේහ බරින් 3% ක් - 5% ක් ලෙස ලබා දීම.
- මේ සඳහා ලාභදායී ආහාර භාවිත කළ යුතුය. එනම් සහල් නිවුඩු, පොල් පුන්නක්කු, හාල්මැස්සන් කුඩු/කරවල කුඩු අමතර ආහාර සකසා ගැනීමට අමුද්‍රව්‍යය ලෙස භාවිතා කළ හැකිය.

**අස්වැන්න ලබා ගැනීම**

මාස 4 ½ - 6 කට පසු හෝ ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන්ගේ උපදෙස් අනුව අස්වැන්න නෙළාගත හැකිය.

**වියදම් සාරාංශය**

*වර්ග මීටර් 500 ක පොකුණක් සඳහා*

- පොකුණ සකස් කිරීම - රු. 50,000.00
- මත්ස්‍ය පැටවුන් 2500 ක් සඳහා - රු. 7,500.00
- මත්ස්‍ය ආහාර සඳහා - රු. 80,000.00
- වෙනත් වියදම් - රු.12,500.00
- මුළු වියදම - රු.150,000.00

**ආදායම්**

මසුන් 2000 ක් එක් මත්ස්‍යයෙක් ග්‍රෑම් 400 බැගින් වර්ධනය වන්නේ නම් කි.ග්‍රෑ. රු.300.00 ට අලෙවි කළහොත් මුළු ආදායම රු. 240,000.00 ලබා ගත හැක. එක් වගා කන්නයකදී ලාභය රු. 90,000.00 කි.

**ක්‍රියාත්මක කිරීම**

දිවයින පුරා ක්‍රියාත්මක කළ හැක.

## 11.8 වතු ආශ්‍රිත පොකුණු/ වතු ජලාශ වල ජලජීවී වගාව

**වතුකරයේ ජලාශ තුළ මිරිදිය මත්ස්‍ය වගාව**

වතුකර ප්‍රදේශවල වතු ආශ්‍රිතව ජලාශ විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර මේවායේ ජලජීවී වගාව ආරම්භ කිරීම සඳහා ඉතා හොඳ විභවයක් පවතී.

වතු ආශ්‍රිතව ඉතා අඩු මත්ස්‍ය පරිභෝජන රටාවක් දක්වන අතර ඊට ප්‍රධානතම සාධකය වී ඇත්තේ මත්ස්‍ය මිල අධිකවීම හා ප්‍රාදේශීයව අඩු මත්ස්‍ය නිෂ්පාදන තත්ත්වයක් පැවතීමයි.

එබැවින් වතුකරයේ ජලාශ තුළ ජලජීවී වගාව ව්‍යාප්ත කිරීමෙන් ප්‍රදේශයට අවශ්‍ය මත්ස්‍ය නිෂ්පාදන ලබාගත හැකි අතර මෙයින් ඔවුන්ගේ ආර්ථික මෙන්ම පෝෂණ තත්ත්වය ද ඉහළ නැංවිය හැකිය.



වතුකරයේ ජලාශයක්

**ව්‍යාපෘති ආරම්භයට අවශ්‍ය දේ**

වතුකරයේ දැනටමත් පිහිටි ජලාශ මේ සඳහා යොදවා ගත හැකි බැවින් ජලාශ සැකසීම සඳහා අමතර වියදමක් දැරීමට අවශ්‍ය නැත.

ජලාශයේ තිබෙන ස්වභාවික ආහාර වර්ග (ඇල්ගී) මසුන් ප්‍රයෝජනයට ගන්නා අතර අවශ්‍යතාවය අනුව පිටතින් ආහාර ලබාදිය හැකිය.

ජලජීවී වගාවට මූලික යෙදවුම මත්ස්‍ය ඇඟිල්ලන් තැන්පත් කිරීම වේ. ජලාශයක හෙක්ටයාර් එකකට අවම ලෙස මත්ස්‍ය ඇඟිල්ලන් 3000 ක් තැන්පත් කළ හැකිය. ජලාශයේ විශාලත්වය අනුව කීපදෙනෙකු එකතු වී මෙවැනි ක්‍රියාකාරකමක යෙදිය හැකිවනු ඇත.

**කාල චකවානුව**

වසරේ ඕනෑම කාලයකදී ඔබේ වතු ජලාශයේ ජලජීවී වගාව ආරම්භ කළ හැකිය.

**ඔබට ලබාගත හැකි ප්‍රතිලාභ**

හෙක්ටයාර් එකක ජලාශයක මත්ස්‍ය ඇඟිලිලන් 3000 ක් තැන්පත් කළහොත් අවම ලෙස මසුන් කි.ග්‍රෑ. 700 ක මත්ස්‍ය අස්වැන්නක් ලබාගත හැකි වේ. දැනට මසුන් අලෙවි වන මිල කිලෝවක් රු. 200,00 ලෙස සැළකුවිට එයින් රු. 140,000.00 ක් පමණ ආදායමක් එක් වගා කන්නයකදී ලබා ගත හැකිය.

විශේෂයෙන් වතු ජලාශවල ජලයේ පවතින උෂ්ණත්වය හා ස්වාභාවික ආහාර සුලභතාවය අනුව යෙදිය හැකි මත්ස්‍ය විශේෂ තීරණය කරනු ලැබේ.

**තාක්ෂණික සේවාවන්**

අවශ්‍ය තාක්ෂණික උපදෙස් ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ ජලජීවී වගා ව්‍යාප්ති නිළධාරීන්ගෙන් ලබා ගත හැකිය.

## 11.9 කාලීන ජලාශ වල මත්ස්‍ය වගාව

කාලීන ජලාශයක් යනුවෙන් අදහස් කරනුයේ මෝසම් වැස්සෙන් ජලය පිරෙන, වසරක දී අඩු තරමින් මාස හත අටක්වත් ජලය පිරී තිබෙන, වියළි කාලයේ දී සම්පූර්ණයෙන්ම සිඳී යන හෝ ඉතාම අඩු ජල ප්‍රමාණයක් ඉතිරිවන ජලාශයකි. ජලාශයක් පිරුණු පසු මත්ස්‍ය ඇඟිලිලන් තැන්පත් කර මාස 7-8 කට පසු වැඩෙන්නට හැර කළමනාකරණය කර අස්වැන්න නෙළීම තුළින් ආදායම ලබා ගත හැකිය. හෙක්ටයාර් 5 ක කාලීන ජලාශයකින් රුපියල් ලක්ෂ 4 ක පමණ ආදායමක් ලබාගත හැකිය.

**කාලීන ජලාශ තෝරා ගැනීම සහ මසුන් තැන්පත් කිරීම**

මත්ස්‍ය වගාවට සුදුසු ජලාශ තෝරා ගැනීමේ දී සැළකිල්ලට ගත යුතු කරුණු කිහිපයකි. එනම්,

- ජලාශයේ ජලය පිරී පවතින කාලය (මාස 7-8 ක් වත් තිබිය යුතුය).
- ජලාශයේ විශාලත්වය (හෙක්ටයාර් 4 කට වඩා විශාල නම් වඩාත් සුදුසුය)
- ජලජ පැළෑටි (ඕළු, නෙළුම්, සැල්වීනියා, ජපන්ජබර ආදිය) පැතිරී තිබෙන ප්‍රමාණය 30% කට වඩා අඩු නම් වඩාත් සුදුසුය.
- වැව ඇතුළෙහි තිබෙන ගස්, ගල්, කොටන් ආදී බාධක අස්වැන්න නෙළීමේදී බාධාවක් නොවිය යුතුය.
- සුදුසු මත්ස්‍ය පැටවුන් (ඇඟිලිලන්) තැන්පත් කර වැඩෙන්නට හැර මාස හත අටකට පසුව වැඩුණු මසුන් අල්ලා ගත හැකිය.



*මත්ස්‍ය පැටවුන් ජලාශයට මුදා හැරීම*

**ක්‍රියාත්මක කිරීම**

මෙම වැඩසටහන ගොවි සංවිධානවල සාමාජිකයන්ගේ සම්පූර්ණ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කළ හැකිය. මේ සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේනතුව හා ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව

ක්‍රියාත්මක කරනු ලැබේ. ජලාශයට අදාළ ගොවි සංවිධානයේ ජනතාව දැනුවත් කර මේ සඳහා කැමැත්තක් දක්වන පිරිස තුළින් අදාළ වගා කණ්ඩායම තෝරා ගත යුතුය. ජලාශයේ වපසරිය අනුව වගාකරුවන් සංඛ්‍යාව තීරණය කළ හැකිය.



මත්ස්‍ය අස්වැන්න

**මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම**

ජලාශයේ ජල මට්ටම අනුව මසුන් විශේෂ කිහිපයක් එනම් බහු වගාවක් කළ හැක.

| | | |
|---|---|---|
| උඩ ස්ථරය | 30 - 35% | කැට්ලා, හිස ලොකු කාපයා, රිදී කාපයා |
| මැද ස්ථරය | 20 - 25% | රෝහු |
| පතුල ස්ථරය | 25 - 30% | සාමාන්‍ය කාපයා මිරිගාල් |
| සියලු ස්ථර | 10% | තිලාපියා |

මීට අමතරව මිරිදිය අඩු ඉස්සන් 20 – 25% යොදා ගත හැක. තැන්පත් කරන මත්ස්‍ය ඝණත්වය හෙක්ටයාර් 1 ට මත්ස්‍ය ඇඟිල්ලන් 2500 කි. (ඇඟිල්ලෙක් සෙ.මී. 5 – 7)

**අස්වැන්න නෙළීම**

මාස 7-8 ක් ගත වු පසු මසුන්ගේ වර්ධනය සහ ජලාශයේ ජලය රඳාපැවැත්ම මත මත්ස්‍ය අස්වැන්න නෙළීම සිදුකළ හැකිය. අස්වැන්න නෙළීම එකවර හෝ කොටස් වශයෙන් සිදුකළ හැකිය.

**වියදම් සාරාංශය**

හෙක්ටයාර් 10 ක කාලීන ජලාශයක් සඳහා

හෙක්ටයාර් 01 කට පැටවුන් 2500 බැගින් මත්ස්‍ය පැටවුන් 25,000 තැන්පත් කිරීමේ දී

- මත්ස්‍ය පැටවුන් සඳහා - රු. 62,500.00
- ප්‍රවාහන වියදම් - රු. 25,000.00
- වෙනත් වියදම් - රු. 12,500.00
- මුළු වියදම - රු. 100,000.00

**ආදායම**

තැන්පත් කළ මත්ස්‍ය පැටවුන්ගෙන් 50% ක් ඉතිරි වී, එක් මත්ස්‍යයෙක් අවම ලෙස ග්‍රෑම් 500 බැගින් වර්ධනය වේ යැයි ද අලෙවි මිල රු. 150.00 ලෙස උපකල්පනය කළ විට, අවම වශයෙන් රු. 937,500.00 ක ආදායමක් ලබා ගත හැක.

(කි. ග්‍රෑ. 6250 × රු .150.00 = රු. 937,500.00)

**ක්‍රියාත්මක කළ හැකි ප්‍රදේශ**

කුරුණෑගල, අනුරාධපුර, පුත්තලම, හම්බන්තොට, අම්පාර, මොණරාගල, මාතලේ, බදුල්ල, මඩකලපුව, පොළොන්නරුව, වව්නියාව, කිලිනොච්චිය, මුලතිව්, ත්‍රිකුණාමලය

## 11.10 විසිතුරු මත්ස්‍ය වගාව



**විසිතුරු මත්ස්‍ය වගාව ඔබට යෝග්‍ය වන්නේ කෙසේද ?**

- රැකියා විරහිත තරුණ තරුණියන්ට ස්වයං රැකියාවක් ලෙස
- රැකියාවල නිරත ස්ත්‍රී පුරුෂ සැමට අමතර ආදායම් මාර්ගයක් ලෙස
- ඒකාකාරී දිවියක් ගෙවන ගෘහණියන්ට
- විශ්‍රාම සුවෙන් සිටින වැඩිහිටි සැමට නිවසේ සිට කළ හැකි වෘත්තියක් ලෙස
- නව මං සොයන ව්‍යාපාරිකයන්ට මහා පරිමාණ නිෂ්පාදනයට මෙන්ම අපනයන කර්මාන්තයක් ලෙස

**විසිතුරු මත්ස්‍ය වගාව සඳහා ලබාදෙනු ලබන මූල්‍ය සහන**

කුඩා පරිමාණ විසිතුරු මත්ස්‍ය වගා - එක් ප්‍රතිලාභියෙකු සඳහා අවම වශයෙන් රු. 100,000.00 ක මූල්‍ය අවශ්‍යතාවය ලබා දේ.

**විසිතුරු මත්ස්‍ය වගාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික සාධක**

- සුදුසු බිමක්
- ජලයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක තත්ත්වය
- ආලෝකය (හිරු එළිය)
- ඔක්සිජන්

මසුන් වගා කිරීම සඳහා සිමෙන්ති ටැංකි, මඩ පොකුණු හෝ වීදුරු ටැංකි භාවිතා කළ හැකිය. මත්ස්‍ය වර්ගය අනුව වෙනස් වේ.



*මසුන් වගාකළ සිමෙන්ති ටැංකි*

**විසිතුරු මත්ස්‍ය වගාව ආරම්භ කිරීමේදී සැළකිය යුතු කරුණු**

- නිවැරදි තාක්ෂණික දැනුම ලබා ගැනීම.
- ප්‍රදේශයට වඩාත් යෝග්‍ය සහ ඉල්ලුමක් ඇති මත්ස්‍ය විශේෂ වගාව සඳහා තෝරා ගැනීම.
- ඔබගේ භූමියට ගැළපෙන මත්ස්‍ය විශේෂ අනුව සියලුම සැලසුම් සකස් කිරීම.

**විසිතුරු මත්ස්‍ය වගාව ආශ්‍රිතව පවතින ව්‍යාපාර අවස්ථා**

නව විසිතුරු මත්ස්‍ය ගොවිපළ ආරම්භ කිරීම

**ඔබට ලැබෙන ප්‍රතිලාභ**

- මසුන් අභිජනන ගොවිපලකින් මත්ස්‍ය පැටවුන් ලබාගෙන වර්ධනය කර වෙළඳපලට නිකුත් කළ හැක.
- වැය වන කාලය ආසන්න වශයෙන් මාස 2 ½.
- පර්චස් 2.5 ප්‍රමාණයේ ආවරණ දැල් සහිතව සිමෙන්ති ටැංකි පද්ධතියක් සෑදීමට ආසන්නව රු. 100,000.00 ක පමණ මුදලක් වැය වේ.
- නඩත්තුව සඳහා මාස 2 ක කාලයක් සඳහා රු. 15,000.00 ක පමණ මුදලක් වැය වේ.
- මෙම ටැංකි ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් මසුන් 4000 ක් පමණ ලබා ගත හැකි අතර රු. 50,000.00 ක ආදායමක් උපයා ගත

හැකිය. මාස 2 ක වගා කාලයක් තුළ ලබාගත හැකි ලාභය රු. 35,000.00 (ලැබෙන ආදායම මත්ස්‍ය වර්ගය හා වෙළඳපොළ අවශ්‍යතාවය අනුව වෙනස් වේ).

## 11.11 විසිතුරු මත්ස්‍ය වගා ගොවිපළ වැඩිදියුණු කිරීම



**පවත්නා විසිතුරු මත්ස්‍ය වගා ගොවිපල් වැඩිදියුණු කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය**

- විසිතුරු මත්ස්‍ය වගා ගොවිපල වැඩිදියුණු කිරීමට - එක් ප්‍රතිලාභියෙකු සඳහා රු. 250,000.00
- මෙම මූල්‍ය සහය ලබා ගැනීම සඳහා ඔබගේ අවශ්‍යතාවය අනුව ව්‍යාපෘති වාර්ථාවක් ඉදිරිපත් කළ යුතුය.

**දැනට පවතින ව්‍යාපෘති සංවර්ධනය කළ යුත්තේ කෙසේද ?**

- දැනට පවතින ටැංකි පද්ධතිය හා මඩපොකුණු පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා.
- දැනට පවතින ටැංකි පද්ධතියට නව ටැංකි පද්ධතියක්, මඩපොකුණු ඉදිකිරීම සඳහා.
- දැනට පවතින විසිතුරු මත්ස්‍ය අලෙවි සැල වැඩිදියුණු කිරීම සඳහා.



මත්ස්‍ය අලෙවිසැලක්

**ඔබට ලැබෙන ප්‍රතිලාභ**

විසිතුරු මත්ස්‍ය වගා පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් වැඩි ගුණාත්මක විසිතුරු මත්ස්‍යයින් ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම තුළින් ව්‍යාපෘතියෙන් ලාබෙන ආදායම වැඩි කළ හැකිය.

**සම්බන්ධීකරණය හා ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය

අංක 41/1, නව පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

දුරකථන අංක : 011-2786495/011-2786577

ෆැක්ස් අංකය : 011-2786493

වෙබ් අඩවිය : www.naqda.gov.lk

අධ්‍යක්ෂ ජනරාල් - 0112786498

අධ්‍යක්ෂ (ව්‍යාප්ති) - 0112786579

අධ්‍යක්ෂ (වෙරළබඩ)- 0112786578

විසිතුරු මත්ස්‍ය ජලජ පැළෑටි හා උපාංග හුවමාරු හා තොරතුරු මධ්‍යස්ථානය - 011 2177032/2786495



## 11.12 ගෘහාශ්‍රිත කුකුළු පාලනය

ගෘහාශ්‍රිත ක්‍රමයට කුකුළන් ඇති කිරීම නිවෙස් වලට සුළු පරිමාණයෙන් කළ හැකි ලාභදායි ව්‍යාපාරයකි. ගොවිපළ ක්‍රමයට කුකුළන් ඇති කිරීමේදී මෙන් මිල අධික ආහාර හා අනෙකුත් යෙදවුම් ගෘහස්ථ ක්‍රමයෙන් කුකුළන් ඇති කිරීම සඳහා අවශ්‍ය නොවේ.

මෙම ව්‍යාපෘතිය යටතේ මසක් වයසැති කිකිළි පැටවුන් ලබා දෙනු ලැබේ. වැඩි මරණ අනුපාතයක් සහිත මාසයක කාලය මෙම සතුන් පසු කර තිබීම හා වැඩි බිත්තර ප්‍රතිශතයක් ලබා දෙන කිකිළි පැටවුන් ලබා දීම ප්‍රතිලාභියාට වාසි සහගත වේ.

### ගෘහාශ්‍රිත කුකුළන් ඇති කිරීමේ වාසි

- ගම් කුකුළු බිත්තර හා කුකුළු මස් සඳහා වැඩි ඉල්ලුමක් හා වැඩි මිලක් ලබාගත හැකිය.
- ආරම්භක වියදම අඩුවන අතර, යෙදවුම් සඳහා අඩු මුදලක් අවශ්‍ය වේ. එමෙන්ම අමතර ශ්‍රමයක් ද අවශ්‍ය නොවේ.
- සත්ත්ව ප්‍රෝටීන ලබාදෙන හෙයින් පවුලේ පෝෂණ අවශ්‍යතා සපුරයි.



කුකුල් පාලනයෙන් අමතර ආදායමක්

- බිත්තර හා අතිරේක කුකුළන් විකිණීමෙන් ගෘහණියට අමතර ආදායමක් උපයා ගත හැකි වේ.
- මුළුතැන්ගෙයින් ඉවතලන සහ අවට පරිසරයේ පවතින දෑ ආහාර ලෙස ගැනීම නිසා වැය කළ යුතු වියදම අඩුය.

- දේශීය තත්ත්වයට ඔරොත්තු දෙන ගම් කුකුළු පැටවුන් බෝ කර විකිණීමෙන් අමතර ආදායමක් ලබාගත හැකිය.
- අද පවතින සත්ත්ව ප්‍රෝටීන ප්‍රභව අතුරින් පහසුවෙන්ම සපයාගත හැක්කේ බිත්තරය.
- කුකුළු පොහොර ගෙවතු වගාවට සෘජුවම එක් කළ හැකි අතර කොම්පෝස්ට් පොහොර සෑදීම සඳහා ද භාවිතා කළ හැකිවීම තවත් වාසියකි.

**යෙදවුම් / අවශ්‍යතා / අමුද්‍රව්‍ය**

- දිනක් හෝ මසක් වයසැති කිකිළි සහ කුකුළු පැටවුන්
- කුකුළු කොටුවක් (ගෙවතු වගාවේදී සරල ආකාරයට සකස්කළ හැකි විවිධ කුකුල් කොටුවර්ග ඇති අතර, අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයක් කළ හැක.)
- ගෘහාශ්‍රිතව කුකුල් කොටුවක් ආරම්භ කිරීම සඳහා අවශ්‍යවන වියදම ප්‍රධාන වශයෙන් රඳා පවතිනුයේ එම කුකුල් කොටුව කුමන අරමුණ සඳහා යොදවා ගන්නේ ද යන්න අනුවය.
- පවුලේ පෝෂණ අවශ්‍යතා සපුරා ගැනීම සඳහා කුකුල් කොටුවක් පිහිටුවන්නේ නම් ආසන්න වශයෙන් රු. 3,000 ක් පමණ මූලික වියදමක් අවශ්‍ය වේ
- ගම් කුකුළු පැටව් බෝ කර විකිණීම සඳහා අරමුණු කරගත් කුකුල් කොටුවක් සඳහා නම් රු. 10,000 ක මුදලක් ප්‍රමාණවත් වේ (කිකිළියන් 10 ක් හා කුකුළන් දෙදෙනෙකුගෙ න් යුත් රැළකට)
- නමුත් ව්‍යාපාරයක් ලෙස ගෙවත්තේ කුකුල් කොටුවක් පවත්වාගෙන යාමට අදහස් කරන්නේ නම් අවම වශයෙන් කිකිළියන් 50 ක් වත් ඇති කළ යුතුය.

**කුකුළු පාලනය ආරම්භ කළ යුතු කාලය**

වසරේ ඕනෑම කලකදී ඇරඹිය හැකිය.

**ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාලයෙන් ලැබෙන සේවාවන්**

- ප්‍රදේශයේ පශු වෛද්‍ය කාර්යාලයෙන් පහත සඳහන් සේවාවන් ලබාගත හැකි අතර, එමගින් ගෙවත්තෙහි සාර්ථක කුකුල් කොටුවක් පවත්වා ගත හැක. ලබාගත හැකි සේවාවන් වනුයේ,
  - දිනක්/මසක් වයසැති පැටවුන් ලබාගැනීම
  - සතුන් ඇති දැඩි කිරීමට උපදෙස් ලබාදීම
  - රෝග සඳහා ප්‍රතිකාර ඇතුළු තාක්ෂණික උපදෙස් ලබා ගත හැකි වීම.

**කුකුළු නිවාසය ඉදි කිරීම**

ඉඩ ප්‍රමාණය - එක් සතකුට වර්ග අඩි 2 සිට 2.5 ක් දක්වා අවශ්‍ය වේ. ඒ අනුව කිකිළි පැටවුන් 10 ක් සඳහා ද අඩි 6 ක් හා පළල අඩි 4 ක් වන කූඩුවක් ප්‍රමාණවත් වේ.



කූඩා කුකුල් කොටුවක්



ගෙවත්තට ගැළපෙන තවත් කුකුල් කොටුවක්

## වැඩෙන කිකිළියන් පාලනය

### ආහාර සැපයීම

ප්‍රශස්ත බිත්තර නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා කඩෙන් මිලදී ගත් කුකුළු ආහාර සැපයීම යෝග්‍ය වේ.

- දින 01 සිට සති 08 ක් දක්වා - පැටවි ආහාර
- සති 08 සිට සති 16 දක්වා - වැඩෙන ආහාර
- සති 16 න් පසු - බිත්තර දමන සතුන් සඳහා ආහාර

### ආහාර ලබාදෙන ආකාරය

| වයස (සති) | ශරීර බර (අවම) | එක් සතකුට ආහාර අවශ්‍යතාව දිනකට (ග්‍රෑම්) | පණු හරනය සහ එන්නත් ලබාදීම |
|---|---|---|---|
| 04 | 285 | 32 | - |
| 05 | 380 | 37 | - |
| 06 | 470 | 42 | කුකුල් වසූරිය |
| 07 | 560 | 46 | - |
| 08 | 650 | 50 | පණු හරනය |
| 09 | 740 | 54 | - |
| 10 | 830 | 58 | - |
| 11 | 920 | 61 | - |
| 12 | 1010 | 64 | රැනිකට් 2 |
| 13 | 1095 | 67 | - |
| 14 | 2180 | 70 | කුකුල් වසූරිය 2 |
| 15 | 1265 | 73 | - |
| 16 | 1350 | 76 | පණු හරනය |
| 17 | 1430 | 80 | - |
| 18 | 1500 | 87 | - |
| 19 | 1600 | 97 | - |
| 20 | 1650 | 103 | - |

### ආහාර වෙනස් කිරීම සිදු කරන ආකාරය

ආහාරය වෙනස් කිරීමේ දී එක වරම වෙනස් නොකරන අතර ක්‍රම ක්‍රමයෙන් පහත දැක්වෙන අනුපාතයන්ගෙන් දැනට ලබා දෙන ආහාරය හා අළුතින් එකතු කරනු ලබන ආහාරය මිශ්‍රකර ලබා දීම සිදු කළ යුතුය.

| දින | දැනට දෙන ආහාර | අලුතින් එකතු කරන ආහාර |
|---|---|---|
| 2 | 03 | 01 |
| 2 | 02 | 02 |
| 2 | 01 | 03 |
| 2 | - | 04 |

### පණුහරණය

සති 7 දි පටන්ගෙන සති 6-8 කට වරක් පණු බෙහෙත් ලබා දිය යුතු වේ.

### සතුන්ගේ රෝගී බව හඳුනා ගැනීම

1. ක්‍රියාශීලි බව අඩු වීම
2. මලපහ වල ස්වාභාවය වෙනස් වීම
3. හුස්ම ගැනීමේ ශබ්දයේ වෙනස්කම්
4. හැසිරීමේ වෙනස්කම්
5. ආහාර ඉතිරි වීම

ඉහතින් දක්වා ඇති රෝග ලක්ෂණ දුටුවහොත් වහාම පශු වෛද්‍ය කාර්යාලයට පැමිණ උපදෙස් හා ප්‍රතිකාර ලබා ගැනීම කළ යුතුවේ.

## 11.13 ගෘහස්ථ ජීව වායු ජනක

ගෙදරදොරට අවශ්‍ය ඉන්ධන දැව සපයන එක් ප්‍රභවයක් ලෙසින් ගෙවත්ත හැඳින්විය හැක. මෙයට අමතරව ගෙවත්ත තුළ ජීව වායු ජනක ඒකකයක් ස්ථාපිත කිරීම මඟින් ආහාර පිසීම වැනි කාර්යයන් සඳහා ඉන්ධනයක් ලෙස ජීව වායුව යොදවා ගැනීමට හැකියාවක් ලැබේ.

තවද ජීව වායු ජනකය මඟින් මීට අමතරව පොහොර ලබාදීමේ කාර්යයක් ද ඉටු කරන අතර ඒවා ගෙවතු වගාව සඳහා භාවිතා කළ හැකිවීම විශේෂ වාසියකි.

මෙහිදී විවිධාකාර වූ ජීව වායු ජනක ඒකකයන් පවතින අතර එයින් ගෙවතුවල ස්ථාපනය කළහැකි ගෘහස්ථ ජීව වායු ජනක ආකාර 3 ක් පහතින් විස්තර කර ඇත.

**1. තැනින් තැනට ගෙන යා හැකි ප්ලාස්ටික් ටැංකි යොදවාගත් ජීව වායු ඒකකය**



*තැනින් තැන ගෙන යා හැකි ජීව වායු ඒකකයක්*

මෙම ක්‍රමයේ දී ලීටර් 1000 ක ධාරිතාව ඇති ප්ලාස්ටික් ටැංකියක් භාවිතා කරයි. මෙහිදී නිවසේ ජනනය වන දිරාපත් වන කසළ ජීව වායු ජනකයේ අමුද්‍රව්‍යය ලෙස භාවිතා කරනු ලැබේ.

නිවස පිටුපස මුළුතැන්ගෙයට නුදුරින් තබා ගැනීම මඟින් එලෙස නිවසින් බැහැර කරන ද්‍රව්‍ය ටැංකියට යෙදවීම ද නිපදවන ජීව වායුව මුළුතැන්ගෙය වෙතට ලබාගැනීම ද පහසුවෙන් කළ හැකි වේ.



*ආහාර පිසීමට*

මෙම ටැංකියෙන් බැහැර වන පිටාර ජලය ගෙවතු වගාව සඳහා යොදාගැනීම තුළින් සාරවත් ඵලදාවක් ලබාගත හැකිවේ.



*දිරිමත් වගාවකට*

මෙම ක්‍රමය මඟින් ආහාර පිසීම සඳහා අවැසි සම්පූර්ණ අවශ්‍යතාවයෙන් 30% ජීව වායුව මඟින් සපුරාගත හැකි මෙවැනි ජීව වායු ජනක පද්ධතියක මිල රු. 75,000/- ක් පමණ වේ.

**2. මළ අපද්‍රව්‍යය අමුද්‍රව්‍යය ලෙස භාවිතා කරමින් වැසිකිළි වල වෙනුවට බිමෙහි ඉදිකර ගත හැකි ඝන මීටර් 6 ප්‍රමාණයේ ජීව වායු ජනකය**



*මළ අපද්‍රව්‍ය භාවිතා කළහැකි ජීව වායු ඒකකයක්*

මෙම ජීව වායු ජනකයට අමුද්‍රව්‍යය ඇතුල් කරන ප්‍රධාන ඇතුළු කිරීමේ නලය ලෙස ක්‍රියා කරන්නේ වැසිකිළියට සම්බන්ධ වන නලයයි. ඊට අමතරව අවශ්‍ය නම් මුළුතැන්ගෙයි ජනනය වන දිරාපත් වන කසළ සියල්ලම ඇතුළු කිරීම සඳහා තවත් ඇතුළු කිරීමේ නලයක් පිටතින් තබාගත හැකිය. මෙහි දී පිටාර ජලය වගා කටයුතු සඳහා යොදා ගත හැකි වේ.

ආහාර පිසීම සඳහා අවැසි සම්පූර්ණ අවශ්‍යතාවයෙන් 40% ජීව වායුව මඟින් සපුරා ගත හැකි මෙවැනි පද්ධතියක මිල රු. 125,000/- ක් පමණ වේ.

**3. ගෘහස්ථව ගවයින් දෙදෙනෙකු පමණ සිටින විට ගවගාල ආශ්‍රිතව ඉදිකරගත හැකි ඝන මීටර් 8 ප්‍රමාණයේ ජීව වායු ජනකය**



*ගව ගාල ආශ්‍රිතව ඉදිකළ ජීව වායු ඒකකයක්*

සත්ත්ව වසුරු ජීව වායු ජනකය වෙත යොමු කිරීමෙන් ආහාර පිසීම සඳහා අවැසි සම්පූර්ණ අවශ්‍යතාවය ජීව වායුව මඟින් සපුරාගත හැක. මෙවැනි පද්ධතියක් සඳහා මුළු වියදම රු. 175,000/- ක් පමණ වේ.

# ඇමුණුම්

**පෝෂණීය අගයන්**

**ගෙවතු සඳහා ආදර්ශ සැළසුම්**

**කලාප සඳහා බෝග තොරතුරු**

## I ලාංකිකයන් සඳහා නිර්දේශිත දෛනික පෝෂණ අවශ්‍යතා

| කණ්ඩායම | වයස අවුරුදු | ශරීර බර කි.ග්‍රෑ. | ශක්ති කිලෝ කැලරි | ප්‍රෝටීන් ග්‍රෑම් | විටමින් ඒ මි.ග්‍රෑ. | විටමින් ඩී මි.ග්‍රෑ. | තයමින් මි.ග්‍රෑ. | රයිබෝ ප්ලේවින් මි.ග්‍රෑ. | නයිසීන් මි.ග්‍රෑ. | ෆොලික් අම්ලය මි.ග්‍රෑ. | විටමින් බී 12 මි.ග්‍රෑ. | විටමින් සී මි.ග්‍රෑ. | කැල්සියම් මි.ග්‍රෑ. | යකඩ මි.ග්‍රෑ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිමි** | 18 න් ඉහළ | | | | | | | | | | | | | |
| | මධ්‍යස්ථ | 65 | 3000 | 37 | 750 | 2.5 | 1.2 | 1.8 | 19.8 | 200 | 2.0 | 30 | 400-500 | 8-15 |
| | ක්‍රියාකාරී | 55 | 2530 | 37 | 750 | 2.5 | 1.2 | 1.6 | 16.5 | 200 | 2.0 | 30 | 400-500 | 8-15 |
| **ගැහැණු** | මධ්‍යස්ථ | 55 | 2200 | 29 | 750 | 2.5 | 0.9 | 1.3 | 14.5 | 200 | 2.0 | 30 | 400-500 | 16-22 |
| | ක්‍රියාකාරී | 47 | 1900 | 29 | 750 | 2.5 | 0.9 | 1.1 | 12.6 | 200 | 2.0 | 30 | 400-500 | 16-32 |
| | ගර්භනී | 47 | 2100 | 38 | 750 | 10 | 1.0 | 1.5 | 13.8 | 400 | 3.0 | 30 | 1000 | 16-32 |
| | කිරි දෙන මුල් හය මස | 47 | 2650 | 46 | 1200 | 10 | 1.3 | 1.7 | 17.4 | 300 | 2.5 | 30 | 1000 | 9-17 |
| **ළමා** | 1 අවු: | 7.3 | 820 | 14 | 300 | 10 | 0.3 | 0.5 | 5.4 | 60 | 0.3 | 20 | 500-600 | 6-13 |
| | 1 - 3 අවු: | 13.4 | 1360 | 16 | 250 | 10 | 0.5 | 0.8 | 9.0 | 100 | 0.9 | 20 | 400-500 | 4-8 |
| | 4 - 6 අවු: | 20.2 | 1830 | 20 | 300 | 10 | 0.7 | 1.1 | 12.1 | 100 | 1.5 | 20 | 400-500 | 5-9 |
| | 7 - 9 අවු: | 28.1 | 2190 | 25 | 400 | 2.5 | 0.9 | 1.3 | 14.5 | 100 | 1.5 | 20 | 400-500 | 8-16 |
| **තරුණ පිරිමි** | 10 - 12 අවු: | 36.9 | 2600 | 30 | 575 | 2.5 | 1.0 | 1.6 | 17.2 | 100 | 2.0 | 20 | 600-700 | 12-24 |
| | 13 - 15 අවු: | 51.3 | 2900 | 37 | 725 | 2.5 | 1.2 | 1.7 | 19.1 | 200 | 2.0 | 20 | 600-700 | 12-24 |
| | 16 - 18 අවු: | 62.9 | 3070 | 38 | 750 | 2.5 | 1.2 | 1.8 | 20.3 | 200 | 2.0 | 30 | 500-600 | 12-24 |
| **තරුණ ගැහැණු** | 10 - 12 අවු: | 38 | 2350 | 29 | 575 | 2.5 | 0.9 | 1.4 | 15.5 | 100 | 2.0 | 20 | 600-700 | 13-27 |
| | 13 - 15 අවු: | 49.9 | 2490 | 31 | 725 | 2.5 | 1.0 | 1.5 | 16.4 | 200 | 2.0 | 30 | 600-700 | 13-27 |
| | 16 - 18 අවු: | 54.4 | 2310 | 30 | 750 | 2.5 | 0.9 | 1.4 | 15.2 | 200 | 2.0 | 30 | 500-600 | 13-27 |

ලෝක සෞඛ්‍ය සංවිධානය හා ආහාර සහ කෘෂිකර්ම සංවිධානය විසින් කරන ලද නිර්දේශ අනුව සකස් කරන ලදි
(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)

## II ආහාර වර්ග වල පෝෂක ප්‍රතිශත (ග්‍රෑම් 100ක)

| | තෙතමනය ග්‍රෑම් | ශක්ති කිලෝ කැලරි | ප්‍රෝටීන් ග්‍රෑම් | මේදය ග්‍රෑම් | කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් | කැල්සියම් මි.ග්‍රෑ. | පොස්පරස් මි.ග්‍රෑ. | යකඩ මි.ග්‍රෑ. | විටමින් ඒ මයි.ග්‍රෑ. | කැරටින් මයි.ග්‍රෑ. | තයමින් මයි.ග්‍රෑ. | රයිබෝෆ්ලේවින් මයි.ග්‍රෑ. | නයසින් මි.ග්‍රෑ. | විටමින් සී මි.ග්‍රෑ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පලතුරු** | | | | | | | | | | | | | | |
| ඉදුණු ගස්ලබු | 90.8 | 32 | 0.6 | 0.1 | 7.2 | 17 | 13 | 0.5 | - | 666 | 40 | 250 | 0.2 | 57 |
| අලිපේර | 33.6 | 215 | 1.7 | 22.8 | 0.8 | 10 | 80 | 0.7 | - | - | - | - | - | - |
| රට ඉඳි වියළි | 15.3 | 317 | 2.5 | 0.4 | 75.8 | 120 | 50 | 7.3 | - | 26 | 10 | 20 | 0.9 | 03 |
| අඹ | 81.0 | 74 | 0.6 | 0.4 | 16.9 | 14 | 16 | 1.3 | - | 2743 | 80 | 90 | 0.9 | 16 |
| නෙල්ලි | 81.8 | 58 | 0.5 | 0.1 | 13.7 | 50 | 20 | 1.2 | - | 09 | 30 | 10 | 0.2 | 600 |
| අන්නාසි | 87.8 | 46 | 0.4 | 0.1 | 10.8 | 20 | 09 | 1.2 | - | 18 | 200 | 120 | 0.1 | 39 |
| දිවුල් | 64.2 | 134 | 7.1 | 3.7 | 18.1 | 130 | 110 | 0.6 | - | 61 | 40 | 170 | 0.8 | 03 |
| **ධාන්‍ය** | | | | | | | | | | | | | | |
| ඉරිඟු ඇට | 12.0 | 363 | 10.0 | 4.5 | 71 | 12 | - | 2.5 | - | - | 350 | 130 | 2.0 | - |
| තම්බපු හාල් | 12.6 | 349 | 8.5 | 0.6 | 77.4 | 10 | 280 | 2.8 | - | 09 | 270 | 120 | 4.0 | - |
| කැකුළු හාල් | 13.7 | 345 | 6.8 | 0.5 | 78.2 | 10 | 160 | 3.1 | - | - | 60 | 60 | 1.9 | - |
| තිරිඟු පිටි | 12.2 | 341 | 12.1 | 1.7 | 69.4 | 48 | 355 | 11.5 | - | 29 | 490 | 290 | 4.3 | - |
| කුරක්කන් | 13.1 | 328 | 7.3 | 1.3 | 72 | 344 | 283 | 6.4 | - | 42 | 420 | 190 | 1.1 | - |
| **කිරි හා කිරි ආහාර** | | | | | | | | | | | | | | |
| මව් කිරි | 88.0 | 65 | 1.1 | 3.4 | 7.4 | 28 | 11 | 0.1 | 41.1 | - | 20 | 20 | - | 03 |
| එළකිරි | 87.5 | 67 | 3.2 | 4.1 | 4.4 | 120 | 90 | 0.2 | 57.2 | 6 | 50 | 190 | 0.1 | 02 |
| මී කිරි | 81.0 | 117 | 4.3 | 8.8 | 5.0 | 210 | 130 | 0.2 | 48.0 | - | 40 | 100 | 0.1 | 01 |
| පිටි කිරි | 3.5 | 495 | 25.8 | 26.7 | 38 | 950 | 730 | 0.6 | 520 | - | 310 | 1360 | 0.8 | 04 |
| **මාළු වර්ග** | | | | | | | | | | | | | | |
| බලයා | 72 | 105 | 21 | 0.2 | - | - | - | - | - | - | - | - | - | - |
| කකුළුවා | 76.8 | 100 | 17.9 | 2.0 | 1.3 | 107 | 192 | 1.8 | 35 | - | 50 | 80 | 3.0 | 01 |
| ඇටවල්ලා | 68 | 121 | 20 | 4.2 | - | - | - | - | - | - | - | - | - | - |
| ආඳා | 69.6 | 184 | 16.8 | 12.4 | - | 118 | 196 | 1.4 | 880 | 130 | 190 | 190 | 2.8 | 02 |
| ගල් සාලයා | 78.1 | 101 | 21 | 1.9 | - | 90 | 360 | 2.5 | - | - | - | - | 2.6 | - |
| හාල් මැස්සා | 69.3 | 164 | 19.3 | 9.6 | 0.2 | 143 | 174 | 1.5 | - | - | - | - | - | - |
| හුරුල්ලා | 71.7 | 125 | 19.2 | 5 | - | - | - | - | - | - | - | - | - | - |
| කෙලවල්ලා | 71.9 | 113 | 23.8 | 1.6 | 0.9 | 429 | 349 | 6.8 | - | - | - | - | - | - |
| කුම්බලා | 77.3 | 93 | 18.9 | 1.7 | 0.5 | 429 | 305 | 4.5 | - | - | - | - | - | - |
| තෝර | 72.7 | 126 | 22.5 | 4.0 | - | 71 | 572 | 5.4 | - | - | - | - | 1.2 | - |
| මොරල්ලා | 75.8 | 152 | 21 | 7 | - | - | - | - | - | - | - | - | - | - |
| කාරල්ලා | 77.1 | 89 | 19.2 | 0.6 | 1.6 | 71 | 162 | 2.2 | - | - | - | - | - | - |
| ජපන් කොරලි හා තිලාපියා | 77.4 | 106 | 18.8 | 2.8 | - | 54 | 172 | 0.4 | 25 | 5 | 30 | 120 | 3.1 | - |
| **කරවල** | | | | | | | | | | | | | | |
| අංජිලාවා | 43.3 | 210 | 38.6 | 6.2 | - | 148 | 172 | 4.4 | - | - | - | - | - | - |
| හාල්මැස්සා | 23.5 | 408 | 48.1 | 23.9 | 0.5 | 356 | 433 | 3.7 | - | - | - | - | - | - |
| කිරිගොඩයා | 17.9 | 274 | 61.5 | 0.3 | 1.8 | 6235 | 207 | 9.3 | - | - | - | - | - | - |
| සාවාලයා | 6.7 | 383 | 76.1 | 8.7 | - | 739 | 700 | 4.2 | - | - | - | - | - | - |
| කුනිස්සා | 6.0 | 349 | 68.1 | 8.5 | - | 4384 | 160 | - | - | - | - | - | - | - |
| අඟුළුවා | 78.5 | 91 | 19.3 | 1.0 | - | 37 | 181 | 1.5 | - | - | 80 | 90 | 1.5 | - |
| **එළවළු වර්ග** | | | | | | | | | | | | | | |
| වට්ටක්කා | 92.6 | 25 | 1.4 | 0.1 | 4.6 | 10 | 30 | 0.7 | - | 50 | 60 | 40 | 0.5 | 02 |
| කරවිල | 92.4 | 25 | 1.6 | 0.2 | 4.2 | 20 | 70 | 1.8 | - | 126 | 70 | 90 | 0.5 | 88 |
| දෙල් | 70 | 113 | 1.5 | 0.4 | 26.0 | 25 | - | 1 | - | - | 100 | 60 | 1.2 | 20 |
| වම්බටු | 92.7 | 24 | 1.4 | 0.3 | 4.0 | 18 | 47 | 0.9 | - | 74 | 40 | 110 | 0.9 | 12 |
| අමු තක්කාලි | 93.1 | 23 | 1.9 | 0.1 | 3.6 | 20 | 36 | 1.8 | - | 192 | 70 | 10 | 0.4 | 31 |
| ඉදුණු තක්කාලි | 94 | 20 | 0.9 | 0.2 | 3.6 | 48 | 20 | 0.4 | - | 351 | 120 | 60 | 0.4 | 27 |
| ලා බෝංචි | 86.1 | 48 | 3.8 | 0.7 | 6.7 | 210 | 68 | 1.7 | - | 187 | 100 | 60 | 0.7 | 09 |
| මුරුංගා | 86.9 | 26 | 2.5 | 0.1 | 3.7 | 30 | 110 | 5.3 | - | 110 | 50 | 70 | 0.2 | 120 |
| ඇඹරුල්ලා | 86.9 | 46 | 0.2 | 0.1 | 12.4 | 56 | 67 | 0.3 | - | 205 | 50 | 20 | 1.4 | 36 |

(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)

# III ආහාර වර්ග වල පෝෂක ප්‍රතිශත (ග්‍රෑම් 100ක)

| | තෙතමනය ග්‍රෑම් | ශක්ති කිලෝ කැලරි | ප්‍රෝටීන් ග්‍රෑම් | මේදය ග්‍රෑම් | කබෝ හයිඩ්‍රේට් ග්‍රෑම් | කැල්සියම් මි.ග්‍රෑ. | පොස්පරස් මි.ග්‍රෑ. | යකඩ මි.ග්‍රෑ. | විටමින් ඒ මයි.ග්‍රෑ. | කැරටීන් මයි.ග්‍රෑ. | තයමින් මයි.ග්‍රෑ. | රයිබෝ ප්ලේවින් මයි.ග්‍රෑ. | නයසීන් මි.ග්‍රෑ. | විටමින් සී මි.ග්‍රෑ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පලා වර්ග** | | | | | | | | | | | | | | |
| ගොටුකොළ | 84.5 | 37 | 2.1 | 0.5 | 6.0 | 224 | 32 | 68.8 | - | - | - | - | - | - |
| මුකුණුවැන්න | 77.4 | 73 | 5.0 | 0.7 | 11.6 | 510 | 60 | 16.7 | - | 1926 | - | 140 | 1.2 | 17 |
| කංකුං | 90.3 | 28 | 2.9 | 0.4 | 3.1 | 110 | 46 | 3.9 | - | 1980 | 50 | 130 | 0.6 | 137 |
| කිරි හැන්ද | 88 | 38 | 2.0 | 0.7 | 5.8 | 323 | 38 | - | - | - | - | - | - | - |
| මඤ්ඤොක්කා කොළ | 91 | 28 | 2 | 0.3 | 4 | 80 | - | 2.5 | - | 300 | 80 | 200 | 0.5 | 50 |
| මිංචි | 84.9 | 48 | 4.8 | 0.6 | 5.8 | 200 | 62 | 15.6 | - | 1620 | 50 | 200 | 1.0 | 27 |
| අබ කොළ | 89.8 | 34 | 4 | 0.6 | 3.2 | 155 | 26 | 16.3 | - | 2622 | 30 | - | - | 33 |
| තම්පලා | 90 | 26 | 3.0 | 0.7 | 2.0 | 200 | 40 | - | - | - | - | - | - | - |
| නිවිති | 92.1 | 26 | 2 | 0.7 | 2.9 | 73 | 21 | 10.9 | - | 5580 | 30 | 260 | 0.5 | 28 |
| කැරට් කොළ | 76.6 | 77 | 5.1 | 0.5 | 13.1 | 340 | 110 | 8.8 | - | 5700 | 40 | 370 | 2.1 | 79 |
| කරපිංචා | 63.8 | 108 | 6.1 | 1.0 | 18.7 | 830 | 57 | 7 | - | 7560 | 80 | 210 | 2.3 | 4 |
| කරල් මුරුංගා කොළ | 75.9 | 92 | 6.7 | 1.7 | 12.5 | 440 | 70 | 7.0 | - | 6780 | 60 | 50 | 0.8 | 220 |
| කතුරු මුරුංගා කොළ | 73.1 | 93 | 8.4 | 1.4 | 11.8 | 1130 | 80 | 3.9 | - | 5400 | 210 | 90 | 1.2 | 169 |
| වෙල් අල කොළ | 78.8 | 77 | 6.8 | 2.0 | 8.1 | 460 | 125 | 38.7 | - | 12000 | 60 | 450 | 1.9 | 63 |
| කිරි අල කොළ | 82.7 | 56 | 3.9 | 1.5 | 6.8 | 227 | 82 | 10.0 | - | 10278 | 220 | 260 | 1.1 | 12 |
| **මාංශ බෝග** | | | | | | | | | | | | | | |
| මුං | 10.4 | 334 | 24 | 1.3 | 56.7 | 124 | 326 | 7.3 | - | 94 | 470 | 270 | 2.1 | - |
| කහ පරිප්පු | 13.4 | 335 | 22.3 | 1.7 | 57.6 | 73 | 304 | 5.8 | - | 132 | 450 | 190 | 2.9 | - |
| රතු පරිප්පු | 13.4 | 343 | 25.1 | 0.7 | 59.0 | 69 | 293 | 4.8 | - | 270 | 450 | 200 | 2.6 | - |
| කඩල | 11.8 | 321 | 22 | 0.5 | 57.2 | 287 | 311 | 8.4 | - | 71 | 420 | 200 | 1.5 | 1 |
| කව්පි | 13.4 | 323 | 24.1 | 1 | 54.5 | 77 | 414 | 5.9 | - | 12 | 510 | 200 | 1.3 | - |
| උඳු | 10.9 | 347 | 24 | 1.4 | 59.6 | 154 | 385 | 9.1 | - | 38 | 420 | 200 | 2 | - |
| **අල වර්ග** | | | | | | | | | | | | | | |
| කැරට් | 86 | 48 | 0.9 | 0.2 | 10.6 | 80 | 530 | 2.2 | - | 1890 | 40 | 20 | 0.6 | 3 |
| දෙහි අල | 73.1 | 97 | 3 | 0.1 | 21.1 | 40 | 140 | 1.7 | - | 24 | 90 | 30 | 0.4 | - |
| අර්තාපල් | 74.7 | 97 | 1.6 | 0.1 | 22.6 | 10 | 40 | 0.7 | - | 24 | 100 | 10 | 1.2 | 17 |
| බතල | 68.5 | 120 | 1.2 | 0.3 | 28.2 | 46 | 50 | 0.8 | - | 06 | 80 | 40 | 0.7 | 24 |
| **මස්** | | | | | | | | | | | | | | |
| කුකුල් මස් | 72.2 | 109 | 25.9 | 0.6 | - | 25 | 245 | - | - | - | - | 140 | - | - |
| හරක් මස් | 78.7 | 86 | 19.4 | 0.9 | - | 3 | 189 | - | - | - | - | - | - | - |
| ඌරු මස් | 50 | 371 | 14 | 35 | - | 10 | - | 2 | - | - | 800 | 200 | 0.4 | - |
| එළු මස් | 74.2 | 118 | 21.4 | 3.6 | - | 12 | 193 | - | - | - | - | - | - | - |
| **කිරි නිෂ්පාදන** | | | | | | | | | | | | | | |
| බටර් | 19 | 729 | - | 81 | - | - | - | - | 960 | - | - | - | - | - |
| චීස් | 40.3 | 348 | 24.1 | 25.1 | 6.3 | 790 | 520 | 2.1 | 82 | - | - | - | - | - |
| මුදවපු කිරි | 89.1 | 60 | 3.1 | 4 | 3 | 149 | 93 | 0.2 | 30.6 | - | 50 | 160 | 0.1 | 1 |
| යෝගට් | 77 | 90 | 3.6 | 0.8 | 17.6 | 140 | 130 | 0.1 | 10 | - | 30 | 150 | 0.1 | - |
| **බිත්තර** | | | | | | | | | | | | | | |
| කුකුල් බිත්තර | 73.7 | 173 | 13.3 | 13.3 | - | 60 | 220 | 2.1 | 360 | 600 | 100 | 400 | 0.1 | - |
| බිත්තර සුදු මදය | 87.4 | 52 | 10.7 | 0.2 | 1.1 | 10 | 13 | 0.4 | - | - | 10 | 32 | 0.1 | - |
| කහ මදය | 52.1 | 336 | 16.3 | 29 | 0.9 | 154 | 479 | 6.3 | 950 | 515 | 240 | 470 | - | - |

(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)

# IV ආහාර වර්ග වල පෝෂක ප්‍රතිශත (ග්‍රෑම් 100ක)

| | තෙතමනය ග්‍රෑම් | ශක්ති කිලෝ කැලරි | ප්‍රෝටීන් ග්‍රෑම් | මේදය ග්‍රෑම් | කබෝ හයිඩ්‍රේට් ග්‍රෑම් | කැල්සියම් මි.ග්‍රෑ. | පොස්පරස් මි.ග්‍රෑ. | යකඩ මි.ග්‍රෑ. | විටමින් ඒ මයි.ග්‍රෑ. | කැරටීන් මයි.ග්‍රෑ. | තයමින් මයි.ග්‍රෑ. | රයිබෝ ප්ලේවින් මයි.ග්‍රෑ. | නයසීන් මි.ග්‍රෑ. | විටමින් සී මි.ග්‍රෑ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ගෙඩි හා ඇට වර්ග** | | | | | | | | | | | | | | |
| කජු (බදින ලද) | 13.4 | 543 | 18.3 | 49.3 | 16.4 | 32 | 411 | 3.9 | - | - | 360 | 340 | 1.4 | - |
| පොල් | 51.7 | 313 | 3.2 | 28.2 | 16 | 23 | 112 | 2.5 | - | - | 50 | 30 | 0.6 | 3 |
| තල | 5.3 | 563 | 18.3 | 43.3 | 25 | 1450 | 570 | 10.5 | - | 60 | 1010 | 340 | 4.4 | - |
| රට කජු (බදින ලද) | 1.7 | 570 | 26.2 | 39.8 | 26.7 | 77 | 370 | 3.1 | - | - | 390 | 130 | 22.1 | - |
| අබ | 8.5 | 541 | 20 | 39.7 | 23.8 | 490 | 700 | 17.9 | - | 162 | 650 | 260 | 4 | - |
| සූර්යකාන්ත | 5.5 | 620 | 19.8 | 52.1 | 17.9 | 280 | 670 | 5 | - | - | 860 | 200 | 4.5 | 1 |
| **මල් වර්ග** | | | | | | | | | | | | | | |
| බිම්මල් | 91 | 13 | 2.5 | 0.3 | - | 20 | - | 1 | - | - | 120 | 500 | 5.8 | 3 |
| කෙසෙල් මුව | 89.9 | 34 | 1.7 | 0.7 | 5.1 | 32 | 42 | 1.6 | - | 27 | 50 | 20 | 0.4 | 16 |
| කතුරු මුරුංගා මල් | 92.9 | 26 | 1 | 0.5 | 4.4 | 9 | 5 | - | - | - | - | - | - | - |
| මල් ගෝවා | 90.8 | 30 | 2.6 | 0.4 | 4 | 33 | 57 | 1.5 | - | 30 | 40 | 100 | 0.1 | 56 |
| **කුළු බඩු** | | | | | | | | | | | | | | |
| වියළි මිරිස් | 8 | 291 | 15 | 11 | 33 | 150 | - | 09 | 300 | 600 | 500 | 12 | 10 | - |
| කුරුඳු පොතු | 12 | 229 | 12 | 7.8 | 28 | 440 | - | 17 | - | - | 100 | 400 | 2.4 | - |
| කොත්තමල්ලි | 11.2 | 288 | 14.1 | 16.1 | 21.6 | 630 | 393 | 17.9 | - | 942 | 220 | 350 | 1.1 | - |
| දුරු | 11.9 | 356 | 18.7 | 15 | 36.6 | 1080 | 511 | 31 | - | 522 | 550 | 360 | 2.6 | 3 |
| උළුහාල් | 13.7 | 333 | 26.2 | 5.8 | 44.1 | 160 | 370 | 14.1 | - | 96 | 340 | 290 | 1.1 | - |
| සුදු ලූණු | 62 | 145 | 6.3 | 0.1 | 29.8 | 30 | 310 | 1.3 | - | - | 60 | 230 | 0.4 | 13 |
| අමු ඉඟුරු | 80.9 | 67 | 2.3 | 0.9 | 12.3 | 20 | 60 | 2.6 | - | 40 | 60 | 30 | 0.6 | 6 |
| ගම්මිරිස් | 13.2 | 304 | 11.5 | 6.8 | 49.2 | 460 | 198 | 16.8 | - | 1080 | 90 | 140 | 1.4 | - |
| වියළි සියඹලා | 20.9 | 283 | 3.1 | 0.1 | 67.4 | 170 | 110 | 10.9 | - | 60 | - | 70 | 0.7 | 3 |
| වියළි කහ | 13.1 | 349 | 6.3 | 5.1 | 69.4 | 150 | 282 | 14.8 | - | 30 | 30 | - | 2.3 | - |
| **තෙල් වර්ග** | | | | | | | | | | | | | | |
| පොල්තෙල් | - | 883 | - | 99.9 | - | 2 | 3 | - | - | - | - | - | - | - |
| මෝර තෙල් | - | 930 | - | 99.9 | - | - | - | - | 22750 | - | - | - | - | - |
| සෝයා තෙල් | 0.1 | 883 | - | 99.9 | - | - | - | - | - | - | - | - | - | - |
| තල තෙල් | 0.1 | 881 | 0.2 | 99.7 | 0.1 | 10 | 5 | 0.1 | - | - | 10 | 70 | 0.1 | - |
| **විවිධ** | | | | | | | | | | | | | | |
| මී පැණි | 20.6 | 319 | 0.3 | - | 79.5 | 5 | 16 | 0.9 | - | - | - | 40 | 0.2 | 4 |
| කෝපි කුඩු | 4.1 | 301 | 12.5 | 15.4 | 28.5 | 133 | 161 | 4.1 | - | - | - | - | - | - |
| දුඹුරු සීනි | 1 | 389 | 0.2 | - | 97 | 30 | - | 2 | - | - | 20 | 10 | 0.3 | - |
| සුදු සීනි | - | 400 | - | - | 100 | - | - | - | - | - | - | - | - | - |
| උක් හකුරු | 3.9 | 383 | 0.4 | 0.1 | 95 | 80 | 40 | 11.4 | - | 168 | 20 | 40 | 0.5 | - |
| පොල් හකුරු | 10.3 | 340 | 1 | 0.2 | 83.5 | 1638 | 62 | - | - | - | - | - | - | - |

(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)

**V මෙහි සඳහන් කර ඇත්තේ උදේ, දවල් හා රාත්‍රී ආහාර වේල් සඳහා යොදාගත හැකි ආහාර වර්‍ග රැසකි. පවුලේ රුචිකත්වය, අවශ්‍යතාවය හා ආදායම් තත්ත්වය මත ආහාර වේල් සැලසුම් කර ගැනීමට මෙම වට්ටෝරු ඔබට උපයෝගී කර ගත හැකිය**

| ආහාර වර්ග | ප්‍රමාණය | කැලරි ගණන | ප්‍රෝටීන් ග්‍රෑම් |
|---|---|---|---|
| **උදය ආහාරය** | | | |
| කිරි තේ | 1 කෝප්ප | 60 | - |
| හාල් පිටි පිට්ටු | 100 ග්‍රෑම් | 340 | 6.0 |
| පොල් කිරි | 50 ග්‍රෑම් | 90 | - |
| හකුරු | - | 170 | - |
| සීනි සමඟ තේ | 1 කෝප්ප | 56 | - |
| පාන් පෙති 05 යි | 05 පෙති | 294 | 9.4 |
| බිත්තර (බැදපු) | 1 - 35 ග්‍රෑම් | 63.3 | 4.7 |
| කුරක්කන් රොටි | 100 ග්‍රෑම් | 328 | 7.3 |
| පොල් සම්බෝල | 30 ග්‍රෑම් | 93 | 0.9 |
| ඉදුණු කෙසෙල් ගෙඩි | පොඩි 1 යි | - | 0.1 |
| **දිවා ආහාර** | | | |
| බත් | 200 ග්‍රෑම් | 690 | 13.6 |
| කව්පි ව්‍යංජනය | 50 ග්‍රෑම් | 161.5 | 12.0 |
| ගෝවා | 100 ග්‍රෑම් | 27 | 1.8 |
| අර්තාපල් | 30 ග්‍රෑම් | 29.1 | 0.5 |
| හාල් මැස්සෝ | 20 ග්‍රෑම් | 82 | 9.6 |
| පොල් | 50 ග්‍රෑම් | 156 | 1.6 |
| තෙල් | 03 ග්‍රෑම් | 30 | - |
| රතු පරිප්පු | 20 ග්‍රෑම් | 70 | 5.0 |
| බෝංචි | 30 ග්‍රෑම් | - | 8.0 |
| ලීක්ස් | 30 ග්‍රෑම් | 10.5 | 0.7 |
| හරක් මස් | 20 ග්‍රෑම් | 40.4 | 3.8 |
| ගෝවා, බීට්, කැරට්, සලාද | 30 ග්‍රෑම් | 15 | 0.5 |
| කව්පි | 20 ග්‍රෑම් | - | 0.4 |
| වට්ටක්කා ව්‍යංජනය | 15 ග්‍රෑම් | 20 | 5.0 |
| අලිපේර | 100 ග්‍රෑම් | 215 | 1.7 |
| සීනි | 50 ග්‍රෑම් | 200 | - |
| **ප.ව. 3.00 ට** | | | |
| තේ සහ කිරි | 1 කෝප්ප | 60 | - |
| බිස්කට් | පොඩි 1 යි | 43.5 | 0.7 |
| කහට තේ සහ සීනි | 1 කෝප්ප | 56 | - |
| බඩඉරිඟු | 300 ග්‍රෑම් | 726 | 20 |
| **රාත්‍රී ආහාර** | | | |
| බත් | 150 ග්‍රෑම් | 518 | 10.2 |
| රාත්‍රී ආහාරයට එළවළු ප්‍රමාණය බොහෝ දුරට දිවා ආහාරය මෙනි | | | |
| දෙල් ව්‍යාංජනය | 150 ග්‍රෑම් | 170 | 2.3 |
| බැදපු හාල් මැස්සන් | 20 ග්‍රෑම් | 82 | 9.6 |
| ගොටුකොළ මැල්ලුම් | 20 ග්‍රෑම් | - | - |
| බැදපු වම්බටු | 80 ග්‍රෑම් | 12 | 0.7 |
| මිශ්‍ර එළවළු | 30 ග්‍රෑම් | 45 | 0.5 |
| තක්කාලි | 20 ග්‍රෑම් | 10.0 | 0.2 |
| පොලොස් මැල්ලුම් | 50 ග්‍රෑම් | 78 | 7.4 |

(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)

## VI ග්‍රෑමයක අඩංගු එළවළු බීජ ගණන, සිටුවන පරතරය, අස්වැන්න නෙළීමට ගතවන කාලය සහ බෝගයේ ආයු කාලය

| බෝගය | දළ වශයෙන් ග්‍රෑමයක අඩංගු බීජ ගණන | සිටුවන පරතරය | | එකතැනක තිබිය යුතු පැළ හෝ බීජ ගණන | පළමු අස්වැන්න ලැබීමට ගතවන කාලය, දින |
|---|---|---|---|---|---|
| | | පේළි අතර සෙ.මී | පේළිය තුළ සෙ.මී | | |
| වට්ටක්කා | 18-25 | 300 | 300 | 1-2 | 90 |
| කරවිල | 3-5 | 150 | 100 | 1-2 | 75 |
| පතෝල | 3-5 | 150 | 150 | 1-2 | 75 |
| වැටකොළු | 9-12 | 150 | 150 | 1-2 | 75 |
| කැකිරි | 30-40 | 100 | 100 | 2 | 45 |
| පිපිඤ්ඤා | 30-45 | 100 | 100 | 2 | 45 |
| මඤ්ඤොක්කා | | 90 | 90 | 1-2 | 240-270 |
| කිරි අල | | 90 | 90 | 1 | 90-120 |
| වම්බටු | 250-300 | 90 | 60 | 1 | 75 |
| බණ්ඩක්කා | 20-29 | 90 | 60 | 1-2 | 45 |
| මෑ | 8-10 | 90 | 30 | 1-2 | 60 |
| තක්කාලි | 300-375 | 80 | 50 | 1-2 | 75 |
| දඹල | 4-6 | 75 | 60 | 1-2 | 90 |
| වැල්බෝංචි | 3-5 | 60 | 45 | 1-2 | 60 |
| මිරිස් (වියළි) | 160-400 | 60 | 45 | 2 | 75 |
| ගෝවා | 200-350 | 50 | 40 | 1 | 75 |
| පඳුරු බෝංචි | 4-6 | 50 | 10 | 1-2 | 45 |
| මාළුමිරිස් | 150-200 | 40 | 40 | 1-2 | 75 |
| නිවිති | 40-80 | 30 | 30 | 1 | 60 |
| නෝකෝල් | - | 30 | 15 | 1 | 75 |
| සලාද | 600-1200 | 30 | 15 | 1 | 30 |
| බීට් | 50-60 | 30 | 10 | 1 | 75 |
| රාබු | 75-140 | 30 | 10 | 1 | 45 |
| කැරට් | 750-1250 | 30 | 5 | 1 | 105 |
| ලීක්ස් | 350-400 | 15 | 10 | 1 | 150 |
| කංකුං | - | 45 | 30 | 1-2 | 60 |
| ගොටුකොළ | - | 20 | 20 | 2-3 | 60 |
| මුකුණුවැන්න | - | 20 | 20 | 1-2 | 60 |
| මල් ගෝවා | 250-450 | 50 | 40 | 1 | 45-60 |
| තම්පලා | 1900-2000 | 30 | 15 | 1-2 | 45-60 |

(මූලාශ්‍රය : ගෙවතු වගාව - කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රකාශනය)


ගෙවත්ත සඳහා ආදර්ශ සැලසුමක් (වර්ග මීටර් 1000 සඳහා)


ගෙවත්ත සඳහා ආදර්ශ සැලැස්මක් (වර්ග මීටර 250 සඳහා)

## ගෙවත්තක් සඳහා ආදර්ශ සැලසුමක් (වර්ග මීටර 25-50)



## වියළි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | කරවිල  | බණ්ඩක්කා  | මෑ  | වැටකොළු  |
|---|---|---|---|---|
| බිම් සැකසීම | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ, පැළ අතර මීටර් 1 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 30 | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ, පැළ අතර මීටර් 1.5 |
| බීජ/පැළ සිටුවීම | එක වලක බීජ 2 ක් සිටුවන්න. | එක වලක බීජ 3-4 ක් දමා පැළවී සති 2 කදී පමණ නිරෝගී පැළ 2 ක් ඉතිරිකර වැඩි පැළ ඉවත් කරන්න. | එක වලක බීජ 2 ක් සිටුවන්න. | එක වලක බීජ 2 ක් සිටුවා සති 2-3 කදී නිරෝගී පැළයක් ඉතිරි කරන්න. පොල් කටුවක හෝ පොලිතින් බඳුනක පැළකර සති 3ක් පමණ වූ නිරෝගී පැළයක් වලක සිටුවීම වඩාත් සාර්ථකවේ. |
| වගා පාලන කටයුතු | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා පල කුණුවීම වළක්වා ගැනීමට කරල් මලෙන් හටගත් විගසම කඩදාසි හෝ පතුල විවෘත පොලිතින් බෑග් යොදා ආවරණය කරන්න. හානි වූ කරල් එකතු කර ගිනි තබා හෝ ගැඹුරට වළලා විනාශ කරන්න. | වගාවේ මුල් අවස්ථාවේ වර්ධනය දුර්වල වුවහොත් ගසේ වර්ධනය නැවත ඇතිකර ගත නොහැක. මේ නිසා හොඳින් කාබනික පොහොර යොදා, ජල සම්පාදනය කර දිරිමත් පැළයක් ඇති කර ගැනීම හොඳ වගාවක මුලාරම්භයයි. අස්වනු නෙලන විට එයට පහළින් ඇති පත්‍රය ද ඉවත් කරන්න. | සිටුවා සති 2-3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වලට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමු කිරීමද කළ හැකිය. ලපටි දළු හා කරල් වලට කුඩිත්තන් (කළු දුඹුරු පැහැයට හුරු කුඩා කෘමීන්) සිටිනම් උදෑසන පින්නට අළු ඉසින්න. ගහනය අධික නම් එම කොටස් කඩා ඉවත් කරන්න. | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා පල කුණුවීම වළක්වා ගැනීමට මලෙන් කරල් හටගත් විගසම කඩදාසි හෝ පතුල විවෘත පොලිතින් බෑග් යොදා ආවරණය කරන්න. හානි වූ කරල් එකතු කර ගිනි තැබීම හෝ ගැඹුරට වැලලීම හෝ කළු පොලිතින් මල්ලක දමා ගැටගසා අව්වේ තබන්න. |
| අස්වැන්න | මාස 2 1/2 කදී පමණ අස්වැන්න නෙලීම ආරම්භ කළහැකිය. | මාස 1 1/2-2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. | මාස 1 1/2-2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. | මාස 2-2 1/2 කදී පමණ අස්වැන්න නෙලීම ආරම්භ කළහැකිය. |
| පෝෂණ ගුණය | රුධිරයේ සීනි ප්‍රමාණය අඩු කරන රසායනික සංයෝග සහිතය. තද කොළ පැහැති කරවිල වල එම ගුණය වැඩිය. විටමින් ඒ හා බී, පොස්පරස් හා දළ තන්තු බහුලයි. | කැල්සියම්, අයඩින් සහ විටමින් සී බහුල එළවළුවකි. | ප්‍රෝටීන්, කැල්සියම්, පොස්පරස් සහ දළ තන්තු බහුල වේ. | තන්තු බහුල පහසුවෙන් පිරණය වන එළවළුවකි. |

**ඊළග වගාව සඳහා අවශ්‍ය බීජ ඔබේ ගෙවත්තේම නිපදවා ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## වියළි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | නිවිති  5 | තම්පලා  6 | පිපිඤ්ඤා  7 |
|---|---|---|---|
| බිම් සැකසීම | පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | **බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න.** | වල් පැළෑටි ඉවත්කර පස හොඳින් බුරුල්කර සියුම්ව සකසා ගන්න. බෝගය අනුව සුදුසු පරතරයට දිග, පළල සහ ගැඹුර සෙ.මී. 30 ක් පමණ වූ වලවල් සකසා ගන්න. |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | **පේළි අතර සෙ.මී 30<br>පේළිය දිගේ තුනීවට බීජ දමන්න.** | පේළි අතර, මීටර් 1<br>පේළිය තුළ, පැළ අතර මීටර් 1 |
| බීජ/පැළ සිටුවීම | එක වලක බීජ 2 ක් සිටුවන්න. | බීජ සෙ.මී 1 ක් පමණ ගැඹුරට දමන්න.<br>බීජ වැලි සමඟ මිශ්‍රකර යෙදීමෙන් තුනීවට බීජ දැමීම පහසු වේ. | එක් වලක එකිනෙකට තරමක් දුරින් බීජ 3-4 බැගින් (සෙ.මී. 2-3 ගැඹුරින්) සිටුවන්න.<br>බීජ පැළවී සති 2 ක් ගතවූ පසු එක් වලක පැළ 2 ක් ඉතිරි කර වැඩි පැළ ඉවත් කරන්න. |
| වගා පාලන කටයුතු | **දියකරගත් අමු ගොම පත්‍ර තෙමෙන සේ සති කිහිපයකට වරක් යොදන්න. පොළව මට්ටමේ සිට අඟල් 6-8 ක් වර්ධනය වූ පසු අග්‍රස්ථය කපා දැමීමෙන් පඳුරක් ආකාරයට වර්ධනය කර ගැනීම හෝ සිටුවා සති 3-4 කදී පොළොව මට්ටමේ සිට අඩි 1-1 1/2 උසින් සිටින සේ පාත්තියට ඉහළින් සැකසූ මැස්සකට යැවීම ද කළ හැකිය.** | පැළ ගහනය වැඩි වීම නිසා දුර්වල පැළ ඇතිවේ. එවැනි අවස්ථාවක පැළ තුනී කරන්න. | පැළවලට මීටර් 1 1/2 පමණ උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද, වැල් ඒවාට යොමුකරන්න.<br>යටිකුරු "වී" (Λ) ආකාරයට සකසා ගත් පන්දලමකට ද යැවිය හැකිය. |
| අස්වැන්න | අස්වැන්න වරින් වර නෙළාගත හැකිය. දණ්ඩ සමඟ කරටි කැපීම මඟින් වර්ධක වර්ධනය දිගටම පවත්වා ගත හැකිය. මල් පිපීමට ඉඩහැරීමෙන් වර්ධනය බාලවේ. මල් කිනිති කඩා ඉවත් කරන්න. | සති 4-6 කදී පමණ ගස් සම්පූර්ණයෙන්ම ගලවා ගැනීම හෝ කඳ කපා ගැනීම තුළින් වරින් වර අස්වනු ගැනීම සඳහා වගාව පවත්වා ගත හැකිය. | පළමු අස්වැන්න මාස 2 කදී පමණ ලබාගත හැක. |
| පෝෂණ ගුණය | විටමින් ඒ, යකඩ හා දළ තන්තු බහුල එළවළුවකි. | යකඩ, කැල්සියම් සහ තන්තු බහුල පලා වර්ගයකි. | දළ තන්තු බහුල පහසුවෙන් ජීරණය වන එළවළුවකි. |

**නිරෝගී දිවියක් සඳහා දිනකට එළවළු සහ පලතුරු වර්ග 05 ක් ආහාරයට ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

# වියළි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | මිරිස්  8 | මාළුමිරිස්  9 | තක්කාලි  10 | බටු  11 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | මිරිස්, මාළුමිරිස්, තක්කාලි, බටු වැනි බෝග පසුගිය කන්නයේ වගා නොකළ ස්ථානයක් මේ සඳහා වඩාත් සුදුසුය. පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1 අනුපාතයට පුරවනලද, කිලෝ ග්‍රෑම් 10 ප්‍රමාණයේ හාල්මළු හෝ පොලිතින්මළු වලද, සිටුවිය හැකිය. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කුඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී 60<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 45 | පේළි අතර සෙ.මී. 40<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| බීජ/පැළ සිටුවීම | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. | | දින 14-21 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටින සේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. |
| වගා පාලන කටයුතු | කොළකොඩවීම වැනි හානි වළක්වා ගැනීම සඳහා නිතර පරීක්ෂා කර හානිය මුල් අවස්ථාවේම හඳුනාගන්න. දින 3-4 කට වරක් ජලය ස්ප්‍රේ කිරීම හෝ පීඩනයක් යටතේ පත්‍ර වලට ඉසින්න. වරින් වර කොහොඹ බීජ නිස්සාරකය හෝ කොහොඹ පත්‍ර, කුරුඳු, සුදුලූනු, ඉඟුරු වැනි පලිබෝධනාශක ගුණ ඇති ශාක සාර ඉසින්න. පිදුරු, ග්ලිරිසීඩියා කොළ වැනි දෑ වලින් වසුනක් යොදන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | | ගස් කඩා වැටීම වැළැක්වීමට හා ගෙඩි පොලොවේ ගෑවී කුණුවීම වළක්වා ගැනීමට සිටුවා සති 3-4 කදී ආධාරක කෝටු සිටුවන්න. ගසේ වර්ධනය අනුව පුරුක් 3-4 කට වරක් ගස ආධාරකයට ලිහිල්ව ගැට ගසන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | ප්‍රධාන කඳේ පහළින් එන අතු ඉවත් කරන්න. කරටි මැලවී තිබේනම් එම කරටිවල හානිවූ ස්ථානය සහිත කොටස සමඟ කරටිය කඩා විනාශ කරන්න. හානි වූ කරල් ද එලෙස විනාශ කරන්න. |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. |
| පෝෂණ ගුණය | කැල්සියම්, විටමින් ඒ හා සී බහුලයි. | කැල්සියම්, විටමින් ඒ හා බී බහුලයි. | ඉදුනු තක්කාලිවල කැල්සියම්, පොස්පරස් සහ විටමින් සී බහුලය පිළිකා නාශක ගුණයෙන් යුතු ලයිකොපීන් සංයෝගය බහුලව අඩංගු වේ. | විටමින් බී සහ කෙඳි බහුලයි. |

**එළවළු සහ පලතුරු වැඩිපුර ආහාරයට ගැනීමෙන් පිළිකා ඇතුළු බොහෝ රෝග වැලදීමේ අවදානම අඩුවේ.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## තෙත් කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | වැටකොළු  1 | බණ්ඩක්කා  2 | වැල් බෝංචි  3 | රාබු  4 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | බීජ සිටුවීමට සති 2 - 3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. රාබු සඳහා මීටර් 3 (අඩි 10) ක් දිග සෙ.මී. 90 (අඩි 3) පළල පාත්ති සකසා ගැනීමෙන් වගා නඩත්තු කටයුතු පහසු කරගත හැක. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4 - 5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි. ග්‍රෑම් 2 ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2 කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ, පැළ අතර මීටර් 1.5 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 30 | පේළි අතර සෙ.මී. 30<br>පේළිය දිගේ සෙ.මී. 10 |
| බීජ/පැළ සිටුවීම | එක වලකට බීජ 2 - 3 ක් සිටුවා සති 2 - 3 කදී නිරෝගී පැළ 2 ක් ඉතිරි කරන්න. පොල්කටුවක හෝ පොලිතීන් බඳුනක බීජ පැළ කර සති 3 ක් පමණ වූ නිරෝගී පැළ 2 ක් වලක සිටුවීම වඩාත් සාර්ථක වේ. | එක් වලක බීජ 3 - 4 ක් දමා පැළවී සති 2 කදී පමණ නිරෝගී පැළ 2 ක් ඉතිරි කර වැඩි පැළ ඉවත් කරන්න | එක් වලක බීජ 2 බැගින් සිටුවන්න | පේළිය දිගේ සෙ.මී. 1 ක් පමණ ගැඹුරට තුනීවට බීජ දමන්න. බීජ පැළවී සති 1 - 2 කදී සෙ.මී. 10 පරතරය පිහිටින සේ වැඩි පැළ ඉවත් කරන්න |
| වගා පාලන කටයුතු | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා එල කුණුවීම වළක්වා ගැනීමට මලෙන් කරල් හටගත් විගසම කඩදාසි හෝ පතුළ විවෘත පොලිතීන් බෑග් යොදා ආවරණය කරගන්න. හානි වූ කරල් එකතු කර ගිනි තැබීම හෝ ගැඹුරට වැලලීම හෝ කළු පොලිතීන් මල්ලක දමා ගැට ගසා අව්වේ තබන්න | වගාවේ මුල් අවස්ථාවේ වර්ධනය දුර්වල වුවහොත් ශාකේ වර්ධනය නැවත ඇති කරගත නොහැක. මේ නිසා හොඳින් කාබනික පොහොර යොදා ජල සම්පාදනය කර දිරිමත් පැළයක් ඇති කර ගැනීම හොඳ වගාවක මූලාරම්භයයි. අස්වනු නෙළන විට එයට පහළින් ඇති පත්‍රය ද ඉවත් කරන්න | සිටුවා සති 2 - 3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වලට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර, වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමු කිරීම ද කළ හැකිය. | පස බුරුල් කරන්න. වල් පැළෑටි ගලවා ඉවත් කරන්න |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ | මාස 1 1/2 - 2 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය | මාස 2 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැක | දින 45 කදී පමණ ගැලවිය හැක. ප්‍රමාදවී ගැලවීමෙන් අලවල ගුණාත්මය අඩුවේ. |
| පෝෂණ ගුණය | තන්තු බහුල පහසුවෙන් පිරණය වන එළවළුවකි. | කැල්සියම්, අයඩින් හා විටමින් සී බහුල එළවළුවකි | ප්‍රෝටීන්, පොස්පරස්, කැල්සියම්, විටමින් බී සහ දල තන්තු බහුල එලවළුවකි | කැල්සියම්, පොටෑසියම් සහ දලතන්තු බහුල ආහාරයකි. |

**ඊළග වගාව සඳහා අවශ්‍ය බීජ ඔබේ ගෙවත්තේම නිපදවා ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවය) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## තෙත් කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය බීජ වල ස්වරූපය | නිවිති  5 | තම්පලා  6 | මෑ  7 |
|---|---|---|---|
| බිම් සැකසීම | පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | බීජ සිටුවීමට සති 2 - 3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | සෙ.මී. 30 පමණ ගැඹුරට පස පෙරලා හොඳින් කැට පොඩි කරන්න. වතුර බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4 - 5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි. ග්‍රෑම් 2 ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2 කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 30<br>පේළි දිගේ තුනීවට බීජ දමන්න. | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 30 |
| බීජ සිටුවීම | එක් වලක බීජ 2 ක් සිටුවන්න. | බීජ සෙ.මී. 1 පමණ ගැඹුරට දමන්න. බීජ වැලි සමඟ මිශ්‍ර කර යෙදීමෙන් තුනීවට දැමීම පහසු වේ | එක වලක බීජ 2 ක් සිටුවන්න. |
| වගා පාලන කටයුතු | දියකරගත් අමුගොම පත්‍ර තෙමෙන සේ සති කීපයකට වරක් යොදන්න. පොලොව මට්ටමේ සිට අඟල් 6 - 8 ක් වර්ධනය වූ පසු අග්‍රස්ථය කපා දැමීමෙන් පඳුරක් ආකාරයට වර්ධනය කර ගැනීම හෝ සිටුවා සති 3 - 4 කදී පොලොව මට්ටමේ සිට අඩි 1 - 1 1/2 උසින් සිටින සේ පාත්තියට ඉහලින් සැකසූ මැස්සකට යැවීමද කල හැකිය. | පැළ ඝහනය වැඩි වීම නිසා දුර්වල පැළ ඇතිවේ. එවැනි අවස්ථාවක පැළ තුනී කරන්න | සිටුවා සති 2 - 3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වලට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද, වැල් ඒවාට යොමු කිරීමද කළ හැකිය. ලපටි දළු හා කරල් වලට කුඩිත්තන් (කළු දුඹුරු පැහැයට හුරු කුඩා කෘමින්) සිටිනම් උදෑසන පින්නට අළු ඉසින්න. ඝහනය අධික නම් එම කොටස් කඩා ඉවත් කරන්න. |
| අස්වැන්න | අස්වැන්න වරින්වර නෙලාගත හැකිය. දණ්ඩ සමඟ කරටි කැපීම මගින් වර්ධක වර්ධනය දිගටම පවත්වා ගත හැකිය. මල් පිපීමට ඉඩ හැරීමෙන් වර්ධනය බාලවේ. | සති 4 - 6 කදී පමණ ගස් සම්පූර්ණයෙන්ම ගලවා ගැනීම හෝ කඳ කපා ගැනීම තුලින් වරින් වර අස්වනු ගැනීම සඳහා වගාව පවත්වා ගත හැකිය | මාස 1 1/2 - 2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කල හැකිය. |
| පෝෂණ ගුණය | විටමින් ඒ, යකඩ හා දළ තන්තු බහුල එළවළුවකි. | යකඩ, කැල්සියම් හා තන්තු බහුල පලා වර්ගයකි | ප්‍රෝටීන්, කැල්සියම්, පොස්පරස් සහ දළ තන්තු බහුල වේ. |

**නිරෝගී දිවියක් සඳහා දිනකට එළවළු සහ පලතුරු වර්ග 05 ක් ආහාරයට ගන්න**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවය) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## තෙත් කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය<br>බීජ වල<br>ස්වරූපය | මිරිස් | මාළුමිරිස් | තක්කාලි | වම්බටු |
|---|---|---|---|---|
| |  8 |  9 |  10 |  11 |
| බිම් සැකසීම | මිරිස්, මාළු මිරිස්, තක්කාලි, බටු වැනි බෝග පසුගිය කන්නයේ වගා නොකළ ස්ථානයක් මේ සඳහා වඩාත් සුදුසුය. පැළ සිටුවීමට සති 2 - 3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1 අනුපාතයට පුරවන ලද කිලෝ ග්‍රෑම් 10 ප්‍රමාණයේ හාල් මළු හෝ පොලිතීන් මළු වල ද සිටුවිය හැකිය. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4 - 5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්තිවල වගා කරන්නේ නම් වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි. ග්‍රෑම් 2 ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2 කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 60<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 40<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 80<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 50 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 60 |
| පැළ සිටුවීම | තවානේ දින 25 - 30 ක් වයසැති නිරෝගි පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | | තවානේ දින 14 - 21 ක් වයසැති පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න | තවානේ දින 25 - 30 ක් වයසැති පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න |
| වගා පාලන කටයුතු | කොළ කොඩවීම වැනි හානි වළක්වා ගැනීම සඳහා නිතර පරීක්ෂා කර හානිය මුල් අවස්ථාවේම හඳුනා ගන්න. දින 3 - 4 කට වරක් ජලය ස්ප්‍රේ කිරීම හෝ පීඩනයක් යටතේ පත්‍ර වලට ජලය ඉසින්න. වරින් වර කොහොඹ බීජ නිස්සාරකය හෝ කොහොඹ පත්‍ර, කුරුඳු, සුදුළූණු, ඉඟුරු වැනි පළිබෝධනාශක ගුණ ඇති ශාක සාර ඉසින්න. පිඳුරු, ග්ලිරිසිඩියා කොළ වැනි දෑ වලින් වසුනක් යොදන්න.<br><br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | | ගස් කඩා වැටීම වැළැක්වීමට හා ගෙඩි පොළොවේ ගෑවී කුණුවීම වළක්වා ගැනීමට සිටුවා සති 2 - 3 කදී ආධාරක කෝටු සිටුවන්න. ගසේ වර්ධනය අනුව පුරුක් 3 - 4 කට වරක් ගස ආධාරකයට ලිහිල්ව ගැට ගසන්න.<br><br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | ප්‍රධාන කඳේ පහළින් එන අතු ඉවත් කරන්න. කරටි මැලවී තිබේ නම් එම කරටිවල හානිවූ ස්ථානය සහිත කොටස සමඟ කරටිය කඩා දමන්න. හානි වූ කරටි හා කරල් ගැඹුරට වැලලීමෙන් හෝ පුළුස්සා විනාශ කරන්න.<br><br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. |
| පෝෂණ ගුණය | කැල්සියම්, විටමින් ඒ සහ විටමින් සී බහුලයි. | කැල්සියම්, විටමින් ඒ සහ විටමින් බී බහුලයි | ඉදුණු තක්කාලිවල කැල්සියම්, පොස්පරස් සහ විටමින් සී බහුලය. පිළිකා නාශක ගුණයෙන් යුතු ලයිකොපීන් සංයෝගය බහුලව අඩංගු වේ. | විටමින් බී සහ දල තන්තු බහුලයි |

**නිරෝගී දිවියක් සඳහා නැවුම් එළවළු සහ පලතුරු වැඩිපුර ආහාරයට එක්කර ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවය) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## අතරමැදි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | වැටකොළු  1 | බණ්ඩක්කා  2 | මෑ  3 | රාබු  4 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. රාබු සඳහා මීටර් 3 (අඩි 10) ක් දිග සෙ.මී. 90 (අඩි 3) පළල පාත්ති සකසා ගැනීමෙන් වගා නඩත්තු කටයුතු පහසු කරගත හැක. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල් වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර මීටර් 1.5<br>පේළිය තුළ, පැළ අතර මීටර් 1.5 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 60 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී 30 | පේළි අතර සෙ.මී. 30<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 10 |
| බීජ/පැළ සිටුවීම | එක වලක බීජ 2 ක් සිටුවා සති 2-3 කදී නිරෝගී පැළයක් ඉතිරි කරන්න. පොල් කටුවක හෝ පොලිතින් බඳුනක පැළකර සති 3ක් පමණ වූ නිරෝගී පැළයක් වලක සිටුවීම වඩාත් සාර්ථකවේ. | එක වලක බීජ 3-4 ක් දමා පැළවී සති 2 කදී පමණ නිරෝගී පැළ 2 ක් ඉතිරි කර වැඩි පැළ ඉවත් කරන්න. | එක වලක බීජ 2 ක් සිටුවන්න. | පේළිය දිගේ සෙ.මී 1 ක් පමණ ගැඹුරට තුනීවට බීජ දමන්න. බීජ පැළවී සති 1-2 කදී සෙ.මී. 10 පමණ පරතරය සිටින සේ වැඩි පැළ ඉවත් කරන්න. |
| වගා පාලන කටයුතු | සිටුවා සති 3 කට පමණ පසු මීටර් 2ක් පමණ උස මැස්සකට වැල් යොමු කරන්න. ප්‍රධාන වැලේ පාමුල කොටසින් හට ගන්නා රිකිලි ඉවත් කරන්න. ඉල් මැස්සාගේ හානිය නිසා පල කුණුවීම වලක්වා ගැනීමට කරල් මලෙන් හටගත් විගසම කඩදාසි හෝ පතුල විවෘත පොලිතින් බෑග් යොදා ආවරණය කරන්න. හානි වූ කරල් එකතු කර ගිනි තැබීම හෝ ගැඹුරට වැලලීම හෝ කළු පොලිතින් මල්ලක දමා ගැටගසා අව්වේ තබන්න. | වගාවේ මුල් අවස්ථාවේ වර්ධනය දුර්වල වුවහොත් ගසේ වර්ධනය නැවත ඇතිකර ගත නොහැක. මේ නිසා හොඳින් කාබනික පොහොර යොදා, ජල සම්පාදනය කර දිරිමත් පැළයක් ඇති කර ගැනීම හොඳ වගාවක මූලාරම්භයයි. අස්වනු නෙලන විට එම කරලට පහලින් ඇති පත්‍රය ද ඉවත් කරන්න. | සිටුවා සති 2-3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වලට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමු කිරීමද කළ හැකිය. ලපටි දළු හා කරල් වලට කුඩිත්තන් (කළු දුඹුරු පැහැයට හුරු කුඩා කෘමීන්) සිටීනම් උදැසන පින්නට අළු ඉසින්න. ගහනය අධික නම් එම කොටස් කඩා ඉවත් කරන්න. | පස බුරුල් කරන්න.<br>වල් පැළෑටි පාලනය කරන්න. |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | මාස 1 1/2-2 කදී පමණ අස්වනු නෙලීම ආරම්භ කළ හැකිය. | | දින 45 කදී පමණ ගැලවිය හැක. ප්‍රමාදවී ගැලවීමෙන් අලවල ගුණාත්මය අඩුවේ. |
| පෝෂණ ගුණය | තන්තු බහුල, පහසුවෙන් පිර්ණය වන එළවළුවකි. | කැල්සියම්, අයඩින් සහ විටමින් සී බහුල එළවළුවකි. | ප්‍රෝටීන්, කැල්සියම්, පොස්පරස් සහ දළ තන්තු බහුල වේ. | කැල්සියම්, පොටෑසියම් සහ දළ තන්තු බහුල ආහාරයකි. |

**ඊළග වගාව සඳහා අවශ්‍ය බීජ ඔබේ ගෙවත්තේම නිපදවා ගන්න.**

තාක්‍ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## අතරමැදි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| | | | |
|---|---|---|---|
| බෝගය සහ බීජ වල ස්වරූපය | නිවිති  5 | තම්පලා  6 | බෝංචි  7 |
| බිම් සැකසීම | පැළ හෝ බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න.. | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න | සෙ.මී. 30 පමණ ගැඹුරට පස පෙරලා හොඳින් කැට පොඩි කරන්න. වතුර බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වළවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | |
| පරතරය | ජේළි අතර සෙ.මී 45<br>ජේළිය තුළ, පැළ අතර සෙ.මී 45 | ජේළි අතර සෙ.මී 30<br>ජේළිය දිගේ තුනීවට බීජ දමන්න. | ජේළි අතර සෙ.මී. 75<br>ජේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| බීජ/පැළ සිටුවීම | එක වළක බීජ 2 ක් සිටුවන්න. | බීජ සෙ.මී 1 ක් පමණ ගැඹුරට දමන්න.<br>බීජ වැලි සමඟ මිශ්‍රකර යෙදීමෙන් තුනීවට බීජ දැමීම පහසු වේ. | එක් වළක බීජ 1-2 ක් සිටුවන්න. |
| වගා පාලන කටයුතු | දියකරගත් අමු ගොම පත්‍ර තෙමෙන සේ සති කිහිපයකට වරක් යොදන්න. පොළව මට්ටමේ සිට අඟල් 6-8 ක් වර්ධනය වූ පසු අග්‍රස්ථය කපා දැමීමෙන් පඳුරක් ආකාරයට වර්ධනය කර ගැනීම හෝ සිටුවා සති 3-4 කදී පොළොව මට්ටමේ සිට අඩි 1-1 1/2 උසින් සිටින සේ පාත්තියට ඉහලින් සැකසූ මැස්සකට යැවීමද කල හැකිය. | පැළ ගහනය වැඩි වීම නිසා දුර්වල පැළ ඇතිවේ. එවැනි අවස්ථාවක පැළ තුනී කරන්න. | සෑම වළක්ම කෝටුවකට හෝ ඉපලකට යොමු කරන්න. වැල්වලට මීටර 2 ක් පමණ උස කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇදීම ද කළ හැකිය. |
| අස්වැන්න | අස්වැන්න වරින් වර නෙලාගත හැකිය. දණ්ඩ සමඟ කරටි කැපීම මඟින් වර්ධක වර්ධනය දිගටම පවත්වා ගත හැකිය. මල් පිපීමට ඉඩහැරීමෙන් වර්ධනය බාලවේ. මල් කිනිති කඩා ඉවත් කරන්න. | සති 4-6 කදී පමණ ගස් සම්පූර්ණයෙන්ම ගලවා ගැනීම හෝ කඳ කපා ගැනීම තුලින් වරින් වර අස්වනු ගැනීම සඳහා වගාව පවත්වා ගත හැකිය. | දින 90 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය. |
| පෝෂණ ගුණය | විටමින් ඒ, යකඩ හා දළ තන්තු බහුල එළවළුවකි. | යකඩ, කැල්සියම් සහ තන්තු බහුල පලා වර්ගයකි. | ප්‍රෝටීන්, විටමින් සී සහ දල තන්තු බහුල එළවළුවකි. |

**නිරෝගී දිවියක් සඳහා දිනකට එළවළු සහ පලතුරු වර්ග 05 ක් ආහාරයට ගන්න.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

# අතරමැදි කලාපයේ - ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජ වල ස්වරූපය | මිරිස්  8 | මාළුමිරිස්  9 | තක්කාලි  10 | බටු  11 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | මිරිස්, මාළු මිරිස්, තක්කාලි, බටු වැනි බෝග පසුගිය කන්නයේ වගා නොකළ ස්ථානයක් මේ සඳහා වඩාත් සුදුසුය. පැළ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1 අනුපාතයට පුරවන ලද කිලෝ ග්‍රෑම් 10 ප්‍රමාණයේ හාල් මළු හෝ පොලිතීන් මළු වලද සිටුවිය හැකිය. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 60<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 40<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 80<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 50 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| බීජ/පැළ සිටුවීම | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටිනසේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. | | දින 14-21 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටිනසේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. | දින 25-30 ක් වයසැති පැළ 2 ක් එක් වලක පරතරයක් සිටිනසේ, මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය යොදා සෙවන සපයන්න. |
| වගා පාලන කටයුතු | කොල කොඩවීම වැනි හානි වලක්වා ගැනීම සඳහා නිතර පරීක්ෂා කර හානිය මුල් අවස්ථාවේම හඳුනාගන්න. දින 3-4 කට වරක් ජලය ස්ප්‍රේ කිරීම හෝ පිඩනයක් යටතේ පත්‍ර වලට ඉසින්න. වරින් වර කොහොඹ බීජ නිස්සාරකය හෝ කොහොඹ පත්‍ර, කුරුඳු, සුදුලූනු, ඉඟුරු වැනි පලිබෝධනාශක ගුණ ඇති ශාක සාර ඉසින්න. පිදුරු, ග්ලිරිසීඩියා කොළ වැනි දෑ වලින් වසුනක් යොදන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | | ගස් කඩා වැටීම වැළැක්වීමට හා ගෙඩි පොලොවේ ගෑවී කුණුවීම වලක්වා ගැනීමට සිටුවා සති 3-4 කදී ආධාරක කෝටු සිටුවන්න. ගසේ වර්ධනය අනුව පුරුක් 3-4 කට වරක් ගස ආධාරකයට ලිහිල්ව ගැට ගසන්න.<br>පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | ප්‍රධාන කඳේ පහලින් එන අතු ඉවත් කරන්න. කරටි මැලවී තිබේනම් එම කරටිවල හානිවූ ස්ථානය සහිත කොටස සමඟ කරටිය කඩා විනාශ කරන්න. හානි වූ කරල්ද එලෙස විනාශ කරන්න. |
| අස්වැන්න | පලමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පලමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පලමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. | පලමු අස්වැන්න මාස 2-2 1/2 කදී ලබාදේ. |
| පෝෂණ ගුණය | කැල්සියම්, විටමින් ඒ හා සී බහුලයි. | කැල්සියම්, විටමින් ඒ හා බී බහුලයි. | ඉදුනු තක්කාලිවල කැල්සියම්, පොස්පරස් සහ විටමින් සී බහුලය. පිළිකා නාශක ගුණයෙන් යුතු ලයිකොපීන් සංයෝගය බහුලව අඩංගු වේ. | විටමින් බී සහ කෙඳි බහුලයි. |

**එළවළු සහ පලතුරු වැඩිපුර ආහාරයට ගැනීමෙන් පිළිකා ඇතුළු බොහෝ රෝග වැලඳීමේ අවදානම අඩුවේ.**

තාක්ෂණික තොරතුරු සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) දුරකථන අංකය අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## උඩරට කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජවල ස්වරූපය | කැරට්  1 | බීට් රූට්  2 | ගෝවා  3 | රාබු  4 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. **රාබු, බීට් සහ කැරට් සඳහා** මීටර් 3 (අඩි 10) ක් දිග සෙ.මී. 90 (අඩි 3) පළල පාත්ති සකසා ගැනීමෙන් වගා නඩත්තු කටයුතු පහසු කරගත හැක. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 25<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 10 | පේළි අතර සෙ.මී. 30<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 15 | පේළි අතර සෙ.මී. 50<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 30<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 10 |
| බීජ/පැළ සිටුවීම | පේළිය දිගේ සෙ.මී. 1 ක් පමණ ගැඹුරට තුනීවට බීජ දමන්න. බීජ පැළවී සති 1-2 කදී සෙ.මී. 10 පරතරය සිටින සේ වැඩි පැළ ඉවත් කරන්න. | තවාන් දමා ප්‍රරෝහණය වී සති 5-6 ක් වයසැති අලය තරමක් වර්ධනය වී ඇති තවාන් පැළ ගලවා පත්‍ර කෙළවර කපා සකස් කරගත් ක්ෂේත්‍රයේ නියමිත පරතරයට සිටුවන්න. බීජ කෙළින්ම ක්ෂේත්‍රයේ සිටුවීමද කළ හැකි අතර, ඉහත පරතරය සිටින සේ තුනීවට බීජ යොදන්න. | තවාන් දමා ප්‍රරෝහණයෙන් පසු සති 3-4 ක් වයසැති නිරෝගී දැඩිමත් පැළ සකස්කරගත් වලවල් තුල එක් වලක එක පැළයක් බැගින් සිටුවන්න. ජලය යොදා සෙවන කරන්න. | පේළිය දිගේ සෙ.මී. 1 ක් පමණ ගැඹුරට තුනීවට බීජ දමන්න. බීජ පැළවී සති 1-2 කදී සෙ.මී. 10 පමණ පරතරය සිටින සේ වැඩි පැළ ඉවත් කරන්න. |
| වගා පාලන කටයුතු | පස බුරුල් කරන්න. වල් පැළෑටි පාලනය කරන්න. | පස බුරුල් කරන්න. වල් පැළෑටි පාලනය කරන්න. | පස බුරුල් කරන්න. කොළ කන දළඹුවන්ගේ හානිය පිළිබඳව නිතර පරීක්ෂාකාරී වන්න. කුඩා දළඹුවන් අතින් ඇහිඳ ඉවත් කරන්න. කොහොඹ නිස්සාරකය යොදන්න. | පස බුරුල් කරන්න. වල් පැළෑටි පාලනය කරන්න. |
| අස්වැන්න | මාස 3 - 3 1/2 කදී පමණ අස්වනු නෙලීමට හැකිය. | මාස 3 - 3 1/2 කදී අස්වනු නෙලීමට හැකිය. | මාස 3 - 3 1/2 කදී අස්වනු නෙලීමට හැකිය. | දින 45 කදී පමණ ගැලවිය හැක. ප්‍රමාදවී ගැලවීමෙන් අලවල ගුණාත්මය අඩුවේ. |
| පෝෂණ ගුණය | විටමින් ඒ කැල්සියම්, පොස්පරස් බහුල වේ. | ප්‍රෝටීන්, කැල්සියම්, පොස්පරස්, විටමින් බී හා දළ තන්තු බහුල වේ. ඇන්තොසයනින් අඩංගු බැවින් ප්‍රතිඔක්සිකාරක ගුණයෙන් යුක්තය. | විටමින් සී, ඛනිජ ලවණ හා දළ තන්තු බහුල එළවළුවකි. | කැල්සියම්, පොටෑසියම් සහ දළ තන්තු බහුල ආහාරයකි. |

**ඊළඟ වගාව සඳහා අවශ්‍ය බීජ ඔබේ ගෙවත්තේම නිපදවා ගන්න.**

වැඩි විස්තර සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## උඩරට කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජවල ස්වරූපය | නිවිති  5 | වැල් බෝංචි  6 | දඹල  7 |
|---|---|---|---|
| බිම් සැකසීම | බීජ හෝ පැළ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | බීජ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. | සෙ.මී. 30 පමණ ගැඹුරට පස පෙරලා හොඳින් කැට පොඩි කරන්න. වතුර බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වළවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 45<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 30 | පේළි අතර සෙ.මී. 75<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| බීජ සිටුවීම | එක් වළක බීජ 2 ක් සිටුවන්න. | එක් වළක බීජ 2 බැගින් සිටුවන්න. | එක් වළක බීජ 1-2 ක් සිටුවන්න. සිටුවීමට පෙර බීජ පෙඟවී-මෙන් පැළවීම ඉක්මන් වේ. |
| වගා පාලන කටයුතු | දියකර ගත් අමුගොම පත්‍ර තෙමෙන සේ සති කිහිපයකට වරක් යොදන්න. පොළොව මට්ටමේ සිට අඟල් 6-8 ක් වර්ධනය වූ පසු අග්‍රස්ථය කපා දැමීමෙන් පඳුරක් ආකාරයට වර්ධනය කර ගැනීම හෝ සිටුවා සති 3 - 4 කදී පොළොව මට්ටමේ සිට අඩි 1-1 1/2 උසින් සිටින සේ සැකසූ මැස්සකට යැවීම ද කළ හැකිය. | බීජ සිටුවා සති 2-3 කට පමණ පසු මීටර් 2 ක් පමණ උස ඉපලකට වැල් යොමු කරන්න. පැළ වළට මීටර් 2 ක් උස ආධාරක කෝටු සිටුවා ඒවා අතර, වැටක් ආකාරයට ලණු ඇද වැල් ඒවාට යොමු කිරීම ද කළ හැකිය. | සෑම වැලක්ම කෝටුවකට හෝ ඉපලකට යොමු කරන්න. වැල්වලට මීටර් 2 ක් පමණ උස කෝටු සිටුවා ඒවා අතර වැටක් ආකාරයට ලණු ඇදීම ද කළ හැකිය. |
| අස්වැන්න | අස්වැන්න වරින් වර නෙළාගත හැකිය. දණ්ඩ සමඟ කරටි කැපීම මගින් වර්ධක වර්ධනය දිගටම පවත්-වා ගත හැකිය. මල් පිපීමට ඉඩ හැරීමෙන් වර්ධනය බාලවේ. මල් කිනිති කඩා ඉවත් කරන්න. | මාස 2 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැක. | දින 90 කදී පමණ අස්වනු නෙළීම ආරම්භ කළ හැකිය. |
| පෝෂණ ගුණය | විටමින් ඒ, යකඩ හා දළ තන්තු බහුල එළවළුවකි. | ප්‍රෝටීන්, පොස්පරස්, කැල්සියම්, විටමින් බී සහ දළ තන්තු බහුල එළවළුවකි. | ප්‍රෝටීන්, විටමින් සී සහ දළ තන්තු බහුල එළවළුවකි. |

**නිරෝගී දිවියක් සඳහා දිනකට එළවළු සහ පලතුරු වර්ග 05 ක් වත් ආහාරයට ගන්න.**

වැඩි විස්තර සඳහා 1920 (කෘෂි උපදේශන සේවාව) අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. 2020

## උඩරට කලාපයේ ගෙවතු වගාව සඳහා උපදෙස්

| බෝගය සහ බීජවල ස්වරූපය | මිරිස්  8 | මාලුමිරිස්  9 | තක්කාලි  10 | වම්බටු  11 |
|---|---|---|---|---|
| බිම් සැකසීම | මිරිස්, මාළුමිරිස්, තක්කාලි, වම්බටු වැනි බෝග වගා කිරීම සඳහා පසුගිය කන්නයේ වගා නොකළ ස්ථානයක් තෝරා ගැනීම වඩාත් සුදුසුය. පැළ සිටුවීමට සති 2-3 කට පෙර සෙ.මී. 30 පමණ ගැඹුරට බිම පෙරලා කැට පොඩි කරන්න. ජලය බැස යන පරිදි උස් පාත්ති සකසා ගන්න. කොම්පෝස්ට් හා මතුපිට පස් 1:1 අනුපාතයට පුරවන ලද කිලෝ ග්‍රෑම් 10 ප්‍රමාණයේ හාල්මළු හෝ පොලිතීන් මළුවල ද සිටුවිය හැකිය. | | | |
| කාබනික පොහොර | බෝගයට අදාල පරතරයට සකසා ගත් වලවල්වලට හොඳින් දිරූ කොම්පෝස්ට්, ගොම, කුකුළු පොහොර වැනි සත්ත්ව පොහොර, කොළ පොහොර, කර දහයියා වැනි කාබනික පොහොර අවම වශයෙන් දෝත් 4-5 ක් වත් එක්කර පස සමඟ මිශ්‍ර කරන්න. පාත්ති සඳහා වර්ග මීටරයකට හොඳින් දිරූ කාබනික පොහොර අවම වශයෙන් කූඩයක් (කි.ග්‍රෑම් 2ක්) පමණ එක්කර පස සමඟ හොඳින් කලවම් කරන්න. බීජ හෝ පැළ සිටුවීමට සති 2කට පමණ පෙර කාබනික පොහොර යෙදීම වඩා සුදුසුයි. | | | |
| පරතරය | පේළි අතර සෙ.මී. 60<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 45 | පේළි අතර සෙ.මී. 40<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 40 | පේළි අතර සෙ.මී. 80<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 50 | පේළි අතර සෙ.මී. 90<br>පේළිය තුළ, පැළ අතර සෙ.මී. 60 |
| පැළ සිටුවීම | දින 25-30 ක් වයසැති තවාන් පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | දින 25-30 ක් වයසැති පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | දින 14-21 ක් වයසැති පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. | දින 25-30 ක් වයසැති පැළ 2 ක් පරතරයක් සිටින සේ එක් වලක සිටුවන්න. මුල් හොඳින් පසට යටවන පරිදි සිටුවා ජලය සපයා සෙවන කරන්න. |
| වගා පාලන කටයුතු | කොළ කොඩවීම වැනි හානි වළක්වා ගැනීම සඳහා නිතර පරීක්ෂාකර හානිය මුල් අවස්ථාවේම හඳුනාගන්න. දින 3-4 කට වරක් ජලය ස්ප්‍රේ කිරීම හෝ පිඩනයක් යටතේ ජලය පත්‍රවලට ඉසින්න. වරින් වර කොහොඹ බීජ නිස්සාරකය හෝ කොහොඹ පත්‍ර, කුරුඳු, සුදුළූනු, ඉඟුරු වැනි පලිබෝධනාශක ගුණ ඇති ශාකසාර යොදන්න. පිදුරු, ග්ලිරිසිඩියා කොළ වැනි දෑ වලින් වසුනක් යොදන්න. පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | | ගස් කඩා වැටීම වැළැක්වීමට හා ගෙඩි පොළොවේ ගෑවී කුණුවීම වළක්වා ගැනීමට සිටුවා සති 2-3 කදී ආධාරක කෝටු සිටුවන්න. ගසේ වර්ධනය අනුව පුරුක් 3-4 කට වරක් ගස ආධාරකයට ලිහිල්ව ගැට ගසන්න. පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. | ප්‍රධාන කඳේ පහළින් එන අතු ඉවත් කරන්න. කරටි මැලවී තිබේ නම් එම කරටිවල හානිවූ ස්ථානය සහිත කොටස සමඟ කරටිය කඩා දමන්න. හානිවූ කරටි හා කරල් ගැඹුරට වළලා හෝ පුළුස්සා විනාශ කරන්න. පසේ තෙතමනය හොඳින් පවත්වා ගන්න. |
| අස්වැන්න | පළමු අස්වැන්න මාස 2 -2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. | පළමු අස්වැන්න මාස 2 - 2 1/2 කදී ලබාදේ. |
| පෝෂණ ගුණය | කැල්සියම්, විටමින් ඒ සහ විටමින් සී බහුලයි. | කැල්සියම්, විටමින් ඒ සහ විටමින් බී බහුලයි. | ඉදුණු තක්කාලිවල කැල්සියම්, පොස්පරස් සහ විටමින් සී බහුලය. පිළිකා නාශක ගුණයෙන් යුතු ලයිකොපීන් සංයෝගය බහුලව අඩංගු වේ. | විටමින් බී සහ දළ තන්තු බහුලයි. |

**එලවළු හා පලතුරු වැඩිපුර ආහාරයට ගැනීමෙන් පිළිකා ඇතුළු බොහෝ රෝග වැලඳීමේ අවදානම අඩුවේ.**

වැඩි විස්තර සඳහා **1920** (කෘෂි උපදේශන සේවාව) අමතන්න. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය. **2020**

## - වැඩිදුර විස්තර සඳහා -

| | |
|---|---|
| **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | |
| - අධ්‍යක්ෂ, ව්‍යාප්ති හා පුහුණු අංශය, ප්‍රධාන කාර්යාලය | 0812 388 098 |
| - අධ්‍යක්ෂ, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව | 0812 388 011 |
| - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස | 0472 228 204 |
| - අතිරේක අධ්‍යක්ෂ, තිරසර කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මාකඳුර | 0312 299 625 |
| - අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන ආයතනය, ගන්නොරුව | 0812 030 040 |
| - 1920 කෘෂි උපදේශන සේවාව | 1920 |
| **අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | |
| - අපනයන කෘෂිකර්ම ප්‍රධාන කාර්යාලය, ගන්නොරුව | 0812 388 651 |
| - ප්‍රාදේශීය අපනයන කෘෂිකර්ම මධ්‍යස්ථානය, මාතලේ | 0662 222 822 |
| **ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය** | 0112 786 495 |
| - කලාප සහකාර අධ්‍යක්ෂ කාර්යාලය බස්නාහිර/දකුණ | 0912 225 795 |
| - කලාප සහකාර අධ්‍යක්ෂ කාර්යාලය නැගෙනහිර/ඌව | 0632 222 404 |
| - කලාප සහකාර අධ්‍යක්ෂ කාර්යාලය මධ්‍යම/සබරගමුව | 0812 234 816 |
| - කලාප සහකාර අධ්‍යක්ෂ කාර්යාලය වයඹ/උතුරුමැද | 0252 221 594 |
| **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව - ගැටඹේ** | 0812 388 195 |
| **පොල් පර්යේෂණ ආයතනය - ලුණුවිල** | 0313 717 362 |
| **ආයුර්වේද දෙපාර්තමේන්තුව** | |
| - වනස්පති, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද මධ්‍යස්ථානය | 0332 222 748 |
| - ප්‍රාදේශීය ආයුර්වේද මධ්‍යස්ථානය, කුණ්ඩසාලේ | 0812 423 932 |



ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන
ජනාධිපති කාර්යසාධන බලකාය

NAICC | Designed by: NATIONAL AGRICULTURE INFORMATION & COMMUNICATION CENTER
Gannoruwa Peradeniya.